# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටු වාර්තාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව

2016 මැයි

© ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව, 2016 මැයි
(සංස්කරණය සහ යාවත්කාලීන කරන ලද පිටපත) සිංහල පරිවර්තනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව

විසුම්පාය

ස්ටේපල් වීදිය

කොළඹ 02

ශ්‍රී ලංකාව

# ස්තූතිය

අපට පැවරුණු කාර්යය ඉටු කිරීම සඳහා සහයෝගය දුන් සෑම දෙනාට ම කමිටුවේ සභාපති ලෙස මගේ කෘතඥතාව පළ කරමි. දෙදහස් පන්සියයක පුද්ගලයින් සංඛ්‍යාවක් අප ඉදිරියේ කරුණු දැක්වූ අතර ඉන් සමහරෙක් පුළුල් සාමාජිකත්වයක් සහිත සංවිධාන නියෝජනය කළහ. ඔවුන්ටත්, අපට ලිඛිත ව කරුණු ඉදිරිපත් කළ සියලු දෙනාටත් අපේ විශේෂ ස්තූතිය හිමිවේ.

රට පුරා ජනතාව හමුවෙමින්, ඔවුන්ගේ අදහස් ලබා ගනිමින් හා ඒවා අධ්‍යයනය කරමින් ඉතා දුෂ්කර තත්ත්වයන් මැද කෙටි කාලයක් තුළ වාර්තාව සකස් කිරීමට ගරු සේවයක් සැපයූ කමිටුවේ සාමාජිකයන් වූ වින්ස්ටන් පතිරාජ මහතා (ලේකම්), ෆයිස් මුස්තාපා මහතා, මහාචාර්ය ඒ. එම්. නවරත්න බණ්ඩාර, මහාචාර්ය එම්.එල්.ඒ. කාදර්, එන්. සෙල්වක්කුමාරන් මහතා, ගරු එස්. තවරාජා, කුෂාන් ද අල්විස් මහතා, ආචාර්ය හරිනි අමරසූරිය, ආචාර්ය කුමුදු කුසුම් කුමාර, සුනිල් ජයරත්න මහතා, ආචාර්ය උපුල් අබේරත්න, තේමිය එල්.බී. හුරුල්ලේ මහතා, එස්. විජේසන්දිරන් මහතා, එම්.වයි.එම්. ෆායිස් මහතා, එම්.කේ. නදීකා දමයන්ති මහත්මිය, කාන්ති රණසිංහ මහත්මිය, එස්.සී.සී. ඉළංකෝවන් මහතා සහ සිරිමසිරි හපුආරච්චි මහතාට මගේ හෘදයාංගම කෘතඥතාව පුද කරන්නේ ඉතා සතුටෙනි.

කමිටු සාමාජිකයින් මෙම දුෂ්කර කර්තව්‍යය ඉටු කළේ කෙසේ ද යන්න සටහන් කර තැබිය යුතුය. සති හයක කාලය තුළ දිස්ත්‍රික්ක විසි පහක සංචාරය කර ජනතා අදහස් ලබා ගැනීම විශාල ජයග්‍රහණයකි. හාරදහසක් පමණ වූ වාචික හා ලිඛිත අදහස් දැක්වීම් සියල්ල අධ්‍යයනය කිරීම යෝධ කර්තව්‍යයක් වූ බව කිවයුතු නොවේ. නමුත් ජීවිතයේ අන් සියලුම කටයුතු අමතක කර දමා එකාවන් ව දිවා රාත්‍රී වෙහෙසී වැඩ කිරීමෙන් අපට එය සාර්ථක කර ගත හැකි වූයේය.

මෙහිදී අපට ලබා දුන් සහයෝගය පිළිබඳ ව චරිත රත්වත්ත මහතා, අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා හා ඔහුගේ අතිරේක ලේකම් සහ සහකාර ලේකම්වරුන්ට මගේ ස්තූතිය පුද කිරීමට කැමැත්තෙමි.

අපගේ කාර්යය සාර්ථක කර ගැනීමට කැපවී කටයුතු කළ විසුම්පාය කාර්යාලයේ සේවක මණ්ඩලයට ද, මගේ ස්තූතිය හිමිවේ. අපගේ කාර්යාලයේ කටයුතු මෙහෙයවමින්

වෙහෙස නොබලා ක්‍රියා කළ මගේ ලේකම්වරිය වූ රංගා ජයසුන්දර මෙනෙවියට මගේ ස්තුතිය හිමි විය යුතුය.

ස්වේච්ඡා බලකායෙන් අපට උපකරණ හා සහාය ලබා දීම පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට ස්තුතිවන්ත වෙමි. ඉදිරිපත් කළ අදහස් හා කරුණු සාරාංශගත කරමින් හා සබැඳි දත්ත සමුදාය පද්ධතිය පිළියෙල කරමින් අපට සහාය වූ සධනි රාජපක්ෂ මෙනෙවිය, විමුක්ති කල්දේරා මෙනෙවිය ඇතුලු එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා බලකායේ ස්වේච්ඡා සේවක සේවිකාවන් හැටක් පමණ වූ කණ්ඩායමට අපේ කෘතඥතාව හිමිවිය යුතු ය.

වාර්තාවේ පෙළ සැකසීම පිළිබඳ ව වී.කේ. නානායක්කාර මහතාට ද, මුල් ඉංග්‍රීසි පිටපත සිංහලට පරිවර්තනය කළ පරිවර්තකයන්ට ද, ඉතා සුළු කාලයක් තුළ එය මුද්‍රණය කරදීම පිළිබඳ ව රජයේ මුද්‍රණාලායාධිපති ගාමිණී ෆොන්සේකා මහතාට ද, ස්තුතිවන්ත වෙමි.

එමෙන්ම, මෙම කාර්යයේදී නන් අයුරින් සහය දුන් සියළු දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහ නිලධාරින් ඇතුළු කාර්යාල මණ්ඩලයට, සියළු ම ග්‍රාම නිලධාරීන්ට සහ පොලිස් නිලධාරීන්ට, මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යවේදීන්ට, එම ආයතන කාර්ය මණ්ඩලවලට ද, මා ඇතුලු කමිටු සාමාජිකයින්ගේ ස්තුතිය පිරිනමමු.

අවසාන වශයෙන් විශාල කැපවීමකින් අපේ සම්පූර්ණ ක්‍රියාවලිය ම කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් කමිටුවේ ලේකම් වින්ස්ටන් පතිරාජ මහතාට මගේ හෘදයංගම ස්තුතිය පුද කරමි.

**ලාල් විජේනායක**
සභාපති
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජන කමිටුව

2016 මැයි 10වැනිදා

## පෙරවදන

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයේ ගරු සභාපතිතුමා සහ සාමාජිකයන් වෙත

අමාත්‍ය මණ්ඩලය විසින් අප පත් කරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සහායක් ලෙස ඒ පිළිබඳ මහජන අදහස් හා යෝජනා ලබා ගැනීමටයි. අපහට පැවරුණු වගකීම වූයේ මේ සම්බන්ධයෙන් මහජනතාවගෙන් ලිඛිත අදහස් ලබා ගැනීමත්, වාචිකව අදහස් ලබා ගැනීම සඳහා රට පුරා විවිධ පළාත්වල මහජන සැසි වාර පැවැත්වීමත්, මාස තුනක් ඇතුළත අපේ නිර්දේශ සමග ඒ පිළිබඳ අවසන් වාර්තාවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට ඉදිරිපත් කිරීමත්, වේ.

අපේ ඉල්ලීම මත ගරු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් වාර්තාව ලබා දිය යුතු කාලය මාසයකින් දීර්ඝ කරන ලදී. අප විසින් කළ තවත් ඉල්ලීමක් මත අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතු දිනය 2016 මැයි 10 දක්වා දීර්ඝ කරනු ලැබීය.

2016 ජනවාරි 5 වැනිදා කමිටුව පළමුවරට රැස් වූ අතර අපට පැවරුණු වගකීම ඉටු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග සැලසුම් කිරීම සඳහා මූලික රැස්වීම් ගණනාවක් ඉන් පසුව පවත්වන ලදී.

අපේ කාර්යය ඉටු කිරීමට ලබා දී ඇති කෙටි කාලයත්, ලබා ගත හැකි සම්පත් ආදියත්, සැලකිල්ලට ගනිමින් පහත සඳහන් තීරණ ගන්නා ලදී.

1. කමිටුව විසින් තීරණය කළ විෂයයන් 20ක් යටතේ මහජනයාගේ ලිඛිත අදහස් ලබා ගැනීම (විෂය ලැයිස්තුව අමුණා ඇත. ආ ඇමුණුම)
2. එක දිස්ත්‍රික්කයක අඩු ම වශයෙන් දින දෙකක් බැගින් දිස්ත්‍රික්ක විසි පහේ ම මහජන සැසිවාර පැවැත්වීම.
3. කොළඹින් පිට දිස්ත්‍රික්කවල මහජන සැසිවාර සමාන්තරව පැවැත්වීම සඳහා කමිටුව සාමාජිකයන් 4-6 කණ්ඩායම්වලට වෙන් කිරීම.
4. ඒ ඒ දිස්ත්‍රික්කවල මේ සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කිරීමට ග්‍රාම නිලධාරීන් යොදා ගැනීම හා ඒ සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සහාය ලබා ගැනීම.
5. මහජන සැසි වාර පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ කාර්යාලවලින් ලබා ගැනීම.
6. විවිධ දිස්ත්‍රික්කවල වාචිකව ඉදිරිපත් කළ කරුණු පිළිබඳ ව වාර්තාවක් තබා ගැනීම සඳහා සියලු දිස්ත්‍රික් සැසිවාර විද්‍යුත් ක්‍රමයට වාර්තා කර තබා ගැනීම.
7. මහජන අදහස් ඉ-තැපෑලෙන් (constitutionalreforms@gmail.com) ෆැක්ස් පණිවුඩ හා අනිත් සන්නිවේදන මාර්ගවලින් ලබා ගැනීම.

8. වෙබ් අඩවියක් (www.yourconstitution.lk) ආරම්භ කිරීම.
9. මුද්‍රිත මාධ්‍යවල භාෂා තුනෙන් ම දැන්වීම් පළ කිරීමෙන් හා හැකි තාක් දුරට විද්‍යුත් මාධ්‍ය තුළින් සෑම දිස්ත්‍රික්කයකම මහජන සැසිවලට ප්‍රචාරය ලබා ගැනීම.
10. මාධ්‍ය සම්මන්ත්‍රණ හා මාධ්‍ය සාකච්ඡා තුළින් කමිටුවේ කටයුතු පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.

මේ අනුව කොළඹ දිස්ත්‍රික්කයේ දින අටක් ද, අන් සියලුම දිස්ත්‍රික්කවල දින දෙක බැගින් ද, මහජන රැස්වීම් පවත්වන ලදී.

2016 ජනවාරි 11 වැනිදා පැවැත්වූ කමිටු රැස්වීමේදී කමිටුවේ ලේකම් ලෙස වින්ස්ටන් පතිරාජ මහතා පත් කර ගන්නා ලදී.

දිස්ත්‍රික් රැස්වීම්වල සභාපතිතුමා නොමැති අවස්ථාවලදී මුලසුන ගැනීමට සභාපති විසින් සාමාජිකයෙක් නම් කරනු ලැබීය (දිස්ත්‍රික්ක රැස්වීම්වලට සහභාගි වූ කමිටු සාමාජිකයන්ගේ ලැයිස්තුවක් අමුණා ඇත. ඈ ඇමුණුම).

කමිටුව විසින් ගත් තීරණයකට අනුව විවිධ දිස්ත්‍රික්කවල සංචාරවල දී ආගමික නායකයන් හමුවී ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ගැන ඔවුන්ගේ අදහස් ලබා ගැනීමට කමිටු සාමාජිකයෝ ක්‍රියා කළහ.

2016 මාර්තු 5 වැනිදා දිස්ත්‍රික්ක සැසිවාර අවසන් කිරීමෙන් පසු කමිටුව අතිගරු ජනාධිපති තුමා, ගරු අගමැතිතුමා, ගරු කථානායකතුමා හා විපක්ෂ නායකතුමා හමුවී කමිටුවේ කටයුතු ගැන ඔවුන් දැනුවත් කළෝය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ ව ඔවුන්ගේ අදහස් දැන ගැනීමට කමිටුව, දේශපාලන පක්ෂ නායකයන්, ස්වාධීන කොමිෂන් සභා, වෘත්තීය සංවිධාන හා විද්වතුන් ගණනාවකට ආරාධනය කළෝය.

ලිඛිතව හා වාචිකව කරුණු දැක්වීමට මහජනයා විශාල උනන්දුවක් දැක්වූ අතර ඔවුන් සියලු දෙනාට ම අවස්ථාවක් ලබා දීම අපට අභියෝගයක් විය.

ලිඛිත හා වාචික අදහස් දැක්වීම් සඳහා කාල සීමාවක් ලබා දෙන ලද නමුත් එයින් පසුවත් අප වෙත ඉල්ලීම් ගලා ආවේය.

අපගේ වාර්තාවලට අනුව පුද්ගලයන්/සංවිධාන 2500කට වැඩි ගණනක් අප ඉදිරියට පැමිණ වාචිකව කරුණු දක්වා තිබේ. තවත් නියෝජනයන් 800ක් පමණ ඉ-තැපෑලෙන් ද, 150ක් පමණ ෆැක්ස් පණිවුඩවලින් ද, 60ක් පමණ දුරකථන ඇමතුම් ද, තැපෑලෙන් ලැබුණු හා කාර්යාලයට භාර දුන් නියෝජන 700ක් පමණ ද, විය.

බොහෝ අදහස් දැක්වීම් ඉදිරිපත් කරන ලද්දේ වෘත්තිකයින්ගේ ආයතන, වෘත්තිය සමිති හා අනිකුත් සිවිල් සමාජ සංවිධාන නියෝජනය කළ පුද්ගලයන් විසිනි.

මෙයට අමතරව විදේශගත ව ජීවත්වන ශ්‍රී ලාංකික වෘත්තිකයන් හා විද්වතුන්ගෙන් ද, අප වෙත ලිඛිත නියෝජනයන් ලැබුණි. වීඩියෝ සම්මන්ත්‍රණ මගින් ඔවුන්ට වාචිකව අදහස්

දැක්වීමට අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියත්, එම පහසුකම් නොතිබීම නිසා එම ඉල්ලීම ඉටු කිරීමට හැකි වූයේ නැත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කිරීමේ පළමු පියවරක් ලෙස ජනතාවගේ අදහස් විමසීමට ගත් ක්‍රියා මාර්ගය නිසා දේශපාලන ක්‍රියාවලිය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළත්වය පිළිබඳ ව ජනතාව දැනුවත් වීම නිසා ව්‍යවස්ථාව සෑදීම ජනතාවට සමීපවී ඇති බව කමිටුවේ හැඟීමයි.

ලැබී තිබුණු කාල සීමාව තුළ මහජනයාගේ පුළුල් පැති කඩක් හමුවීමට අපි හැකි තරම් උත්සාහ දැරුවෙමු. එම කාල සීමාව තුළ ආගමික නායකයන්, දේශපාලන පක්ෂ නායකයන්, ස්වාධීන කොමිෂන් සභා, වෘත්තිය සංවිධාන ආදියේ අදහස් ලබා ගැනීමට සෑම ප්‍රයත්නයක් ම දැරුවෙමු.

අපගේ සැසිවාර ප්‍රසිද්ධියේ පැවැත්වුණු අතර අප ඉදිරියට පැමිණි අයට නිදහසේ හා විවෘතව අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ සලසන ලදී. ඉදිරිපත් වූ අදහස් හා යෝජනා අධ්‍යයනය කිරීමේදී පෙනී ගියේ ශ්‍රී ලංකාව පුරා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් එකඟත්වයක් පවතින බවයි.

1. නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීම, පරිපූර්ණ අයිතිවාසිකම් පනතක් තුළින් මූලික මානව හිමිකම් පුළුල් කිරීම හා ස්වාධීන කොමිෂන් සභා ශක්තිමත් කිරීම මගින් රාජ්‍යය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම.

2. පාලන ක්‍රියාවලියේ සහ දේශපාලන ජීවිතයෙහි ලා මහජනයාගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගන්නා ආයතන ශක්තිමත් කිරීමෙන්, පළාත් හා පළාත් පාලන මට්ටමට බලය පැවරීමෙන් හා රාජ්‍ය ව්‍යුහය තුළට ග්‍රාමීය හෝ නාගරික මට්ටමේ පුරවැසියන්ගේ දේශපාලන කටයුතු අන්තර්ගත කිරීමෙන් රාජ්‍යතන්ත්‍රය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම.

3. ජාතික ප්‍රතිසන්ධානය වහා කළ යුතු කාර්යයකි. එය ළඟා කර ගත හැක්කේ කෙසේද යන්න ගැන වෙනස් මත තිබුණි. මේ අතර එක් අදහසක් වූයේ දීර්ඝ කාලයක සිට පැවත එන සුළු ජාතීන්ගේ දේශපාලන ප්‍රශ්න විසඳීමේ ක්‍රමයක් ලෙස අර්ථාන්විත බලය පැවරීමක් පිළිබඳ ව ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයේදී අවධානය යොමු විය යුතුය යන්නයි.

4. ජනතාවට සමීප, සාධාරණ, දේශපාලනයෙන් තොර, ස්වාධීන, වෘත්තීය හා ජනතා සේවයට කැපවූ රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.

අප ඉදිරියට පැමිණි ජනතාව තුළ තිබූ පොදු මතයක් වූයේ රාජ්‍යය ප්‍රජාතන්ත්‍රීකරණය කිරීම හා ජාතික ප්‍රතිසන්ධානය සඳහා හොඳ ම අවස්ථාව මෙය බවයි. එය වහා ම කළ යුතු අතර මෙවර එය අසාර්ථක වුවහොත් රටට නැවතත් එවැනි අවස්ථාවක් උදා නොවනු ඇත යන්න බොහෝ දෙනාගේ මතය විය.

අප ඉදිරියට පැමිණි අයගේ මෙන් ම ලිඛිත නියෝජනයන්ගේ අඩංගුවූ සියලු ම අදහස් මෙම වාර්තාවට ඇතුළත් කර තිබේ. ජනතාව ඉදිරිපත් කළ අදහස් සංස්කරණය කිරීමක් නොකළ බව මෙහිලා සඳහන් කළ යුතුය.

මෙම වාර්තාවේ අප අනුගමනය කර ඇති ආකෘතිය වන්නේ සෑම ශීර්ෂයක් යටතේ ම ජනතාව දැක්වූ අදහස් ඉදිරිපත් කර ඒවා සනාථ කිරීමට ගෙන ආ තර්ක දක්වා ජනතා අදහස් මත පදනම්ව අපේ නිර්දේශ ඉදිරිපත් කිරීමයි. වාර්තාවේ ඇතුළත් කළ යුතු නිර්දේශ පිළිබඳව කමිටු සාමාජිකයන් වෙනස් මත දැරූ අවස්ථාවලදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයේ සැලකිල්ලට ගැනීම සඳහා අප මෙම වෙනස් නිර්දේශ ද, වාර්තාවේ ඇතුළත් කර තිබේ.

මහජන අදහස් ලබා ගැනීම, රටේ සියලු ම ප්‍රදේශවලට යමින් ඉතා ගැඹුරින් මෙම කරුණු ගැන සාකච්ඡා කිරීම ආදියේ නියැළෙමින් ඉතා කාර්ය බහුල වාතාවරණයක මෙම වාර්තාව සකස් කිරීමට සිදු වූ බැවින් මෙහි සංස්කරණ හා තාක්ෂණික දෝෂ තිබිය හැකි බව කරුණාවෙන් සලකන්න.

අපට පැවරූ වගකීම අනුව අපි මෙම වාර්තාව ඉදිරිපත් කරමු.

01. ලාල් විජේනායක (සභාපති) ..............................

02. වින්ස්ටන් පතිරාජ (ලේකම්) ..............................

03. ෆයිස් මුස්තාපා, ජ.නී. ..............................

04. ඒ.එම්. නවරත්න බණ්ඩාර ..............................

05. එම්.එල්.ඒ. කාදර් ..............................

06. එන්. සෙල්වක්කුමාරන් ..............................

07. එස්.තවරාජා ..............................

08. කුෂාන් ද අල්විස් ජ.නී. ..............................

09. හරිනි අමරසූරිය ..............................

10. කුමුදු කුසුම් කුමාර ..............................

11. ජී.ඒ. සුනිල් ජයරත්න ..............................

12. උපුල් අබේරත්න ..............................

13. තේමිය එල්.බී. හුරුල්ලේ ..............................

14. එස්. විජේසන්දිරන් ..............................

15. එම්.වයි.එම්. ෆායිස් ..............................

16. එම්.කේ. නදීකා දමයන්ති ..............................

17. කාන්ති රණසිංහ ..............................

18. එස්.සී.සී. ඉළංකෝවන් ..............................

19. සිරිමසිරි හපුආරච්චි ..............................

**2016 මැයි 10 වැනි දින**

# පටුන


| | |
|---|---|
| ස්තුතිය | iii |
| පෙරවදන | v |
| 1. හැඳින්වීම | 01 |
| 2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව | 07 |
| 3. ජාතික ධජය, ජාතික ගීය හා පුරවැසිභාවය | 11 |
| 3.1 ජාතික ධජය | 11 |
| 3.2 ජාතික ගීය | 12 |
| 3.3 පුරවැසිභාවය | 13 |
| 4. ආගම | 15 |
| 5. රාජ්‍යයේ ස්වභාවය | 19 |
| 6. ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහය | 25 |
| 7. රජයේ ආකෘතිය හා ස්තර | 31 |
| 7.1 රජයේ ආකෘති | 31 |
| 7.2 උප/නියෝජ්‍ය ජනාධිපති හෝ නියෝජ්‍ය අගමැති | 34 |
| 7.3 අමාත්‍ය මණ්ඩලය | 34 |
| 7.2 රජයේ ස්තර | 36 |
| 8. බල හවුල්කාරීත්වය | 39 |
| 9. බලය බෙදාහැරීම | 44 |
| 9.1 බලය පැවරීමේ ඒකකය | 44 |
| 9.2 බලය පැවරීමේ විෂය පථය | 49 |
| 10.පළාත් පාලනය | 63 |
| 11. රාජ්‍ය ප්‍රතිපත්ති හා මූලික වගකීම් පිළිබඳ නියාමක මූලධර්ම | 65 |
| 12 මූලික අයිතිවාසිකම් | 84 |
| 13 භාෂා අයිතිවාසිකම් | 121 |
| 14 අධිකරණය | 124 |
| 14.1 උසාවි ව්‍යුහය | 125 |
| 14.2 ව්‍යවස්ථාදායක උසාවිය/ශ්‍රේෂ්ඨාධිකරණයේ ව්‍යවස්ථාදායක මඬුල්ල | 127 |
| 14.3 අධිකරණ සමාලෝචනය | 130 |

14.4 අධිකරණයේ ස්වාධීනත්වය 130

14.5 උපරිමාධිකරණය සඳහා අධිකරණ කොමිසම 136

14.6 අධිකරණ සේවා කොමිසම 140

14.7 මානව හිමිකම් කොමිසම 141

14.8 ඔම්බුඩ්ස්වරයා 142

14.9 යුක්තිය ලබා ගැනීම 143

14.10 නීතියේ ප්‍රමාද 144

15. මැතිවරණ ක්‍රමය හා ක්‍රියාවලිය 146

16. රාජ්‍ය සේවය, රජයේ මුල්‍යය හා විගණනය 162

17. මහජන ආරක්ෂාව හා මානව ආරක්ෂාව 172

18. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හා ස්වාධීන කොමිෂන් සභා 176

18.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව 176

18.2 ස්වාධීන කොමිෂන් සභා 177

19. ඉඩම්, පරිසරය හා සංවර්ධනය 180

20. ප්‍රතිජනන ක්‍රියා හා ප්‍රතිසන්ධානය 188

20. වෙනස් ලෙස සැලකීමට විරුද්ධ කොමිසම 189

21 රාජ්‍ය සේවා දුක්ගැනවිලි කොමිසම 191

අ ඇමුණුම - කමිටු සාමාජිකයෝ 193

ආ ඇමුණුම - විෂය ලැයිස්තුව 195

ඇ ඇමුණුම - සාකච්ඡාවලට සහභාගී වූ සාමාජිකයෝ 196

ඈ ඇමුණුම - දිස්ත්‍රික් මහජන සැසිවාරවලට සහභාගී වූ සාමාජිකයෝ 197

ඉ ඇමුණුම - විසුම්පාය කාර්ය මණ්ඩලය 206

ඊ ඇමුණුම - එක්සත් ජාතීන්ගේ ස්වේච්ඡා සේවකයන්ගේ ලැයිස්තුව 207

උ ඇමුණුම - මහජන අදහස් ඉදිරිපත් කිරීම් පිළිබඳ තාවකාලික ලැයිස්තුව 208

# 1 පරිච්ඡේදය

# හැඳින්වීම

2015 දෙසැම්බර් 22වැනිදා අමාත්‍ය මණ්ඩලය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජන කමිටුව පත් කරන ලද්දේ යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ගැන ශ්‍රී ලංකාවේ ජනතාව සමග සාකච්ඡාමය ක්‍රියාවලියක නිරත වීම සඳහා ය. මෙම කමිටුව සාමාජිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත විය (අ ඇමුණුම).

## 1.1 ක්‍රියාවලිය

කමිටුව බහුවිධ ක්‍රමවලින් ජනතාවගේ අදහස් ලබා ගත්තේය. වාචිකව හෝ තැපෑලෙන්, විද්‍යුත්-තැපෑලෙන් හෝ ෆැක්ස් මගින් ලිඛිතව හෝ අදහස් හෝ යෝජනා ඉදිරිපත් කරන ලෙස මහජනයාට ආරාධනය කරන ලදී. දින අටක් පුරා මහජන අදහස් විමසූ කොළඹ දිස්ත්‍රික්කයේ හැරෙන්නට, අනිත් දිස්ත්‍රික්ක විසි හතරේ ම දින දෙක බැගින් මහජන අදහස් විමසීමට කමිටුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහාය ලබා ගත්තේය. මෙම දිස්ත්‍රික් රැස්වීම් සඳහා කමිටුව උප-කණ්ඩායම් ලෙස සහභාගි වීය. (ඈ ඇමුණුම බලන්න). සියලු මහජන අදහස් විමසීමේ සැසි, මාධ්‍යවලට හා මහජනයාට විවෘත විය. දින ගණනාවක් සාකච්ඡා කිරීමෙන් අනතුරුව යෝජිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා මහජනයාගේ අදහස් හා නිර්දේශ අඩංගු වාර්තාවක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ අවධානය සඳහා කමිටුව විසින් පිළියෙල කරන ලදී.

පාරදෘශ්‍ය භාවය පවත්වා ගැනීම සඳහා මහජනයා විසින් ඉදිරිපත් කළ අදහස් අඩංගු දත්ත සමුදාය පද්ධතියක් ද, කමිටුව විසින් ස්ථාපිත කරනු ලැබීය. මෙම දත්ත සමුදාය පද්ධතිය නිර්මාණය කරන ලද්දේ මෙම ඓතිහාසික ක්‍රියාවලිය අනාගතය සඳහා ආරක්ෂා කිරීමටත්, මහජනතාවට මෙම ලේඛන ලබාගැනීමේ පහසුවත්, සඳහායි.

මෙම ක්‍රියාවලියට මහජනයාගෙන් ලැබුණු ප්‍රතිචාරය ඉතා ප්‍රශංසනීය වේ. මහජන අදහස් ඉදිරිපත් කිරීමට දුන් කෙටි දැනුම්දීම හා කාලයේ හා මානව සම්පත්වල සීමාවන් මැද වුවත් රටේ ජනගහණයෙන් සැලකිය යුතු කොටසක් තුළ රටේ උත්තරීතර නීතිය ප්‍රතිසංස්කරණය කිරීමේ හා රාජ්‍ය බලය ප්‍රතිසංවිධානය කිරීමේ ප්‍රයත්නයට සම්බන්ධ වීමට අභිලාෂයක් තිබුණු බව අපට පැහැදිලිව දැක ගත හැකි විය.

කමිටුව ඉදිරියේ අදහස් දැක්වූ අය අතර සිවිල් සමාජ කණ්ඩායම්, පූජකවරුන්, විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්, මාධ්‍යවේදීන්, විශ්‍රාමික හා ආබාධිත පොලිසියේ හා හමුදා සාමාජිකයින්, දේශපාලන ක්‍රියාකාරීන්, ශිෂ්‍ය-ශිෂ්‍යාවන්, වෘත්තීය සමිති සාමාජිකයින්, දේශපාලනඥයින්, ජනවාර්ගික කණ්ඩායම්, ආන්තික හා නොතකා හරින ලද කණ්ඩායම්, සුළු ජනවාර්ගික කණ්ඩායම් හා ආබාධිත පුද්ගලයන් ආදි පුළුල් නියෝජනයක් දක්වන පුද්ගලයන් හා කණ්ඩායම් වූහ.

ලිඛිතව මෙන්ම වාචික ව බහුවිධ අදහස් හා මත ඉදිරිපත් කෙරුණි. මෙහිදී වඩාත් ප්‍රශංසනීය කරුණ වන්නේ ජනතාව ඉතා අවංකව අදහස් ඉදිරිපත් කිරීම පමණක් නොව අන් අදහස්වලට සවන්දීමට දැක්වූ උනන්දුවයි. අදහස් දැක්වීමට පැමිණි බොහෝ අය, තම සහෝදර පුරවැසියන්ගේ අදහස්වලට සවන් දීමට ද, නතරවූහ. මෙම ක්‍රියාවලියට ජනතාව දැක්වූ උනන්දුව, ව්‍යවස්ථාව සැදීමේ කටයුතු වලට සහභාගී වීමට ඔවුන් දැක්වූ කැපවීම හා වෙනස් අදහස්වලට කන්දීමේ විවෘත භාවය මෙයින් පිළිබිඹු විය. මෙම මහජන අදහස් විමසීම මගින් පරිණත ප්‍රජාතන්ත්‍රීය සමාජයක වැදගත් ලක්ෂණයක් දැකිය හැකි වූයේය. එනම්, ජාතික වශයෙන් වැදගත්වන කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා හා විවාදවල නිරත වීමට ජනතාව දක්වන උනන්දුවයි. බොහෝ දුරට මෙම සාකච්ඡා හා අදහස් දැක්වීම් සාමකාමී හා විනීත වාතාවරණයක සිදු වුණි. එකිනෙකට ඉතා වෙනස් අදහස් ඉදිරිපත් කිරීම මැද වුවත් මහජනයා මෙම ක්‍රියාවලියටත්, විවෘතව අදහස් දැක්වීමට සෑම කෙනෙකුට ම ඇති අයිතියටත්, ගරු කළෝය. මෙය ඉතා ප්‍රශංසා කළ යුතු මෙන් ම අගය කළ යුතු ලක්ෂණයකි.

මෙම කටයුතුවලදී කමිටුව වැදගත් කරුණු දෙකක් නිරීක්ෂණය කළෝය. මෙයින් එකක් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමටත්, තියුණු කිරීමටත්, මහජනයා දැක්වූ කැමැත්ත වන අතර දෙවැන්න වන්නේ සාමය හා ප්‍රතිසන්ධානය සඳහා දැක්වූ උනන්දුවයි. ඔවුන් මේවා ළඟා කර ගත හැක්කේ කෙසේද, යන්න ගැන වෙනස් මත තිබුණත් ප්‍රජාතන්ත්‍රවාදී හා සාමකාමී රටක් සඳහා ශ්‍රී ලාංකික ජනතාවගේ ඇති අවංක අභිලාෂය මෙයින් පැහැදිලි විය.

මෙම ක්‍රියාවලියට සහභාගී වීමේදී අපේ ජනතාව දැක්වූ අව්‍යාජත්වය හා අභිලාෂයන් අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයින් වටහාගෙන ඒවාට ගරු කළ යුතු බව මෙම කමිටුවේ අදහසයි. අප ඉදිරියට පැමිණි බොහෝ දෙනෙක් මෙම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියේ ඓතිහාසික වැදගත්කම පෙන්වා දුන් අතර ඔවුන්ට එයට සහභාගී වීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳ ව කෘතඥතාව පළ කළෝය. ඔවුන් කමිටුව ඉදිරියට පැමිණියේ විශ්වාසී

හැඟීමකින් හා යෝධ අපේක්ෂාවන් සහිතවයි. මෙය, අපේ රටේ ඉතිහාසයේ තීරණාත්මක සන්ධිස්ථානයක් බවත්, අතීතයේ සිදු වූ වැරදි නිවැරදි කිරීමට ලැබෙන සුවිශේෂී අවස්ථාවක් බවත්, අනාගත පරම්පරාවන් සඳහා සුරක්ෂිත හා ප්‍රීතිමත් රටක් ගොඩ නැඟීමට මෙය යොදා ගත හැකි බවත් බොහෝ අය කියා සිටියහ. ඔවුන් අප ඉදිරියට පැමිණියේත්, අදහස් ඉදිරිපත් කළේත්, විශාල බලාපොරොත්තු සහිතව බැවින් එම විශ්වාසය හා අපේක්ෂා බිඳ නොදැමිය යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අර්ථාන්විත වන්නේ ජනතාව එය තමන්ට 'අයිති' දෙයක් ලෙස ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්නේ නම් පමණි. මේ නිසා මහජනයාගේ අදහස්වලට අවධානය යොමු කරමින්, ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියේ ඔවුන්ගේ කාර්යභාරය පිළිගනිමින්, ජනතාව මෙම ක්‍රියාවලියට දිගට ම සහභාගි වන බව සහතික කිරීම තීරණාත්මක ව වැදගත් වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනය නිතර සිදුවන දෙයක් නොවේ. මෙය නිදහස ලැබීමෙන් පසු අපේ රටේ සිදුවන තුන්වැනි ප්‍රධාන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය වීම, අපේ රටේ සියලු ජනයාගේ අපේක්ෂාවන් පිළිබඳ ව සාමූහික එකඟත්වයකට එළඹීමට අතීතයේ අපේ ව්‍යවස්ථා සම්පාදකයන් අසමත් වීම පිළිබඳ සංඥාවකි. රාජ්‍යයේ ඓන්ද්‍රීයාංග, නීතියේ ආධිපත්‍යය හා ඒවා එකිනෙක අතරෙහිත් විශ්වාසය ගොඩනැඟීමේ කාර්යයේදී අපි අසාර්ථක වී ඇත්තෙමු. අතීත වැරදිවලට සමාව ගැනීමේ කාර්යයට අපි නැවතත් මුහුණදී සිටිමු. එම නිසා මේ අවස්ථාව අපතේ යෑමට ඉඩ නො දිය යුතුය. රටේ අනාගතය වෙනුවෙන් දේශපාලන අවස්ථාවාදයෙන් ඔබ්බට යෑමට තැත් කළ යුතු වෙමු. අනාගත පරම්පරාවන්ට අපි ලබා දිය යුත්තේ කුමන ආකාරයක උරුමයක් ද? එය ගිලිහී ගිය අවස්ථා හා අසාර්ථක ප්‍රයත්න පිළිබඳ ව ද? එසේ නැත්නම් ආඩම්බරයෙන් හිමිකම් පෑ හැකි දෙයක් ද? අප කළ යුත්තේ වර්තමානයේ අවශ්‍යතාවන්ට පමණක් ප්‍රතිචාර දක්වමින් පහසු මග ගැනීම ද? එසේ නැත්නම් අනාගතය ගැන විශ්වාසයෙන් සියලු දෙනාට ම සාධාරණය හා සමානත්වය සහතික කරන ශක්තිමත් හා ක්‍රියාකාරී ප්‍රජාතාන්ත්‍රික සමාජයක් ගොඩ නැඟීම ද? මේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ හා පුළුල් සමාජයේ විවාදයට භාජනය විය යුතු ප්‍රශ්න වේ.

සියලු ප්‍රජාවන් ඇතුළත් වන සාමකාමී හා සුසංවාදී වාතාවරණයක් නිර්මාණය කිරීමේ පෙර නොවූ විරූ අභියෝගයකට වන්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ උත්සාහයට මුහුණ දීමට සිදුවී තිබේ. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදය, නීතිය හා සාමය, පාරදෘශ්‍ය බව, වගවීම, මානව හිමිකම් හා නිදහස, සමාජ සාධාරණත්වය, සමානත්වය,

පරිසරය හා ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම වැනි සියලු ම කරුණු ගැන ව්‍යවස්ථා සම්පාදකයන් අවධානය යොමු කළ යුතු වේ.

අපේ සමාජයේ ඇති සියලු වැරදි, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ තුළින් විසඳිය නොහැකිබව  අප පිළිගත යුතුය. දේශපාලන නියෝජිතයන් ගැන බොහෝ පුරවැසියන්  ඔවුන්ගේ අසතුට ප්‍රකාශ කළ ආකාරයට ම  අපත්, අපේ ප්‍රජාතාන්ත්‍රික වගකීම් ඉටු කළේදැයි විමසා බැලිය යුතුය.  අපගේ නියෝජිතයන්ගෙන් අප සමහර ගුණාංග හා සාරධර්ම අපේක්ෂා කරන ආකාරයට ම  අපත් එම සාරධර්ම අනුව ජීවත් වන්නේදැයි, මෙනෙහි කළ යුතු වේ.

කෙසේ වෙතත් අප තෝරා පත් කර ගන්නා නියෝජිතයන් එන්නේ අප අතරෙනි. ප්‍රජාතන්ත්‍රවාදය සමග වගකීම් ද, තිබේ.  අපේ නිර්දේශවලින් පිළිබිඹු වන පරිදි අපගේ ජනතාව ඉල්ලා සිටින්නේ වඩාත්  තියුණු ලෙස  ප්‍රජාතන්ත්‍රීකරණය වූ සමාජයකි. ප්‍රජාතාන්ත්‍රික සහභාගිත්වය යනු,  ආත්මාර්ථකාමි ව නොව  අන් අය වෙනුවෙන් ද, කටයුතු කිරීම බව අප අවබෝධ කර ගත යුතුය.  එයින් අදහස් කරන්නේ  අනේක ආස්ථාන හා බහුවිධ ළැදියාවන්  සැලකිල්ලට ගනිමින් එකඟත්වයට හා විසඳුම්වලට එළඹීමයි; එයින් අදහස් කරන්නේ  අප සියලු දෙනා එකඟ නොවන නමුත්  අපේ වෙනස්කම් මැද සමාදානයෙන් ජීවත් වීමට අප කැමති බව පිළිගැනීමයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ  ක්‍රියාවලිය සාර්ථක වීමට නම්  එම ප්‍රතිසංස්කරණ පිළිබඳව  එකඟත්වයක් ගොඩ නැඟීමත්, පුරවැසියන් ක්‍රියාකාරී ලෙස සහභාගී කර ගැනීමත් අත්‍යවශ්‍ය බව අපගේ නිශ්චිත අදහස වේ. මේ සඳහා අපට දූරදර්ශී දේශපාලන නායකත්වයක් හා පරිකල්පනයක්  අවශ්‍ය වේ. ජනතාව පුබුදුකිරීම හා ඔවුන් සමග ඵලදායී ලෙස සන්නිවේදනයේ යෙදීම දේශපාලන නායකයන්ගේ වගකීම වෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය පුරා ම  ජනතාව දිගට ම සම්බන්ධ කරගැනීමේ හා එය රටේ සියලු ජනතාවන්ට අයිති  ව්‍යවස්ථාවක් බවට පත් කිරීමේ අවශ්‍යතාව දේශපාලන බලාධිකාරිය විසින්  අවබෝධ කරගනු ඇතැයි යන්න අපගේ අපේක්ෂාවයි.

විශේෂයෙන් ම අප ඉදිරියට පැමිණි අය ඇතුලු රටේ ජනතාවට ද, විශේෂ ආයාචනයක් කිරීමට අපි කැමැත්තෙමු. කරුණාකර ඔබට වැදගත් වන කරුණු ගැන දිගටම උද්ඝෝෂණයේ නිරත වන්න. මෙය ආරම්භය පමණි, අවසානය නොවේ. අපි තෝරා පත් කර ගෙන ඇති නියෝජිතයන් අපටත්, මේ රටේ ජනතාවටත්, මෙම තීරණාත්මක වශයෙන් වැදගත්  කාර්යය සඳහා පැහැදිලිව ඉදිරිපත් කර ඇති අපේක්ෂාවන් හා අභිලාෂයන්ට

වගකියන බවට සහතික වීම සඳහා මෙම ක්‍රියාවලියේ අප දිගට ම ක්‍රියාකාරීව සිටීම අවශ්‍ය වේ.

මීට පෙර ද, සඳහන් කර ඇති පරිදි කමිටුවට බහුවිධ ක්‍රමවලින් අදහස් ඉදිරිපත් කරන ලදී. රට පුරා පවත්වන ලද මහජන අදහස් දැක්වීමේ සැසිවලදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අමතරව අපට තැපෑලෙන්, ඉ-තැපෑලෙන් හා ෆැක්ස් මගින් ද, අදහස් හා යෝජනා ලැබුණි (ඇ ඇමුණුම). ලැබුණු සියලු ම ලේඛන, කමිටු සාමාජිකයන් විසින් දිස්ත්‍රික් වාර්තා ලෙස සාරාංශ ගත කරන ලදී. ඉන්පසු විවිධ තේමා යටතේ වාර්තා කෙටුම්පත් කරන ලදී. මෙම කෙටුම්පත් වාර්තා, සාකච්ඡාවට බඳුන් කළ කමිටු සාමාජිකයෝ ඒ ඒ විෂය යටතේ නිර්දේශ සකස් කළෝය. අපේ අවසාන වාර්තාව පිළියෙල කරන ලද්දේ මෙම සාකච්ඡා පදනම් කර ගෙනයි.

අපේ අරමුණ දෙවැදෑරුම් විය; පළමුව මහජනයා විසින් ඉදිරිපත් කරන ලද අදහස් හැකිතාක් නිවැරදිව හා සාධාරණව ගෙන හැර දැක්වීම හා ඒවායේ යුක්ති සහගත බව පැහැදිලි කිරීමයි. දෙවෙනුව අප වෙත ඉදිරිපත් කෙරුණු අදහස්වල විශ්ලේෂණයක් මෙන් ම අපේ දේශපාලන, වෘත්තිය හා ශික්ෂණ විශේෂඥ දැනුම මත පදනම් ව නිර්දේශ ඉදිරිපත් කිරීමයි. මෙම කමිටුව නීතිඥයින්, සිවිල් සමාජ ක්‍රියාකාරීන්, දේශපාලනඥයින්, විද්වතුන් හා වෘත්තිකයන්ගෙන් සමන්විත වූ බැවින් එය විවිධ ආස්ථානයන් හා ළැදියාවන් නියෝජනය කරන කණ්ඩායමක් විය. අපේ අදහස වූයේ නිර්දේශ සකස් කිරීම සඳහා මෙම කණ්ඩායමේ විශේෂඥ දැනුම යොදා ගැනීම වැදගත් බවයි.

කිසියම් නිර්දේශයක් සම්බන්ධයෙන් අපට එකඟත්වයකට පැමිණීමට නො හැකිවූ විට සියලුම සාමාජිකයන්ගේ අදහස් නියෝජනය වන පරිදි නිර්දේශ එකකට වඩා ඉදිරිපත් කිරීමට අපි එකඟ වූයෙමු. බොහෝ අතින් කමිටුවේ අදහස් සමාජයේ ඇති බහුවිධ ආස්ථාන හා මතවල ක්ෂුද්‍ර විශ්වයක් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ සාකච්ඡා කිරීම සඳහා මෙම වෙනස්කම් හා විවිධත්වය අපේ වාර්තාවේ ඇතුළත් කළ යුතු බවට අපි එකඟ වූයෙමු. මෙම වාර්තාවේ අරමුණ වන්නේ මහජනතාවගේ අදහස් විශ්ලේෂණය කරමින් හා ඉදිරිපත් කරමින් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ සාකච්ඡාවලට දායකත්වයක් සැපයීමයි. මෙහි දැක්වෙන්නේ කමිටුවට ලැබුණු අදහස් පිළිබඳ සාකච්ඡාවක් හා අපේ නිර්දේශයි.

## 1.2 වාර්තාවේ ව්‍යූහය

වාර්තාවේ පරිච්ඡේද විසි දෙකක් අඩංගු වේ. සෑම පරිච්ඡේදයක් ම ආරම්භ වන්නේ මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳ සාකච්ඡාවකිනි. ඉන් පසු කමිටුවේ නිර්දේශ ඉදිරිපත් කර ඇත. නිර්දේශ එකකට වැඩියෙන් ඇති අවස්ථාවලදී ඒ ඒ නිර්දේශ ඉදිරිපත් කළ කමිටු සාමාජිකයන්ගේ නම් පාදීය සටහනක් ලෙස දක්වා තිබේ.

මෙම කමිටුවට අදහස් ඉදිරිපත් කළ පුද්ගලයන් හෝ සංවිධාන, නම් වශයෙන් සඳහන් නො කිරීමට අපි තීරණය කළෙමු. යෝජනා හා අදහස් ඉදිරිපත් කළ සියලූ දෙනාගේ ම සම්පූර්ණ ලැයිස්තුවක් ‘ උ‘ ඇමුණුමේ ඇතුළත් කර තිබේ. අපගේ ඇතැම් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී අපට ලැබුණු ලේඛනවල තිබූ වාග් ව්‍යවහාරය ම යොදා ගත් බව මෙහිලා සඳහන් කරමු.

## 1.3 සීමා හා බාධක

අපට මුහුණ දීමට සිදුවූ විශාල ම බාධකය වූයේ කාලය පිළිබඳ ප්‍රශ්නයයි. මහජනයා කමිටුව ඉදිරියේ අදහස් දැක්වීම කෙරෙහි ද, මෙය බලපෑවේය. ව්‍යවස්ථා සම්පාදනය වැනි කටයුත්තකදී තම අදහස් ඉදිරිපත් කිරීමට කාලයක් අවශ්‍ය වේ. ප්‍රමාණවත් කාලයක් නොලැබීම නිසා බොහෝ අයට නියමිත කාලය තුළ අපට කරුණු දැක්වීමට නොහැකි වන්නට ඇත. තව ද, කාලය සීමා වීම නිසා කොළඹින් පිට දිස්ත්‍රික්කවල මහජන අදහස් විමසීම දින දෙකකට සීමා කිරීමට සිදු විය. බොහෝ දිස්ත්‍රික්කවල මෙම කාලය ප්‍රමාණවත් නොවූ බව පැහැදිලිව ම පෙනී ගියේය.

අපට පැහැදිලි කිරීමට අවශ්‍ය තවත් සාධකයක් වන්නේ මහජනයා ඉදිරිපත් කළ අදහස්වල සංඛ්‍යාන විශ්ලේෂණයක් මෙහි දක්වා නොතිබීමයි. කමිටුව මෙම තීරණය ගත්තේ අප වෙත ලැබුණු ඉදිරිපත් කිරීම්, සංඛ්‍යාන විශ්ලේෂණයකට යොදා ගත හැකි නියැදියක් ලෙස සැලකීමට නොහැකි නිසාය. කමිටුව ඉදිරියේ කරුණු ඉදිරිපත් කරන ලද්දේ ස්වේච්ඡාවෙන් කමිටුව ඉදිරියට ඒමට තීරණය කළ අයයි. ඔවුන් කිසිසේත් කමිටුව විසින් තෝරා ගත් පිරිසක් නොවේ. මේ නිසා අප මෙහිදී අනුගමනය කළ ක්‍රියා මාර්ගය නම් ලැබුණු සියලූ ඉදිරිපත් කිරීම්, හොඳින් අධ්‍යයනය කර, මහජනයා විසින් ඉදිරිපත් කළ මතවල විවිධ ප්‍රභේද මතු කර, මෙම අදහස් මත පදනම්වූ සාකච්ඡාවකින් පසුව අපේ නිර්දේශ ඉදිරිපත් කිරීමයි.

# 2 පරිච්ඡේදය

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ව පොදුවේ එකඟවන අදහස් මෙන් ම ප්‍රතිවිරුද්ධ අදහස් ද, මහජනයා විසින් ප්‍රකාශ කරන ලදී. පොදු එකඟත්වයක් තිබූ එක් අදහසක් වූයේ රාජ්‍යය බිහිවන්නේ 'තමන්ව ආණ්ඩු කළ යුත්තේ කෙසේ ද?' යන්න ගැන ජනතාව අතර ඇති වන එකඟත්වයකින් බවත් රාජ්‍යයේ බලය යොදා ගත යුත්තේ ජනතාවගේ සුබ සිද්ධිය සඳහා බවත්ය.

මහජන නියෝජනයේ දැකිය හැකි තවත් මතයක් වූයේ ව්‍යවස්ථාව, මහජනයාගේ සිවිල්, දේශපාලන හා ආර්ථික අයිතිවාසිකම් සහතික කළ යුතු බවයි. ජනතාව ප්‍රකාශ කළ තවත් අදහසක් වූයේ ජනයා ආවේණිකව නිදහස් මෙන් ම අයිතිවාසිකම් ඇති පුද්ගලයන් බවත්, මේ නිසා බලයේ සම්භවය වන්නේ ජනතාව බවත්ය.

## 2.1 ඉදිරිපත් කළ අදහස්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාවට අනාගත දැක්මක් ලබා දිය යුතුය යන අදහස මහජනතාව ඉදිරිපත් කළ එක් අදහසක් විය. මෙම දැක්ම අම්ල පරිසරය හා ස්වාභාවික සම්පත් ආරක්ෂා කරන අතර අනාගත පරම්පරාවන් හි අයිතීන්, නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජ සාධාරණත්වය අනතුරට පත් නොකර ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම රාජ්‍යයේ වගකීමක් වේ. මහජනයා ඉදිරිපත් කළ තවත් පොදු අදහසක් වූයේ රාජ්‍යය පවතින්නේ ජනයාගේත්, එහි සිටින ප්‍රජාවන්ගේත්, අරමුණු හා ඉලක්ක මුදුන්පත් කර ගැනීමට බවයි. මේ නිසා අපේ අනාගත පරම්පරාවන් පෝෂණය කළ හැකි තිරසර සංවර්ධන ක්‍රියාවලියක් ව්‍යවස්ථාවෙන් තහවුරු කර ස්ථාපිත කළ යුතු වේ.

රටේ දුර්වල හා ආන්තික ප්‍රජාවන් ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් පියවර ගැනීම හා සැමට සමාන අවස්ථා ලබා දීම රාජ්‍යයේ වගකීමක් යැයි ජනතාව කියා සිටියහ. සමස්තයක් වශයෙන් බලන විට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ව්‍යායාමයෙන් ජනතාව බලාපොරොත්තු වන්නේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය, සමාජ සාධාරණත්වය, යුක්තිය හා සමානාත්මතාවේ පරමාදර්ශී අදහස්වලට කැපවූ ශ්‍රී ලංකාවකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලාංකික අනන්‍යතාවක් ගොඩ නැගීමෙහිලා රටේ අනේක හා බහුවිධ ලක්ෂණ පිළි ගනිමින් විවිධ ප්‍රජාවන්ගේ ආත්ම ගෞරවය හා අන්‍යෝන්‍ය පිළිගැනීම

සංකල්පගත කළ යුතුය යන්න මහජනයාගේ ඉල්ලීම විය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය, උපේක්ෂාව, ත්‍යාගශීලීත්වය, සත්‍යවාදී බව හා වගවීම වැනි සාරධර්ම තුළින් ඔවුන්ගේ විසම්මුති සමනය කර ගැනීමේ අවස්ථාවක් ලබා දී ඇති බව බොහෝ අයගේ අදහස විය.

බොහෝ ප්‍රජාවන් විසින් ඉදිරිපත් කළ සුවිශේෂී කරුණක් වූයේ ප්‍රජාතන්ත්‍රවාදය අර්ථාන්විත වීමට නම් ගම් මට්ටමේ සහ නාගරික ප්‍රදේශවල කොට්ඨාස තුළ ජනතාව ප්‍රජාතන්ත්‍රවාදී ලෙස තීරණ ගැනීම පහළ සිට ඉහළට සිදුවන දේශපාලන පද්ධතියක කොටසක් විය යුතුය යන්නයි. උදාහරණයක් වශයෙන් එවැන්නකට ග්‍රාම මණ්ඩල සම්බන්ධ කර ගැනීම දැක්විය හැකියි. ගම් මට්ටමේ ස්වයං-පාලන යාන්ත්‍රණයක අවශ්‍යතාවත්, එවැන්නක් ඵලදායි ලෙස ක්‍රියාත්මක වීමට ප්‍රමාණවත් පහසුකම් සැලසීමත්, රජයේ ඉහළ මට්ටම්වල වගකීමක් බව ඔවුහු අවධාරණය කළහ.

මධ්‍යගත පාලනය නිසා සිදුවූයේ යැයි සිතන කොන් කිරීම හා වෙනස් ලෙස සැළකීම නිසා පළාත් හා උප-ඒකකවලට ස්වයං-පාලනයක් හා බලය වැඩිපුර විමධ්‍යගත කිරීමක් අවශ්‍ය යැයි සමහර ප්‍රදේශවල ජනයා ඉල්ලා සිටි අතර අනිත් අයගේ ඉල්ලීම වූයේ පර්යන්තයට වැඩිපුර බලතල විමධ්‍යගත කිරිමයි. රටේ ප්‍රජාතන්ත්‍රවාදය හා ඒකාබද්ධතාව ශක්තිමත් කිරීමේ මඟක් ලෙස ඔවුන් ඉදිරිපත් කළේ බලය බෙදාහැරීම හා විමධ්‍යගත කිරීමයි.

මහජනයා විසින් ඉදිරිපත් කරන ලද අදහස් පදනම් කර ගනිමින් කමිටුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුයැයි යෝජනා කර සිටී.

- ශ්‍රී ලාංකික ප්‍රජාවේ සහානුබද්ධ කොටස් ලෙස සිංහල, දෙමළ, මුස්ලිම්, මලයහ/කඳුරට දෙමළ, ආදිවාසී, මැලේ, බර්ගර් හා අනිකුත් සංස්කෘතික හා අනිකුත් භාෂාත්මක ප්‍රජාවන් පිළිගැනීම;
- සියලුම පුරවැසියන්ට හා ප්‍රජාවන්ට රට අයිති බවත්, සාමයෙන් හා සමගියෙන් එකට ජීවත්වීමේ අයිතිය සැමට ඇති බවත් පිළිගැනීම;
- අපගේ සංස්කෘතීන්, ආගම් හා භාෂාවල ඇති විවිධත්වය අපේ රටේ සම්පත් බවත් ඒවාට ගරු කිරීම හා ආරක්ෂා කිරීම අවශ්‍ය බවත් පිළිගැනීම;
- ජනතාවගේ අභිලාෂ අනුව ක්‍රියා කරන රජයක් සහිත ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට පදනම දැමීමට කටයුතු කිරීම;

- ශ්‍රී ලංකාව තමාගේ මවුබිම ලෙස විශ්වාස කරන සියල්ලන්ට ම සමානාත්මතාව, යුක්තිය, සාධාරණය හා නිදහස තහවුරු කරන සමාජවාදී හා ජනරජ මූලධර්ම පිළිබඳව සහතික වීම;
- රටේ සෑම හා සියලු ම පුරවැසියන්ට නීතිය හා අධිකරණය යටතේ සමාන ආරක්ෂාව ඇති බවට සහතික වීම;
- අතීතයේ සිදුවූ හිංසා හා ලේවැගිරීම් පිළිගනිමින්, නැතිවූ ජීවිතවලට ගරු කරමින්, අනාගතයේ නැවතත් එවැනි ප්‍රචණ්ඩත්වයක් ඇතිවීම වැළැක්වීමේ අවශ්‍යතාව පිළිගැනීම;
- අතීත අමිහිරි සිදුවීම් සුවපත් කිරීමට හා නීතියේ ආධිපත්‍යය, නිදහස, ප්‍රජාතාන්ත්‍රික සාර ධර්ම, සමාජ සාධාරණත්වය හා මූලික අයිතිවාසිකම් මත පදනම්වූ සමාජයක් ස්ථාපිත කිරීමට කටයුතු කිරීම;
- මානව අභිමානය ආරක්ෂා කිරීමට සහ අබලතා ඇති පුද්ගලයන්ට සහ මානව විවිධත්වයේ සහ මානවීයත්වයේ අංග ලෙස ගරු කිරීමට ක්‍රියා කිරීම

## 2.2 නිර්දේශ

යෝජිත ව්‍යවස්ථාවේ පූර්විකාවේ ඇතුළත් කළ යුතු කරුණු පිළිබඳව මහජනතාව බොහෝ අදහස් ඉදිරිපත් කර තිබේ. අනාගතයට පාඩමක් හා සිහි ගැන්වීමක් ලෙස රාජ්‍යයේ අතීත සිදුවීම් ගැන සඳහනක් ඇතුළත් කිරීමට සමහරුන්ට අවශ්‍ය විය. කෙසේ වෙතත් පූර්විකාවේ ඇතුළත් විය යුත්තේ ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය, මානව හිමිකම්, මානව අභිමානය, සාධාරණත්වය, සමානත්වය, බහුවිධතාව, විවිධත්වය, සාමය ආදිය ප්‍රවර්ධනය කිරීමටත්, ගරුකිරීමටත්, කැපවීම බවට එකඟත්වයක් ඇති විය.

ඉදිරිපත් වූ අදහස් සලකා බැලීමෙන් පසුව කමිටුවේ මතය වූයේ යෝජිත පූර්විකාවේ පහත සඳහන් කරුණු ඇතුළත් කිරීම පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බවයි.

"අතීතයේ භේද සුව කිරීමේ අවශ්‍යතාව සහ ජාතියේ ඒකීයත්වය හා ඒකාග්‍රතාව දියුණු කිරීම පිළිගැනීම

ආණ්ඩුකරණයට සම්බන්ධ ආයතන ශක්තිමත් කිරීම,

පුළුල් බල හවුල්කාරීත්වය ගැන සහතික වීම.

ප්‍රජාතාන්ත්‍රික සාර ධර්ම, නීතියේ ආධිපත්‍යය, සමාජ සාධාරණත්වය, මානව අභිමානය හා මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

ආර්ථික, සමාජීය හා සංස්කෘතික අභිවෘද්ධියට පහසුකම් සැලසීම, හා

සාමය, වාර්ගික සංහිඳියාව හා ප්‍රජාතාන්ත්‍රික භාවිතයන් දිරි ගැන්වීම."

## 3 පරිච්ඡේදය

## ජාතික ධජය, ජාතික ගීය හා පුරවැසිභාවය

### 3.1 ජාතික ධජය

### 3.1.1 ඉදිරිපත් කළ අදහස්

ජාතික ධජය සම්බන්ධයෙන් මහජනයා පළ කළ අදහස වූයේ සියලු ම වාර්ගික කණ්ඩායම්වල සමානත්වය හා ඔවුන් අතර සාමය හා සමාදානය අවධාරණය කරමින් රටේ වාර්ගික සමගිය හා බහුවිධ ලක්ෂණ ජාතික ධජයෙන් සංකේතාත්මකව පිළිබිඹු විය යුතු බවයි.

විකල්ප අදහසක් වූයේ ජාතික ධජයෙන් කිසිම වාර්ගික අනන්‍යතාවක් නොදැක්විය යුතු බවත් ඒ වෙනුවට එහි අවධාරණය කළ යුත්තේ පොදු ශ්‍රී ලාංකික අනන්‍යතාවක් බවත්ය. මෙම ආස්ථාන දෙකෙන් ම කියැවෙන්නේ ශ්‍රී ලංකාවට නව ධජයක් සැලසුම් කළ යුතු බවයි. මේ අතර, ඉදිරිපත් වූ වෙනත් විකල්ප අදහසක් වූයේ කිසි ම වෙනසකින් තොරව වර්තමාන ධජය ඒ අයුරෙන් ම භාවිතයට ගත යුතුය යන්නයි.

### 3.1.2 නිර්දේශ

ඉහත සඳහන් අදහස් මත පදනම්ව, පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කෙරේ.

අ. ජනවර්ග පිළිබඳ සඳහනකින් තොරව, ශ්‍රී ලාංකික සාමූහික ජීවිතය නියෝජනය වන අනාගමික රාජ්‍යයකට සුදුසු නව ජාතික ධජයක් නිර්මාණය කිරීම[1]

ආ. සියලු ජනවාර්ගික කණ්ඩායම්වල සමානත්වය හා ඔවුන් අතර සාමය හා සමාදානය සංකේතවත් වන නව ධජයක් සැලසුම් කිරීම[2]

ඇ, කිසි ම වෙනසකින් තොරව වර්තමාන ධජය තබා ගැනීම[3]

---

[1] හරිනි අමරසූරිය; ඒ.එම්. නවරත්න බණ්ඩාර; එස්.සී.සී. ඉළංකෝවන්; කුමුදු කුසුම් කුමාර; එන්.සෙල්වක්කුමාරන්; එස්. විජේසන්දිරන්;

[2] එස්. තවරාජා

[3] උපුල් අබේරත්න; එම්.එල්.ඒ. කාදර්; කුෂාන් ද අල්විස්, ජ.නී; එම්.කේ. නදීකා දමයන්ති; එම්.වයි.එම්. ෆායිස්; සුනිල් ජයරත්න; සිරිමසිරි හපුආරච්චි; තේමිය එල්.බී. හුරුල්ලේ; කාන්ති රණසිංහ; වින්ස්ටන් පතිරාජ; ලාල් විජේනායක

## 3.2 ජාතික ගීය

### 3.2.1 ඉදිරිපත් කළ අදහස්

ජාතික ගීය සම්බන්ධයෙන් මතු කෙරුණු ප්‍රධාන ගැටලුව වූයේ එය සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන් ම ගායනා කළ යුතු ද හා කුමන ආකාරයට ද යන්නයි. එය ගායනා කළ යුත්තේ සිංහල භාෂාවෙන් පමණක් ය, යන්න එක් මතයක් වූ අතර තවත් විකල්ප මතයක් වූයේ එය භාෂා දෙකෙන් ම ගායනා කළ යුතු බවයි. දෙවැනි මතය දරන්නන් අතර සමහරෙකු කියා සිටියේ සිංහලෙන් හා දෙමළෙන් එකකට පසුව එකක් ලෙස ගායනා කළ යුතු බව වන අතර සමහරෙකුගේ අදහස වූයේ එය මිශ්‍රව ගායනා කළ යුතුය යන්නයි. උදා: එක් පැදියක් සිංහලෙන් හා දෙමළෙන් ගයා ඊළඟ පැදිය නැවතත් සිංහලෙන් හා දෙමළෙන් ගායනා කිරීම. තවත් විකල්ප අදහසක් වූයේ ජාතික ගීය සිංහල ප්‍රදේශවලදී පළමුව සිංහලෙන් ද, දෙමළ ප්‍රදේශවල දී පළමුව දෙමළෙන් ද, ගායනා කළ යුතු බවයි.

ජාතික ගීය සිංහලෙන් හා දෙමළෙන් ගැයීමට මනාපයක් ඇත්තේ එක් අතකින් සිංහලයන් අනික් අතින් දෙමළ හා (දෙමළ කථා කරන) මුස්ලිම් ජනතාවත් නියෝජනය කරන ජාතික භාෂා දෙකට ම පිළිගැනීමක් ලැබෙන බැවිනි. මේ අනුව ජාතික ගීය ගැයීමේදී රටේ සිටින ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් තුනට ම සමානත්වයක් තිබිය යුතු යැයි යෝජනා විය. ජාතික ගීය සිංහලෙන් පමණක් ගායනා කළ යුතු ය යන ස්ථාවරය දරන අයගේ මතය වී ඇත්තේ සිංහල නොවන අයට සමානත්වයක් ලබා දීමෙන් සිංහල අනන්‍යතාවට තර්ජනයක් එල්ල විය හැකි බවයි. අපගේ නිර්දේශ ඉදිරිපත් කිරීමේදී අපේ ආරම්භක ස්ථාවරය වූයේ රාජ්‍ය උත්සවවලදී සිංහල හා දෙමළ යන භාෂා දෙකෙන් ම ජාතික ගීය ගායනා කිරීමට රජය දැනටමත් තීරණය කර ඇතැයි යන්නයි.

### 3.2.2 නිර්දේශ

ඉහත සඳහන් කරුණු මත පදනම් ව අපි පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කරමු.

**අ.** 2000 ව්‍යවස්ථා පනත් කෙටුම්පතෙහි සඳහන් ඇති ජාතික ගිය පිළිබඳ වගන්ති සැලකිල්ලට ගැනීම[4]

[4] කුෂාන් ද අල්විස්, ජ.නි

**ආ.** ජාතික ගීය සිංහලෙන් හා/හෝ දෙමළෙන් ගායනා කිරීමට ඇති අයිතිය පිළිගනිමින් 2000 ව්‍යවස්ථා පනත් කෙටුම්පතෙහි ඉදිරිපත් කර ඇති ජාතික ගීය පිළිබඳ වගන්ති සැලකිල්ලට ගැනීම[5]

## 3.3 පුරවැසිභාවය

### 3.3.1 ඉදිරිපත් කළ අදහස්

යමෙක් පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් යන කුමන ක්‍රමයකින් වුවත් “ශ්‍රී ලාංකික” ලෙස හඳුනාගෙන ඇති සෑම කෙනෙකුට ම සමාන ලෙස සැලකීමේ අවශ්‍යතාව පුරවැසිභාවය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළ පිරිස් අවධාරණය කළහ. රටේ මුල් පුරවැසියන් ලෙස සිංහල ජනයාට “භූමිපුත්‍ර” නම් විශේෂ තත්ත්වයක් හිමිවිය යුතු යැයි ඇතැමුන් කියා සිටි අතර අනිත් අය අවධාරණය කළේ කිසි ම පුරවැසියෙක් ඔවුන්ගේ සම්භවය, ජනවර්ගය, ජාතිය, කුලය, භාෂාව, ආගම හෝ විශ්වාස මත පදනම් ව වෙනස් ලෙස සැළකීමට භාජනය විය යුතු නැති බවයි. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අනෙක් වැදගත් අදහස් පහත දැක්වෙන ආකාරයට සාරාංශ ගත කළ හැකිය:

පුරවැසි පනත යටතේ පුරවැසිභාවය අයැදුම් කරන හා හිමිවන අය ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනත වන බවට දිවුරුම් දිය යුතුය; පුරවැසිභාවය සඳහා ලියාපදිංචි කිරීමේදී මලයහ (කඳුරට) දෙමළ පුද්ගලයන් හා වෙනත් රටවල ජීවත්වන ශ්‍රී ලාංකික සම්භවයක් සහිත සරණාගතයන් අතර කිසි ම වෙන් කොට හඳුනා ගැනීමක් නොකළ යුතුය; යුද්ධය, ත්‍රස්තවාදය හා වධ බන්ධන නිසා රට හැර ගිය ශ්‍රී ලාංකික සම්භවයක් සහිත පුද්ගලයන් හා ඔවුන්ගේ දරුවන්ට නොමිලේ ද්විත්ව පුරවැසිභාවය ලබා දිය යුතුය; පුරවැසිභාවය සඳහා ලියාපදිංචි කිරීම විමධ්‍යගත කළ යුතුය; ඉඩම් අයිතිය ලබා ගැනීම හා රටේ වෙනත් ආකාරයේ ආයෝජන සිදු කිරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලාංකිකයන් හා විවාහවන විදේශිකයින්හට ලබා දෙන පුරවැසි අයිතිවාසිකම් සීමා කළ යුතුය.

පුරවැසිභාවය සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරුණු අදහස්වලින් එක් අතකින් සියලු සමාජීය හා සංස්කෘතික කණ්ඩායම්වල සමානත්වය මත පදනම් වූ ශ්‍රී ලාංකික අනන්‍යතාවක මනෝභාවයක් ප්‍රකාශයට පත්වූ අතර අනික් අතින් සිංහල අනන්‍යතාව යටපත් වීමේ බිය ද, ප්‍රකාශ කෙරුණි.

---

[5] උපුල් අබේරත්න; හරිනි අමරසූරිය; ඒ.එම්. නවරත්න බණ්ඩාර; එම්.එල්.ඒ. කාදර්; එම්.කේ. නදීකා දමයන්ති; එස්.සී.සී. ඉළංකෝවන්; එම්.වයි.එම්. ෆායිස්; සුනිල් ජයරත්න; සිරිමසිරි හපුආරච්චි; කුමුදු කුසුම් කුමාර; කාන්ති රණසිංහ; වින්ස්ටන් පතිරාජ; එන්.සෙල්වක්කුමාරන්: එස්. තවරාජා; එස්.විජේසන්දිරන්; ලාල් විජේනායක

### 3.3.2 නිර්දේශ

රටේ පුරවැසියන් වර්තමානයේ මුහුණ දී සිටින තත්ත්වය මැද එකඟතාවක් ගොඩ නැගීමේ කාර්යය සඳහා අපේ නිර්දේශ මෙසේ දක්වමු.

**අ.** පුරවැසියෙක් වූයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් යන කුමන ආකාරයකින් වුවත්, සියලු ම ශ්‍රී ලාංකික පුරවැසියන්ට සමාන ලෙස සැලකීම.

**ආ.** ලියාපදිංචියෙන් පුරවැසියන් වන පුද්ගලයන් අවනතවීමේ දිවුරුමක් ගත යුතුය.

# 4 පරිච්ඡේදය

## ආගම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආගම පිළිබඳ කරුණු ඇතුළත් කළ යුතු ආකාරය ගැන ජනතාව දැක්වූ අදහස් මේ කොටසේදී සාකච්ඡා කරමු. විශේෂයෙන් ම බුද්ධාගමට හිමි ස්ථානය පිළිබඳ ව වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි ව්‍යවස්ථාව සම්බන්ධයෙන් බොහෝ දුරට සාකච්ඡා කරන ලදී.

### 4.1 ඉදිරිපත් කළ අදහස්

රාජ්‍යය හා ආගම මෙන් ම විශේෂයෙන් ම රාජ්‍යය හා බුද්ධාගම අතර ඇති සබඳතාව ගැන එකිනෙකට වෙනස් අදහස් ඉදිරිපත් විය. බුද්ධාගමට ප්‍රමුඛ ස්ථානය දෙමින් රාජ්‍යය එය ආරක්ෂා කළ යුතුය යන අදහසට විකල්පය වූයේ රාජ්‍යය අනාගමික විය යුතු බවත්, ආගම, රාජ්‍යයේ විෂය පථයට අයත් නොවිය යුතු බවත්ය. තවත් අදහසක් වූයේ රජය සියලුම ආගම් සමාන ලෙස පිළිගෙන ආරක්ෂා කළ යුතු බවත්, මේ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ පරිච්ඡේදය බුද්ධාගම නොව "ආගම" විය යුතු බවයි. බුද්ධාගමට ප්‍රධාන තැන ලැබිය යුතුය යන ස්ථාවරය ගන්නා අය ද, රජය සියලු ම ආගම්වලට ආරක්ෂාව හා නියමිත අයිතිවාසිකම් ලබා දිය යුතු බවට එකඟ වූහ. බුද්ධාගම පෝෂණය කර ආරක්ෂා කළ යුතු යැයි පවසන සමහරෙකු එයට බුද්ධ ශාසනය (ඔවුන් එය සංඝ සංස්ථාව ලෙස තේරුම් ගන්නා බව පෙනේ) ඇතුළත් නොවිය යුතු යැයි කියා සිටී.

බුද්ධාගමට ප්‍රථම ස්ථානය දෙමින් එය ආරක්ෂා කළ යුතුය යන මතය පිටුපස ඇති තර්කය වන්නේ ශ්‍රී ලංකාවේ බුද්ධාගම හා සංඝ සමාජය රාජ්‍ය ආරක්ෂාව නොමැති වුවහොත් පරිහානියට පත් විය හැකි බවයි. මෙහිදී රාජ්‍යයේ කාර්යභාරය ඓතිහාසික පූර්වාදර්ශවලින් සනාථ වේ. මේ අනුව සිංහල ජනයාගේ ස්වයං අනන්‍යතාව හා බුද්ධාගම අතර දීර්ඝ ඓතිහාසික සම්බන්ධයක් ඇති බැවින් බුද්ධාගමට ප්‍රධාන ස්ථානය දීම නිවැරදි බවට තර්ක කෙරුණි. තවදුරටත් ඔවුන් කියා සිටියේ සියලු සචේතනික සත්ත්වයන්ගේ යහපත මත පදනම්වූ බෞද්ධ මූලධර්මවලට සාමූහික ජීවිතයේ ප්‍රමුඛත්වයක් දිය යුතු බවත්, ඒ නිසා රාජ්‍ය අනුග්‍රහය අවශ්‍ය බවත්ය.

අතීත් අතට අනාගමික රාජ්‍යයක් පිළිබඳ ව කරුණු දැක්වූ අය පෙන්වා දුන්නේ ආගම පෞද්ගලික දෙයක් බවත්, එයට රාජ්‍යය මැදිහත් විය යුතු නැති බවත් ය. තව ද, එක්

ආගමකට ප්‍රමුඛත්වයක් දීම අනිත් ආගම්වලට වෙනස් ලෙස සැලකීමක් වන බැවින් එය සමානාත්මතාවේ මූලධර්ම උල්ලංඝනය කරන අතර ආගමික අසමගියට ද, හේතු විය හැකිය.

බුද්ධාගමට ප්‍රධාන ස්ථානය දෙන අතර අන් සියලු ම ආගම් ද, සමාන ආකාරයට රජයෙන් ආරක්ෂා කළ යුතුය යන ස්ථාවරයේත්, බුද්ධ ධර්මය එහි ආයතනික ආගමෙන් වෙන් කළ යුතු යැයි යන මතයේත්, පදනම වන්නේ ඓතිහාසික හා සංස්කෘතික හේතු මත රාජ්‍යය තුළ බුද්ධාගමේ උත්තමත්වය පිළිගන්නා අතර බෞද්ධ නොවන අයගේ අයිතීන්ට හානි වන ආකාරයට බෞද්ධ ආගමික කණ්ඩායම් හෝ පුද්ගලයන්ට ක්‍රියා කිරීමට ඉඩ නො දිය යුතු බවයි.

අප ඉදිරියට පැමිණි වෙනත් ඇතැම් ආගමික පූජකවරුන්ගේ අදහස වූයේ මතභේදාත්මක තත්ත්වයක් ඇතිවීම වැළැක්වීම සඳහා, අනිකුත් ආගම්වලට ප්‍රබල ව්‍යවස්ථාමය ආරක්ෂාවක් ඇත්නම් දැනට ආගම සම්බන්ධයෙන් ඇති වගන්තිවලට ඔවුන්ගේ විරුද්ධත්වයක් නැති බවයි. සමහර පූජකවරුන් පෙන්වා දුන්නේ ශ්‍රී ලංකාවේ සංස්කෘතිය, ශිෂ්ටාචාරය හා බුද්ධාගම අතර ඇති ඓතිහාසික සම්බන්ධය පිළිගැනීම අවශ්‍ය බවයි.

කමිටුව මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කළ නමුත් නිර්දේශ පිළිබඳ එකඟත්වයකට පැමිණීමට හැකි වූයේ නැත. අප සමහරෙකු මේ ප්‍රශ්නය දෙස බැලුවේ ප්‍රායෝගික දෘෂ්ටියකිනි. අප පෞද්ගලිකව අනාගමික රාජ්‍යයකට කැමති නමුත් මහජනතාව ඉදිරිපත් කළ විවිධ අදහස් අනුව අපට පෙනී ගියේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙම වගන්ති වෙනස් කිරීම අනවශ්‍ය ගැටුමකට හේතුවක් විය හැකි බවත්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට ම බලපෑ හැකි බවත්ය. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 2වැනි පරිච්ඡේදයේ හා 9 වැනි ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුවත්, ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් බව ශ්‍රේෂ්ඨාධිකරණය අවස්ථා කීපයකදී ප්‍රකාශ කර ඇති බව ද, පෙන්වා දෙන ලදී. සමහර සාමාජිකයන් මහජනයා විසින් ඉදිරිපත් කරන ලද අදහස් ඇතුළත් වන සේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙම ව්‍යවස්ථා නැවත සූත්‍රගත කිරීමට යෝජනා කළහ. එක් සාමාජිකයෙක් ඉතා ප්‍රබල ලෙස කියා සිටියේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වෙනස් කිරීමට කිසි ම අවශ්‍යතාවක් නැති බවයි. ඔහුගේ තර්කය වූයේ උඩරට ගිවිසුමේ සිට ව්යවස්ථාවේ බුද්ධාගමට ප්‍රධාන ස්ථානයදී ඇති බවත් වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි ව්‍යවස්ථාව අනිත් සියලු ආගම්වල අයිතීන් ආරක්ෂා කරන බැවින් කිහිප දෙනෙක්

ඉදිරිපත් කළ අදහස් අනුව ද, යමින් 9 වැනි ව්‍යවස්ථාව ඒ ආකාරයට තබා ගත යුතු බවත්ය.

කමිටුවේ තවත් අයගේ මතයක් වූයේ මේ සම්බන්ධයෙන් මහජනයා ඉදිරිපත් කළ විවිධ මත සැලකිල්ලට ගනිමින්, ප්‍රායෝගික ප්‍රවේශයක් ගැනීම වෙනුවට පවතින භේදකාරී තත්ත්වයෙන් ඔබ්බට යෑම සඳහා අපේ රට ගත යුතු අනාගත මඟ ගැන සිතමින් ආගම පිළිබඳ සංවාදය හා විවාදයට අභියෝග කිරීම අපගේ වගකීම බවයි. ශ්‍රී ලාංකික සමාජය හා බුද්ධාගම අතර ඇති ඓතිහාසික සම්බන්ධය පිළිගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාවේ සඳහන් කළ හැකි යැයි තර්ක කරන ලදී.

## 4.2 නිර්දේශ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ සැලකිල්ලට ගැනීම සඳහා සාමාජිකයන්ගේ විකල්ප නිර්දේශ සියල්ල ම මෙහි ඉදිරිපත් කිරීමට කමිටුව තීරණය කළේය.

i. කිසිම වෙනසකින් තොරව වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (II වැනි පරිච්ඡේදය) 9 වැනි ව්‍යවස්ථාව තබා ගැනීම.[6]

ii. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II වැනි පරිච්ඡේදයේ ශීර්ෂය "බුද්ධාගම" නොව "ආගම්" යනුවෙන් වෙනස් විය යුතු අතර 9 වැනි ව්‍යවස්ථාව කිසිම වෙනසක් නොකර තබා ගත යුතුය.[7]

iii. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වැනි ව්‍යවස්ථාව පහත දැක්වෙන ආකාරයට වෙනස් කළ යුතුය:
ශ්‍රී ලංකා ජනරජය සියලුම ආගම්වලට සම තත්ත්වයක් දිය යුතුය. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වැනි හා 14(1)ඉ ව්‍යවස්ථාවලින් සියලු ආගම්වලට ලබාදී ඇති අයිතීන් ආරක්ෂා කරමින් රාජ්‍යය බුද්ධාගම හා බුද්ධ ශාසනය පෝෂණය කර ආරක්ෂා කළ යුතුය.[8]

iv. ශ්‍රී ලංකාව අනාගමික රාජ්‍යයක් විය යුතුය.[9]

v. ජනතාවගේ ආධ්‍යාත්මික සංවර්ධනයට ආගමේ කාර්යභාරය පිළිගන්නා අතර ශ්‍රී ලංකාව අනාගාමික රාජ්‍යයක් විය යුතුය.[10]

[6] කුෂාන් ද අල්විස්, ජ.නී; එම්.කේ. නදීකා දමයන්ති
[7] තේමිය එල්.බී. හුරුල්ලේ; වින්ස්ටන් පතිරාජ
[8] උපුල් අබේරත්න; එම්.එල්.ඒ. කාදර්; ලාල් විජේනායක; සිරිමසිරි හපුආරච්චි; සුනිල් ජයරත්න
[9] හරිනි අමරසූරිය; එස්.සී.සී. ඉළංකෝවන්; කුමුදු කුසුම් කුමාර; කාන්ති රණසිංහ; එන්. සෙල්වක්කුමාරන්

vi. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II වැනි පරිච්ඡේදයේ ශීර්ෂය "ආගම්" විය යුතුය. එයට අදාළ ව්‍යවස්ථාව පහත දැක්වෙන ආකාරයට සංශෝධනය විය යුතුය[11].

"ශ්‍රී ලංකා ජනරජය සියලු ආගම්වලට සමාන තත්ත්වයක් දිය යුතුය"

---

[10]ඒ.එම්. නවරත්න බණ්ඩාර

[11]එස්. තවරාජා; එස්. විජේසන්දිරන්

# 5 පරිච්ඡේදය

# රාජ්‍යයේ ස්වභාවය

## 5.1 ඉදිරිපත් කළ අදහස්

රාජ්‍යයේ ස්වභාවය පිළිබඳව මහජනයා විවිධ අදහස් ඉදිරිපත් කළ අතර ඒවා සන්ධීය ක්‍රමයේ සිට ඒකීය රාජ්‍යයක් දක්වා මෙන්ම අනාගමික තත්ත්වයේ සිට අනාගමික නොවන ආකාරයේ පුළුල් පරාසයක අදහස් ඉදිරිපත් කෙරුණි. තවත් අය විසින් ෆෙඩරල් හා ඒකීය රාජ්‍යයන් අතර විකල්ප ද, ඉදිරිපත් කරන ලදී. දෙමළ දේශපාලනඥයින් විසින් දීර්ඝ කාලයක් තිස්සේ ෆෙඩරල් රාජ්‍යයක් පිළිබඳ අදහස සාකච්ඡා කර ඇති බැවින් උතුරු පළාතේ හා නැගෙනහිර පළාතේ බොහෝ නියෝජිතයෝ ෆෙඩරල් රාජ්‍යයක් පිළිබඳ අදහස ප්‍රකාශ කළෝය. දෙමළ ජනතාවගේ දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ මගක් ලෙස ෆෙඩරල් රාජ්යයක් හෝ බලය බෙදා ගැනීමේ යන්ත්‍රණයක් යෝජනා කළ අය අතර වෙනත් ප්‍රජාවන්ට අයත් පුද්ගලයන් හා රටේ වෙනත් කොටස්වල පුද්ගලයන් හා කණ්ඩායම් ද, වූ බව මෙහිලා සඳහන් කළ යුතුය.

මේ අතර රටේ අනෙක් ප්‍රදේශවලින් ලැබුණු අදහස්වල ඒකීය රාජ්‍යයකට ඇති කැමැත්ත ප්‍රබල ලෙස ප්‍රකාශ කර තිබුණි. බොහෝ අය ෆෙඩරල් ක්‍රමයට විරුද්ධ වන්නේ එය බෙදුම්වාදය පිළිබඳ අදහසට ප්‍රබල ලෙස සම්බන්ධ නිසා බව පැහැදිලිව පෙනේ. ඒ සමග ම ඒකීය රාජ්‍යය යනු නො බෙදිය හැකි රටක් ලෙස සැලකේ. වැඩිපුර බලය බෙදා හැරීමට හා ෆෙඩරල් ව්‍යුහයකට කැමැත්ත දක්වන අය, ඒකීය රාජ්‍යය දකින්නේ ප්‍රජාතන්ත්‍ර විරෝධී මධ්‍යගත රාජ්‍ය පාලනයක් දිගට ම පවත්වා ගෙන යෑමක් ලෙසයි. ෆෙඩරල් රාජ්‍යයක් පිළිබඳ ව විශේෂයෙන් ම සිංහල ජනතාව අතර ඇති බියට හේතුව අවසානයේ රට දෙකඩවීමට එය හේතු විය හැකි ය යන විශ්වාසයයි. ඒකීය රාජ්‍යය පිළිබඳ බියට පදනම් වී ඇත්තේ එය බහුතරයේ පාලනයකටත්, බලය මධ්‍යගත වීමටත්, හේතු වේය යන අදහසයි.

සහසන්ධීය හෝ කලාපීය සංගමයක් නිර්දේශ කළ යෝජනා ද, මේ අතර විය. උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනයාගේ සම්ප්‍රදායික වාසභූමි ලෙස හා මේ පළාත් දෙක ඒකාබද්ධ කිරීම පිළිගන්නා ලෙස උතුරු හා නැගෙනහිර පළාත්වලින් පැමිණි සමහර කණ්ඩායම් ඉල්ලා සිටියෝය. උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ වූවහොත් නැගෙනහිර මුස්ලිම් ජනයා නො වැදගත් තත්ත්වයකට පත්වනු ඇතැයි යන බිය විශේෂයෙන් ම නැගෙනහිර මුස්ලිම් නියෝජිතයෝ ප්‍රකාශ කළහ. එවැනි ඒකාබද්ධ වීමක් සිදුවුවහොත්

නැගෙනහිර පළාතේ මුස්ලිම් ජාතිකයන් බහුතරයක් සිටින යාබද ප්‍රදේශ ඇතුළත් වෙන ම කලාපයක් ලබා දිය යුතු යැයි තර්ක කරන ලදී.

මතුපිටින් බලන විට රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ වෙනස් මතවලට පදනම වන්නේ හේතුව ජනවර්ගය ලෙස පෙනී යන අතර, අපට ඉදිරිපත් කළ අදහස් විශ්ලේෂණය කිරීමේදී පෙනී ගියේ කුලය, ආගම, භාෂාව හා භූගෝලීය පෙදෙස මත පදනම්වූ වෙනස්කම් ද, ඇති බවයි. ආගමික හා භූගෝලීය කණ්ඩායම් තුළ පවා විශාල ඒකක තුළට කුඩා කණ්ඩායම් අන්තර් ග්‍රහණය වීම ගැන බියක් ඇති බව පෙනේ. උදාහරණයක් වශයෙන් මැලේ ජාතිකයන් වෙනස් කණ්ඩායමක් ලෙස හඳුනා ගැනීමට ඉල්ලා සිටි අතර මලයහ (කඳුරට) දෙමළ ජනයා ද, වෙන ම කණ්ඩායමක් ලෙස පෙනී සිටියහ. බර්ගර්, තෙළිඟු කථාකරන ජනයා හා අප්‍රිකානු සම්භවයක් ඇති ජනයා ද, එවැනි ඉල්ලීම් කළෝය. සූෆි මුස්ලිම් ජාතිකයන් විසින් ඉදිරිපත් කරන ලද අදහස්වලින් පෙනී ගියේ ආගම් තුළ පවා වෙනස්කම් ඇති බවයි. සමහර නිකායවලට අයත් බෞද්ධ භික්ෂූන් කියා සිටියේ ඔවුන්ගේ ආගමික සංස්ථාව තුළ වඩා අධිපති කණ්ඩායම් තමන් කොන් කරන බවයි.

බහුතරය විසින් යටපත් කරනු ලැබේ යැයි සුළුතරය තුළ බියක් ඇති බව නිරීක්ෂණය කළ හැකි විය. සුළුතරයක් යනු කුමක් ද? යන්න නියත දෙයක් නොවන අතර එය සාධක ගණනාවක් මත වෙනස් වන බව පැහැදිලිව පෙනෙන්නට තිබුණි. ඔවුන් උතුරේ හා නැගෙනහිර ජීවත් වන සිංහලයන් වුවත්, මධ්‍යම පළාතේ සිටින මලයහ (කඳුරට) දෙමළ ජාතිකයන් වුවත්, නැගෙනහිර පළාතේ බර්ගර් ප්‍රජාවන් වුවත්, උතුරේ ඊනියා අඩු කුල කණ්ඩායම් වුවත්, රටේ නැගෙනහිර හා දකුණේ සූෆිවරුන් වුවත්, මැලේ ජාතිකයන් වුවත් සෑම තැනක ම සුළුතරයේ අනාරක්ෂිත බව පැහැදිලිව දැකිය හැකි විය. රටේ ප්‍රධාන වාර්ගික කණ්ඩායම වන සිංහල ජාතිකයන් ප්‍රකාශ කළ බිය ද, මේ ආකාරයට ම අවබෝධ කර ගත හැකියි. සිංහලයන්ගේ බිය හා අනාරක්ෂිත හැඟීමට පදනම වන්නේ යාබද දකුණු ඉන්දියාවේ වෙසෙන දැවැන්ත දෙමළ ප්‍රජාවෙන් තර්ජනයක් ඇතැයි යන උපකල්පනයයි. සිංහල ජනයාගේ මෙම බියට හේතු වන තවත් අදහසක් වන්නේ සිංහලයන්ට ඇති එක ම රට ශ්‍රී ලංකාව පමණක් නමුත් අනිත් ප්‍රජාවන්ට ලොව පුරා සබඳතා ඇති බවයි. මේ නිසා සිංහල භාෂාව, සංස්කෘතිය හා ආගම දුර්වල වීමේ තර්ජනයක් ද, ඇතැයි ඔවුහු විශ්වාස කරති. ඉන්දියානු රජය විසින් බලහත්කාරයෙන් ඒ කාලයේදී පටවන ලද්දේ යැයි සළකන 13වැනි සංශෝධනයට සමහර සිංහලයෝ ෆෙඩරල් ක්‍රමය සම්බන්ධ කරති.

මෙම සැක සංකාවන්ට හේතුව රටේ අවුරුදු ගණනාවක් තිස්සේ පැවති ගැටුම් හා යුද්ධත්, එයින් ජාතීන් අතර වර්ධනය වූ සැකය හා අවිශ්වාසයත්, බව අපගේ අදහසයි. පසුගිය දශක කීපය තුළ ජනතාව දේශපාලන වශයෙන් සංවිධානය වී ඇත්තේ ජනවාර්ගික ආගමික අනන්‍යතා වටාය. පසුගිය දශක කීපය පුරා දේශපාලන වශයෙන්, සමාජීය වශයෙන් හා සංස්කෘතික වශයෙන් ප්‍රධාන කතිකාව වූයේ ජනවාර්ගික-ආගමික ජාතිකවාදයයි. යුද්ධය අවසන් වීමෙන් පසුවත් අප සමාජය තුළ මෙම සාධකයේ බලපෑම අඩුවී නැත. ඇත්ත වශයෙන්ම මෙම හැඟීම් වඩාත් තීව්‍ර හා ප්‍රබල වී ඇතැයි යමෙකුට තර්ක කළ හැකියි. විවිධ කණ්ඩායම් තමන්ගේ හිමිකම් පවත්වා ගැනීමට හා තම දුක්ගැනවිලිවලට සහන ලබාගැනීමට උත්සාහ කිරීම හේතු කොට ගෙන අපේ සමාජයේ බහුවිධතාව හා විවිධත්වයට ගරු කරන පොදු ශ්‍රී ලාංකික අනන්‍යතාවක් ගොඩ නැඟීමට අප අසමත්වීම මෙයින් පිළිබිඹු වේ. විශ්වාසය ගොඩනැඟීම හා බහුවිධතාව පිළිගැනීම එක් රැයකින් සිදුවන දෙයක් නොවේ. අපේ රටේ අනාගතය සාකච්ඡාවට බඳුන් වී ඇති මේ අවස්ථාවේ, අප අතර ඇති මෙම බිය හා අවිශ්වාසය පිළි ගනිමින්, ක්‍රමයෙන් මෙම මානසිකත්වයෙන් පිටතට ඒමේ ක්‍රම අප සොයා ගත යුතු වේ.

මේ සියලු වෙනස්කම් මැද වුවත්, අප ඉදිරියේ අදහස් දැක්වූ සියලු දෙනා ම පාහේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ ප්‍රබල අවශ්‍යතාව ගැන එකඟ වීම ඉතා වැදගත් වේ. බලවත් ලෙස ප්‍රකාශ වූ තවත් අදහසක් වූයේ බලයේ මූලාශ්‍රය ඇත්තේ ජනතාව අත බැවින් රාජ්‍යයට පැවතිය හැකි වන්නේ ජනතා කැමැත්ත ඇති තෙක් පමණක් බවයි. මේ නිසා රාජ්‍යය ජනරජයක් විය යුතුය යන මතය ප්‍රබල ලෙස ප්‍රකාශ විය. රාජ්‍යය යනු ඒ රටේ පුරවැසියන්ගේ සංගමයක් බවත්, එය ජනතාව වෙනුවෙන් ක්‍රියාකරමින් ඔවුන්ගේ පුද්ගලික හා කණ්ඩායම් අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතු බවටත්, තර්ක කරන ලදී. රජයේ ක්‍රියාමාර්ග තුළින් යුක්තිය හා සාධාරණත්වය සහතික කළ හැකි රාජ්‍යයකට මහජනයා කැමැත්ත පළ කළෝය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව එහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය හා රාජ්‍ය ප්‍රතිපත්තියේ නියාමක මූලධර්ම තුළින් සියලු දෙනාට ම සමානත්වය හා සාධාරණත්වය සහතික කළ යුතුය යන අදහස ද, ඉදිරිපත් විය. මෙය අපේ ජනතාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය ගැන ඇති ප්‍රබල පෙළඹීම පිළිබිඹු කරයි. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමෙන් හා යුක්තිය හා සමානත්වය සහතික කිරීමෙන් පෙර සාකච්ඡා කළ බිය සහ සැක සංකා බොහෝ දුරට අඩු කර ගැනීමට හැකි වනු ඇත.

## 5.2 නිර්දේශ

රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ නිර්දේශ සකස් කිරීමේදි කමිටුව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළේය. අපි මෙහිදී කරුණු දෙකක් ගැන අවධානය යොමු කළෙමු. ඒවා නම් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව හා ජාතික ප්‍රශ්නයට විසඳුමක් සොයා ගැනීමයි. අප ඉදිරියට පැමිණි සියලු දෙනාට ම මෙම කරුණු දෙක ඉතා වැදගත් බව පෙනුණි. වඩා යහපත් අනාගතයක් කරා රට ගෙන යෑමට ඉවහල් වන නිර්දේශ ඉදිරිපත් කිරීමේදී විවිධ ප්‍රජාවන් අතර බිය හා අනාරක්ෂිතබව නැවත ඇති නො කිරීමේ අවශ්‍යතාව ද, අපි අවබෝධ කර ගත්තෙමු. රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ එකඟතාවකට එළඹිය නො හැකි වුවත්, කමිටු සාමාජිකයන් ඔවුන්ගේ මුල් අදහස්වලින් මඳක් ඉවත්ව පහත දැක්වෙන නිර්දේශ සම්බන්ධයෙන් එකඟත්වයකට පැමිණි බව මෙහිලා සඳහන් කළ යුතුය.

අපගේ නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණ උදෙසා අප ඒකීය හා ෆෙඩරල් ක්‍රම අර්ථ දක්වන්නේ මෙසේයි:

ඒකීය ආණ්ඩු ක්‍රමයක් යනු ආණ්ඩු බලය එක මධ්‍යස්ථානයක පවතින ක්‍රමයකි. ඒකීය රාජ්‍යයක් තුළ කේන්ද්‍රයේ ඇති එක් ආයතනයකට ව්‍යවස්ථාදායක බලය පවතින අතර කේන්ද්‍රයේ ඇති තවත් ආයතනයකට විධායක බලය ද, කේන්ද්‍රයේ ඇති තවත් ආයතනයකට අධිකරණ බලය ද, හිමිවේ. කෙසේ වෙතත් මෙම ආයතන අතර බලතල වෙන් කිරීමේ මට්ටම වෙනස් විය හැකිය. ඒකීය රාජ්‍ය ක්‍රමයක් යටතේ මේවාට ඉහළ, සමාන්තර හෝ සම්බන්ධීකරණ ආයතනයකට ඉඩක් නැත. තව ද, මෙම බලතල සමහරක් පැවරූ හෝ දේශපාලන බලය බෙදාහරින ලද ආයතන තිබිය හැකි වුවත්, කේන්ද්‍රයේ ආයතනයට බලය පැවරූ හෝ බෙදා හරින ලද ආයතනයේ කැමැත්ත හෝ එකඟත්වය නොමැතිව පැවරූ බලතල ආපසු ගැනීමට, සංශෝධනය කිරීමට හෝ අහෝසි කිරීමට බලය තිබේ. මේ අනුව බලය පැවරීම හෝ දේශපාලන බලතල බෙදා හැරීම රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලේඛනයක් තුළින් සිදු වුවහොත් පැවරූ හෝ බෙදාහැරි ඒකකවල අනුමැතියකින් හෝ එකඟත්වයකින් තොරව මධ්‍යම ව්‍යවස්ථාදායකයට එවැනි විධිවිධාන ප්‍රතිසංවිධානය කිරීමට හෝ ඉවත් කිරීමට හැකි වේ.

අනිත් අතට ෆෙඩරල් ආණ්ඩු ක්‍රමයක් යනු ඇතැම් විෂය කරුණු සම්බන්ධයෙන් ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල ඇති ෆෙඩරල් රජයක් හා අනිකුත් විෂය කරුණු ගැන ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල ඇති ප්‍රාදේශීය

ෆෙඩරල් ඒකක ද, තිබිය හැකි ක්‍රමයකි. මෙහිදී සමහර කරුණු පිළිබඳ ජනතා බලය (පරමාධිපත්‍යය) ෆෙඩරල් (මධ්‍යම) රජයටත්, අනිත් කරුණු සම්බන්ධයෙන් එම බලය (ප්‍රාදේශීය) ෆෙඩරල් ඒකකවලටත්, හිමි වේ. මෙම බලය බෙදා ගැනීමේ හෝ විමධ්‍යගත කිරීමේ විධිවිධාන රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ලේඛනයකින් සිදු විය යුතු අතර ෆෙඩරල් (මධ්‍යම) රජයට ඒකපාර්ශිකව ඒවා වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ නු පුළුවන. එවැනි සංශෝධන සඳහා (ප්‍රාදේශීය) ෆෙඩරල් ඒකක කිසියම් ප්‍රතිශතයක හෝ අනුමැතිය හෝ එකඟත්වය තිබිය යුතුය.

ලෝකයේ දැකිය හැකි බොහෝ (පාලන) පද්ධති නියම ලෙස මෙම වර්ගීකරණය යටතට පත් නොවන බව අපි දනිමු. සමහරක් මෙම පද්ධති දෙකේ උපරිපතනයන් වන අතර එක් පද්ධතියකින් සමහර අංගත්, අනිත් පද්ධතියෙන් වෙනත් අංගත්, රැගෙන දේශපාලන ක්‍රමයේ අවශ්‍යතාවන්ට අනුකූල වන ලෙස නිර්මාණාත්මකව සකස් කර ගත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා තිබේ. රට ආණ්ඩු කිරීමේ අරමුණට හානියක් නොවන සේ එක් පද්ධතියක වැදගත් අංග අනිත් පද්ධතියේ අංග සමග සම්බන්ධ කිරීමේ හැකියාව ද, තිබේ.

කමිටුවට රාජ්‍යයේ ස්වභාවය ගැන එකඟත්වයකට එළඹීමට නොහැකි වූ නිසා පහත දැක්වෙන සූත්‍රකරණ තුන ඉදිරිපත් කරමු.

i. ශ්‍රී ලංකාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති ආණ්ඩු ආයතනවලින්* සමන්විත වන එක්, ස්වාධීන, නිදහස්, ස්වෛරී ජනරජයක් විය යුතු අතර රාජ්‍යය, ජනරජයේ නිදහස, ස්වෛරීත්වය, ඒකීයත්වය හා භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කරමින්, රටේ විවිධ ජන කොටස් අතර සාමය හා සංහිඳියාව පවත්වා ගනිමින් ශ්‍රී ලාංකීක අනන්‍යතාව රාජ්‍ය විසින් ප්‍රවර්ධනය කළ යුතුය.[12]

ii. ශ්‍රී ලංකා ජනරජය, ව්‍යවස්ථාවේ සඳහන් කර ඇති ආණ්ඩු ආයතනවලින්* සමන්විත වන ස්වාධීන, නිදහස්, ස්වෛරී ඒකීය ජනරජයක් විය යුතු අතර රටේ විවිධ ජන කොටස් අතර සාමය හා සංහිඳියාව පවත්වා ගනිමින් එය ශ්‍රී ලාංකික අනන්‍යතාව

[12] හරිනි අමරසූරිය; ඒ.එම්. නවරත්න බණ්ඩාර; එම්.එල්.ඒ.කාදර්; එම්.වයි. එම්. ෆායිස්; සිරිමසිරි හපුආරච්චි; කුමුදු කුසුම් කුමාර (ෆෙඩරල් ස්ථාවරයේ සිට සම්මුතියකට එළැඹිණි); කාන්ති රණසිංහ; එන්. සෙල්වක්කුමාරන්; එස්. තවරාජා (ෆෙඩරල් ස්ථාවරයේ සිට සම්මුතියකට එළැඹිණි) ; එස්. විජේසන්දිරන් (ෆෙඩරල් ස්ථාවරයේ සිට සම්මුතියකට එළැඹිණි)

ප්‍රවර්ධනය  කළ යුතුය. මෙම ව්‍යවස්ථාවේ  පරමාර්ථය සඳහා ඒකීය රාජ්‍යයක් යනු බහු-ස්තර පාලන පද්ධතියක් සහිත නොබෙදුණු රටකි.[13]

*ආණ්ඩුවේ ආයතනවලට, ජාතික මට්ටමේදී පාර්ලිමේන්තුව, විධායකය හා අධිකරණය: පළාත් මට්ටමේදී  පළාත් සභා හා පළාත් විධායකය හා ප්‍රාදේශීය මට්ටමේදී  පළාත් පාලන ආයතන, මෙම ආයතනවල ප්‍රධානියා හෝ නියෝජ්‍ය ප්‍රධානියා.

iii  වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ  2 වැනි ව්‍යවස්ථාව  කිසි ම වෙනසකින් තොරව තබා ගත යුතුය. එනම්: " ශ්‍රී ලංකා ජනරජය ඒකීය රාජ්‍යයකි"[14]

---

[13] උපුල් අබේරත්න; එම්.කේ. නදීකා දමයන්ති; තේමිය එල්.බී. හුරුල්ලේ; සුනිල් ජයරත්න; වින්ස්ටන් පතිරාජ; ලාල් විජේනායක

[14] කුෂාන් ද අල්විස්, ජ.නි.

# 6 පරිච්ඡේදය

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ව්‍යුහය

## 6.1 ඉදිරිපත් කළ අදහස්

කමිටුව ඉදිරියේ අදහස් දැක්වූ අයට අවශ්‍ය වූයේ ප්‍රජාතන්ත්‍රවාදී සහ සියල්ලන් ම අන්තර්ගත කරගන්නා රාජ්‍යයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රජාතන්ත්‍රවාදය හා අන්තර්ගතභාවය මත පදනම් විය යුතු බවත්, ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අංග ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතු බවත්, ඔවුහු ප්‍රකාශ කළෝය. මෙයින් අදහස් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණවලට විරුද්ධ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් හෝ සාමාන්‍ය නීතියක් ව්‍යවස්ථාදායකයට සම්මත කළ නොහැකි බවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය ආරක්ෂා කරන අතර ම පහත සඳහන් කරුණු පිළිබඳ ව ද, සහතික විය යුතුය.

- i ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ/මැතිවරණ නීතියේ දක්වා ඇති ආකාරයට වරින් වර පවත්වන නිදහස් හා සාධාරණ මැතිවරණවලදී තමන් කැමති ආණ්ඩුවක් තෝරා ගැනීමට ජනතාවට ඇති අයිතිය;
- ii නීතියේ ආධිපත්‍යය;
- iii අධිකරණයේ ස්වාධීනත්වය;
- iv මූලික හා මානව හිමිකම්වලට ගෞරව කිරීම;
- v අන්තර්ගතභාවය හා සමානාත්මතාව මත පදනම් වූ සමාජයක්.

යෝජනා ඉදිරිපත් කළ ජනයාගේ අදහස වූයේ ශ්‍රී ලංකාව යනු ජනතාව අත, කඩකළ නොහැකි ලෙස පිහිටා ඇති පරමාධිපත්‍යය ඇති, බහුවිධ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී රටක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සනාථ කළ යුතු බවයි. ජනයාගේ ඡන්ද බලය පිළිගත යුතු හා ගෞරව කළ යුතු අතර රජයේ සෑම මට්ටමක ම ඔවුන්ගේ නියෝජිතයන් පත් කර ගැනීමට විධිමත් ව පවත්වන නිදහස් හා සාධාරණ මැතිවරණවලදී එය භාවිතා කළ යුතුය. ජනතා පරමාධිපත්‍යයේ අංග වන රජයේ බලය භාවිතයට ගැනීම ජනතාවට සමීප ම ඒකකය වන ප්‍රාදේශීය හෝ ග්‍රාමීය මට්ටමේ සිට පළාත් මට්ටම තුළින් ජාතික

මට්ටමට යා යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන තුළින් ජනතාවගෙන් රජයේ ආයතන බලය ලබා ගත යුතු අතර ඒ යටතේ පනවන නීති ව්‍යවස්ථාවේ ඇති සීමා කිරීම් හා තහනම් කිරීම්වලට යටත් විය යුතුය. ජනතාවට සේවය සැපයීමේ මූලස්ථම්භය වන්නේ සාධාරණ හා කාර්යක්ෂම රාජ්‍ය පරිපාලනයක මූලධර්ම හා භාවිතයන් මෙන්ම ඵලදායී හා කාලානුරූප ලෙස යුක්තිය ඉටු කිරීමයි.

## 6.2 ව්‍යවස්ථාවේ උත්තරීතරත්වය

### 6.2.1 ඉදිරිපත් කළ අදහස්

කමිටුව ඉදිරියේ අදහස් දැක් වූ අය කියා සිටියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උත්තරීතර විය යුතු බවත්, ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන තුළින් රාජ්‍ය ආයතන ලබා ගන්නා බලතලවල විෂය පථය සීමිත විය යුතු බවත්ය. මෙහි ප්‍රධාන අදහස වූයේ කිසිම රාජ්‍ය ආයතනයකට අසීමිත හෝ බන්ධන රහිත බලතල නො තිබිය යුතුය යන්නයි. මෙම කිසි ම ආයතනයක් වගවීමෙන් තොර ව බලතල ප්‍රයෝජනයට නො ගත යුතුය.

අප ඉදිරියේ අදහස් දැක්වූ සමහරුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතර භාවය පිළිබඳ සංකල්පය රැකෙන ප්‍රතිපාදන ව්‍යවස්ථාවේ අඩංගු විය යුතු යැයි සෘජුව ම කියා නො සිටියත්, රාජ්‍ය බලය යොදා ගැනීම සම්බන්ධයෙන් ඔවුන් ඉදිරිපත් කළ නිර්දේශවලින් කියවෙන්නේ ආණ්ඩුක්‍රම වියවස්ථාවේ උත්තරීතර භාවය පිළිබඳ සංකල්පය ආරක්ෂා කළ යුතු බවයි.

පාර්ලිමේන්තුව උත්තරීතර විය යුතු යැයි ද, එය ස්වෛරී ආයතනයක් විය යුතු යැයි ද, කිහිපදෙනෙක් යෝජනා කර තිබුණි. කෙසේ නමුත් මෙම අදහස ඉදිරිපත් කර තිබුණේ ජනාධිපතිගේ බලතල සමග සංසන්දනය කරමිනි. පාර්ලිමේන්තුවේ බලතල සම්බන්ධයෙන් සීමාවක් නොතිබිය යුතු යැයි මෙයින් අදහස් නොකෙරේ. ඇත්ත වශයෙන් ම පාර්ලිමේන්තුව උත්තරීතර ආයතනයක් විය යුතුයයි යෝජනා කළ අය පවා එසේ කර තිබුණේ ජනාධිපති තනතුරට ප්‍රති-ව්‍යතිරේකයක් ලෙසය.

ජනතාවගෙන් ප්‍රකාශ වූ අදහස් මෙන් ම ප්‍රාණවත් හා තිරසර ප්‍රජාතාන්ත්‍රික සංකල්පයේ පරමාදර්ශී අරමුණු සැලකිල්ලට ගනිමින් කමිටුවේ මතය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය පැහැදිලිව දැක්වෙන අංග හා කොටස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නීතිගත කළ යුතු බවයි.

මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය බවත්, ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට පටහැණි ලෙස පනවා ඇති හෝ පැනවීමට ඇති ඕනෑ ම නීතියක් බල රහිත බවත් දැක්වෙන නිශ්චිත ජේදයක් ව්‍යවස්ථාවේ අඩංගු කළ යුතු වේ. දකුණු අප්‍රිකානු ව්‍යවස්ථාවේ 2 වැනි ජේදයට සමාන ප්‍රතිපාදනයක් මේ සඳහා යෝග්‍ය වේ.

### 6.2.2 නිර්දේශ

1. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ජනරජයේ උත්තරීතර නීතිය වේ; එයට පටහැණි නීතියක් හෝ ක්‍රියාවක් අවලංගු වන අතර එයින් නියම කෙරෙන කර්තව්‍යයන් සපුරා ලිය යුතුය.[15]

2. ඉහත සඳහන් ආකාරයට ජනරජයේ කිසි ම ආයතනයකට එයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති ඒවා හැර වෙනත් කිසි ම බලයක් ඇතැයි කියා සිටීමට නුපුළුවන. මෙම බලතල විෂය පථය අනිත් සීමා විය යුතු අතර කිසිම ආයතනයකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අසීමිත හෝ බන්ධන රහිත බලතල ලබාදී ඇතැයි කිව හැකි නොවේ.

3. රජයේ ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ අංශවල සංවිධානාත්මක ව්‍යුහය සම්බන්ධයෙන් බලතල බෙදීම පිළිබඳ සිද්ධාන්තයේ අත්‍යවශ්‍ය ලක්ෂණ හා මෙම අංශවල ක්‍රියාකාරී භූමිකාවන් යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විය යුතු යැයි නිර්දේශ කෙරේ.

4. මෙය තවදුරටත් පහසු කිරීම සඳහා ව්‍යවස්ථා ප්‍රතිපාදන විවරණය කිරීමේ බලය ඇති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මණ්ඩලයක් හෝ ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කළ යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට හෝ ව්‍යවස්ථා මණ්ඩලයට පාර්ලිමේන්තුව හෝ අනිකුත් නීති සම්පාදක ආයතන විසින් සම්මත කර ගත් නීති පරීක්ෂා කර ඒවා වලංගු ද? නැද්ද? යන්න ප්‍රකාශ කිරීමේ බලය තිබේ. මේ නිසා නීති අධිකරණ සමාලෝචනයකට භාජනය කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැහැදිලි ව පිළිගත යුතු වේ. මේ ආකාරයට ම විධායක ක්‍රියා හා අධිකරණ ක්‍රියා ද, අධිකරණ සමාලෝචනයට භාජනය කිරීමේ ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විය යුතුය. මේ කරුණු පිළිබඳ විස්තරාත්මක නිර්දේශ 14 වැනි පරිච්ඡේදයේ අඩංගු වේ.

[15] කරුණාකර 12 වැනි පරිච්ඡේදයේ 16 වැනි ජේදය පිළිබඳ සාකච්ඡාව බලන්න.

5. මේ ආකාරයට ම නීතියේ ආධිපත්‍යය පිළිගැනීම, ගෞරව කිරීම හා පවත්වා ගැනීම සහතික කරන ප්‍රතිපාදන යෝජිත ව්‍යවස්ථාවේ ඇතුළත් කළ යුතු වේ. මෙම සාරධර්ම සමග ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනයට කැපවීම, ජනරජවාදය, මූලික මානව හිමිකම් හා මහජන භාරය පිළිබඳ සිද්ධාන්තය ව්‍යවස්ථාවේ අඩිතාලමේ පදනම වනු ඇත.

6. රාජ්‍ය ආයතනවල බලතල අයිති වන්නේ රටේ ජනතාවට බවත්, එම බලතල ක්‍රියාත්මක කරන ආයතන ඒවා තාවකාලික වශයෙන් දරන්නන් බවත්, ඒවා පවතින්නේ ජනතාවගේ හා මතු පරම්පරාවල යහපත සඳහා බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිත ලෙස සඳහන් විය යුතුය.

## 6.3 බලතල බෙදීම හා නීතියේ ආධිපතය

### 6.3.1 ඉදිරිපත් කළ අදහස්

කමිටුව ඉදිරියේ අදහස් දැක්වූ බොහෝ දෙනෙක් අවධාරණය කළ කරුණක් වන්නේ බලතල බෙදීම පිළිබඳ සිද්ධාන්තය ව්‍යවස්ථාවේ අඩංගු කළ යුතු බවත්, රජයේ සෑම අංශයක් ම අනිත් අංශවල අධීක්ෂණයට භාජනය කිරීමෙන් රජයේ කිසි ම අංශයක් අධිකාරිවාදී හෝ අත්තනෝමතික ලෙස හෝ බලය යොදා ගැනීම වැළැක්වීම සහතික කළ හැකි බවයි.

ව්‍යවස්ථාදායකය ව්‍යුහගත කළ යුත්තේ විධායකය, එනම් අමාත්‍ය මණ්ඩලය ඔවුන්ගේ කටයුතු සම්බන්ධයෙන් පිළිතුරු දිය යුතු හා වගකිය යුතු ආකාරයට බව බොහෝ දෙනෙකුගේ අදහස විය. අධිකරණය අභීත ලෙස අනිත් ආයතනවලින් ස්වාධීන විය යුතු බවත්, රජයේ අනිත් අංශවලින් කිසිම ආකාරයක මැදිහත් වීමකට හෝ පාලනයකට යටත් නොවිය යුතු බවත්, බොහෝ දෙනෙකු ප්‍රකාශ කර සිටියහ.

### 6.3.2 නිර්දේශ

1. බලතල බෙදීම පිළිබඳ සිද්ධාන්තය, හුදු අර්ථය නොව, එහි අගය හා ජීව ගුණය ගැන සලකා ව්‍යවස්ථා සම්පාදනයේදී අවධානය යොමු කළ යුතු වේ. පාර්ලිමේන්තු කැබිනට් ආණ්ඩු ක්‍රමයක් අනුගමනය කළ යුතු ය යන ප්‍රබල නිර්දේශය තුළ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර දැඩි ලෙස සපුරා ම වෙන්වූ බෙදීමක් අපේක්ෂා කළ හැකි නොවේ. එවැන්නක් යෝග්‍ය වන්නේ ද, නැත. එහෙත් අධිකරණය ස්ථාන

ගත කළ යුත්තේ න්‍යායිකව හා යථාර්ථවාදීව එය රජයේ අනිත් අංශවලින් ස්වාධීන වන ආකාරයටය.

2. රටේ ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ කටයුතුවල ව්‍යවස්ථානුකූලභාවය හා නීත්‍යානුකූල බව පරීක්ෂාවට ලක් කිරීමේ කාර්යය, අධිකරණයට ව්‍යවස්ථානුකූලව පැවරිය යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරබව හා රටේ නීතියේ ආධිපත්‍යය පවත්වා ගැනීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඍජුව ම පවරා ඇති ජනතාවගේ අධිකරණ බලය දරා සිටින්නන් ලෙස එය අධිකරණයේ පරම වගකීමක් වෙයි.
3. අධිකරණය, පැහැදිලි සංවිධානීය හා කාර්යාත්මක ලෙස ව්‍යවස්ථාදායකය හා විධායකයෙන් වෙන් කළ යුතුය. අසාමාන්‍ය අවස්ථාවන්හිදී විනිශ්චයකරුවන් ඒකාබද්ධ, වගකියන හා පාරදෘශ්‍ය විනය ක්‍රියා මාර්ගයකට යටත් කළ හැකි වේ. මෙය දැඩි ලෙස ස්වාභාවික යුක්තියේ නීතිවලට අනුකූලව සිදු විය යුතුය.
4. රටේ නීති පද්ධතියේත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේත් කටයුතුවලට මඟ පෙන්වන , අවිවාදනීය හා නොසැලෙන ලක්ෂණය වන්නේ, නීතියෙන් පාලනය කිරීම නොව, නීතියේ ආධිපත්‍යය පිළිබඳ න්‍යායයි.
5. රටේ සියලු ම ආයතන හා රටේ ජනතාව එහි ලිහිල් මෙන් ම පුළුල් අර්ථයෙන් නීතියේ ආධිපත්‍යය පිළිගෙන ආරක්ෂා කළ යුතු අතර නීතියේ ආධිපත්‍යය පිළිබඳ පුළුල් අවබෝධයකින් කටයුතු කළ යුතු වේ. වෙනත් කරුණු අතර නිශ්චිතතාව, සාමාන්‍යත්වය හා සමානාත්මතාව පිළිබඳ අවම ප්‍රමිතිවලට නීති පද්ධතිය අනුකූල වීම නීතියේ ආධිපත්‍යයෙන් අපේක්ෂා කෙරේ.
6. විධායක හා පරිපාලන ක්‍රියා සම්බන්ධයෙන් රජයේ ආයතනයක හෝ කාරකත්වයක ක්‍රියාවක් හෝ ක්‍රියා නොකිරීම හෝ ව්‍යවස්ථාව හෝ නීතියක් යටතේ හෝ නිශ්චිතව හෝ ඉඳුරාම ව්‍යංජිතව හෝ බලය පැවරීමකින් අවධාරණය කළ නො හැකි නම් ඒවා නීත්‍යානුකූල හෝ වලංගු නොවේ. ව්‍යවස්ථාපිත ආයතනයක ඕනෑම ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ නීතියක් මගින් හෝ තහවුරු කළ නොහැකි නම් එහි නීත්‍යානුකූලභාවයක් හෝ වලංගුභාවයක් නැත.
7. අනිත් අතට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ නීතියෙන් නිශ්චිතව හෝ ඉඳුරා ම ව්‍යංජිතව හෝ තහනම් කර නැති ඕනෑ ම ක්‍රියාවක නියැලීමට හෝ එසේ නොකිරීමට හෝ ස්වාභාවික පුද්ගලයෙකුට නිදහස තිබේ. නීතියෙන් වළක්වා නැති ඕනෑ ම ක්‍රියාවක යෙදීමට මිනිසුන්ට නිදහස තිබේ.

8. නීතියේ ආධිපත්‍යය පිළිබඳ න්‍යායේ විෂය පථය හා අන්තර්ගතය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි නිශ්චිත ව ඇතුළත් කළ යුතුය.
9. මේ සම්බන්ධයෙන් අපගේ නිශ්චිත අදහස වන්නේ උසාවි මගින් හා විශේෂඥයින් විසින් අර්ථ කථනය කරන ලද හා පැහැදිලි කරන ලද නීතියේ ආධිපත්‍යය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතු බවයි. පුද්ගලයන්ගේ හෝ සංවිධානවල ආශාවන් හා මනාපයන් අනුව නොව නීතියට අනුව ක්‍රියාත්මකවන ප්‍රාණවත් ප්‍රජාතන්ත්‍රයක් සහතික කළ හැකි වන්නේ ඒ මගින් පමණි.

# 7 පරිච්ඡේදය

# රජයේ ආකෘතිය හා ස්තර

මෙම කොටසේදී අප සාකච්ඡා කරන්නේ ජනාධිපති, උප-ජනාධිපති තනතුරු හා ජාතික විධායකය හා ව්‍යවස්ථාදායකයයි. රජයේ යෝජිත ස්තර පිළිබඳ විස්තර ද, මෙම කොටසේ අඩංගු වේ.

## 7.1 රජයේ ආකෘතිය

### 7.1.1 ඉදිරිපත් කළ අදහස්

ජනතාවගේ විධායක බලය ක්‍රියාත්මක වන ආකාරය හා සම්බන්ධ විවිධ වර්ගවල ආණ්ඩුක්‍රම පිළිබඳව කමිටුව ඉදිරියෙන් අදහස් දක්වන ලදී. මෙසේ ලැබුණු අදහස් වලින් අවධාරණය කෙරුණේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විධායක ජනාධිපති ක්‍රමයේ ප්‍රතිඵලයක් ලෙස රටේ දේශපාලනය හා සංස්කෘතිය පිරිහීමට හා විනාශයට පත්වී ඇති බවයි.

මෙම අදහස් දැක්වීම්වලට අනුව විධායක ජනාධිපති, බලතල අවභාවිතා කරමින් මහජනයාට නීතිය ඉදිරියේ යුක්තිය හා සමානත්වය අහිමි කර තිබේ. ඔවුන්ගේ මතය වී ඇත්තේ නීතියේ ආධිපත්‍යය බිඳ වැටී ඇති බවයි.

සමහරුන් කියා සිටියේ ජනාධිපති, රාජ්‍යයේ නාමික ප්‍රධානියා පමණක් විය යුතු බවයි. ඡන්දදායක ගණයකින් තෝරා ගන්නා ඔහු හමුදාවල ප්‍රධාන අණදෙන නිලධාරියා වන අතර ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට නායකත්වය දිය යුතුය. ජනාධිපති කිසි ම දේශපාලන පක්ෂයක කිසි ම තනතුරක් දැරිය යුතු නැතැයි යනුවෙන් ද, යෝජනා කෙරුණි.

කමිටුව ඉදිරියට පැමිණි තවත් අය කියා සිටියේ ඔවුන් විධායක ජනාධිපති ක්‍රමය පවත්වා ගෙන යෑමට පක්ෂ නමුත් ජනාධිපතිට පවරාදී ඇති අධිකරණ මුක්තිය ඉවත් කළ යුතු බවයි.

සමහරුන්ට වර්තමාන ජනාධිපති ක්‍රමය පවත්වා ගැනීම අවශ්‍ය විය. යම් කිසි ආකාරයක විධායක ජනාධිපති ක්‍රමයකට පක්ෂ අය අතර මත දෙකක් දැකිය හැකි විය. පළමුවැනි මතය වූයේ දේශපාලන ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ජනාධිපති ක්‍රමය පවත්වා ගෙන යා යුතු බවයි. අනිත් අදහස වූයේ ජනාධිපති ජාතික වශයෙන් තෝරා පත් කර ගන්නා බැවින් ඒ මගින් සුළු ජාතීන්ට ආරක්ෂාව සැපයෙන බවයි.

මහජනයා විසින් යෝජනා කරන ලද අනිත් ආණ්ඩු ක්‍රමය වූයේ කැබිනට් ආණ්ඩු ක්‍රමය හෝ වෙස්ට්මින්ස්ටර් ආකෘතියයි.

ප්‍රධාන වශයෙන් සුළු ජාතික ප්‍රජාවෙන් ඉදිරිපත් වූ තවත් අදහසක් වූයේ  උප ජනාධිපති හෝ උප අගමැති තනතුරු එකක් හෝ කීපයක් ඇති කිරීමයි. උප ජනාධිපති හෝ උප අගමැති, ජනාධිපති හෝ අගමැති අයත්  ප්‍රජාවෙන් නොවිය යුතු යැයි ද, යෝජනා කරන ලදී.

වෙස්ට්මින්ස්ටර් ආදර්ශය වෙනුවෙන් පෙනී සිටි අයට අගමැති හා අමාත්‍ය මණ්ඩලය, ව්‍යවස්ථාදායකයට වගකියන තත්ත්වයට පත් කරමින්  පාර්ලිමේන්තු ක්‍රමය ශක්තිමත් කිරීමට අවශ්‍ය විය. මෙම ආදර්ශය  යටතේ  ආණ්ඩුවට  වගවීමේ  තත්ත්වයේ තබා ගනිමින්  විරුද්ධ පක්ෂය තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි.

විධායක කමිටු ක්‍රමය නැවත හඳුන්වා දීමට යෝජනා කළ අය සමූහමතික ආණ්ඩු ක්‍රම ස්වරූපයක් වෙනුවෙන් විරුද්ධ පක්ෂයට ද, කාර්ය භාරයක් දිය යුතු යයි යන තර්කය ඉදිරිපත් කළෝය. ඔවුන්ගේ අදහස වූයේ වර්තමානයේ  විරුද්ධ පක්ෂය, සාධනීය ප්‍රවේශයක් ගනු වෙනුවට  සෑම දෙයට ම විරුද්ධ වන බවයි. මෙම මතය (සමූහමතික ආණ්ඩුක්‍රම ස්වරූපයක්) යෝජනා  කළ අයගේ අදහස වූයේ රට ඉදිරියට යෑම වැළැක් වූ විශාල බාධකයක් වූයේ මෙම පසමිතුරු දේශපාලනය බවයි.

මහජනයා විසින් ආණ්ඩුවේ ආකෘතිය ගැන දක්වන ලද  විකල්ප මත මෙසේ සාරාංශ ගත කළ හැකිය.

1. 19වැනි සංශෝධනයට පෙර තිබූ විධායක ජනාධිපති ක්‍රමය
2. 19වැනි සංශෝධනයට පසු ක්‍රියාත්මක වූ විධායක ජනාධිපති ක්‍රමය
3. වෙස්ට්මින්ස්ටර් ආදර්ශයේ ආණ්ඩුක්‍රමයක්
4. විධායක කමිටු ක්‍රමයක් සහිත වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රමයක්
5. ජනාධිපති ආණ්ඩුවේ නායකයා නොවන එහෙත් රාජ්‍ය නායකයා මෙන්ම සමහර සත්‍ය බලතල ඇති විධායක නායකයා ද, වන මිශ්‍ර හෝ දෙමුහුන් ආණ්ඩු ක්‍රමයක්.

### 7.1.2 **නිර්දේශ**

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කරමු.

1. ජාතික හා පළාත් මට්ටමේදී වෙස්ට්මින්ස්ටර් ක්‍රමයේ ආණ්ඩුවක් ක්‍රියාත්මක කළ යුතු ය. පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අවස්ථාවන්හිදී අලුත් ආණ්ඩුව පත් වන තෙක් භාරකාර ආණ්ඩුවක් තිබිය යුතුය[16].
2. මධ්‍යම රජයේ මට්ටමට පහළින් විධායක කමිටු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය.[17]

    අ. මෙම ක්‍රමය පළාත් මට්ටමේ මෙන් ම පළාත්පාලන ආයතන මට්ටමේ ද, ක්‍රියාත්මක කළ යුතු යැයි සමහරුන් යෝජනා කර තිබේ.

    ආ. මෙවැනි ආණ්ඩු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුත්තේ පළාත්පාලන මට්ටමේ පමණක් යැයි  සමහරුන් නිර්දේශ කර තිබේ.

ජනාධිපතිගේ කාර්ය භාරය සම්බන්ධයෙන් ද, විවිධ මත ඉදිරිපත් වූ අතර  ඒවා පහත දැක්වේ

1. ජනාධිපති රාජ්‍යයේ නාමික ප්‍රධානියා විය යුතුය.[18]
2. ජනාධිපති රාජ්‍ය නායකයා මෙන් ම සන්නද්ධ හමුදාවල ප්‍රධාන අණ දෙන නිලධාරියා වනු ඇත. ජනාධිපති ඡන්දදායක ගණයකින් තෝරා ගන්නා අතර ඔහුට ව්‍යවස්ථාවෙන් නියමිත බලතල හිමි වේ. ව්‍යවස්ථාවේ අන්තර්ගත මූලධර්ම අනුව ජාතික ආරක්ෂාව, ජාතික අපේක්ෂා හෝ සුළු ජාතික අපේක්ෂාවන්ට තර්ජනයක් එල්ල වූ අවස්ථාවලදී  මැදිහත් වීමේ බලතල මෙයට ඇතුළත් විය යුතුය.[19]
3. ජනාධිපති රාජ්‍ය නායකයා මෙන් ම හමුදාවල ප්‍රධාන අණ දෙන නිලධාරියා විය යුතුය. ජනාධිපති මහජන ඡන්දයෙන් පත් කර ගත යුතු අතර ව්‍යවස්ථාවෙන් නියමිත බලතල හිමිවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලධර්මවලට අනුකූලව ජාතික ආරක්ෂාව, ජාතික අපේක්ෂා හෝ සුළු ජාතික අපේක්ෂාවන්ට තර්ජනයක් එල්ල වූ අවස්ථාවලදී මැදිහත් වීමේ බලතල මෙයට ඇතුළත් විය යුතුය.[20]

---

[16] උපුල් අබේරත්න; කුෂාන් ද අල්විස්, ජ.නී; හරිනි අමරසූරිය; එම්.වයි.එම්. ෆායිස්; තේමිය එල්.බී. හුරුල්ලේ; කුමුදු කුසුම් කුමාර;  වින්ස්ටන් පතිරාජ; එන්. සෙල්වක්කුමාරන්; එස්. තවරාජා; එස්. විජේසන්දිරන්; ලාල් විජේනායක

[17] ඒ.එම්. නවරත්න බණ්ඩාර;  එම්.කේ. නදීකා දමයන්ති; එස්. සී.සි ඉළංකෝවන්; සුනිල් ජයරත්න; සිරිමසිරි හපුආරච්චි; කාන්ති රණසිංහ;

[18] එම්.කේ. නදීකා දමයන්ති; එන්. සෙල්වක්කුමාරන්

[19] උපුල් අබේරත්න;  එම්.වයි. එම්. ෆායිස්; කාන්ති රණසිංහ; එස්. තවරාජා; ලාල් විජේනායක

[20] හරිනි අමරසූරිය; සුනිල් ජයරත්න; කුමුදු කුසුම් කුමාර; එස්. විජේසන්දිරන්

## 7.2 උප/නියෝජ්‍ය ජනාධිපති හෝ නියෝජ්‍ය අගමැති

### 7.2.1 ඉදිරිපත් කළ අදහස්

උප/නියෝජ්‍ය ජනාධිපති හෝ නියෝජ්‍ය අගමැති තනතුරු ඇති කිරීම පිළිබඳ ව බොහෝ යෝජනා ඉදිරිපත් විය. ඉතා සිත් ගන්නා සුළු යෝජනාවක් වූයේ මෙම තනතුරුවලට පත් කළ යුත්තේ ජනාධිපති හෝ අගමැති අයත් වන ජන වර්ගයේ පුද්ගලයන් නො විය යුතු බවයි. මේ අනුව මෙම යෝජනාවේ අදහස වූයේ සුළු ජාතික පක්ෂ/ප්‍රජාවන්ගේ ගැටලුවලට පිළිතුරක් සැපයීම බව පෙනේ. දෙවැනි මන්ත්‍රණ සභාවක් පිහිටුවිය යුතු යැයි ද, යෝජනා වූ අතර එහි සභාපති උප ජනාධිපති විය යුතු යැයි අදහසක් ඉදිරිපත් විය.

### 7.2.2 නිර්දේශ

මෙම අලුත් තනතුරු සඳහා වූ යෝජනාවල ඒවායේ බලතල පුළුල් කිරීමක් සම්බන්ධයෙන් සඳහන් නොවූ අතර ඒවා යෝජනා කරන ලද්දේ විශේෂයෙන් ම සුළු ජාතික ප්‍රජාවන්ට සංකේතාත්මක අගයක් ලබා දීමට බව පෙනේ. දීර්ඝ සාකච්ඡාවකින් පසු පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

1. ඡන්දදායක ගණයකින් තෝරා ගන්නා උප ජනාධිපතිවරයෙක් සිටිය යුතු අතර ඔහුගේ බලතල ව්‍යවස්ථාවෙන් නියම කෙරේ. උප ජනාධිපති, ජනාධිපති අයත් ප්‍රජාවට වඩා වෙනස් ප්‍රජාවකට අයත් පුද්ගලයෙක් විය යුතුය.[21]
2. සමහර කමිටු සාමාජිකයන්ගේ අදහස වූයේ මෙවැනි තනතුරක් ඇති කිරීමේ අවශ්‍යතාවක් නැති බවයි. මෙවැනි තනතුරක් ඇති කරන ලෙස ඉල්ලා සිටීමට හේතුව සුළු ජාතිකයන්ට නියෝජනයක් හා වැඩිපුර ආරක්ෂාවක් ලබා දීම හෙයින් අවශ්‍ය වන්නේ සුළු ජාතිකයන්ට නියෝජනය හා ආරක්ෂාව සහතික කරන පියවර ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමයි.[22]

## 7.3 අමාත්‍ය මණ්ඩලය

### 7.3.1 ඉදිරිපත් කළ අදහස්

අමාත්‍ය තනතුරු ගණන අඩු කිරීම හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එය සඳහන් කිරීම පිළිබඳ ව යෝජනා විශාල සංඛ්‍යාවක් ලැබී තිබේ. විශාල අමාත්‍ය මණ්ඩලයක් නිසා මහජන මුදල්

[21] සුනිල් ජයරත්න; එස්.තවරාජා; වින්ස්ටන් පතිරාජ; ලාල් විජේනායක
[22] උපුල් අබේරත්න; හරිනි අමරසූරිය; එම්.කේ. නදීකා දමයන්ති; එම්.වයි. එම්. ෆායිස්; කුමුදු කුසුම් කුමාර; එන්. සෙල්වක්කුමාරන්; එස්. විජේසන්දිරන්

අපනේ යෑම පිළිබඳ ව බොහෝ විවේචන තිබුණි. ඔවුන්ගේ අදහස වූයේ අමාත්‍ය තනතුරු ඇති කරන්නේ හුදු දේශපාලන අවශ්‍යතා අනුව මිස කිසිම මූල ධර්මයකට හෝ තර්කානුකූල ආකාරයකට නො වන බවයි. ඇත්ත වශයෙන් ම බොහෝ දෙනෙකුගේ මතය වූයේ අමාත්‍ය තනතුරු විශාල ගණනක් තිබීමේ ප්‍රතිඵලය වී ඇත්තේ ව්‍යාකූලතාව, එක ම වගකීම කිප දෙනෙකුට තිබීම, අකාර්යක්ෂමතාව හා අනවශ්‍ය වියදම් සිදුවීම බවයි. පූර්ණ හා ඒකාබද්ධ සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ද, මේ නිසා වැළකුණි.

බලය බෙදාහැරීමක් සිදු වුවහොත් විශාල අමාත්‍ය මණ්ඩලයක අවශ්‍යතාව අඩුවන බව ද, කමිටුවේ සැලකිල්ලට භාජනය විය. තව ද, බොහෝ අය තර්ක කළ පරිදි යෝධ ඇමති මණ්ඩලයක් බිහිවූයේ ස්ථාවර රජයක් ගොඩ නැඟීමට ගත් ව්‍යායාමයේ ප්‍රතිඵලයක් ලෙසය. කෙසේ වෙතත් බොහෝ දෙනෙක් විසින් ද, පෙන්වා දී ඇති පරිදි මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් (සරල බහුතර ක්‍රමය සහ පළාත් සමානුපාතික නියෝජනය) ඇති කළහොත් රජයේ ස්ථාවරභාවය සම්බන්ධයෙන් සහතික විය හැකියි. එවිට ද විශාල අමාත්‍ය මණ්ඩලයක අවශ්‍යතාව පැන නො නගිනු ඇත.

අමාත්‍යංශ සඳහා අධීක්ෂණ කමිටු නිර්දේශ කෙරුණු අතර බොහෝ අය කියා සිටියේ ඒවා සමන්විත විය යුත්තේ අදාළ ඇමතිවරුන්ට අමතරව ඒ ඒ විෂයය පිළිබඳ විශේෂඥයින්ගෙන් බවයි. විශේෂයෙන් ම පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා අධීක්ෂණ කමිටු යෝජනා කරන ලදී.

i. ආර්ථික සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනය
ii. විද්‍යාව, තාක්ෂණය හා මානව සම්පත් සංවර්ධනය
iii. රාජ්‍ය පරිපාලනය හා පළාත් පරිපාලනය
iv. විදේශ කටයුතු හා විදේශ වෙළඳ හා වාණිජ කටයුතු

### 7.3.2 නිර්දේශ

ඉදිරිපත් වූ අදහස් හා ඒවායේ සාධාරණත්වය සැලකිල්ලට ගැනීමෙන් පසු අපගේ නිර්දේශ පහත දක්වමු.

1. අමාත්‍ය මණ්ඩලයක් තිබිය යුතුය.
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අමාත්‍ය මණ්ඩලය, ඇමතිවරුන් 25-30කටත් නියෝජ්‍ය ඇමතිවරුන් 25-30කටත් සීමා කළ යුතුය. රාජ්‍ය ඇමති ක්‍රමය අහෝසි කළ යුතුය.

3. අමාත්‍යංශ යටතට පැවරෙන විෂයය බලයේ සිටින රජය විසින් තීරණය කළ යුත්තේ හේතු යුක්ති ලෙස කාර්යයන් හා සම්පත් වෙත් කරමිනි.
4. අමාත්‍ය මණ්ඩලය පත්වීමෙන් සති දෙකක් ඇතුළත අමාත්‍යංශ යටතට එන දෙපාර්තමේන්තු/ආයතන හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යයන් පැහැදිලිව දක්වා ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.
5. සෑම අමාත්‍යංශයකට ම අධීක්ෂණ කමිටුවක් තිබිය යුතුය. මෙම කමිටුවල අදාළ ඇමතිවරුන්ට අමතරව අදාළ වෘත්තීය සුදුසුකම් ඇති පුද්ගලයන් මෙන් ම අදාළ ව්‍යාපාරික මණ්ඩලවල නියෝජිතයන් හා අමාත්‍යංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද, ඇතුළත් විය යුතුය. අධීක්ෂණ කමිටුවල සාමාජිකයන් අගමැතිගේ උපදෙස් මත ජනාධිපති විසින් පත් කෙරේ. මෙම කමිටුවල කාර්ය භාරය හා විෂය පථය සාකච්ඡා කර තීරණය කළ යුතු වේ.

## 7.4 රජයේ ස්තර

රජයේ ස්තරවල වෙනසක් කිරීම පිළිබඳ ව බොහෝ අදහස් ඉදිරිපත් විය. මේවායේ වැඩිපුර ම කරුණු දක්වා තිබුණේ 2වැනි (පළාත් සභා) හා 3 වැනි (ප්‍රාදේශීය සභා, නගර සභා) මට්ටමේ ආයතන පිළිබඳවයි. මේ කරුණු ගැන දීර්ඝ වශයෙන්, බලය බෙදීම හා පළාත් පාලන ආයතන පිළිබඳ, කොටසේදී සාකච්ඡා කරන අතර රජයේ විවිධ ස්තර පිළිබඳව ජනතාව ඉදිරිපත් කළ අදහස්වල සාරාංශයක් හා කමිටුවේ නිර්දේශ පහත දක්වමු.

### 7.4.1 ඉදිරිපත් කළ අදහස්

රජයේ විවිධ ස්තරවලට බලය බෙදා හැරීම අර්ථාන්විත විය යුතු අතර රාජ්‍ය ව්‍යුහයට අනවශ්‍ය ස්තර එක් කිරීමේ ප්‍රතිඵලය වන්නේ වියදම් වැඩි වීම, අකාර්යක්ෂමතාව හා රජය සමග කටයුතු කරන මහජනයා ව්‍යාකූලත්වයට පත් කිරීමයි. බොහෝ අවස්ථාවල පළාත් සභා "සුදු අලි" ලෙස හඳුන්වනු ලැබුවේ මේ නිසාය. මෙම ස්ථාවරය රජයේ විවිධ ස්තරවලට බලය බෙදා හැරීමට විරුද්ධ වීමක් නොව, නිශ්චිත කාර්යයන්, ඒ සඳහා බලය හා මූල්‍ය ශක්තිය නොමැතිව, රජයේ විවිධ ස්තර ඇති කිරීමට විරුද්ධ වීමකි.

ඕනෑ ම විමධ්‍යගත ඒකකයක් සම්බන්ධයෙන් මධ්‍යම රජයට අධිකාර බලය තිබිය යුතුය යන්න ඉදිරිපත් වූ තවත් අදහසකි. මෙම අදහස දැරූ පුද්ගලයන් බලය විමධ්‍යගත කිරීම

සම්බන්ධයෙන් සැක පළ කළ අතර ඔවුන් වඩා අනුකූලතාව දැක්වූයේ වඩා ප්‍රබල මධ්‍යගත ආණ්ඩු ක්‍රමයකටයි.

ප්‍රජාතන්ත්‍රීය හා දේශපාලන ක්‍රියාවලියට පුරවැසියන්ගේ වැඩි සහභාගිත්වයක් සහතික කිරීමත්, විශේෂයෙන් ම ඔවුන්ගේ ප්‍රදේශ සම්බන්ධයෙන් ගන්නා තීරණවලට බලපෑම් කිරීමට ඉඩ ලබා දීමත්, ඔවුන්ගේ නියෝජිතයන් සමීක්ෂණය කිරීමට ඉඩ ලබා දෙමින් පුරවැසියන් සංවර්ධන ක්‍රියාදාමය සහභාගීවීම පහසු කිරීමත්, සඳහා කුඩා ම ඒකකයට බලය විමධ්‍යගත කළ යුතුය යන මතය ද, ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් සමහරුන් හතරවැනි ස්තරයක් යෝජනා කළ අතර එය ග්‍රාම රාජ්‍ය/ගම් සභා/ ජන සභා ආදි වශයෙන් නම් කිරීමට පුළුවන. පළමුවැනි හෝ දෙවැනි අදහස යෝජනා කළ අය බොහෝ අවස්ථාවන්හිදි පුරවැසි සහභාගීත්වය වැඩි කිරීමේ යාන්ත්‍රණයක් පිළිබඳ ව ද, අවධාරණය කළෝය.

තවත් පොදු මතයක් වූයේ රජයේ සියලූ ම ස්තර ප්‍රජාතන්ත්‍රවාදී විය යුතු බවත්, මෙම කටයුතුවලට කඳුරට දෙමළ ජනයා, ආදී වාසී ප්‍රජාව, කාන්තාවන්, තරුණයන් හා ඊනියා අඩු කුළ කණ්ඩායම් වැනි කොන් කළ ප්‍රජාවන් නියෝජනය වන බව සහතික කිරීම සඳහා විශේෂ පියවර ගත යුතු බවයි.

වර්තමානයේ රජයේ ස්තර තුනක් (ජාතික, පළාත් සභා හා පළාත් පාලන ආයතන) ඇති බව කමිටුවේ නිරීක්ෂණය විය. පළාත් පාලනය යටතේ වර්තමානයේ ප්‍රාදේශීය සභා, නාගරික හා මහනගර සභා දක්නට ලැබේ. රජයේ මුල් ස්තර දෙක සම්බන්ධයෙන් එතරම් විවාදයක් නොවූ අතර තෙවැනි ස්තරය බරපතළ ලෙස සාකච්ඡාවට භාජනය කරන ලදී. මෙය අවශ්‍ය වූයේ වැඩි සහභාගීත්වයක් ලබා දීමට ජනතාව දැක්වූ කැමැත්ත මෙන් ම රජය සමග ඔවුන්ගේ එදිනෙදා කටයුතු අවුල් කරන අනවශ්‍ය ස්තරවලට දැක්වූ විරෝධයටත් ප්‍රමාණවත් ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ය (කරුණාකර පළාත්පාලන ආයතන පිළිබඳ සාකච්ඡාව සඳහා 10 වැනි පරිච්ඡේදය බලන්න).

### 7.4.2 නිර්දේශ

කමිටුව පහත සඳහන් කරුණු ගැන ඒකමතිකව එකඟ වූහ.

1. රජය ස්තර තුනකින් සමන්විත වනු ඇත: ජාතික, පළාත් හෝ කලාපීය හා පළාත් පාලන යනුවෙනි. පළාත් හෝ කලාපයට පසුව, බලය විමධ්‍යගත කෙරෙන ඊළඟ ස්තරය වන්නේ පළාත් පාලන ආයතනයි.

2. පළාත් පාලන ආයතනවල කාර්ය භාරය, බලතල හා කාර්යයන් පුළුල් කර පහත දැක්වෙන මූල ධර්ම යටතේ ඒවා වඩාත් ඵලදායී ආයතන බවට පත් කළ යුතුය.

   අ. ජනතාවගේ පරමාධිපත්‍යයට සමීපතම මට්ටම

   ආ. ප්‍රාදේශීය ප්‍රජාතන්ත්‍රවාදය

   ඇ. ප්‍රාදේශීය සංවර්ධනය

   ඈ පාලනයේ පුරවැසි සහභාගීත්වය

   ඉ. සියල්ලන් ඇතුළත් වන ප්‍රජාතන්ත්‍රවාදයක් (ආන්තික හා විවිධ ලැදියාවන් ඇති කණ්ඩායම් සහ ප්‍රජාවන්)

මෙවැනි පරිවර්තනයක් සාර්ථක කර ගැනීම සඳහා පළාත් පාලනයේ පහළ ම ඒකකවල ව්‍යුහය හා ක්‍රියාවලියට වැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

# 8 පරිච්ඡේදය

# බල හවුල්කාරීත්වය

## 8.1 ඉදිරිපත් කළ අදහස්

අපට ලැබූ යෝජනා මත පදනම් ව බලය බෙදා ගැනීම සම්බන්ධයෙන් දෙයාකාරයකට සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

i) පර්යන්ත ඒකකවලට බලය බෙදා හැරීම සාක්ෂාත් කිරීම ඉලක්ක කොට ගත් කේන්ද්‍රය හා පර්යන්තය අතර බල හවුල්කාරිත්වය

ii) කේන්ද්‍රය තුළ ම බල හවුල්කාරිත්වය

මෙම කොටසේදී අප ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනුයේ කේන්ද්‍රයේ බල හවුල්කාරිත්වය පිළිබඳවයි.

කේන්ද්‍රයේ බලය බෙදා ගැනීම පිළිබඳව පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් විය.

අ. සැලකිය යුතු පළාත්බද නියෝජනයක් ඇති දෙවැනි මන්ත්‍රණ සභාවක් ස්ථාපිත කිරීම

ආ. ජනාධිපති අයිති ප්‍රජාවට වඩා වෙනස් ප්‍රජාවකින් පාර්ලිමේන්තුව මගින් උප ජනාධිපති කෙනෙක් තෝරා ගැනීම.

ඇ. විවිධ ප්‍රජාවන්ගේ ප්‍රබලත්වය පිළිබිඹු වන ආකාරයට අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය සකස් කිරීම

දෙවැනි සභාව ප්‍රධාන වශයෙන් පිට පළාත්වල නියෝජිතයන්ගෙන් සමන්විත යුතුයයි යෝජනා කරන ලදී. දෙවැනි සභාවක් යෝජනා කරන බොහෝ දෙනෙකුගේ අදහස වූයේ එය පළාත්බද නියෝජිතයන්, විශේෂඥයින්, විද්වතුන්, වෘත්තිකයන්, අධිකරණ සේවයේ විශ්‍රාමික සාමාජිකයන්, විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් සහ වාණිජ මණ්ඩල හා වෘත්තිය සමිති සාමාජිකයන් ආදීන්ගෙන් සමන්විත විය යුතු බවයි. ඌන නියෝජනයක් ඇති කණ්ඩායම්වල සාමාජිකයන් ද, දෙවැනි සභාවට ඇතුළත් කළ යුතු යැයි යෝජනා විය.

අප ඉදිරියට පැමිණි බොහෝ දෙනෙක් ප්‍රකාශ කළ අදහස්වලින් පෙනී ගියේ දෙවැනි මන්ත්‍රණ සභාවක් පිහිටුවීම, සුළුතර කණ්ඩායම් හා ඌන නියෝජනයක් සහිත කණ්ඩායම්වල ගැටලුවලට පිළිතුරු ලබා දීමට අවස්ථාවක් වනු ඇති බවයි. පළමු වැනි මන්ත්‍රණ සභාවේ බහුතරවාදී ප්‍රවණතා වැළැක්වීමට දෙවැනි සභාව යොදා ගත හැකි යැයි ද, තර්ක කරන ලදී. මෙහිදී සුළුතරය ලෙස දක්වන්නේ ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් පමණක් නොව කුඩා ජනවාර්ගික හා සංස්කෘතික කණ්ඩායම් (මැලේ, ආදිවාසී, බර්ගර් ආදී) මෙන්ම ආගමික හා කුල කණ්ඩායම්ය. පළමු සභාවේ ඉතිහාසය පුරා ඌන නියෝජනයක් දක්වන කාන්තාවන්ට ද, දෙවැනි සභාවෙන් සමාන නියෝජනයක් සහතික කළ හැකි වේ.

### 8.1.1 **සෝල්බරි ව්‍යවස්ථාවේ දෙවැනි මන්ත්‍රණ සභාවේ අත්දැකීම්**

දෙවැනි මන්ත්‍රණ සභාවක් සඳහා නිර්දේශ සකස් කිරීමේදී, සෝල්බරි ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලද උත්තර මන්ත්‍රී මණ්ඩලයේ ඇතැම් සීමාවන් පිළිබඳව අපගේ අවධානය යොමු කළෙමු. උත්තර මණ්ඩලයට සාමාජිකයන් පත් කරන ලද්දේ පාර්ලිමේන්තුවෙන් බැවින් ඔවුන්ගේ ස්වාධීනත්වය ප්‍රශ්න කරනු ලැබීය.

නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉදිරිපත් කිරීමට පෙර උත්තර මන්ත්‍රී මණ්ඩලයත්, ප්‍රිවි කවුන්සලයට අභියාචනා ඉදිරිපත් කිරීමේ පහසුකමත්, ඉවත් කරන ලද්දේ යෝජිත නව ව්‍යවස්ථාවට උත්තර මන්ත්‍රී මණ්ඩලයෙන් හා ප්‍රිවි කවුන්සිලයෙන් බාධා කරනු ඇතැයි එදා පැවති රජය බියවූ බැවින් යැයි ද තර්ක කළ හැකි වේ.

එය පිහිටුවීමේදී අපේක්ෂා කළ ආකාරයට එහි වගකීම් ඉටු කරමින් සුළුතර කණ්ඩායම්වලට තරමක ආරක්ෂාවක් ලබා දීමට උත්තර මන්ත්‍රණ සභාව සමත් වුවත්, සමහරුන්ට අනුව එය අසමත්වූ එක් අවස්ථාවක් නම් රටට අසීමිත ඵල විපාක ගෙන දුන් සිංහල පමණක් පනත කිසිම අභියෝගයකින් තොරව සම්මත කිරීමයි.

### 8.1.2 **දෙවැනි මන්ත්‍රණ සභාවේ අරමුණු හා අභිප්‍රාය**

ඉහත සඳහන් කළ කරුණු අනුව දෙවැනි මන්ත්‍රණ සභාවක අරමුණු හා අභිප්‍රාය පහත දැක්වෙන ආකාරයට විය යුතුය යන්න අපගේ අදහසයි.

1. සුළුතරයන් හා ඌන නියෝජනයක් ඇති ප්‍රජාවන් හා ඔවුන්ගේ ඵල ප්‍රයෝජනයන් හි ආරක්ෂාව තහවුරු කිරීම

2. රාජ්‍යය, ප්‍රජාතන්ත්‍රීකරණය සඳහා රුකුල් දීම හා ව්‍යවස්ථාදායකයට සංවරණ සහ තුලන ක්‍රම සැපයීම
3. පළමුවැනි මන්ත්‍රණ සභාවෙන් පැමිණෙන අධිකාරීවාදී හා බහුතරවාදී ප්‍රවණතා සීමා කිරීම.
4. රාජ්‍යයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට විශේෂඥයින්ගේ හා වෘත්තිකයන්ගේ සේවය ලබා ගැනීම.

## 8.2 නිර්දේශ

1. සාමාජිකයන් 75 දෙනෙකුගෙන් සමන්විත දෙවැනි මන්ත්‍රණ සභාවක් (උත්තර මණ්ඩලයක් හෝ සෙනෙට් සභාවක්) කමිටුව නිර්දේශ කරයි[23]. කෙසේ වෙතත් එහි සංයුතිය සම්බන්ධයෙන් කමිටු සාමාජිකයන් අතර වෙනස් මත තිබේ.

i) කමිටු සාමාජිකයන් සමහර දෙනෙකුට අනුව දෙවැනි මන්ත්‍රී මණ්ඩලය පහත දැක්වෙන අයගෙන් සමන්විත විය යුතු ය[24].

අ. පළාත් සභාවල මහ ඇමතිවරුන් (9)

ආ. කේවල ඡන්ද ක්‍රමය හරහා පළාත් සභිකයන්, පළාතේ මහ නගර සභාවල නගරාධිපතිවරුන් සහ උප නගරාධිපතිවරුන්. පළාතේ සියළුම නගර සභා සහ ප්‍රාදේශීය සභාපතිවරුන් හා උපසභාපතිවරුන් විසින් පළාතෙන් තෝරා පත් කර ගන්නා වෙනත් සාමාජිකයන් හය දෙනෙක්

ii) කමිටුවේ අනිත් සාමාජිකයන්ගේ අදහස වන්නේ දෙවැනි මන්ත්‍රණ සභාවේ සංයුතිය මෙසේ විය යුතු බවයි;[25]

අ. පළාත් සභාවෙන් යෝජනා කරන සෑම පළාත් සභාවකින් ම එක් සාමාජිකයෙක් බැගින් (මහ ඇමති විධායකයට අයත් වන බැවින් ඔහු නීති සම්පාදක ආයතනයක නො සිටිය යුතුය යන්න මොවුන්ගේ තර්කය විය)

---

[23] එම්.එල්.ඒ.කාදර්; එම්.කේ. නදීකා දමයන්ති; එස්.සී.සි. ඉළංකෝවන් සහ කුමුදු කුසුම් කුමාරගේ අදහස වූයේ දෙවැනි මන්ත්‍රණ සභාවේ සාමාජිකයන් ගණන 75ට අඩු විය යුතු බවයි.

[24] උපුල් අබේරත්න; එම්.කේ.නදීකා දමයන්ති; සිරිමසිරි හපුආරච්චි; සුනිල් ජයරත්න; වින්ස්ටන් පතිරාජ; එන්. සෙල්වක්කුමාරන්; ලාල් විජේනායක

[25] හරිනි අමරසූරිය; කුෂාන් ද අල්විස්; ඒ.එම්. නවරත්න බණ්ඩාර; එස්.සී.සී. ඉළංකෝවන්; එම්.වයි.එම්.ෆායිස්; කුමුදු කුසුම් කුමාර; කාන්ති රණසිංහ; එස්.තවරාජා; එස්.විජේසන්දිරන්

ආ. කේවල ඡන්ද ක්‍රමය හරහා පළාත් සභිකයන්, පළාතේ මහ නගර සභාවල නගරාධිපතිවරුන් සහ උප නගරාධිපතිවරුන්. පළාතේ සියළුම නගර සභා සහ ප්‍රාදේශීය සභාපතිවරුන් හා උපසභාපතිවරුන් විසින් පළාතෙන් තෝරා පත් කර ගන්නා වෙනත් සාමාජිකයන් හය දෙනෙක්

iii) කමිටුවේ සාමාජිකයන් දෙදෙනෙකු තවදුරටත් යෝජනා කළේ දෙවැනි මන්ත්‍රණ සභාවක් පිහිටුවීමේ මූලික අරමුණ බහුතරවාදී පාර්ලිමේන්තු පද්ධතියෙන් සුළු ජාතික අපේක්ෂාවන් ආරක්ෂා කිරීම බවයි. මේ නිසා පහත දැක්වෙන දෑ සහතික කිරීමේ ක්‍රමයක් දෙවැනි සභාවේ තිබිය යුතුය.

අ. දෙවැනි මන්ත්‍රණ සභාවේ සියලු සුළුතර නියෝජිතයන් එකට එක් කළ විට එය බහුතර ප්‍රජාවේ නියෝජනයට වඩා අඩු නොවිය යුතුය.

ආ. සුළුතර ප්‍රජාවන්ට බලපාන පනත් සම්බන්ධයෙන් දෙවැනි සභාවේ බර තබන ලද ඡන්ද ක්‍රමයක් පවත්වා ගැනීම.[26]

iv) වෘත්තිය සමිති. සමාජ ව්‍යාපාර, වෘත්තිකයන්ගේ සංගම් ආදියෙන් තනි ඡන්දය පැවරිය හැකි ඡන්ද ක්‍රමය යටතේ පාර්ලිමේන්තුවෙන් සාමාජිකයන් හය දෙනෙක් නම් කිරීම.

v) ආගමික හා සංස්කෘතික කණ්ඩායම් ඇතුලු පහළ මන්ත්‍රණ සභාවේ ප්‍රමාණවත් ලෙස නියෝජනය නො වන ප්‍රජාවන් හා සුළුතරයන් අතරින් හය දෙනෙක් අගමැතිගේ උපදෙස් පිට ජනාධිපති විසින් පත් කිරීම.

vi) දෙවැනි සභාවේ සාමාජිකයන්ගෙන් තුනෙන් එකකට නො අඩු ප්‍රමාණයක් කාන්තාවන් විය යුතුය.

vii) සාමාජිකයන් නම් කිරීමේදී විවිධ දේශපාලන මතවාද නියෝජනය කරන කුඩා දේශපාලන පක්ෂ පිළිබඳ ව ද සැලකිල්ල යොමු කළ යුතුය.[27]

දෙවැනි මන්ත්‍රණ සභාව සම්බන්ධයෙන් පහත දැක්වෙන නිර්දේශ ද, කමිටුව ඉදිරිපත් කරයි.

[26] එස්.තවරාජ; එස්.විජේසන්දිරන්
[27] සිරිමසිරි හපුආරච්චි; එස්.විජේසන්දිරන්

2. දෙවැනි සභාවේ සාමාජිකයන්ගේ උපරිම නිල කාලය අවුරුදු හයක් වන අතර සෑම කණ්ඩායකම සාමාජිකයන් තුනෙන් එකක් දෙවැනි අවුරුද්ද අවසානයේ හා හතරවැනි අවුරුද්ද අවසානයේ සාමාජිකත්වයෙන් ඉවත් විය යුතුය. සෑම අවුරුදු දෙකකට වරක් ඉවත් වන සාමාජිකයන් කුසපත් ඇදීමෙන් තෝරා ගත යුතුය.
3. දෙවැනි, හතරවැනි හා හයවැනි අවුරුදුවල සාමාජිකත්වය අවසන් වන සාමාජිකයන් වෙනුවට ඉවත් වූ සාමාජිකයන් නියෝජනය කළ කණ්ඩායම්වලින් අලුත් සාමාජිකයන් පත් කළ යුතුය.
4. පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කළ ඕනෑ ම සාමාජිකයෙක්, සාමාජිකත්වය දැරිය යුත්තේ මුල් සාමාජිකයාගේ ධුර කාලය අවසන් වන තුරු පමණි.
5. රටේ සිටින විශිෂ්ට පුද්ගලයන් අතරින් කෙනෙක් ව්‍යවස්ථාදායක මණ්ඩලය සමග සාකච්ඡා කර ජනාධිපති විසින් දෙවැනි මන්ත්‍රණ සභාවේ සභාපති ලෙස පත් කළ යුතුය. සභාපති වර්ෂ 6ක කාලයකට මෙම තනතුර දරනු ඇත.

# 9 පරිච්ඡේදය

# බලය බෙදාහැරීම

බලය බෙදාහැරීමේ ඒකකය හා බලය බෙදා හැරීමේ විෂය පථය මෙම පරිච්ඡේදයේ දී සාකච්ඡා කෙරේ.

## 9.1 බලය බෙදාහැරීමේ ඒකකය

### 9.1.1 ඉදිරිපත් කළ අදහස්

උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ ප්‍රජාව කළ කරුණු දැක්වීම්වලදී උතුරු නැගෙනහිර පළාත් සහා ඒකාබද්ධ කිරීම පිළිබඳ ප්‍රශ්නය මතු කරන ලදී. මෙහිදී ප්‍රධාන තර්කය වූයේ උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීම 1987 ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුමේ අඩංගු කොන්දේසියක් බව හා ගිවිසුමේ සඳහන් ආකාරයට ජනමත විචාරණයකින් තොරව එය වෙනස් කිරීම ආ පස්සට යෑමක් බවත්, එය ගිවිසුම කඩ කිරීමක් බවත්ය.

එක් දේශපාලන ඒකකයක් ලෙස උතුරු සහ නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීම සාධාරණීකරනය කරනු ලබන්නේ මෙම පළාත් ඓතිහාසික යථාර්තයන් පදනම් කරගෙන දෙමළ ජනයාගේ සම්ප්‍රදායික වාසභූමි ලෙස සැලකිය යුතුය යන මතය පදනම් කරගෙනය. මෙය දෙමළ ජනයාගේ ආරක්ෂාව තහවුරු කරන ප්‍රධාන දේශපාලන ඉල්ලීම ලෙස සැලකේ. මේ නිසා උතුරේ හා නැගෙනහිර දෙමළ ප්‍රජාවේ අභිලාෂය වන්නේ, ස්වයං පාලනයක්ය යන අදහස මේ සමග බැඳී පවතී.

කෙසේ වෙතත් මෙම පළාත් දෙක ඒකාබද්ධ කිරීමට මෙන් ම ෆෙඩරල් ක්‍රමයකට ද, නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනයා ප්‍රබල ලෙස විරුද්ධ බව පෙනේ. එසේ නමුත් එම පළාත්වලට ඉහළ ප්‍රමාණයක බලය බෙදාහැරීමක් ඇති කිරීම ගැන ඔවුන් පක්ෂ වේ. නැගෙනහිර සිංහල ප්‍රජාව ද, මෙම පළාත් දෙක එක් කිරීමට විරුද්ධය.

බලය බෙදා හරින ලද ඒකක තුළ අසන්තතික උප ඒකක දෙකක් ද, යෝජනා වී ඇති අතර මෙයින් එකක් ඒකාබද්ධ උතුරු නැගෙනහිර පළාත් තුළ මුස්ලිම් ජනතාව සඳහා ද, දෙවැන්න මධ්‍යම, ඌව සහ සබරගමුව පළාත්වල මලයහ (කඳුරට) දෙමළ ජනයා සඳහා ද, වෙයි. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ තර්කය වූයේ මොවුන් නිශ්චිත ජාතිකත්වයන් වන

බැවින් බලය බෙදා හරින ලද ඒකක තුළ තමන්ගේ කටයුතු සොයා බැලීමේ ඔවුන්ට අවශ්‍ය බවයි.

දෙමළ ජනයාගේ දීර්ඝ කාලීන අභිලාෂ සපුරාලීම සඳහා උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කළ යුතු නම් පොතුවිල්, කල්මුණේ, සමන්තුරේ මෙන් ම කාත්තන්කුඩි, එරාවූර්, ඔඩමාවඩි, කින්නියා, මුත්තූර් හා පුල්මුඩෙයි වැනි අසන්තතික ප්‍රදේශ සඳහා අග්නිදිග ඒකකයක් නැගෙනහිර මුස්ලිම් ජාතිකයන් සඳහා ලබා දිය යුතුයැයි ද, යෝජනා කරන ලදී.

තවත් නව අදහසක් වූයේ ඒකාබද්ධ උතුරු හා නැගෙනහිර පළාත්වලට ප්‍රධාන අමාත්‍යවරුන් දෙදෙනෙක් පත් කිරීමයි. මෙයින් එක් අයෙක් දෙමළ ද, අනිත් තැනැත්තා මුස්ලිම් ද, වන අතර ඔවුන් අතර වගකීම් බෙදා ගනු ඇත.

රටේ සියලු ම පළාත්වලට මුහුදට ප්‍රවේශ විය හැකි ආකාරයට ගංගාධාර පදනම් කර පළාත් පහකට වෙන් කිරීමේ යෝජනාවට ද, බොහෝ පුද්ගලයන් හා කණ්ඩායම් සහයෝගය දැක්වූහ. මෙම අදහස සාධාරණීකරණය කරන ලද්දේ එය ජනවාර්ගික නිර්ණායක මත පදනම් නොවූ, වඩා තර්කානුකූල, පරිසර හිතකාමී හා සංවර්ධන නැඹුරු යෝජනාවක් ලෙසයි. සීමිත කලාපීය ස්වයං පාලනයක් පිළිබඳ සුළු ජාතික අභිලාෂයන් ද, මෙම විසඳුම තුළ අනුගත කළ හැකි වේ.

ශ්‍රී ලංකාවේ අගනුවර අනුරාධපුරය විය යුතු යැයි ද, යෝජනාවක් ඉදිරිපත් විය. මෙම යෝජනාවට ඓතිහාසික පදනමක් ඇති බවත්, රජයේ කටයුතු පුළුල් කිරීම සඳහා යොදා ගත හැකි විශාල ඉඩම් ප්‍රමාණයක් එහි ඇති බවත්, පෙන්වා දෙන ලදි. මෙම අදහස සාධාරණීකරණය කිරීමට යොදා ගත් තවත් සාධකයක් වූයේ රටේ සියලු ම කොටස්වලින් ඒ වෙත පහසුවෙන් ළඟා විය හැකි බවත්, එය ශ්‍රී ලංකාවේ කේන්ද්‍රීය ස්ථානයක් බවත්ය.

බලය බෙදා හැරීමේ ඒකකය සම්බන්ධයෙන් මහජනයාගෙන් ලැබුණු අදහස් සාරාංශයක් ලෙස පහත දක්වමු.

- වර්තමාන පළාත් නමය බලය බෙදා හැරීමේ ඒකක ලෙස පවත්වා ගැනීම
- උතුරු හා නැගෙනහිර පළාත් එක ඒකකයක් ලෙසත්, දකුණේ පළාත් එක ඒකකයක් ලෙසත්, ඒකාබද්ධ කිරීම
- උතුරු හා නැගෙනහිර පළාත් එක් ඒකකයක් ලෙස ඒකාබද්ධ කිරීම හා අනිකුත් පළාත් හත වෙන ම ඒකක ලෙස පවත්වා ගැනීම

- අදාළ පළාත්වල පවත්වන ජනමත විචාරණයක් තුළින් පළාත් ඒකාබද්ධ වීමට ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයකින් ඉඩ ලබා දිය යුතුය.
- උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කර 1978ට පෙර තිබූ ආකාරයට ඒවායේ මායිම් ලකුණු කළ යුතුය.
- උතුරු හා නැගෙනහිර පළාත් එක් ඒකකයක් ලෙස ඒකාබද්ධ කළ යුතු අතර පළාතේ දේශ සීමාවට අවට මුහුද ද, ඇතුළත් විය යුතුය (නාවික සැතපුම් 12ක් දක්වා).
- කලාපීය ඒකක තුනක් පිහිටුවීම - (බටහිර හා දකුණ), (උඩරට) හා (උතුරු නැගෙනහිර)
- සෑම පළාතකට ම මුහුදු ප්‍රවේශයක් ලැබෙන ආකාරයට ගංගාධාර පදනම් කර ගනිමින් පළාත් පහකට බෙදීම.
- රජයේ දෙවැනි ස්තරය ලෙස, බලය බෙදා හැරීමේ ඒකකය දැනට පවතින දිස්ත්‍රික්ක විය යුතු ය.
- රජයේ දෙවැනි ස්තරය ලෙස, පවතින පළාත් පාලන ප්‍රදේශවලට බලය පැවරීම
- උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කළහොත් අසන්තතික මුස්ලිම් ප්‍රදේශ බලය බෙදා හැරීමේ එක් උප ඒකකයක් විය යුතුය.
- මධ්‍යම ඌව හා සබරගමුව පළාත්වල අසන්තතික මලයහ (කඳුරට දෙමළ) ප්‍රදේශ බලය පවරන එක් උප ඒකකයක් විය යුතුය.
- ඒකක, වාර්ගික හා භෞමික අනන්‍යතා පිළිගත යුතුය. කලාප පහක සහසන්ධීයත්වයක් සඳහා පහත දැක්වෙන ආකාරයට ඒකක පිහිටුවිය යුතුය: උතුරු-නැගෙනහිර දෙමළ; මුස්ලිම්; ක්‍රිස්තියානි හා කතෝලික තීරුව සඳහා විශ්වදේශ කොළඹ; සිංහල බෞද්ධ; මලයහ (කඳුරට) දෙමළ
- ඒ ඒ ප්‍රදේශවල ආර්ථික ශක්තිය මත පදනම්වූ ඒකක: කර්මාන්ත හා නිෂ්පාදන (බස්නාහිර හා වයඹ) කෘෂිකර්මය (උතුර, නැගෙනහිර හා උතුරු මැද) වතු (මධ්‍යම හා ඌව) සංචාරක ( නැගෙනහිර හා දකුණ)

අප වෙත ලැබුණු මෙම විවිධ අදහස්වලින් පෙනී ගියේ බලය පවරන ඒකකය පිළිබඳව ජනතාවට කනස්සල්ලට විවිධ කරුණු ඇති බවයි.

- උතුරු හා නැගෙනහිර පළාත්වල තත්ත්වය කුමක් ද? ඒවා ඒකාබද්ධ කළ යුතු ද? නැද්ද?
- උතුරු නැගෙනහිර ඒකාබද්ධ කළහොත් නැගෙනහිර සුළු ජනවාර්ගික ප්‍රජාවන්ගේ තත්ත්වය කුමක් ද?
- ඒකක බෙදීම ජනවාර්ගික නොවන පදනමකින් කළ හැකි ද?
- විශේෂයෙන් ම උතුරු හා නැගෙනහිර දෙමළ ජනයා ඇතුළු ජනතාවගේ දේශපාලන ඉල්ලීම් අපි විසින් සපුරා ලන්නේ කෙසේ ද?
- පළාත්/කලාපීය ඒකක වෙත් කිරීමේ වඩා සබුද්ධික සංවර්ධනයට නැඹුරු ක්‍රමයක් තිබේ ද?

වැඩියෙන් ම විවාදයට තුඩු දුන් කරුණ වූයේ උතුරු නැගෙනහිර පළාත් ඒකාබද්ධ කිරීමයි. පරිපාලන කටයුතු සඳහා යාබද පළාත් දෙකකට හෝ තුනකට ඒකාබද්ධ වීමට දැනටත් ව්‍යවස්ථාමය ප්‍රතිපාදන ඇති බව බොහෝ දෙනෙක් දැන සිටියේ නැත.[28] උතුරු නැගෙනහිර ඒකාබද්ධ කිරීමට යෝජනා කළ අය මෙන් ම එයට විරුද්ධ වූ අය ද, මෙය වරදවා වටහා ගෙන තිබුණි. ජනතාව උතුරු නැගෙනහිර ඒකාබද්ධ කිරීම දකින්නේ දේශපාලනමය ඒකාබද්ධ වීමක් ලෙස මිස, පරිපාලන කටයුතු සඳහා ඒකාබද්ධ වීමක් ලෙස නොවේ. ඒකාබද්ධ පළාතක ඔවුන් සුළුතරයක් වන බැවින් නැගෙනහිර මුස්ලිම් ජනතාව කිසි ම ඒකාබද්ධ කිරීමකට විරුද්ධ විය. නැගෙනහිර මෙන් ම වෙනත් ප්‍රදේශවල සිංහල ජනයා කුමන ආකාරයක හෝ ඒකාබද්ධ කිරීමකට විරුද්ධ වූයේ එය වෙන ම රාජ්‍යයක් පිහිටුවීමට දෙමළ ජනතාවට අයිතියක් ලබා දීමක් ලෙස දුටු බැවිනි.

ස්වයංපාලන උප ඒකක ප්‍රධාන වශයෙන් ම ඉල්ලා සිටියේ කඳුරට දෙමළ හා මුස්ලිම් ජනතාවයි. බහුතර දෙමළ පළාතක තමන් උපගුහණය වේය යන බිය මුස්ලිම් ජනයාගේ මෙම ඉල්ලීමට බලපෑ බව පෙනේ. මලයහ (කඳුරට) දෙමළ ජනයා මෙම ඉල්ලීම කළේ වතුවල ජීවත්වන ඔවුන් බලය බෙදීමේ හෝ සංවර්ධන ක්‍රියාවලියෙන් සම්පූර්ණයෙන් ම කොන් කර තිබීම නිසාය. ඔවුන් ගැන වගකීම ඇත්තේ වතු කළමනාකරණයට යැයි සලකන බැවින් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමක් සිදු නොවීය. මූලික වශයෙන් ඔවුන්ගේ ඉල්ලීම වූයේ රටේ දේශපාලන හා සංවර්ධන ක්‍රියාදාමයට සම්බන්ධ වීමේ අවශ්‍යතාවයි.

---

[28] වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(අ) 3 ව්‍යවස්ථාව

ජනවාර්ගික ප්‍රජාවක් ලෙස ඔවුන් කියා සිටියේ ඔවුන් ඓතිහාසික වශයෙන් කොන් කළ සුළුතරයක් වූ අතර ඔවුන්ගේ අයිතිවාසිකම් හා අපේක්ෂාවන් මෙන් ම සුබ සාධනයට බලපෑමක් කරන සංවර්ධන වැඩ සටහන් වලට හෝ දේශපාලන බලය බෙදා ගැනීමට අවස්ථාවක් නො ලැබුණු බවයි. මෙම හේතු නිසා ඔවුන්ගේ ඉල්ලීම වූයේ මධ්‍යම පළාත් සභාව තුළ භෞමික සීමා මත පදනම්වූ උප ඒකකයක් ලබා දිය යුතුය යන්න යි. භෞමික වශයෙන් සම්බන්ධ නොවූ එහෙත් සංස්කෘතික වශයෙන් එක ම ප්‍රජාවක් වන අසන්තතික ප්‍රදේශවල ජීවත්වන අය ද මෙයට ඇතුළත් කළ යුතු යයි ඉල්ලා සිටින ලදී.

### 9.1.2 නිර්දේශ

ඉහත සඳහන් කරුණු මත පදනම් ව පහත දැක්වෙන විකල්ප විසඳුම් ඉදිරිපත් කෙරේ.

1. පරිපාලන කටයුතු සඳහා යාබද පළාත් එකකට හෝ වැඩි ගණනකට ජනමත විචාරණයක් තුළින් එක් ව්‍යූහයක්/ඒකකයක් ලෙස එක් වීමට ඇති විකල්පය සහිතව දැනට ඇති පළාත් නමය පවත්වා ගැනීම. 154අ(3) ව්‍යවස්ථාව ඒ ආකාරයටම තබා ගත යුතුය.[29]
2. දැනට ඇති පළාත් නවය තබා ගැනීම. කුමන ඒකක අතරවත් ඒකාබද්ධ වීමකට ඉඩ නොදිය යුතුයි. මේ නිසා 154අ(3) ව්‍යවස්ථාව ඉවත් කිරීම හෝ යෝජිත ව්‍යවස්ථාවේ එය ඇතුළත් නොකිරීම.[30]
3. විධායකයේ හා ව්‍යවස්ථාදායකයේ සුළුතර කණ්ඩායම්වල සහභාගීත්වය හා නියෝජනය සහතික කිරීමට පළාත් මට්ටමේ බල හවුල්කාරිත්වය සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සහිත ව දැනට පවතින පළාත් නවය තබා ගැනීම.[31]
4. අදාළ පළාත්වල පවත්වන ජනමත විචාරණ තුළින් යාබද පළාත්වලට ඒකාබද්ධ වීමට ඉඩදෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහිත ව පවතින පළාත් නවය ඒ ආකාරයට ම තබා ගැනීම. පළාත්වල විධායකයේ හා ව්‍යවස්ථාදායකයේ සුළුතර කණ්ඩායම්වල ප්‍රමාණවත් නියෝජනයක් ඇතිබව සහතික කිරීමේ ප්‍රතිපාදන තිබිය යුතුය. නැගෙනහිර මුස්ලිම් ජාතිකයන්ට හා මධ්‍යම පළාතේ මලයහ (කඳුරට) දෙමළ ජනයාට අභ්‍යන්තර ස්වයං පාලන ඒකක සාදා ගැනීමට ඉඩ දිය යුතුය. මලයහ දෙමළ ප්‍රජාවේ ස්වයං පාලන ඒකකය/ මණ්ඩලයට ඔවුන්ට බලපාන ආර්ථික, සමාජ, සංස්කෘතික, ආගමික හා සිවිල් කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය තිබිය

[29] එස්.සී.සී. ඉළංකෝවන්; කුමුදු කුසුම් කුමාර; වින්ස්ටන් පතිරාජ; එන්.සෙල්වක්කුමාරන්; ලාල් විජේනායක
[30] එම්.කේ. නදීකා දමයන්ති; එම්.වයි.එම්. ෆායිස්; තේමිය එල්.බී. හුරුල්ලේ; කාන්ති රණසිංහ
[31] උපුල් අබේරත්න; හරිනි අමරසූරිය; ඒ.එම්. නවරත්න බණ්ඩාර

යුතුය. ඔවුන්ගේ ප්‍රජාවේ ජීවිතවලට බලපෑමක් කරන නිශ්චිත කරුණු සම්බන්ධයෙන් මෙම ඒකකයට/ මණ්ඩලයට නීති සම්පාදක හා විධායක බලතල තිබිය යුතු වේ.[32]

5. ඒකීය රාජ්‍යය තුළ  රාජ්‍ය කේන්ද්‍රයේ බලය රැඳී තිබිය යුතුය. මධ්‍යම රජයට, පළාත්වලට බලය පැවරිය හැකි නමුත්  පැවරූ ඒකකයේ එකඟතාවකින් තොරව එම බලය ආපසු ගැනීමට මධ්‍යම රජයට හැකි විය යුතුය. ව්‍යවස්ථාදායකයේ හා පාර්ලිමේන්තුවේ උත්තරීත්වය  සහතික කළ යුතුය.  පවතින පළාත් නවය ඒ ආකාරයට ම තිබිය යුතුය. කිසිම පළාතකට දේශපාලන හෝ පරිපාලනමය වශයෙන් ඒකාබද්ධ වීමට ඉඩ නොදිය යුතුය. මේ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(අ)3 ව්‍යවස්ථාව ඉවත් කළ යුතු අතර එයට සමාන ප්‍රතිපාදනයක් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු නො කළ යුතුය. භාෂාව, ජාතිය, ආගම හෝ ජනවර්ගය මත පදනම් ව  කිසිම බලය පවරන ඒකකයක් නිර්මාණය නො කළ යුතුය.[33]
6. ජාතික ධනය හා ස්වාභාවික සම්පත් සමාන ලෙස බෙදී යන ආකාරයට භූගෝලීය, සමාජ-ආර්ථික හා ජන විද්‍යාත්මක සාධක  සැලකිල්ලට ගනිමින් තාර්කික පදනමක් මත බලය බෙදා හැරීමේ ඒකකයේ සීමා නියම කළ යුතු වේ.  මෙම ඒකක  ජාති, ජනවාර්ගික-ආගමික හෝ භාෂාමය කරුණු මත පදනම්ව පිහිටුවිය යුතු නොවේ.[34]

## 9.2 බලය බෙදා හැරීමේ විෂය පථය

### 9.2.1 ඉදිරිපත් කළ අදහස්

මෙම කොටසේ සාකච්ඡාවට භාජනය වන්නේ විශේෂයෙන් ම පළාත්/කලාපීය මට්ටමට බෙදාහරින බලයේ විෂය පථයයි. මෙය හේතු දෙකක් නිසා දේශපාලන මතභේදයට තුඩු දෙන කරුණක් බවට පත්වී තිබේ. පළමුවැන්න වන්නේ එය ප්‍රතිසන්ධාන ගැටලුවට අවිසර්ජනීය ලෙස  බැඳී තිබීමයි.  දෙවැනි හේතුව වන්නේ පළාත් සභා ක්‍රමය අසාර්ථක වී ඇත යන මතයයි.

මෙම කොටසේදී  අප පළාත්/කලාපීය ඒකකයේ ආණ්ඩුකාර, විධායකය, අධිකරණ හා නීති සම්පාදක අංශවලට පැවරෙන  බලය ගැන සාකච්ඡා කරමු. විශේෂයෙන් ම  මෙහිදී අර්බුදකාරී ගැටලු දෙකක් වන බලය පැවරූ ඒකකවල ඉඩම් හා පොලිස් බලතල ලබාදීම සාකච්ඡා කරමු.

[32] එස්.තවරාජා; එස්.විජේසන්දිරන්; එම්.එල්.ඒ.කාදර්
[33] කුෂාන් ද අල්විස්, ජා.නී; සිරිමසිරි හපුආරච්චි
[34] සුනිල් ජයරත්න

මෙයට පෙර ද සඳහන් කර ඇති පරිදි පළාත් සභාවල ඵලදායිතාව ගැන ජනතාවට ඇත්තේ විවේචනාත්මක ආකල්පයකි. සමහරුන්ගේ මතය වී ඇත්තේ මෙම තත්ත්වයට හේතුව 13වැනි සංශෝධනය යටතේ පළාත් සභාවලට පැවරූ බලය ප්‍රමාණවත් නොවීම බවයි. මෙහිදී විශේෂයෙන් ම මූල්‍ය සම්පත් හිඟය, මූල්‍ය කළමනාකරණයේ ස්වාධීනත්වය, ප්‍රඥප්ති සම්පාදනයේ සීමා හා ආණ්ඩුකාරයාට පැවරී ඇති බලතලවල අහිතකර බලපෑම ආදිය මෙම තත්ත්වයට හේතු විය. මේ නිසා පළාත් සභාවලට ජනයාගේ හඳුනාගත් ප්‍රශ්න පිළිබඳ ව ක්‍රියා කිරීමටත්, පළාතේ සම්පත් යොදා ගනිමින් ඒවාට විසඳුම් ලබා දීමටත්, නොහැකි විය. ආණ්ඩුකාරයාගේ ක්‍රියා කලාපය විවේචනය කළ සමහරුන් කියා සිටියේ ඔහු ජනාධිපතිගේ නියෝජිතයෙක් ලෙස සැලකූ නිසා ප්‍රධාන අමාත්‍යවරයාගේ හා පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ බලතල යොදා ගත් බවයි. එහෙයින් ආණ්ඩුකාරයා කටයුතු කළ යුත්තේ ජනතා ඡන්දයෙන් තේරී පත්වූ ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් අනුව විය යුතු යැයි යෝජනා කරන ලදී.

ජනතා අපේක්ෂා ඉටු කිරීමට පළාත් සභා අසමත්වී ඇති බව ගැන කිසි ම සැකයක් නැත. සමහරුන්ගේ අදහස වූයේ මෙයට ප්‍රධාන හේතුව 13වැනි සංශෝධනයේ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක නොකිරීම බවයි. බලය පැවරීම සම්බන්ධයෙන් ඇති බාධක හා 13 වැනි සංශෝධනයේ ආවේණික දුර්වලකම් ද, මෙයට හේතු වූ බව පෙනේ. පළාත් සභා ලැයිස්තුව, සංවෘත ලැයිස්තුව හා සමගාමී ලැයිස්තුව යනුවෙන් ලැයිස්තු තුනක් යටතේ බලය බෙදාහැරීමේ මෙවැනි එක් දුර්වලතාවකි. ලැයිස්තු තුන අතර විෂය වෙන් කිරීම පැහැදිලි නොවූ අතර සමගාමී ලැයිස්තුව, බලය පැවරීම පිළිබඳ සංකල්පයට බාධාවක් විය. බොහෝ අය යෝජනා කළේ පළාත් සභා ක්‍රමය අර්ථාන්විත වීමට නම් සමගාමී ලැයිස්තුව අහෝසි කර හැකි තාක් දුරට එය (විෂයයන් කීපයක් හැර) පළාත් සභා ලැයිස්තුවට ඇතුළත් කරන ලෙසයි.

බොහෝ දෙනෙක් අදහස් ඉදිරිපත් කළේ සමමිතික බලය පැවරීමක් පිළිබඳ ව වන නමුත් සමහරෙකු උතුරු හා නැගෙනහිර පළාත්වලට අසමමිතික බලය පැවරීමක් ගැන තර්ක කළහ. ඔවුන්ගේ අදහස වූයේ පළාත් සභා ක්‍රමය ඇති වූයේ දෙමළ ජාතිකයන් ඇතුළු සංඛ්‍යාත්මක වශයෙන් කුඩා කණ්ඩායම්වලට අහිතකර ලෙස බලපෑ එක් ප්‍රජාවක් මත බලය ඒකරාශිවීමේ අමිහිරි අත්දැකීම්වලින් පසුව, උතුරු නැගෙනහිර පළාත්වලට බලය පවරන ලෙසට දෙමළ ජාතිකයන් ගෙන ගිය දීර්ඝ සටනේ ප්‍රතිඵලයක් ලෙස බවය. මේ නිසා බලය පැවරීමේදී උතුරු නැගෙනහිර පළාත් පිළිබඳ ව විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුයයි අවධාරණය කරන ලදී.

තවත් මතයක් වූයේ උතුරු හා නැගෙනහිර පළාත් හැර අනිත් දිස්ත්‍රික්කවල ජීවත්වන බහුතර ප්‍රජාව පළාත් සභා ක්‍රමයක් ඉල්ලා සිටියේ නැති බවත්, මෙය ඔවුන් පිට බලෙන් පැටවූ දෙයක් බවත්ය. පළාත්වලට සමමිතික ලෙස බලය බෙදා හැරීම අසාර්ථක වී ඇත්තේ රටේ දකුණු හා බස්නාහිර කොටස්වල බලය බෙදාහැරීමේ ආදර්ශයකට හේතුවක් නැති නිසාය.

මේ අනුව උතුරු හා නැගෙනහිර පළාත්වලට අසමමිතික ලෙස බලය පැවරීමේ යෝජනාවක් ඉදිරිපත් වූ අතර එය අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සෑදීමේ ක්‍රියාමාර්ගයට පටහැණි නොවේ.

කරුණු දෙකක් ඉතා අර්බුදකාරී බව පෙනුණි. ඒවා නම් පළාත්/කලාපීය මට්ටමට පොලිස් හා ඉඩම් බලතල ලබා දීමයි. අප ඉදිරියේ කරුණු දැක්වූ අය මේ සම්බන්ධයෙන් පළ කළ අදහස් විස්තරාත්මකව පහත දක්වමු.

### 9.2.1.1 පොලිස් බලතල

අප ඉදිරියට පැමිණි සමහරෙකුට ඉඩම් හා පොලිස් බලතල පළාත් සභාවලට ලබා දීම සම්බන්ධයෙන් බොහෝ සැක සංකා තිබුණි. පළාත් සභාවට නියම ලෙස ක්‍රියා කිරීමට මෙම බලතල අවශ්‍ය බව පිළිගත් අය පවා පළාත් සභාවලට අනවශ්‍ය බලතල ලබා දීම ගැන සැක පළ කළහ.

විවාදය ඇත්තේ මෙම බලතල තිබිය යුත්තේ පළාත් සභාවේ ද? මධ්‍යම ආණ්ඩුවේ ද? යන්න පිළිබදවයි. මෙය රටේ දේශපාලනඥයින් බෙදා වෙන් කරන තවත් ආරවුලක ආරම්භයයි.

පළාත් ඒකකයට පොලිස් බලතල පැවරිය යුතු යැයි තර්ක කරන අය පෙන්වා දෙන්නේ එය දැනටමත් ව්‍යවස්ථාවේ 13වැනි සංශෝධනයේ අඩංගු කරුණක් බවයි. මේ නිසා අවශ්‍ය වන්නේ ව්‍යවස්ථාවේ 13වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමයි. අනිත් අතට තර්ක කරන අය ඉල්ලා සිටින්නේ මෙම ප්‍රතිපාදන ඉවත් කර ගන්නා ලෙසත්, මෙම බලතල ක්‍රියාත්මක කිරීම මධ්‍යම රජයේ කාර්යයක් විය යුතු බවත්ය. ප්‍රධාන වශයෙන් යාපනයේ ආන්තික කුල වෙනුවෙන් පෙනී සිටි සංවිධාන හා පුද්ගලයන් කීප දෙනෙක් ද, උසස් කුල ආධිපත්‍යයක් ඇති උතුරු පළාත් සභාවට පොලිස් බලතල ලබාදීමට විරුද්ධ විය.

මෙම ඉල්ලීම් හා ඒවායේ හරය ගැන අවධානය යොමු කිරීමට පෙර, වටහා ගත යුතු වන්නේ 13වැනි සංශෝධනයේ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලීම, රටේ නීතියේ ආධිපත්‍යය පත්වී ඇති ඛේදජනක තත්ත්වය විදහා පාන බවයි. 1988න් පසු

බලයට ආ එක ම ආණ්ඩුවක්වත් රටේ මූලික නීතියේ මෙම ප්‍රතිපාදන නිසි පරිදි ක්‍රියාත්මක කර නැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වීම සහතික කර ගැනීමට අධිකරණයක් වෙත යෑමට පළාත් සභා ද, උනන්දු වී නැත.

එකිනෙකට ප්‍රතිවිරුද්ධ මෙම මත දෙකට පදනම් වූ සාධක විශ්ලේෂණය කිරීමේදී පහත සඳහන් කරුණු දැක ගත හැකිවේ.

අ) එක් මතයක් වන්නේ පළාත තුළ නීතිය හා සාමය පවත්වා ගැනීම, එම පළාතේ (ඡන්දයෙන්) පත් වූ රජයේ වගකීමක් බවයි. පළාත තුළ නීතිය හා සාමය පවත්වා ගැනීමේ වගකීමෙන් ප්‍රධාන අමාත්‍යවරයාට නිදහස් විය නොහැක. ඔහු/ඇය ජනතාව විසින් තෝරා පත් කරගෙන ඇති බැවින් හා ඔහු/ඇය කෙරෙහි විශ්වාසය තබා ඇති බැවින්, නීතිය හා සාමය පවත්වා ගැනීමට තමාට අධිකාර බලයක් නැතැයි ඔහුට හෝ ඇයට කිව හැකි නොවේ. තර්කානුකූලව බලන විට පළාත තුළ නීතිය හා සාමය සතුටුදායක ලෙස පවත්වා නොගනහොත් පළාත් මට්ටමේ තෝරාපත් කර ගත් ව්‍යවස්ථාදායකයට හා විධායකයට තම කාර්යයන් හා රාජකාරි කාර්යක්ෂම ලෙස හා ඵලදායි ලෙස ඉටු කිරීමට හැකි නොවේ. මේ අනුව පළාත් රජයට එම පළාතේ නීතිය හා සාමය පවත්වා ගැනීම පමණක් නොව ජනතාවට පොරොන්දු වූ අනිත් කරුණු සම්බන්ධයෙන් ද, කටයුතු කිරීමට නොහැකි වනු ඇත. මෙය පළාත් සභා ක්‍රමයේ අරමුණ වූ පළාත්බද ප්‍රජාතන්ත්‍රවාදය ගොඩ නැඟීම කෙරෙහි නිෂේධනීය බලපෑමක් වනු ඇත.

ආ) වර්තමාන තත්ත්වය පිළිබඳ සෑහීමකට පත් නොවීමට තවත් හේතුවක් වන්නේ විශේෂයෙන් ම උතුරු නැගෙනහිර පළාත්වල සේවය කරන පොලිස් නිලධාරීන් බහුතරයකට එම පළාත්වල ජීවත්වන ජනයා කථා කරන භාෂාවෙන් කටයුතු කිරීමට නොහැකි වීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ පළාත්වල නීතිය හා සාමය ආරක්ෂා කරන්නේ අසංවේදී හා අහිතවත් පොලිස් බලකායක් යැයි ජනතාවට හැඟී යන නිසා මෙම ප්‍රදේශවල ජීවත් වන බහුතරයකට යුක්තිය ඉටු කරවා ගැනීමේදී විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවී ඇත. ඒ අතර ප්‍රමාදවීම්, ප්‍රතික්ෂේප කිරීම්, නිසි අවබෝධයක් නොතිබීම හා මූලික හා භාෂා අයිතීන් උල්ලංඝනයවීම ආදිය ද වේ.

ඇ) මෙම පළාත් දෙකේ පොලිස් බලකාය "පොලිසිය ඔබේ මිතුරාය" යන ආදර්ශ පාඨය අනුව කටයුතු නො කරන බව ද කියවේ. එය ජනතාවට "සිවිල්" සේවාවක් ලෙස

කටයුතු කරන්නේ ද නැත. සමහරෙකුගේ නිරීක්ෂණය වී ඇත්තේ එය එම පළාත "අත්කරගෙන සිටින හමුදාවක්" බවයි.

ඈ) පළාත් සභාවලට පොලිස් බලතල ලබා දිය යුතු යැයි කියා සිටි අය පෙන්වා දුන් කරුණක් වූයේ පොලිසිය ඉතා දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බවත්, ඔවුන් තමන්ගේ ක්‍රියාවන්හි නීත්‍යානුකූලබව හෝ ව්‍යවස්ථානුකූල බව පිළිබඳ ව කිසි ම තැකීමකින් තොරව බලයේ සිටින අයගේ මනාපයට අනුව කටයුතු කරන බවයි. කේන්ද්‍රයේ බලවත් අයගේ සහයෝගය ඇත්නම් මෙම නිලධාරීන්ට දඬුවම් නොලබා ඕනෑ ම දෙයක් කළ හැකි වේ. මෙය සත්‍ය නොවිය හැකි වුවත් මෙවැනි හැඟීමක් ඇති වීමට හේතුව කේන්ද්‍රයේ පොලිස් හමුදාව දේශපාලනයෙන් තොර ස්වාධීන ආයතනයක් ලෙස කටයුතු නො කිරීමයි.

ඉ) අනිත් අතට ඉදිරිපත් වූ තර්කයක් වූයේ අන්තවාදීන්ගේ ප්‍රයත්න අසාර්ථක වී ඇතත්, අනාගතයේ උතුරු නැගෙනහිර පළාත් වෙන් කිරීමට තැත් කරන කණ්ඩායම්වලට පළාත් සභා/පරිපාලනය සහයෝගය දීමට ඉඩ ඇති නිසා පොලිසිය ඔවුන් යටතට පත් නො කළ යුතු බවයි. ඔවුන්ගේ ප්‍රධාන තර්කය වූයේ විශේෂයෙන් ම උතුරු නැගෙනහිර පළාත්වලට පොලිස් බලතල දීම රටේ භෞමික අඛණ්ඩතාවට නිරන්තර තර්ජනයක් විය හැකිය යන්නයි.

ඊ) මෙම බලතල කාර්යක්ෂම හා ඵලදායී ලෙස කේන්ද්‍රයෙන් ක්‍රියාත්මක කළ හැකි බැවින් පළාත්වලට ඒවා පැවරීමේ අවශ්‍යතාවක් නැතැයි සමහරු කියා සිටියහ. පොලිස් බලතල පළාත්වලට පැවරුවහොත් අපරාධ සැකකරුවන් එක් පළාතක සිට වෙන පළාතකට ගිය විට විමර්ශන කටයුතු සිදුකිරීම දුෂ්කර විය හැකි යැයි ද, පෙන්වා දෙන ලදී.

උ) පළාත් විධායකය හා ව්‍යවස්ථාදායකය අත පොලිස් බලතල ඇති විට මධ්‍යම රජයේ නීති සම්පාදකයන් හා විධායකයන්ට එරෙහිව අත්තනෝමතික ලෙස යොදා ගැනීමට හැකි බවට ද, බිය පළ කරන ලදී. මෙය උතුරු නැගෙනහිර පළාත්වලට සීමා වූවක් නොව අනිත් පළාත්වලට ද, අදාළ වූවකි. මධ්‍යම රජයේ බලයේ සිටින පක්ෂයට විරුද්ධ පක්ෂයක් පළාත් සභාවේ බලයට පත්වූ විටක එම පළාතේ විධායක හෝ නීති සම්පාදකයන් පොලිස් බලතල යොදා ගනිමින් කේන්ද්‍රයේ විධායකයන් හෝ ඇමතිවරුන්හෝ ව්‍යාජ චෝදනා මත අත්අඩංගුවට ගැනීමට හෝ අතවරයට පත් කිරීමට ඉඩ ඇතැයි පෙන්වා දෙන ලදී.

ඍ) පළාත් දේශපාලනඥයින්, පොලිස් සේවය තවත් දේශපාලනීකරණය කර එය තම දේශපාලන විරුද්ධවාදීන් අතවර හා තාඩන පීඩනවලට ලක් කිරීමට යොදා ගනු ඇතැයි ද, බියක් තිබේ.

### 9.2.1.2 රජයේ ඉඩම්[35]

ප්‍රතිසන්ධාන දැක්මකින් කාටත් පිළි ගත හැකි හා චිරස්ථායි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ කාර්යයේදී රටේ දේශපාලනඥයින් අතර වඩාත් ම විවාද සම්පන්න කරුණක් වී ඇත්තේ රජයේ ඉඩම් පිළිබඳ ප්‍රශ්නයයි. රාජ්‍ය ඉඩම් පිළිබඳව අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන කරුණු ජනවාර්ගික සබඳතාවලට අයහපත් ලෙස බලපා තිබේ. රටේ ඉහළ ම උසාවියේ තීන්දුවලින්වත් මෙම තත්ත්වය යහපත් අතට වැඩි දියුණු වී නැත. ඇත්ත වශයෙන් ම සිදුවී ඇත්තේ ව්‍යාකූල බව වැඩිවී එය නිත්‍ය මතභේදයක් බවට පත් වීමයි.

දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රධාන වශයෙන් දෙමළ කථා කරන ජනයා ජීවත් වූ ප්‍රදේශවල රජයේ අනුග්‍රහයෙන් බහුතර ප්‍රජාවේ ජනපද පිහිටුවීම සෑම රජයක් යටතේ ම සිදුවී ඇතැයි කියනු ලැබේ. මේ අනුව රජය මෙම ප්‍රදේශවල ජන විද්‍යාත්මක අසමතුලිතතාවක් නිර්මාණය කර ඇති අතර මේ මගින් ජාතික, පළාත් හා පළාත්පාලන ආයතනවල දෙමළ සහ දෙමළ කථා කරන ජනයාගේ දේශපාලන නියෝජනය දුර්වල කර තිබේ. මෙය ඔවුන්ගේ සිවිල්, දේශපාලන, සංස්කෘතික, සමාජීය හා ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපා තිබේ. මේ නිසා ඔවුන්ගේ අනන්‍යතාව, ආරක්ෂාව වෙනස් ප්‍රජාවක් ලෙස පැවතීම ආදියට තර්ජනයක් එල්ලවී ඇත. මෙය පැහැදිලි කිරීම සඳහා සුළු ජාතික ප්‍රජාවන්, ජාතික ව්‍යවස්ථාදායකයට හා පළාත් පාලන ආයතනවලට තේරී පත්වූ දෙමළ කථා කරන නියෝජිතයන්ගේ සංඛ්‍යාවන් හා නිල ජන සංගණන වාර්තා උපුටා දක්වති. ජාතික ව්‍යවස්ථාදායකයේ සිටින නියෝජිතයන් සංඛ්‍යාව අඩු වන විට ඔවුන්ට හැඟී යන්නේ ඔවුන්ගේ අයිතිවාසිකම් ද, අඩුවන බවත් ඔවුන්ගේ සිවිල්, දේශපාලන, සමාජීය, සංස්කෘතික, ආර්ථික හා අනිකුත් අයිතීන් ද, සම්බන්ධයෙන් ඔවුන් අනාරක්ෂිත තත්ත්වයකට පත්වන බවයි.

උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ කථා කරන බොහෝ අය කියා සිටියේ ඉඩම්, බෙදා හැරීමේ ඒකකයට අයත් විෂයයක් විය යුතු බවයි. ඔවුන් ප්‍රකාශ කර සිටියේ කේන්ද්‍රයට

[35] ඉඩම්වලට සම්බන්ධ සංවර්ධනය, පරිසරය හා අනිකුත් ගැටලු පිළිබඳ ව වෙනත් කොටසක සාකච්ඡා කෙරේ. (19 පරිච්ඡේදය බලන්න). මේ කොටසේදී අප ඉදිරිපත් කරන්නේ බලය පවරන ඒකකවලට දිය යුතු ඉඩම් බලතල ගැන ජනතාව දැක්වූ අදහස් පමණි.

ඉඩම් භාවිතය පිළිබඳ අයිතිය සංවෘත විෂයයක් ලෙස තබා ගත හැකි බවත්, මධ්‍යම රජයේ කාර්යයකට අවශ්‍ය වන ඉඩම් බලය බෙදා හැරීමේ ඒකකය විසින් නිදහස් කළ හැකි බවත්ය. මේ සම්බන්ධයෙන් යම් කිසි ආරවුලක් පැන නැඟුණහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට/ශ්‍රේෂ්ඨාධිකරණයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මඩුල්ලට අභියාචනය කිරීමෙන් විසඳා ගත හැකි වේ.

අනිත් අතට බලය පැවරීමට පක්ෂ ව වෙනත් ප්‍රදේශවලින් පැමිණ කරුණු ඉදිරිපත් කළ සමහර අයගේ තර්කය වූයේ ද, රජයේ ඉඩම් මධ්‍යම රජයේ අයිතියක් ලෙස පවත්වා ගත යුතු බවයි. බලය පැවරීමට විරුද්ධ කණ්ඩායම්, බලය පවරන ඒකකයේ විෂය කරුණක් ලෙස ඉඩම්, ඇතුළත් කිරීමට සම්පූර්ණයෙන් ම විරුද්ධ වෙති.

මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වූ තවත් මතයක් වන්නේ රටේ සම්පූර්ණ භූමිය ම රටේ ජනතාවට අයිති බවත් රටේ ඕනෑ ම කෙනෙකුට එය අයිති කර ගැනීමටත්, භාවිතයට ගැනීමටත්, ඉඩ තිබිය යුතු බවයි. ඔවුන්ගේ අදහස වන්නේ කිසි ම කණ්ඩායමකට හෝ ප්‍රජාවකට රටේ භූමියෙන් කොටසක් ඔවුන්ට අයිති යැයි කීමට හෝ එය ඔවුන්ගේ වාසභූමි යයි කීමට හෝ අයිතියක් නැත. රටේ ඕනෑ ම කොටසක ජනයා පදිංචි කරවීම රජයේ නීත්‍යානුකූල කාර්යයක් බව ද, ඔවුහු පෙන්වා දුන්හ.

ප්‍රධාන වශයෙන් යාපනයේ ආන්තික කුල කණ්ඩායම්, සංවිධාන හා පුද්ගලයන් උසස් කුල ආධිපත්‍යයක් ඇති උතුරු පළාත් සභාවට ඉඩම් බලතල දීමට විරුද්ධත්වය ප්‍රකාශ කළහ.

වතුවල ශත වර්ෂයකට වැඩි කාලයක් ජීවත් වී ඇති මලයහ (කඳුරට) දෙමළ ජනයාට ද, ඉඩම් ප්‍රශ්නය ඉතා වැදගත් විය. ඔවුන් ඉල්ලා සිටියේ නේවාසික හා ගොවිතැන් කටයුතු සඳහා අවම ඉඩම් ප්‍රමාණයක්වත් ඔවුන්ට ලබා දෙන ලෙසයි.

මෙම කරුණ මෙතරම් විවාදයට ලක්වීමට හේතු ගණනාවක් තිබේ. ඉඩම් යනු වටිනා භෞතික වත්කමක් පමණක් නොව ඔවුන්ගේ සිවිල්, දේශපාලන, සාමාජීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට මෙන් ම අනන්‍යතාව, ආරක්ෂාව හා පැවැත්ම යන කරුණුවලට ද, තදින් ම සම්බන්ධ වන්නකි. එය කණ්ඩායම් හෝ ප්‍රජාවන් ලෙස සිටින විවිධ මිනිසුන් අතර චිත්තාවේගී හැඟීම් ඇති කරන අතර ඔවුන් සමහර ප්‍රදේශ සලකන්නේ ඔවුන්ට අයිති භූමිය ලෙස හෝ ඔවුන්ගේ සුපුරුදු නේවාසික ප්‍රදේශ ලෙසයි. වෙනත් ජනතා කොටස් හා ප්‍රජාවන් මෙය අනුමත නො කරති.

ප්‍රජාවක/වාර්ගික කණ්ඩායමක සාම්ප්‍රදායික ජනාවාස රැක ගත යුතුය යන අදහස සමග ඉඩම් ප්‍රශ්නය ඇඳි තිබේ. රාජ්‍ය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන ජනාවාස හෝ පදිංචි කිරීමේ වැඩසටහන් සලකන ලද්දේ සුළුතර ප්‍රජාවන් මත බහුතරවාදී මතවාද පැටවීමේ ක්‍රමයක් ලෙසයි. මෙම ප්‍රයත්නයන්ට පසුව ඉඩම් ප්‍රශ්නය විසඳීමට විවිධ සම්මුති, ගිවිසුම් හා යෝජනා ඉදිරිපත් විය. මෙම ගිවිසුම්වලදී එකඟ වූ ආකාරයට කටයුතු සිදු නොවීමත්, මෙම විවාද සම්පන්න ගැටලුව විසඳීමට ඉදිරිපත් කළ යෝජනා බහුතරයේ පාලක ප්‍රභූන් විසින් සැලකිල්ලට නොගැනීමත්, නිසා ඉඩම්, බලය බෙදා හරින ලද ඒකකයේ විෂයයක් කළ යුතුය යන ඉල්ලීම ඉදිරිපත් විය.

උතුරු නැගෙනහිර ජන විද්‍යාත්මක සංයුතිය වෙනස් කරන, රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදුවන මෙම පදිංචි කිරීමේ වැඩසටහන් නතර කිරීමට ගත් ප්‍රයත්න අසාර්ථක වී ඇති අතර මේ ප්‍රදේශවල දිගට ම සැලසුම් සහගතව ජනාවාස ඉදිවේ. දශක තුනක යුද්ධයෙන් පසුව මෙම ගැටලුව නව මානයකට පත්වී ඇති අතර මේ නිසා තත්ත්වය තවත් උග්‍රවී තිබේ.

අර්ථාන්විත බලය පැවරීමක් සඳහා අවශ්‍ය ම අංගයක් වන්නේ ඉඩම් බලතල පැවරීම බව පෙන්වා දෙන ලදී. ඉඩම් පිළිබඳ තීරණ ගත යුත්තේ ජනතාවට සෘජුව ම වගවීම ඇති අය විසින් වන අතර තීරණ ගන්නා අය සමග ජනතාවට ද, පහසුවෙන් සම්බන්ධ වීමට හැකි විය යුතුය.

ඉඩම් බලතල පැවරීමට විරුද්ධව ද, බොහෝ තර්ක ඉදිරිපත් විය. රටේ භූමියෙන් යම් කිසි කොටසක් ඓතිහාසික වශයෙන්, මානවවංශ විද්‍යාව අනුව හෝ පුරාවිද්‍යාත්මක වශයෙන් තමන්ට පමණක් අයිති යයි ප්‍රකාශ කිරීම මොවුහු ප්‍රශ්න කරති. දැන් දෙමළ ප්‍රජාවේ ඓතිහාසික නිජ භූමි ලෙස හඳුන්වන ප්‍රදේශ මුලදී ඇත්ත වශයෙන් ම සිංහල බෞද්ධයන් ජීවත් වූ ප්‍රදේශ බව ඔවුහු පෙන්වා දෙති.

සංවර්ධනයට වඩාත් සුදුසු රජයේ නැවුම් ඉඩම් විශාල ප්‍රමාණයක් ඇත්තේ උතුරු සහ නැගෙනහිර පළාත්වලය. මෙම ප්‍රදේශවල ඒකකවලට ඉඩම් බලතල පැවරීමෙන් අනිත් පළාත්වල ඉඩම් නැති ජනතාවට අවාසියක් වනු ඇතැයි ද, පෙන්වා දෙන ලදී. මෙවැනි ඉඩම් බලතල පැවරීමකින් රටේ ඉඩම් ප්‍රමාණයෙන් තුනෙන් එකක් පමණ ජනවාර්ගික සුළුතරයක පාලනය යටතට පත්වනු ඇතැයි ද, තර්ක කරන ලදී.

### 9.2.2 නිර්දේශ

ඉහත සඳහන් කරුණු මත පදනම් ව බලය බෙදා හරින ලද ඒකකයේ ආණ්ඩුකාර, විධායකය, අධිකරණය හා ව්‍යවස්ථාදායකයට පවරනු ලබන බලතල සම්බන්ධයෙන් අපේ නිර්දේශ පහත දක්වමු. බලය බෙදා හරින ලද ඒකකයේ ඉඩම් හා පොලිස් බලතල සම්බන්ධයෙන් ද, අපගේ නිර්දේශ ඉදිරිපත් කරමු. සමහර නිර්දේශවලට එකඟ නොවූ කමිටු සාමාජිකයෙකුගේ අදහස් ද, මෙහි දක්වා තිබේ.

i. **ආණ්ඩුකාරවරයාගේ බලතල**

අ. මහ ඇමතිගේ එකඟත්වය ඇතුව ජනාධිපති විසින් ආණ්ඩුකාරයා පත් කළ යුතුය.

ආ. ආණ්ඩුකාරයා කටයුතු කළ යුත්තේ මහ ඇමතිගේ උපදෙස් මතයි.

ඇ. පළාත් ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරන පනත්වලට ආණ්ඩුකාරයා අනුමැතිය දීම අවශ්‍ය නොවේ. ඒ වෙනුවට සෑම පනතක්ම ව්‍යවස්ථාදායක අධිකරණයේ/ ශ්‍රේෂ්ඨාධිකරණයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විනිශ්චය මඬුල්ලෙහි සමාලෝචනයට භාජනය කෙරෙනු ඇත.

ඇ. පළාත්/කලාපීය ඒකකයට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පත් කිරීමේ වගකීම ඇත්තේ ආණ්ඩුකාරයාට නොව පළාත් උසස් තනතුරු කොමිසමටය. ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතුව ජනාධිපති විසින් ප්‍රධාන ලේකම් පත් කළ යුතුය.

ඉ) ඉහත නිර්දේශ සම්බන්ධයෙන් විසම්මුතික මතයක් තිබූ එක් කමිටු සාමාජිකයෙක් කියා සිටියේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා/හෝ 1987 අංක 42 දරණ පනතේ ඇති ආණ්ඩුකාරයාගේ බලතල ඒ ආකාරයට ම තබා ගත යුතු බවයි. එම බලතල ඉවත් කරන්නේ නම් එම බලතල ඇති විකල්ප ආයතනයක් කේන්ද්‍රයේ ස්ථාපිත කළ යුතුය.[36]

[36] කුෂාන් ද අල්විස්, ජා.නී.

ii) පළාත්/කලාප මට්ටමේ විධායක බලය

බලය බෙදාහරින ලද ඒකකයේ විධායක අංශය වන්නේ ප්‍රධාන අමාත්‍ය සහ ඇමති මණ්ඩලයයි. ආණ්ඩුකාරයාට කිසි ම විධායක බලයක් හිමි නොවේ. අමාත්‍ය මණ්ඩලය, පළාත්/කලාපීය ඒකකයේ සියලූ සාමාජික සංඛ්‍යාවෙන් 15-20% නො ඉක්මවිය යුතුය.

iii) පළාත්/කලාපීය මට්ටමේ අධිකරණය

අ. කලාපීය අද්වකාත් ජෙනරාල්වරයෙක් සිටිනු ඇත.

ආ. ආරවුල් විසඳීමේ සාම්ප්‍රදායික ක්‍රම ඇතුළු විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයක් පළාත්/කලාපවල පිහිටුවීමට දිරිගැන්විය යුතුය. කෙසේ වෙතත් එක් සාමාජිකයෙකුගේ මතය වූයේ එවැනි යාන්ත්‍රණයක් අධිකරණ පද්ධතියට අවහිරයක් විය හැකි බැවින් ඔහු එවැනි යන්ත්‍රණයක් පිහිටුවීමට විරුද්ධ වන බවයි.[37]

iv) **පළාත්/කලාප මට්ටමේ නීති සම්පාදන බලය**

අ. පළාත් ඒකකයට දෙන නීති සම්පාදන බලය පැහැදිලි විෂය පථයකින් යුක්ත විය යුතු අතර එය අයත් වන්නේ පළාත් ආණ්ඩුවට ද? එසේ නැත්නම් මධ්‍යම ආණ්ඩුවට ද? යන්න ගැන සැකයක් නො තිබිය යුතුය.

ආ. පළාත් සභාවට ප්‍රඥප්ති සම්පාදන බලය තිබිය යුතුය. මේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයේ/ශ්‍රේෂ්ඨාධිකරණයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විනිසුරු මඬුල්ලේ පූර්ව හා පශ්චාත් අධිකරණ සමාලෝචනයට යොමු කළ හැකියි.

ඇ. ලැයිස්තු තුනක් තිබෙනු ඇත. ඒවා නම්,

1) සංවෘත ලැයිස්තුව

2) පළාත් සභා ලැයිස්තුව

3) පළාත් පාලන ලැයිස්තුව

[37] කුෂාන් ද අල්විස්, ජ.නී.

4) නිර්දේශ කර ඇති පරිදි පළාත් සභා ඇතුළත ස්වයං පාලන මණ්ඩල ස්ථාපිත කළහොත් ස්වයං පාලන මණ්ඩල ලැයිස්තුවක් ද, සකස් කළ යුතුය.

සමහර සංශෝධනවලට යටත්ව 2010 අගෝස්තුවේ ඉදිරිපත් කළ ව්‍යවස්ථා පනතේ ඇතුළත් කර තිබූ ලැයිස්තු දෙක භාවිතා කරනු ඇත.

එක් කමිටු සාමාජිකයෙකුගේ මතය වූයේ සමගාමී ලැයිස්තුව ඒ ආකාරයට ම පවත්වා ගත යුතු බවයි. ඔහුගේ තර්කය වූයේ එම ලැයිස්තුව ඉවත් කිරීමෙන් යම් කිසි පළාතක සුළුතර කණ්ඩායමක් ආරක්ෂා කිරීමට මධ්‍යම රජයට ඇති බලය අඩුවන බවයි.[38] කෙසේ වෙතත්, පොලිස් බලතල, ඉඩම් බලතල, අන්තර්ජාතික ප්‍රදාන, ඍජු විදේශ ආයෝජන, ජාත්‍යන්තර සංවර්ධන ආධාර, පරිසරය, ජාත්‍යන්තර ණය, යුක්තිය පසිඳලීම හා පුරාවිද්‍යා වැඩබිම් ආදිය පළාත් සභාවට නොදෙන්නේ නම් ලැයිස්තු දෙකක් පවත්වා ගැනීමට ඔහු එකඟ විය. එසේ නැත්නම් මෙම සාමාජිකයාගේ මතය වූයේ සමගාමී ලැයිස්තුව පවත්වා ගත යුතු බවයි.[39]

### v. පොලිස් බලතල

මුළු රටට ම සිටිය යුත්තේ එක් පොලිස් බලකායකි. කෙසේ වෙතත් පළාත තුළ නීතිය හා සාමය සම්බන්ධයෙන් මහ ඇමතිට හා අමාත්‍ය මණ්ඩලයට උත්තර දීමට හා වගකීමට පළාතේ පොලිසිය බැඳී සිටී. අපරාධ වැළැක්වීම, විමර්ශනය හා සැකකරුවන්ට නඩු පැවරීම ආදිය සම්බන්ධයෙන් පළාත තුළ පොලිසිය, පළාතේ දේශපාලන නායකයන්ගෙන් ස්වාධීනව කටයුතු කළ යුතු වේ.

මෙම කරුණ සම්බන්ධයෙන් සෑම පළාතක ම ප්‍රොසිකියුටර් ජෙනරාල්වරයෙකු සිටින අතර පළාත තුළ අපරාධ වැළැක්වීම, විමර්ශනය හා සැකකරුවන්ට නඩු පැවරීම ආදිය ඔහුගේ වගකීම වෙයි. සහකාර පොලිස් අධිකාරී තනතුරෙන් පහළ පළාත් පොලිස් නිලධාරීන්ගේ මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් හා විනයානුකූල කටයුතු ආදී කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට පළාත් පොලිස් කොමිසමක් පිහිටුවනු ඇත. පළාත් පොලිස් කොමිසමේ සංයුතිය මෙසේය:

---

[38] කුෂාන් ද අල්විස්, ජ.නි.
[39] කුෂාන් ද අල්විස්, ජ.නි.

අ. සභාපති පළාතේ ආණ්ඩුකාර විසින් පත් කෙරේ.

ආ. මහ ඇමති විසින් නම් කරනු ලැබූ තැනැත්තෙකු

ඇ. ජාතික පොලිස් කොමිසම විසින් නම් කරනු ලැබූ තැනැත්තෙකු

vi රජයේ ඉඩම්

මේ සම්බන්ධයෙන් කමිටුවේ එකඟත්වයක් නොවූ බැවින් නිර්දේශ දෙකක් පහත දක්වමු.

### 1) කමිටු සාමාජිකයන් බොහෝ දෙනෙකුගේ යෝජනාව

රාජ්‍ය ඉඩම්, ඉඩම් පැවරීම, ඉඩම් භාවිතය, මානව ජනාවාස හා අනිකුත් අදාළ කරුණු ඇතුලු ව ඉඩම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ජාතික ඉඩම් කොමිසමක් ස්ථාපිත කිරීම. ඉඩම් භාවිතය, ජනාවාස හා ඉඩම් පැවරීම ආදී ප්‍රතිපත්තිවලදී ප්‍රදේශයේ ජනතාවට ප්‍රමුඛත්වයක් දිය යුතුය. ජාතික ඉඩම් කොමිසම වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 2වැනි පරිශිෂ්ටයේ 2.4 හා 2.5 හි සඳහන් කර ඇති මූලධර්ම අනුගමනය කළ යුතුය. පළාත් සභා හා රජයේ ආයතන විසින් ඉඩම් පැවරීම හා ඉඩම් භාවිතය ගැන තීරණය කිරීමේ බලය ජාතික ඉඩම් කොමිසමට ලබාදිය යුතුය. මධ්‍යම රජය හා පළාත් සභා අතර ආරවුලක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් ජාතික ඉඩම් කොමිසම තීරණය කරනු ඇත. ජාතික ඉඩම් කොමිසමේ තීරණය සමග එකඟ නො වන ඕනෑ ම පාර්ශවයකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය/ශ්‍රේෂ්ඨාධිකරණයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විනිසුරු මඩුල්ලට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි වේ. පළාත් පාලන ආයතනවලට තමන්ගේ කටයුතු සඳහා, රජයේ අනිත් මට්ටමවලට යටත්ව, රජයේ ඉඩම් ලබා ගත හැකිවේ.

ජාතික ඉඩම් කොමිසමේ සංයුතිය මෙසේ විය යුතුය.

අ. සියලු ම ප්‍රධාන අමාත්‍යවරුන්

ආ. ඉඩම්, වාරිමාර්ග, මහවැලි හා නාගරික සංවර්ධනය යන විෂයයන් භාර ඇමතිවරුන්

ඇ. ඉඩම් හා ඉඩම් සංවර්ධනයට අදාළ අමාත්‍යාංශවල ප්‍රධානීන්, නිල බලයෙන් පත්වූ සාමාජිකයන් ලෙස

ඈ. සිංහල, දෙමළ. මුස්ලිම් හා මලයහ (කඳුරට) දෙමළ ජනයා නියෝජනය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ නිර්දේශ මත ජනාධිපති විසින් පත් කරන සාමාජිකයන් හතර දෙනෙක්.

2) **කමිටු සාමාජිකයන් දෙදෙනෙකු යෝජනා කළේ පහත පරිදි වේ.**[40]

පළාතක රජයේ ඉඩම් යනු එම පළාතේ නීති සම්පාදක හා විධායක ආයතන, කටයුතු කළ යුතු විෂයයක් වේ. සංවෘත ලැයිස්තුවේ නියම කර ඇති ඔවුන්ගේ කාර්ය ක්ෂේත්‍රය යටතට එන ඕනෑ ම කටයුත්තක් සඳහා නීත්‍යනුකූල ව භාවිතයට ගැනීම සඳහා ඕනෑ ම ඉඩම් කැබැල්ලක් නිදහස් කරන ලෙස පළාතේ විධායකයෙන් ඉල්ලා සිටීමට මධ්‍යම රජයට අධිකාර බලය තිබේ. සංවෘත ලැයිස්තුව යටතට එන ඕනෑ ම නීත්‍යනුකූල කටයුත්තක් සඳහා මධ්‍යම රජයට භාවිතයට ගැනීමට රජයේ ඉඩම් ප්‍රමාණයක් නිදහස් කිරීම පළාත් විධායකයේ වගකීමක් වේ.

මධ්‍යම රජයට කිසියම් පළාතක ඕනෑ ම ආයතනයක් හෝ ව්‍යවසායක් පිහිටුවීමට අවශ්‍ය වූ විට එම පළාතේ එවැනි ආයතනයක් හෝ ව්‍යවසායක් පිහිටුවීමේ යෝග්‍යතාව පිළිබඳ ව අදාළ පළාත් විධායකය සමග සාකච්ඡා කිරීම මධ්‍යම රජයේ වගකීමක් වේ. අදාළ පළාතේ විධායකය සමග සාකච්ඡා කර සහයෝගී හා එකඟත්ව ක්‍රියාවලියකින් තොරව ආයතන හෝ ව්‍යවසාය පිහිටුවීමට මධ්‍යම රජය පියවර නො ගත යුතුය.

තම භූමි ප්‍රදේශය තුළ රජයේ ඉඩම් භාවිතයට ගැනීමේදී වන ආවරණය, අන්තර් පරම්පරා සාධාරණතාව, කෘෂිකාර්මික තිරසර බව, ඉඩම් කැබලි කිරීම, ඉඩම් අහිමි බව ආදිය සැලකිල්ලට ගනිමින් උචිත උපයෝගීකරණ භාවිතයන් සම්බන්ධයෙන් රාජ්‍ය ඉඩම් කොමිසමෙන් නිකුත් කර ඇති ප්‍රතිපත්ති උපදේශ පළාත් විධායක විසින් පිළිපැදිය යුතු වේ.

රාජ්‍ය ඉඩම් භාවිත කොමිසම, කේන්ද්‍රය හා පළාත්වල අපේක්ෂා නියෝජනය කරන අපක්ෂපාත සාමාජිකයන් ගණනකින් සමන්විත විය යුතු අතර මෙම ආයතනයේ වගකීම් හා බලතල සකස් කළ යුත්තේ, එම පළාතේ නියෝජිතයාගේ එකඟත්වයකින් තොරව, මෙම ආයතනයේ තීරණයක් එම පළාතේ ක්‍රියාත්මක කළ නො හැකි ආකාරයටයි.

---

[40] එස්. තවරාජා; එස්.සෙල්වක්කුමාරන්

vii **පළාත් රාජ්‍ය සේවය**

මහජනයාට ලබා දෙන පළාත් හා පළාත් පාලන සේවා ගැන අදාළ ලැයිස්තුවල සඳහන් විය යුතු අතර මහජනයාට කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සේවය කිරීමට අදාළ ආණ්ඩුවට බලය ලබා දිය යුතුය.

viii **කේන්ද්‍රයෙන් පළාත්වලට බලයපැවරීම**

මධ්‍යම රජය යටතට පැවරෙන විෂයයන්හි කටයුතු, පළාත් හා පළාත් පාලන මට්ටමේ පරිපාලකයින් මගින් ක්‍රියාත්මක කිරීමට බලය පැවරීමට මධ්‍යම රජය බලගැන්විය යුතුය.

ix **පරිසරය**

පළාත්වලින් ද, නියෝජිතයන් ඇතුළත් වන, ජාතික පරිසර කොමිසමක් ස්ථාපිත කළ යුතුය. පරිසරය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කර ප්‍රකාශයට පත් කිරීමට කොමිසමට බලය පැවරෙනු ඇත. මෙම ප්‍රතිපත්තිවලට යටත්ව පරිසරය පැවරූ විෂයයක් වන අතර සෑම විෂයයකම පරිසර අංග පිළිබඳ කටයුතු රජයේ අදාළ ස්තරයෙන් සිදුවනු ඇත. උදාහරණයක් වශයෙන් නිවාස, පළාත් සභා විෂයයක් වන අතර එහි පරිසර අංශය පිළිබඳ ව පළාත් සභාව කටයුතු කරනු ඇත. අන්තර්-පළාත් වාරිමාර්ග, මධ්‍යම රජයේ විෂයයක් වන බැවින් එහි පරිසර අංශය ගැන මධ්‍යම රජය කටයුතු කරනු ඇත.

# 10 පරිච්ඡේදය

# පළාත් පාලනය

## 10.1 ඉදිරිපත් කළ අදහස්

පළාත් පාලනය සම්බන්ධයෙන් කමිටුවට බොහෝ යෝජනා හා අදහස් ලැබුණි. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම වෙනුවෙන් පෙනී සිටි අය මූලික වශයෙන් ඉල්ලා සිටියේ කුඩා පළාත් පාලන ඒකක හා වැඩි පුරවැසි සහභාගීත්වයකි. පළාත් පාලන ආයතනවලින් දැනට කෙරෙන කටයුතුවලට වඩා වැඩි දෙයක් ජනතාව අපේක්ෂා කරන බව අප වෙත ඉදිරිපත් කළ අදහස්වලින් පැහැදිලිව ම පෙනී ගියේය. තව ද, ප්‍රාදේශීය මට්ටමේ තෝරා පත් කර ගන්නා මෙම නියෝජිත ආයතන මත යම්කිසි පාලනයක් ඇති කළ හැකි යාන්ත්‍රණයක් ද, ජනතාව අපේක්ෂා කරන බව පෙනී ගියේය. ප්‍රාදේශීය මට්ටමේ කටයුතු පිළිබඳව ප්‍රජා පාලනකරණයක් මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය, සහභාගීත්වය, අන්තර්ගතබව, පාරදෘශ්‍යබව, ප්‍රවේශ්‍යථාව, සවිබල ගැන්වීම, අයිතිය හා පුරවැසියන්ගේ ස්වයං-පාලනය යන මූලධර්ම මත පදනම් වූ වේගවත් ප්‍රාදේශීය සංවර්ධනයක් ද, ඔවුහු අපේක්ෂා කළහ.

මහජනතාව අපට ප්‍රකාශ කළ අදහස් අනුව අවුරුදු ගණනාවක් තිස්සේ පාර්ලිමේන්තුව, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුලු විවිධ දේශපාලන ආයතනවලට මහජන නියෝජිතයන් විශාල සංඛ්‍යාවක් තෝරා පත් කර ගෙන ඇති නමුත් ජනතාවගේ එදිනෙදා කටයුතු හා බිම් මට්ටමේ සංවර්ධනය පිළිබඳ ප්‍රශ්න හා ගැටලු විසඳී නැත. සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයක ම සංවර්ධනය හා මහජන සේවා සැපයීමේ කටයුතු සඳහා රජයේ නිලධාරීන් විසි අටදෙනෙක් සිටින බව ද ඔවුහු පෙන්වා දුන්හ. මෙම නිලධාරීන් සඳහා මහජන මුදල් විශාල ප්‍රමාණයක් වැය කරන නමුත් ජනතාවගේ ප්‍රශ්න හා දුක්ගැනවිලි සම්පූර්ණයෙන් විසඳීමට ඔවුන්ට නො හැකි වී තිබේ. මහජන සේවා සැපයීමේදී දකින්නට ලැබෙන දූෂණය, බලය අයුතු ලෙස භාවිත කිරීම, සම්පත් අපතේ යැවීම, පාරදෘශ්‍යභාවයක් නොමැති වීම, මහජනයාට වගවීමක් නොමැති වීම, පිරිවැය සඵලතාව දුර්වල වීම, මහජනයා හා ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් මිත්‍රශීලී නොවීම වැනි අවභාවිත සම්බන්ධයෙන් ද, සැලකිය යුතු සංඛ්‍යාවක් අප්‍රසාදය පළ කළහ. මෙවැනි තත්ත්වයක් ඇතිවී තිබෙන්නේ මහජන විගණනය සඳහා යාන්ත්‍රණයක් නොමැති වීම හා තමන් ජනතාවගේ ස්වාමියන් යැයි සිතන නිලධාරීන්ගේ ආකල්ප ඇතුලු නිලධාරිවාදී සංස්කෘතිය නිසා බව

ඔවුහු කියා සිටියහ. තවත් අයගේ අදහස වූයේ පළාත් පාලනයේ පුරවැසි සහභාගීත්වය තුළින් මෙම ප්‍රශ්න සමහරක් විසඳා ගත හැකි බවයි.

තවත් බොහෝ දෙනෙක් පෙන්වා දුන් කරුණක් වූයේ බොහෝ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් අසාර්ථකවීමට හෝ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නො හැකි වීමට හේතු වන්නේ මහජන සහභාගීත්වයක් සහ මහජනයාට වගවීමක් නැති වීම බවයි. තව ද, මෙවැනි ව්‍යාපෘති, කේන්ද්‍රයෙන් හෝ බාහිර ආයතනවලින් ආරම්භ කරන්නේ ප්‍රදේශයේ ජනතාව සමග කිසිම සාකච්ඡාවකින් තොරවයි. පොදු ජනතාවගේ එදිනෙදා ජීවිතවලට බලපාන සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන් ආරම්භ කළ යුත්තේ බිම් මට්ටමේ, ප්‍රදේශයේ ජනතාවගේ සහභාගීත්වයෙන් බව ද, ඔවුන් පෙන්වා දුන්නේය. අප ඉදිරියට පැමිණි සැලකිය යුතු සංඛ්‍යාවක් සඳහන් කළේ ප්‍රජා හා ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් විවිධ රජයන් විශාල මුදල් ප්‍රමාණයක් වැය කර ඇති නමුත් අවසානයේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා දෙනු වෙනුවට ඒවා නිසා වෙනත් ප්‍රශ්න ඇති වූ බවයි.

මහජනයා විසින් ඉදිරිපත් කළ විශේෂිත කරුණු සමහරක් පහත දැක්වේ.

- රජයේ සියලු ම මට්ටම්වල මහජන අදහස් විමසීමක් සහ පුරවැසි සහභාගිත්වයක් නොමැති වීම
- පළාත් පාලන ආයතනවල සාමාජිකයන් අවංක ජනතා නියෝජිතයන් නොව කොන්ත්‍රාත්කරුවන් හා ව්‍යාපාරිකයන් වීම
- රේඛීය අමාත්‍යංශ, පළාත් අමාත්‍යංශ හා පළාත් පාලන ආයතනවල විවිධ ක්ෂේත්‍ර නිලධාරීන් අතර සම්බන්ධවීමේ යන්ත්‍රණයක් හෝ නියම සම්බන්ධීකරණයක් නොමැතිවීම
- පළාත් පාලන නිලධාරීන් දේශපාලනීකරණය වීම
- ඵලදායී ලෙස ක්‍රියා කිරීමට පළාත් පාලන ආයතනවලට ප්‍රමාණවත් සම්පත් නොමැති වීම
- නාගරික සංවර්ධන අධිකාරිය, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය ආදිය මගින් පළාත්පාලන ආයතනවල බලතල පවරා ගැනීම
- විමධ්‍යගත ව්‍යාපෘති යටතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අදාළ අධිකාරීන් පලාත් පාලන ආයතනවල අදහස් ලබා නොගැනීම

- පළාත් පාලන මහජන සේවා සැපයීම් යටතට වතු ජනාවාස අයත් නොවන අතර වතු අංශයේ ජනතාවගේ එදිනෙදා කටයුතු පිළිබඳ පාලන බලය ඇත්තේ වතුවල කළමනාකරණයට පැවරී ඇත. වතු ජනාවාස පළාත් පාලන මහජන සේවා යටතට ගෙන ආ යුතු අතර වතු කළමනාකාරිත්වය, පළාත්පාලන ආයතනවල උපදෙස් හා මග පෙන්වීම යටතේ කටයුතු කළ යුතුය.
- භාෂා ගණනාවක් කථා කරන ප්‍රජාවන් ඇති පළාත් පාලන ආයතනවලට, එම ප්‍රජාවන් කථා කරන හා ඔවුන්ට තේරුම් ගත හැකි භාෂාවකින් සේවා සැපයීමේ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු වී තිබේ. පළාත් පාලන ආයතන තුළින් ඵලදායී හා කාර්යක්ෂම සේවයක් ලබා දීම සඳහා මෙම ගැටලුව විසඳීමට භාෂා ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කළ යුතු වේ.

### 10.1.1 මලයහ (කඳුරට) දෙමළ ප්‍රජාව හා සම්බන්ධ විශේෂ ගැටලු හා ප්‍රශ්න

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ සැලකිය යුතු සංඛ්‍යාවක් පෙන්වා දුන්නේ වර්තමාන පළාත් පාලන ක්‍රමය, ශ්‍රී ලංකාවේ සියලු ප්‍රජාවන් සම්බන්ධයෙන් සාධාරණාත්මකව හා යුක්ති සහගත ලෙස ක්‍රියාත්මක නොවන බවයි. විශේෂයෙන් ම වතු අංශයේ මලයහ (කඳුරට) දෙමළ ජනයා සම්බන්ධයෙන් මෙය සත්‍ය වේ. මලයහ (කඳුරට) දෙමළ ජනයාගේ නියෝජිතයන් පෙන්වා දුන්නේ පවතින නීතිවල ඇති අඩුපාඩු නිසා පළාත් පාලන ආයතනවලින් සපයන බොහෝ සේවා ඔවුන්ට ලබා ගත නොහැකි බවයි. රටේ දිස්ත්‍රික්ක 14ක පුරා විසිරී සිටින වතු ජනයා පහත දැක්වෙන නිරීක්ෂණ ඉදිරිපත් කළ අතර නව ව්‍යවස්ථාව සකස් කිරීමේදී ඒවා සැලකිල්ලට ගත යුතුය.

- වතු අංශයේ මානව ජනාවාස, වර්තමාන පළාත් පාලන පද්ධතියට සම්පූර්ණයෙන් අන්තර්ගත වී නැත.
- වතු අංශයේ ඡන්දදායකයන් පළාත් පාලන ආයතනවලට සාමාජිකයන් පත් කිරීමේ දී ඡන්දය දෙන නමුත් ඔවුන්ට පළාත් පාලන ආයතනවල සේවා ලබා ගැනීමට අයිතියක් නැත. පළාත් පාලන ආයතන, වතු අංශයේ මානව ජනාවාස සලකන්නේ පුද්ගලික ප්‍රදේශ ලෙසයි.
- ප්‍රාදේශීය සභා නිර්මාණය කර ඇත්තේ (ජනගහණය හෝ ඉඩම් ප්‍රමාණය වැනි) ඒකාකාර නිර්ණායක මත නොවීම නිසා වතු අංශයේ ජීවත්වන ජනයාට පළාත් පාලන සේවා ලබා ගත නො හැකි වීමේ ප්‍රවණතාව උග්‍ර

වීමෙන් වෙනස් ලෙස සැලකීමට භාජනය වෙයි (උදා: නුවරඑළිය හා අඹගමුව ප්‍රාදේශීය සභා).

- නව පළාත් පාලන රෙගුලාසි හා ප්‍රජාතන්ත්‍රවාදී තීරණ ගැනීමේ ක්‍රියාවලිය ස්ථාපිත කිරීමේදී ජනතා අභිලාෂ හා ඔවුන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දක්වනු වෙනුවට දේශපාලන මැදිහත්වීම් සිදු වේ.
- 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ ඇති අංශ පදනම්වූ විශේෂිත ප්‍රතිපාදන (උදා: 2(1), 33, 19(xiv), 19(xxii) හා 134(4)) මගින් වතු ජනතාවට රාජ්‍ය සේවා ලබා ගැනීමට බාධක පනවා තිබේ.
- පළාත් පාලන ආයතනවලින් දෙමළ කථා කරන ජනතාවට කාර්යක්ෂම සේවයක් ලබා ගැනීම අපහසු වීමට තවත් හේතුවක් වන්නේ මෙම ආයතනවල දෙමළ කථා කරන නිලධාරීන් හිඟ වීමයි. උතුරු හා නැගෙනහිර පළාත්වල සිංහල කථා කරන සුළුතරයක් සිටින ප්‍රදේශවලින් ද, මෙයට සමාන ප්‍රශ්නයක් වාර්තා විය.

### 10.1.2 ග්‍රාම රාජ්‍ය/ග්‍රාම සභා/ගම්සභා සංකල්පය

ග්‍රාම රාජ්‍ය/ග්‍රාම සභා/ගම් සභා ආදී විවිධ නම්වලින් හඳුන්වන මෙම සංකල්පය ගැන අදහස් දැක්වූ මහජනයාගේ පොදු අදහස වූයේ හැකිතාක් පහළ මට්ටමට එනම් ගමට දේශපාලන බලය ලබා දිය යුතු බවයි. පළාත් පාලන ආකෘතියක් ලෙස ක්‍රියාත්මක කළ යුතු මෙම යෝජිත ඒකකයේ නමට ''ග්‍රාම' හෝ 'ගම' යන විශේෂණ පද යොදා ගෙන ඇත්තේ ඒ හේතුවෙනි.

ගම් මට්ටමට දේශපාලන බලය ලබා දීම අවශ්‍යව ඇත්තේ ගම් මට්ටමේ පාලනයේ දුර්වලතා මග හරවා ගැනීමටත්, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යුහය තුළ පුරවැසියන්ගේ ඍජු සහභාගීත්වය සහතික කිරීමත් සඳහාය.

ගැමියන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ ළඟා කර ගැනීම සඳහා තීරණ ගැනීමේදී පුරවැසියන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ලබා ගනිමින් ගම් මට්ටමේ කටයුතු කළමනාකරණය සඳහාවූ ස්වයං පාලන ආයතනික යාන්ත්‍රණයක් ව්‍යවස්ථානුකූලව ස්ථාපිත කිරීම යෝජිත පද්ධතියේ අරමුණ වේ. මෙවැනි නව දේශපාලන ව්‍යුහයක් අවශ්‍ය වී ඇත්තේ, සියලු මට්ටම්වල දේශපාලනඥයින් හා නිලධාරීන්ට බලය අවභාවිතා කිරීමට තුඩු දෙන

පක්ෂ දේශපාලනයේ ඇති දූෂණය හා ප්‍රාදේශීය දේශපාලනයේ දැකිය හැකි අන්තවාදී දේශපාලනීකරණය හා නිලධාරිවාදය නිසාය.

තව ද, ග්‍රාමීය ආර්ථිකය තුළ අසාධාරණ වෙළඳ භාවිතයන් හා අතරමැදියන්ගේ සූරාකෑම ඉතා පුළුල් ලෙස දකින්නට ලැබේ. සාමාන්‍ය ගැමියන්ගේ සමාජ ආර්ථික අවශ්‍යතා නොසලකා හරිමින් ගැමි ආර්ථිකය සූරා කෑමට දේශපාලනඥයින් හා ප්‍රභූන් එක් වී තිබේ. ග්‍රාමීය මට්ටමේ ආර්ථික සංවර්ධනයක් ඇති වන ආකාරයට සෞඛ්‍යය, අධ්‍යාපනය, ප්‍රවාහනය හා මාර්ග සංවර්ධනය වැනි සේවාවන් හා යටිතල පහසුකම් ලබා දෙන සංවර්ධන වැඩසටහන් ග්‍රාමීය මට්ටමේ ආරම්භ කිරීම හදිසි හා කාලීන අවශ්‍යතාවකි.

ගැමි ජනයාට ආර්ථික ප්‍රතිලාභ දීමට ඔවුන්ගේ නිෂ්පාදන ප්‍රවාහනය, ගබඩා කිරීම හා සකස් කිරීම වැඩිදියුණු කරමින් හා අපතේ යෑම අඩු කරමින් ඔවුන්ගේ නිෂ්පාදන පුළුල් වෙළෙඳපොළකට අලෙවි කළ හැකි ආකාරයට, ගම පදනම් කර ගත් වෙළඳ ක්‍රමයක් සකස් කළ යුතුවේ. හස්ත කර්මාන්ත වැනි දේ මත පදනම් වූ සාම්ප්‍රදායික ජීවිතයක් ගත කරමින්, පරිසරය ආරක්ෂා කර ගනිමින්, වනාන්තර හා පොදු භුක්තියට ඇති ඉඩම් වැනි ප්‍රාදේශීය සම්පත් ප්‍රයෝජනයට ගනිමින් ගම් වැසියන්ට ඔවුන්ගේ ප්‍රදේශ සංවර්ධනය කිරීමේ කටයුතුවල ක්‍රියාකාරී ලෙස නියැළීමට පුළුවන.

මේ නිසා ග්‍රාමීය මට්ටමේ පාලනය හා ආර්ථික කටයුතු කළමනාකරණය වැඩි දියුණු කිරීම තුළින් ග්‍රාමීය ජනතාවගේ ආර්ථික සංවර්ධනය, සමාජ සාධාරණත්වය හා යහපත ළඟා කර ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමට අර්ථාන්විත ලෙස දේශපාලනය බලය බෙදා හැරීම අත්‍යවශ්‍ය වේ.

සංවර්ධන දෘෂ්ටිකෝණයට අමතරව, පළාත් පාලනය සඳහා තවත් තර්කයක් වන්නේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය භාවිතයේදී අසාර්ථක වී ඇත යන්නයි. පාර්ලිමේන්තුව හා අනිකුත් ආයතනවලට පුරවැසියන් විසින් තම නියෝජිතයන් පත් කර ගන්නා නමුත් මැතිවරණ අතර කාලයේ ඔවුන් හුදු තරඹන්නන් බවට පත් වේ. තමන් විසින් ම තෝරාගත් නියෝජිතයන්ට ප්‍රමාණවත් බලපෑමක් කිරීමට මහජනයාට හැකියාවක් නැත. පාලනකරණය හා සංවර්ධනය පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් ඡන්දදායකයන්ගේ අදහස් ලබා ගැනීමේ යාන්ත්‍රණයක් නොමැති හෙයින් ඡන්දදායකයන් තමන්ට ලබා දුන් වරම ගෙන හැර දක්වමින් නියෝජිතයෝ තමන්ගේ සිතැඟි පරිදි පාලනය ගෙන යති.

දේශපාලනඥයින් වගකියන බවට පත්කිරීමේ හැකියාවක් පුරවැසියන්ට නැතිව ගොසිනි. පවතින දේශපාලන පද්ධතියේ ප්‍රධාන අඩුපාඩුවක් වන්නේ ඡන්දදායකයන් ලබා දුන් වරම ඉටු කිරීමට තෝරා පත් කරගත් නියෝජිතයන් අසමත්වූ විට ඔවුන් ආපසු කැඳවීමේ හැකියාවක් නැති වීමයි.

මහජනතාව ග්‍රාම රාජ්‍ය සංකල්පය දකින්නේ ගම් මට්ටමේ දේශපාලනය, පක්ෂ දේශපාලනයේ ඉතා හානිකර බලපෑමෙන් නිදහස් කර ගැනීමට ලැබෙන අවස්ථාවක් ලෙසයි. මෙහි මූලික සංවිධාන ව්‍යූහය වන්නේ මූලික ඒකකය වන ගමත්, ගම් කීපයක් ඇතුළත් වන ග්‍රාම නිලධාරි කොට්ඨාසයත්, එවැනි කොට්ඨාස ගණනාවකින් සමන්විත වන ග්‍රාම රාජ්‍යයත්, යනුවෙනි.

දැනට පවතින ප්‍රාදේශීය සභා හා/හෝ පළාත් සභා හෝ අලුතෙන් යෝජනා කර ඇති දිස්ත්‍රික් සභා හා අවසානයේ ජාතික මට්ටමේ සභාවක් හෝ පාර්ලිමේන්තුව සමග රටේ දේශපාලන ව්‍යූහයට ග්‍රාම රාජ්‍යය සම්බන්ධ කරන්නේ කෙසේ ද යන්න වෙනස් ආකාරයන්ගෙන් සංකල්ප ගත කර තිබේ.

එවැනි එක් දැක්මක් අනුව ග්‍රාම රාජ්‍යය දකින්නේ අ) ප්‍රාදේශීය ආ) දිස්ත්‍රික් සහ ඇ) ජාතික මට්ටමේ දේශපාලන ආයතනවලින් සමන්විත වන ස්තර තුනක ව්‍යූහයකින් පළාත් සභා විස්ථාපනය කිරීමේ මඟක් ලෙසයි. තවත් විකල්ප මතයකට අනුව එය පවතින පළාත් පාලන පද්ධතිය තුළ ජනතා සහභාගීත්වය වැඩි දියුණු කිරීමේ ක්‍රමයක් වේ. මෙය සිදු වන්නේ ගැමියා ඡන්දදායකයා ලෙසත්, ගම මූලික ඒකකය ලෙසත්, සලකන සෘජු මැතිවරණ ක්‍රමයක් මගිනි.

ග්‍රාම රාජ්‍ය සංකල්පය ගම හෝ ග්‍රාමීය ප්‍රදේශවලට සීමා විය යුතු නැති බවත් නාගරික හා මහ නගර සභා වැනි නාගරික ප්‍රදේශවලටත්, එය යොදා ගත හැකි බවටත්, තර්ක කරන ලදී.

### 10.1.3 ගම් මට්ටමේ ප්‍රජා සංවිධාන සාමාජිකයන්ගේ ග්‍රාම රාජ්‍යය

දැන් ක්‍රියාත්මක නොවන, එහෙත් මීට පෙර යුගයක අත්හදාබලන ලද, ග්‍රාමෝදය මණ්ඩල ආකාරයට, ග්‍රාමීය මට්ටමේ ප්‍රජා සංවිධානවල නායකයන්ගෙන් ග්‍රාම රාජ්‍යය සමන්විත විය යුතු ය යන්න එක් යෝජනාවකි. ග්‍රාමෝදය මණ්ඩල අසාර්ථක වූයේ ඒවාට අරමුදල් ලබා දීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ප්‍රතික්ෂේප කළ බැවින් යැයි පවසන ලදී.

මෙම අදහසේ වඩා දියුණු අනුවාදයක් වන්නේ පළාත් පාලන කොට්ඨාසවල ජනතා ප්‍රශ්න ගැන කටයුතු කිරීමට පළාත් පාලන පද්ධතිය තුළ සිවිල් සමාජ නියෝජිතයන්ගෙන් සැදුම්ලත් පුරවැසි කොට්ඨාස කමිටු පිහිටුවීමයි. මෙහිදී පුළුල් පදනමක් ඇති කොට්ඨාස පද්ධතිය තුළ ඇති ආයතන සම්බන්ධ වන බැවින් එය තිරස් ප්‍රජාතන්ත්‍රවාදයේ දියුණුවක් ලෙස සැලකිය හැකි වේ. දැනටමත් සමහර සිවිල් සමාජ කණ්ඩායම් පළාත් පාලන ආයතන සමග කටයුතු කරමින් පළාත් පාලන ගැටලු සම්බන්ධයෙන් අදහස් දීමට මෙම මණ්ඩලවලට නිරීක්ෂකයන් ලෙස සහභාගි වෙති. කොට්ඨාස ක්‍රමය යටතේ පවත්වන ඊළඟ පළාත් පාලන මැතිවරණය, කොට්ඨාස මත පදනම් වූ ජනතා හෝ පුරවැසි කමිටු හා සංවිධාන ශක්තිමත් කිරීමට ලැබෙන අවස්ථාවක් ලෙස සැලකිය හැකි යැයි ද, පෙන්වා දෙන ලදී.

ජාතික දේශපාලන කතිකාවකට හා ක්‍රියා මාර්ගයකට පුරවැසියන් සෘජුව හා ක්‍රියාකාරීව සම්බන්ධ වූ පුරවැසි කණ්ඩායම්වල ජනවාරි 8 ව්‍යාපාරය මත පදනම්ව හා ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේදී ජනතා සහභාගීත්වය වැඩි කිරීමට සම්බන්ධ අදහසක් වන්නේ සෑම දිස්ත්‍රික්කයක ම පුරවැසි කණ්ඩායම් සෑදීමයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය සාධනය මත පදනම්ව ඔවුන් ආපසු කැඳවීමේ ක්‍රියාදාමයක් ආරම්භ කිරීමේ බලය සහිතව මෙම පුරවැසි කණ්ඩායම් අධීක්ෂණ හා සමීක්ෂණ මට්ටමකින්, පවතින දේශපාලන ව්‍යුහය තුළට ව්‍යවස්ථානුකූලව අන්තර්ගත කළ හැකි වේ.

### 10.1.4 අනුපූරකතාව පිළිබඳ මූලධර්මය

ග්‍රාම රාජ්‍යය ඇති කිරීමට යෝජිත වෙනස්කම් සංකල්පගත කිරීමේදී අපට අනුපූරකතාව (subsidiarity) පිළිබඳ මූලධර්මය සහාය වෙයි.

මෙම මූල ධර්මයට අනුව ප්‍රධාන තැන ලැබෙන්නේ පාලන ආයතනවල පහළ ම මට්ටමටයි, (උදා. පළාත් පාලන ආයතනවලට) මෙම මූලධර්මයෙන් කියවෙන්නේ "පළාත්පාලන ආයතනයට කළ හැකි දෙයක් වේ නම් එය පළාත් පාලන පද්ධතිය තුළ තිබෙන්නට ඉඩ හැරිය යුතු" බවයි. පළාත් සභා හෝ ඉන් ඔබ්බට ගෙන යා යුත්තේ අනිත් කරුණු පමණි.

මෙම මූලධර්මයට අනුව රජයේ විශාල ඒකකවලට යොමු නො කර ප්‍රදේශයේ ප්‍රශ්න ගැන කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් බලතල පර්යන්තයේ සිටින පුරවැසියන්ට ලබා දීමට පාර්ලිමේන්තුව කටයුතු කළ යුතු වේ. කෙටියෙන් කිවහොත් ප්‍රජාතන්ත්‍රවාදී ජනතා නැඹුරු

රජයක හදවත විය යුත්තේ මෙම අනුපූරකතා මූලධර්මය පුළුල් ලෙස ක්‍රියාත්මක කිරීමයි. මෙහිදී ප්‍රමුඛ අංගය ලෙස සැලකෙන්නේ ග්‍රාම සභා සංකල්පයයි.

ගම් හෝ කොට්ඨාස මට්ටමේදී ග්‍රාම සභා අර්ථාන්විත හා ඵලදායී කිරීමට පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කෙරුණි. මෙයින් පළමුවැන්න වන්නේ උනන්දුවක් දක්වන අංශ මත පදනම්ව (භේදකාරී පක්ෂ දේශපාලනය මත පදනම්වූ නියෝජිතයන් වෙනුවට) තෝරාගත් නියෝජිතයන්ගෙන් සමන්විත ආයතනික ව්‍යූහයක් නිර්මාණය කිරීමයි. මෙම අංශ වන්නේ (1) ආහාර නිෂ්පාදනය (ගොවිතැන, ධීවර කටයුතු ආදිය), (2) තරුණයන්, (3) කාන්තාවන්, (4) කර්මාන්ත හා සේවා (අධ්‍යාපනය, යටිතල පහසුකම්, සෞඛ්‍යය ආදිය), (5) සම්පත් (පරිසරය, සංස්කෘතිය, ආගම, ප්‍රජා නායකයන්, වැඩිහිටියන්) ආදියයි. දෙවැන්න වන්නේ රට පුරා විහිදී ඇති මෙම ග්‍රාමීය හා කොට්ඨාස මට්ටමේ ඒකකවලට ඔවුන්ගේ ප්‍රමුඛතා අනුව ඔවුන්ගේ කටයුතු කළමනාකරණය කර ගැනීමට, මධ්‍යම රජය විසින් සාධාරණ මුදල් ප්‍රමාණයක් ලබා දීමයි.

### 10.1.5 බලය බෙදාහැරීමේ දෙවැනි ස්තරය ලෙස පළාත් පාලන ආයතන

මේ කොටසේදී සාකච්ඡාවට බඳුන් වන්නේ ග්‍රාම සභා සංකල්පයයි. මෙය රාජ්‍යයකට වඩා සභාවක ස්වරූපය ගන්නා බැවින් අපේ අදහස 'ග්‍රාම සභා' යන පදය මේ සඳහා වඩා යෝග්‍ය බවයි.

ග්‍රාම රාජ්‍යය පිළිබඳ වඩා ප්‍රබල සංකල්පීකරණයකින් කියවෙන්නේ බලය පැවරීමේ දෙවන ස්තරය විය යුත්තේ පළාත් පාලන ආයතන බවයි. පළමුවැනි ස්තරය වන්නේ පළාත් සභායි. (අ) ප්‍රාදේශීය ප්‍රජාතන්ත්‍රවාදය, (ආ) ප්‍රාදේශීය සංවර්ධනය, (ඇ) පාලනයේ පුරවැසි සහභාගීත්වය, (ඈ) අන්තර්ගත ප්‍රජාතන්ත්‍රවාදයක් ආදිය සම්බන්ධයෙන් කටයුතු කළ හැකි ආයතන බවට ඒවා පත් කිරීමට පළාත් පාලන ආයතනවල කාර්යභාරය, බලතල හා කාර්යයන් පුළුල් කළ යුතු වේ.

මෙම පරිණාමනය සාර්ථක කර ගැනීමට ප්‍රාදේශීය සභා මට්ටමට පහළින් ඇති පළාත් පාලනයේ කුඩා ම ඒකක කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. මෙම කාර්යය සඳහා ප්රාදේශීය සභා විශාල වැඩි බැවින් 'ග්‍රාම සභා' නමින් හඳුන්වන කුඩා ඒකක පිහිටුවිය යුතුය. ග්‍රාම සභාවල සංයුතිය, බලතල හා කාර්යයන් තීරණය කිරීමේදී ඉන්දියානු 'පංචයාත් රාජ්' ක්‍රමයෙන් ආභාෂයක් ලබා ගත හැකි වේ. මෙම ඒකකවලට පළාත් සභාවලින් ස්වාධීනව කටයුතු කිරීමට හැකි වන සේ මෙන් ම ඒවායේ මූල්‍ය ස්වාධිකාරය

සහතික කිරීම සඳහා, මධ්‍යම රජය, ග්‍රාම සභාවලට අරමුදල් ලබා දිය යුතුය. පළාත් පාලනයේ මෙම ආයතන දෙක අතර සම්බන්ධය පවත්වා ගැනීමට මෙම මුදල් පළාත් සභා හරහා ග්‍රාම සභාවට යොමු කළ හැකි නමුත්, ඒවා ග්‍රාම සභාවලට ලැබෙන බව සහතික කිරීමේ ප්‍රබල යන්ත්‍රණයක් තිබීම අවශ්‍ය වේ. දැන් පළාත් පාලන ආයතන පවතින්නේ පළාත් සභාවේ හෝ මහ ඇමතිගේ කරුණාව මතය. බොහෝ අවස්ථාවන්හි පළාත් පාලන ආයතනවලට ලැබිය යුතු අරමුදල් ඔවුන්ට ලබාදෙන බවක් නො පෙනේ. පළාත් සභා මෙම අරමුදල්, පළාත් පාලන ආයතනය පාලනය කිරීමේ ක්‍රමයක් ලෙස ද, යොදා ගනී.

කාන්තාවන්, ප්‍රාදේශීය සුළුතරයන් (ජනවාර්ගික හා සමාජීය), තරුණයන් හා දුප්පතුන් වෙනුවෙන් පංගුවක් වෙන් කිරීමෙන් ප්‍රාදේශීය පාලනයේ ඔවුන්ගේ අනිවාර්ය නියෝජනයක් ඇති වන ආකාරයට ග්‍රාම සභා ක්‍රමය සැලසුම් කළ යුතුය. ග්‍රාමෝදය මණ්ඩල ක්‍රමයේදී සිදු වූ ආකාරයට ගමේ ප්‍රභූන්, බලය ඇති පක්ෂයේ නියෝජිතයන් හා දේශපාලන තැරැව්කරුවන් ග්‍රාම සභාවේ බලය අල්ලා ගැනීම වැළැක්වීම සඳහා  මෙය ඉතා වැදගත් වේ.

### 10.1.6 ග්‍රාම සභා හා අනුපූරකතා මූල ධර්මයෙන් ඔබ්බට යමින් අව්‍යාජ පුරවැසි ප්‍රජාතන්ත්‍රවාදයක් පිහිටුවීම

ඍජු සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයක්  බිහි කරන ප්‍රාදේශීය මට්ටමේ පුරවැසියන්ට  ජාතික මට්ටමේ දේශපාලනයේ  ඍජු හා ක්‍රියාකාරී  කාර්ය භාරයක්  ඉටු කළ හැකි  දේශපාලන ව්‍යූහයක්  සංකල්පගත කිරීමෙන්  ග්‍රාම සභා හා අනුපූරක මූලධර්මයෙන් ඔබ්බට යන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ අදහසක් ඉදිරිපත් කරන ලදී.  වත්මන් නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යූහය ගැන මහජනයා  නැගූ විවිධ ගැටලුවලට යෝජිත ක්‍රමය පිළිතුරක් වනු ඇත. ඡන්ද දායකයන්ට වගවීමට නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය අසමත් වීමේ ගැටලුව මේ මගින් සාර්ථක ලෙස විසඳෙනු ඇත.

රජයේ සියලු මට්ටම්වලට  පත් වූ පුරවැසි නියෝජිතයන් ආපසු කැඳවීමේ බලය සහිතව ඒ මගින් ප්‍රජාතාන්ත්‍රීය සංවරණ සහ තුලන ක්‍රමයක් ක්‍රියාත්මක වනු ඇත. එය ජාතික මට්ටම දක්වා ඉහළට යන මණ්ඩල මාලාවකට නියෝජිතයන් පත් කෙරෙන ක්‍රමයක් බැවින් පුරවැසියන්ගේ ඍජු සහභාගීත්වය තහවුරු කෙරෙන සන්ධාන මණ්ඩල පද්ධතියකි. ජාතික මට්ටමේ විවිධ සමාජ ප්‍රවර්ගවල නියෝජනය ද, මෙයින් සහතික කෙරේ. එය,  ජාතික මට්ටමේ දේශපාලනයේදී පොදු යහපත පිළිබද ව සාකච්ඡා කෙරෙන, නගර/ගම් මට්ටමේ පුරවැසියන්ට වැඩිපුර සහභාගී වීමට ඉඩ සලසන,  මධ්‍යම/පළාත් /ප්‍රාදේශීය ආදි විවිධ

ස්තර සම්බන්ධ කරන, පාලන ව්‍යුහයකි. මෙහි ප්‍රධාන නිර්ණායක වන්නේ 'ආපසු කැඳවීමේ අයිතිය' හා කුඩා හා හසුරුවා ගත හැකි ආයතනයි.

ඡන්ද කොට්ඨාසය ඉතා කුඩාවට තබා ගැනීමෙන් (100 දෙනෙක් පමණ) නියෝජිතයා ආපසු කැඳවීම පහසු වන අතර මෙසේ පත් කර ගන්නා මණ්ඩල ද, කුඩාවට තබා ගැනීමෙන් (නියෝජිතයන් 100කට නොවැඩි) ඔවුන් අතර අර්ථාන්විත අන්තර් ක්‍රියාකාරීත්වයක් ගැන සහතික විය හැකි වේ. මෙහිදී අපේක්ෂා කරන්නේ ඡන්දදායකයන් 100ක් පමණ ඇති 'කොට්ඨාස' නම් මූලික ඒකකවලින් සමන්විත වන ස්තර තුනක පාලන ව්‍යුහයකි. මෙහි පළමුවැනි මට්ටම පළාත් පාලන ආයතනය වන අතර එය ඡන්දදායකයන් 10,000 ක් නියෝජනය කරන කොට්ඨාස නියෝජිතයන් 100කින් පමණ සමන්විත වේ. දෙවැනි මට්ටම වන පළාත් ආණ්ඩුව, ඡන්දදායකයන් මිලියනයක් නියෝජනය කරන පළාත් පාලන මන්ත්‍රීන් 100කින් පමණ සමන්විත වනු ඇත. ජාතික රජය නියෝජිතයන් 60 දෙනෙකුගෙන් සමන්විත වනු ඇත. මෙයින් 30 දෙනෙක් එක් පළාත් සභාවකින් ස්ත්‍රී පුරුෂ වශයෙන් දෙදෙනෙකු බැගින් පළාත් සභා මන්ත්‍රීන්ගෙන් තෝරා ගන්නා අතර අනෙක් 30 දෙනා විවිධ කණ්ඩායම් නියෝජනය කිරීමට ජාතික පදනමකින් තෝරා ගනු ඇත. මෙම කණ්ඩායම් වන්නේ ගොවින්, කාර්මික සේවකයන්, වතු කම්කරුවන්, ධීවරයන්, සේවා කර්මාන්තවල සේවකයන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, විද්වතුන්, පාසල් ගුරුවරුන්, වෛද්‍යවරුන්, ඉන්ජිනේරුවන්, වාස්තු විද්‍යාඥයින්, විද්‍යාඥයින්, සුළු කර්මාන්තකරුවන්, මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්තකරුවන්, විශාල කර්මාන්තකරුවන්, වෙළඳුන්, බැංකුකරුවන් වැනි වෙනත් ව්‍යවසායකයන් ආදී කොටස්ය. මේ අනුව 60 දෙනෙකුගෙන් සමන්විත ජාතික මණ්ඩලයේ අවම වශයෙන් 15ක් (උපරිම වශයෙන් 45ක්) කාන්තාවන් වනු ඇත.

පිටතින් සභාපති කෙනෙක් තෝරා පත් කර ගන්නා ජාතික සභාව පාලනයේ ප්‍රධාන අංශ නියෝජනය කරන උප කමිටු 12කට බෙදිය යුතුය. මෙම අංශ වන්නේ ආරක්ෂක හා විදේශ කටයුතු, මුදල්, සෞඛ්‍ය, අධ්‍යාපනය, ආහාර හා කෘෂිකර්මය, අධිකරණ, පරිපාලනය හා නීතිය බලාත්මක කිරීම, කර්මාන්ත ආදියයි. සෑම උප කමිටුවක් ම සභාපති කෙනෙක් පත් කර ගත යුතුවේ. මෙම සභාපතිවරුන්ගේ කමිටුව අමාත්‍ය මණ්ඩලය ලෙස කටයුතු කරන අතර ඔවුන් අතරින් කෙනෙක් අගමැති ලෙස තෝරා ගත යුතුය. යෝජිත ව්‍යුහයේ සෑම පරිපාලන මට්ටමකම බලතල හා වගකීම් පර්යන්තයේ සිට කේන්ද්‍රයට මධ්‍යගත කෙරේ. සෑම මට්ටමක ම ආපසු කැඳවීමේ බලය ඇති අතර සියලු ම ආයතනවල නිල කාලය නියම කෙරේ. සියලු මැතිවරණ අවුරුදු හතරකට වරක් එකඟ වූ මාසයක

පැවැත්වෙනු ඇත. වරින්වර මැතිවරණ පැවැත්වීමෙන් ඇති වන අවුල් හා වියදම් මේ නිසා අවම කර ගැනීමට හැකි වනු ඇත.

ඉහත සඳහන් ආකාරයට අපගේ දේශපාලන ආයතන ප්‍රති-ව්‍යූහගත කිරීමෙන් රටේ දේශපාලන කටයුතුවලට පුරවැසියන්ට ක්‍රියාකාරී ලෙස සහභාගී වීමට ඉඩ සලසා දීම අතින්, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ අසාර්ථකත්වයට පිළියමක් ලැබෙනු ඇත. කෙසේ වෙතත් එවැනි රාජ්‍ය ක්‍රමයක් පිහිටුවීම සඳහා පුරවැසියන් අතර උන්නතකාමී සමාජ පරිකාල්පනික දියුණුවක් අවශ්‍ය වේ. මෙය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරමු.

## 10.2 **නිර්දේශ**

පහත දැක්වෙන ආකාරයට අපි විකල්ප නිර්දේශ දෙකක් යෝජනා කරමු.

1. දැනට පවතින මහනගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවලට අමතරව, අනිත් කටයුතු අතර තම පෙදෙසේ සංවර්ධන කටයුතුවලට සම්බන්ධ වීමට, ගම් මට්ටමේ ග්‍රාමීය ජන සභාවක් (ග්‍රාම රාජ්‍යයක්) පිහිටුවීම. පළාත් පාලන ආයතනවල කටයුතුවලදී උපදේශක හා අධීක්ෂණ කාර්ය භාරයක් ඉටු කිරීමට මෙම ග්‍රාමීය ජනසභාවලට බලය තිබිය යුතු ය. මෙම ග්‍රාමීය ජන සභා, අදාළ පළාත් පාලන ප්‍රදේශ තුළ මහජන උපදේශන ආයතන ලෙස සැලකෙනු ඇත.

   වතුවල මානව ජනාවාස ද, ගම් පද්ධතියේ කොටසක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු අතර ඒවා ග්‍රාමීය ජන සභා, ප්‍රාදේශීය සභා, නගර සභා හා මහනගර සභාවල කොටසක් ලෙස සැලකිය යුතුය.

   එම ප්‍රදේශවල ජනතාවගේ යහපත සඳහා කටයුතු කිරීමටත්, පරිපාලනමය වශයෙන් සම්බන්ධීකරණය කිරීමටත් ග්‍රාමීය ජන සභා, ප්‍රාදේශීය සභා, නගර සභා හා මහනගර සභා වලට බලය පැවරිය යුතුය.

2. දැනට ඇති ප්‍රාදේශීය සභා මෙම කාර්යය සඳහා විශාල වැඩි බැවින් දැනට ඇති නාගරික සභා හා මහනගර සභාවලට අමතරව ගම් සභා හා සුළු නගර සභා ස්ථාපිත කළ යුතුය.

වතුවල මානව ජනාවාස ගම් පද්ධතියේ කොටසක් ලෙස ප්‍රකාශ කර ගම් සභා, සුළු නගර සභා, නාගරික සභා හා මහනගර සභාවල කොටසක් කිරීම නිර්දේශ කෙරේ.

එම ප්‍රදේශවල ජනතාවගේ යහපත සඳහා කටයුතු කිරීමටත්, පරිපාලනමය වශයෙන් සම්බන්ධීකරණය කිරීමටත් ග්‍රාමීය ජන සභා, ප්‍රාදේශීය සභා, නගර සභා හා මහනගර සභා වලට බලය පැවරීම නිර්දේශ කෙරේ.

# 11 පරිච්ඡේදය

# රාජ්‍ය ප්‍රතිපත්තියේ නියාමක මූලධර්ම

## 11.1 ඉදිරිපත් කළ අදහස්

බහුවිධතාව, උත්ප්‍රේක්ෂාව හා සමාජ සාධාරණත්වයේ මූලධර්ම මත පදනම් වූ සමාජයක් ස්ථාපිත කිරීමෙහි ලා රජයේ සියලු ආයතන රාජ්‍ය ප්‍රතිපත්තියේ නියාමක මූලධර්ම අනුව කටයුතු කළ යුතුය යන මතය මහජනයාගෙන් ඉදිරිපත් විය.

පහත දැක්වෙන ආකාරයට නියාමක මූල ධර්ම පිළිබඳ මහජන නියෝජනයේ හරය වූයේ සමාජ සංහිඳියාව, ඒවායේ අන්තර් සම්බන්ධතා සහිත ස්වාභාවික හා මානව පරිසරය, අපරාධ හා ඒවා වැළැක්වීම හා ජාත්‍යන්තර සබඳතා යන කරුණුයි.

මානව විවිධත්වයේ සාමාන්‍ය ලක්ෂණයක් ලෙස ආබාධිත බව පිළිබඳ මූලධර්මය ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතු යැයි ද, ඉල්ලීමක් ඉදිරිපත් විය.

ජාත්‍යන්තර ව්‍යුහයට මානව හිමිකම් රාමුව තුළ ශ්‍රී ලංකාවේ කැපවීම, නියාමක මූල ධර්මයක් ලෙස විශේෂයෙන් සඳහන් කළ යුතු යැයි ද, යෝජනා කරන ලදී.

## 11.2 නිර්දේශ

පහත දැක්වෙන නිර්දේශ සම්බන්ධයෙන් කමිටු සාමාජිකයෝ ඒකමතිකව එකඟ වූහ.

1. මෙහි ඇතුළත් වන රාජ්‍ය ප්‍රතිපත්තියේ නියාමක මූලධර්ම රටේ පාලනය සඳහා මූලික වන අතර සාධාරණ, ප්‍රජාතන්ත්‍රවාදී හා නිදහස් සමාජයක් ස්ථාපිත කිරීම සඳහා ඒවා අනුගමනය කිරීම රාජ්‍යයේ වගකීමක් වෙයි. රජයේ සියලු ම ආයතන, ජාතික, පළාත් හා පළාත් පාලන මට්ටමේ සියලු රාජ්‍ය නිලධාරීන් හා සියලු පුද්ගලයින් කවරෙකු හෝ විසින් මෙම නියාමක මූලධර්ම පහත සඳහන් කටයුතුවලදී අනුගමනය කළ යුතු වේ.

   අ. මෙම ව්‍යවස්ථාව භාවිත කිරීම හෝ විවරණය කිරීම

   ආ. ඕනෑම නීතියක් පැනවීම, භාවිත කිරීමහෝ විවරණය කිරීම හෝ

   ඇ. රාජ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීම හෝ ක්‍රියාත්මක කරන ඕනෑම විටෙක

### 11.2.1 නියාමක මූලධර්ම

1. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී රජයක් ස්ථාපිත කිරීමට රජය සහතික වී ඇති අතර එහි අරමුණු අතර පහත දැක්වෙන කරුණු අඩංගු විය යුතුය.

අ) සියලු පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහස පූර්ණ ලෙස සාක්ෂාත් කිරීම;

ආ) ජාතික ජීවිතයේ සියලු ම ආයතනවලට මඟ පෙන්වන (සමාජීය, ආර්ථික හා දේශපාලන)සාධාරණත්වයක් සහිත සමාජ ක්‍රමයක් ඵලදායී ලෙස ස්ථාපිත කරමින් හා ආරක්ෂා කරමින් ජනතාවගේ සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම;

ඇ) ප්‍රමාණවත් ආහාර, ඇඳුම් පැළඳුම් හා නිවාස, තිරසර ලෙස ජීවන තත්ත්වයන් දියුණුවීම, විවේකය සහ සමාජ හා සංස්කෘතික අවස්ථාවන් හි පූර්ණ වින්දනය ඇතුළුව සියලු පුරවැසියන්ට හා ඔවුන්ගේ පවුල්වලට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් සාක්ෂාත් කර ගැනීම;

ඈ) රාජ්‍යය, අන්තර්ගත සමෝධානික හා තිරසර සංවර්ධනයක් ප්‍රවර්ධනය කළ යුතුය;

ඉ) පොදු යහපතට හොඳම සේවය සිදුවන ආකාරයට සියලු ස්වාභාවික හා ද්‍රව්‍යමය සම්පත් හා සමාජ නිෂ්පාදන සාධාරණ ලෙස බෙදී යා යුතුය;

ඊ) විශේෂයෙන්ම කෘෂිකර්මයේ, සත්ත්ව පාලනයේ හා ධීවර කර්මාන්තයේ සාම්ප්‍රදායික ආහාර නිෂ්පාදන අංශ, රාජ්‍යය, සමූපකාර හා පුද්ගලික ව්‍යවසාය මෙන් ම පුද්ගල ව්‍යවසායකයන් අතර බෙදී යන නිෂ්පාදනය, බෙදා හැරීමේ හා හුවමාරු ක්‍රම සහිත සාධාරණ සමාජ ක්‍රමයක් ස්ථාපිත කිරීම;

උ) ජනතාවගේ සදාචාර හා සංස්කෘතික තත්ත්වය දියුණු කිරීම හා මානව ස්වීයත්වයේ පූර්ණ සංවර්ධනය සහ

ඌ) අසාක්ෂරතාව සම්පූර්ණයෙන් තුරන් කිරීම හා සියලු පුද්ගලයන්ට සෑම මට්ටමකදීම අධ්‍යාපනය ලැබීමට ඇති සාර්ව හා සමාන අයිතිය තහවුරු කිරීම.

2. රාජ්‍යය විසින් ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය, ස්වෛරීභාවය, ඒකීයත්වය හා භෞමික අඛණ්ඩතාව ආදිය ආරක්ෂා කළ යුතුය.

3. විමධ්‍යගත කිරීමෙන් හා ජාතික ජීවිතයේ හා රජයේ සෑම මට්ටමක ම මහජනතාවට සහභාගී වීමට හැකි තරම් අවස්ථා සලසා දීමෙන්, රජයේ ප්‍රජාතන්ත්‍රීය ව්‍යුහය හා ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රික අයිතීන් පුළුල් කිරීමටත්, ශක්තිමත් කිරීමටත් රාජ්‍යය ක්‍රියා කළ යුතු ය.

4. බහුවිධ ලක්ෂණ පවත්වා ගනිමින්, විවිධත්වය ආරක්ෂා කරමින් සියලු ජනවාර්ගික, ආගමික හා සමාජ කණ්ඩායම් අතර සංහිඳියාව හා සාමකාමී සහජීවනය සහතික කිරීම රාජ්‍යයේ වගකීම වෙයි. වාර්ගික, ආගමික, භාෂා කණ්ඩායම් හා අනිකුත් කණ්ඩායම් ද, ඇතුලු ශ්‍රී ලාංකික ජනතාවේ සියලු කොටස් අතර සහයෝගීතාව හා අන්‍යෝන්‍ය විශ්වාසය ප්‍රවර්ධනය කරමින්, ජාතික සමඟිය ශක්තිමත් කිරීමට රාජ්‍යය කටයුතු කළ යුතුය. වෙනස් ලෙස සැලකීම හා සාවද්‍ය පූර්ව විනිශ්චයන් පිටු දැකීමට, ඉගැන්වීම, අධ්‍යාපනය හා තොරතුරු යන අංශවල ඵලදායී පියවර ගත යුතුය.

5. රාජ්‍යය සියලු පුරවැසියන්ට සමාන අවස්ථා සහතික කළ යුතුය.

6. බරපතල අපරාධවලට වැරදිකරුවන් වූ අය හැර, ජාතිය, ජනවාර්ගිකත්වය, කුලය, පංතිය, ආගම, භාෂාව, විශ්වාස, ලිංගිකත්වය, ලිංගික නැඹුරුව හා අනන්‍යතා, වෛවාහික තත්ත්වය, මානසික හා ශාරීරික දුබලතා, දේශපාලන මත හෝ සම්බන්ධතා, වෘත්තිය, රාජ්‍යයට විරුද්ධව කැරලි ගැසීම් ඇතුලු අතීත හැසිරීම් යනාදී කිසිවක් පදනම් කර ගෙන කිසිම පුද්ගලයෙකුට හෝ සමූහයකට වෙනස් ලෙස නො සැලකිය යුතුය. ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගිකත්වය පිළිබඳ බහුවිධ නැඹුරුවක් සහිත පුද්ගලයන් ඇතුලු සියලු අනාරක්ෂිත කණ්ඩායම්වලට නියමිත ආරක්ෂාව ලබා දීම රාජ්‍යයේ වගකීමක් වෙයි.

7. රජයේ නීති, ක්‍රියා හා ප්‍රතිපත්තිවල බලපෑමට ලක් වූ අය හෝ ප්‍රධාන ධාරාවෙන් වෙන් කර හෝ කොන් කර ඇති අයට, ඔවුන්ගේ අනාගත දියුණුව හා අභිවෘද්ධිය වෙනුවෙන් විශේෂ විධි විධාන සැලසිය යුතුය.

8. පිළිගත් විවිධ මූලික අයිතිවාසිකම් සමග අනුකූල වන, ප්‍රජාවන්ගේ චාරිත්‍රානුකූල අයිතීන් ආරක්ෂා කිරීම සහතික කළ යුතුය.[41]

9. රැකවරණය පතන්නන්ගේ, සරණාගතයන්ගේ, රටක් නැති පුද්ගලයන්ගේ හා විදේශීකයන්ගේ මූලික අයිතීන් පිළිගෙන ආරක්ෂා කරන බවට රාජ්‍යය සහතික විය යුතුය.

10. උසාවියක්, විනිශ්චය සභාවක්, විමර්ශන කොමිසමක්, පොලිස් ස්ථානයක්, බන්ධනාගාරයක් වැනි ස්ථානවලදී නිදහස් නෛතික නියෝජනයකට සෑම පුද්ගලයෙකුට ම අයිතියක් ඇති බව සහතික කිරීමට රාජ්‍යය සියලු සාධාරණ පියවර ගත යුතුය.

11. ආර්ථික හා සමාජ වරප්‍රසාද හා අසමානතා මෙන්ම පුද්ගලයෙක් විසින් හෝ රාජ්‍යය විසින් පුද්ගලයෙක් සූරාකෑම තුරන් කිරීමට රාජ්‍යය ක්‍රියා කළ යුතුය.

12. ආර්ථික පද්ධතියේ ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් ලෙස පොදු අනර්ථයක් සිදුවන ආකාරයට ධනය හෝ නිෂ්පාදන මාර්ග ඒකරාශී වීමක් සිදු නොවන බවට රාජ්‍යය සහතික විය යුතුය.

13. ජාතික සේවා, පළාත් සභා හෝ පළාත් පාලන ආයතන තුළින් දේශපාලන හෝ වෙනත් පක්ෂපාතීත්වයකින් තොරව පුරවැසියන්ට අවශ්‍ය පොදු සුබ සාධනය හා ආධාර සේවා පවත්වා ගනිමින්, රාජ්‍යය සමාජ සුරක්ෂිතතාව හා සුබ සාධනය තහවුරු කළ යුතු අතර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ලබා දිය යුතුය.

14. වෙළඳපොළේ ආධිපත්‍යය සතු පුද්ගලික අංශයට යටත් කර ගැනීමට ඉඩ නොදී නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍යය හා පොදු ප්‍රවාහන සේවා මහජන සේවා ලෙස පවත්වා ගත යුතුය.

[41] පිටුවේ 43 වන පාද සටහන බලන්න

15. පුරවැසියන්ගේ සමාජීය, සංස්කෘතික හා දේශපාලන අයිතීන් සහතික කිරීම. දුගී බව නැති කිරීමට සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම, ඉඩම්, ජලය, වනාන්තර, ඛනිජ සම්පත්, නිවාස, අධ්‍යාපනය, භාෂාව, කෘෂිකර්මය, සෞඛ්‍යය  සහ අනිකුත් සාමූහික කටයුතු පිළිබඳ විධිමත් රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමෙන් ජනතාවගේ ආර්ථික අයිතීන් සහතික කිරීම ආදිය රාජ්‍යයේ වගකීම වේ.

16. ජනතාවගේ භාෂා හා සංස්කෘතීන්  දියුණු කර ගැනීමට  රජය සහාය විය යුතුය.

17. සියලු ම ආගමික විශ්වාස දරන ජනයාට ආගමික මූල ධර්ම යථාර්ථයක් කර ගැනීම සඳහා අවශ්‍ය ආර්ථික හා සමාජ පරිසරයක්  රජය විසින් නිර්මාණය කළ යුතුය.

18. පවුල, සමාජයේ මූලික ඒකකය ලෙස රාජ්‍යය විසින් පිළිගෙන එය ආරක්ෂා කළ යුතුය.

19. ආබාධිත පුද්ගලයන් මනුෂ්‍යත්වයේ හා මානව විවිධත්වයේ කොටසක් ලෙස පිළිගෙන ගෞරව කළ යුතුය. මානව හා ස්වාභාවික ව්‍යසන ඇතුලු හදිසි හා අවදානම් සහගත තත්ත්වයන් ගැන රාජ්‍යයේ සෑම ස්තරයකදීම පවතින සන්නිවේදන මාධ්‍ය තුළින් ආබාධිත පුද්ගලයන්ට එවැනි තත්ත්වයන් ගැන දැනුම් දෙන බවට රජය සහතික විය යුතු අතර අනෙකුත් පුද්ගලයින් හා සමාන පදනමක් මත ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට විශේෂ පියවර ගත යුතුය.

20. ළමයින්ගේ හා තරුණ තරුණියන්ගේ/තරුණ ජනයාගේ  කායික, මානසික, සදාචාරාත්මක, ආගමික හා සමාජීය සංවර්ධනය සහතික කිරීමටත්, ඔවුන් සූරා කෑමෙන් හා වෙනස් ලෙස සැලකීමෙන් ආරක්ෂා කිරීමටත්, රාජ්‍යය අවධානයකින් කටයුතු කළ යුතුය.

21. රජය විසින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ විශේෂ රැකවරණය හා ආරක්ෂාව ප්‍රවර්ධනය කළ යුතුය.

22. ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව ප්‍රජාවේ යහපත සඳහා පෘථිවි සම්පත් හා වත්කම්, සතුන් හා ශාක, ජල සම්පත්, ආදිය ඇතුලු පරිසරය රාජ්‍යය විසින් ආරක්ෂා කර සංරක්ෂණය කර වැඩි දියුණු කළ යුතුය. ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව අවම වනගහණයක් පවත්වා ගැනීමත්, හරිත වායු විමෝචන අඩු කිරීමට පියවර ගැනීමත්, රාජ්‍යයේ වගකීම් වේ.

23. ජීවනෝපායකට ඇති අයිතිය ඇතුලු සංවර්ධන කටයුතුවල බලපෑමට ලක් වන ප්‍රජාවන් හා පුද්ගලයන්ගේ අයිතීන් ආරක්ෂා කරමින්, පරිසරය සුරැකෙන හා දූෂණය අවම වන ආකාරයට, සංවර්ධන කටයුතු සිදු වන බවට රාජ්‍යය සහතික කළ යුතුය.

24. ජාතික ප්‍රතිපත්තියක් පිළියෙල කිරීම මගින් නිෂ්පාදන ආර්ථිකයකට ප්‍රමුඛත්වය දෙමින් ජාතික කර්මාන්ත ප්‍රවර්ධනය කළ යුතුය.

25. වී වගාවට සම්බන්ධ ජීවන රටාවට අනුව ග්‍රාමීය කෘෂිකර්මාන්යට සහාය දී ආරක්ෂා කළ යුතු වේ.

26. ජනතාවගේ පෝෂණ මට්ටම හා ජීවන මට්ටම ඉහළ නැංවීම හා මහජන සෞඛ්‍යය දියුණු කිරීම රාජ්‍යයේ මූලික වගකීමක් වෙයි.

27. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන යෝජනාවක් මගින් අනුමැතිය ලබා ගැනීමෙන් තොර ව කිසිම රාජ්‍ය ආයතනයක් හෝ රාජ්‍ය ආයතනයක කොටස් හෝ කිසිම රාජ්‍ය වත්කමක් හෝ විකිණීම හෝ පුද්ගලීකරණය නො කළ යුතුයි.

28. අදාළ ජාත්‍යන්තර ප්‍රඥප්තීන්ට අනුකූල නීත්‍යනුකූල ක්‍රියා මාර්ගයකින් තොර ව කිසිවෙකුගේ ඉඩම් අයිතිය අහිමි නො කරන බවට රජය වග බලා ගත යුතුය. සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ දී එවැනි අත්පත් කරගැනීමකට පොරතුව ඉඩම් හිමියන්ට නියමිත වන්දි ගෙවිය යුතුය.

29. වෙළඳපොළ හා රාජ්‍ය පද්ධතිවලට විකල්පයක් ලෙස සමූපකාර ක්‍රමය රජය පිළිගත යුතු අතර සමූපකාර ව්‍යාපාරය ප්‍රචලිත කිරීමට කටයුතු කරමින් සමූපකාරවල කළමනාකරණයට දේශපාලනය මැදිහත් වීම වැළැක්වීමට කටයුතු කළ යුතුය.

30. වැඩපොළේ මූලික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ප්‍රඥප්තිවල සඳහන් කම්කරු අයිතිවාසිකම් රජය ආරක්ෂා කළ යුතුය.

31. ආර්ථික සූරාකෑම ඇතුළු සියලු ආකාරයේ සූරාකෑම්වලින් පුරවැසියන් ආරක්ෂා කිරීමට රාජ්‍යය සියලු පියවර ගත යුතුය.

32. පුරුෂයින් හා ස්ත්‍රීන් යන දෙකොටසට ම සමාන වැඩ සඳහා සමාන මෙන් ම අවම වේතනයක් සහතික කිරීමෙන් ප්‍රමාණවත් ජීවනෝපායක් සලසා ගැනීමට රජය එහි පුරවැසියන්ට සහාය විය යුතුය.

33. ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ට ලබා දී ඇති අයිතිවාසිකම් ඔවුන් විදේශ රටක සිටිය ද, ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් රැකවරණ සැපයීමට රජය කටයුතු කළ යුතුය.

34. කූඨ මනුෂ්‍ය ප්‍රවාහනජාවාරමට ගොදුරු වූ අයට ප්‍රමාණවත් ආරක්ෂාව සපයමින් සංවිධානාත්මක අන්තර් ජාතික අපරාධ වැළක්වීමට රජය විසින් ප්‍රමාණවත් පියවර ගත යුතු වේ.

35. අල්ලස්, දූෂණය හා අපරාධ, කූඨ මනුෂ්‍ය ප්‍රවාහන ජාවාරම, වහල් ශ්‍රමය සහ මත් ද්‍රව්‍ය පරිහරණය තුරන් කිරීමට රජය ක්‍රියා කළ යුතුය.

36. විශේෂයෙන්ම කායික හා මානසික දුබලතා ඇති අයට හා කාන්තාවන් හා ළමයින්ට එරෙහි බරපතළ අපරාධ සම්බන්ධයෙන් හැර අන් සියලු ම දඬුවම් වරදට සමානුපාතික හා ප්‍රතිශෝධක දඬුවම් වන බවට රාජ්‍යය වග බලා ගත යුතු ය.

37. රාජ්‍යය, ජාත්‍යන්තර සාමය, ආරක්ෂාව හා සහයෝගය ප්‍රවර්ධනය කරමින්, සාධාරණ අන්තර්ජාතික ආර්ථික හා සමාජීය ක්‍රමයක් ස්ථාපිත කිරීමට සහාය දෙමින් ජාත්‍යන්තර නීතිය පෝෂණය කරමින් එයට ගරු කළ යුතුය.

38. ජනතාවගේ ස්වෛරීත්වය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකාව අත්සන් කිරීමට අපේක්ෂා කරන සියලු ම ආර්ථික සම්මුති හා ප්‍රඥප්ති අනුමත කිරීමට පෙර පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීම අනිවාර්ය වන ක්‍රියාදාමයන් තුළින් රජය ක්‍රියාකළ යුතුය.

39. සංස්කෘතික, සමාජ, ආර්ථික හා තාක්ෂණික හුවමාරු සමග සියලු ම ජාතීන් සමග මිත්‍ර සබඳතා පවත්වා ගැනීම රජය විසින් තහවුරු කළ යුතුය.

40. ආර්ථික, සමාජීය, සංස්කෘතික, සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුම්වල එකඟ වී ඇති ආකාරයට රජය ක්‍රියා කළ යුතුය. මෙහිදී විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ළමයින්ගේ හා දුබලතා සහිත පුද්ගලයන්ගේ මානව හිමිකම් වැදගත් වේ.

41. රජය අත්සන් කළ ජාත්‍යන්තර ප්‍රඥප්ති, සම්මුති හා ගිවිසුම් ඒවා අත්සන් කිරීමෙන් අවුරුද්දක් තුළ නීතිගත කිරීමට සහතික වීම රාජ්‍යයේ වගකීමක් වෙයි.

### 11.2.2 රාජ්‍යයේ සහ එහි නිලධාරීන්ගේ මූලික වගකීම්

42. රජයේ, රජයේ සියලු ආයතනවල හා නියෝජිතයන්/නිලධාරීන්ගේ මූලික වගකීම වන්නේ රටේ මූලික හා උත්තරීතර නීතිය ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිගැනීම හා එහි ප්‍රතිපාදන පිළිපැදීමය.

43. ඍජු ව හෝ වක්‍රව රටේ ජනවර්ග ජාතිවාදය කුමන ආකාරයකින් හෝ ප්‍රවර්ධනය කිරීමෙන් වැළකීම රාජ්‍යයේ මූලික වගකීමක් වෙයි. ඒ වෙනුවට රජය ප්‍රවර්ධනය කළ යුත්තේ ඉතා ප්‍රබුද්ධ ආගමික හා අනාගමික මූලධර්ම මත පදනම් වූ ජාතිකවාදය හා පුරවැසි දේශමාමකත්වය, මූලික මානව හිමිකම් හා විශ්වදේශ වාදයයි.

44. පොලිස් නිලධාරීන් ඇතුළු සියලු ම රාජ්‍ය නිලධාරීන්ගේ මූලික වගකීමක් වන්නේ පුරවැසියන්ට සේවය කිරීමත්, ඔවුන්ට ආචාරශීලී වීමත්, ඉහළ ම වෘත්තීය ප්‍රමිතීන් පවත්වා ගැනීමත්, අයථා අනුග්‍රහයන්, ඥාති සංග්‍රහ හා කුමන ආකාරයක හෝ මූල්‍ය හෝ වෙනත් නොපනතත්කම්වලින් වැළකීමත්ය.

### 11.2.3 **පුරවැසියන්ගේ මූලික වගකීම්**

45. අයිතීන් හා නිදහස ක්‍රියාත්මක වීම හා භුක්ති විඳීම, වගකීම් හා බැඳීම්වලින් වෙන් කළ නොහැකි වන හෙයින් පහත දැක්වෙන කරුණු ශ්‍රී ලංකාවේ ජීවත් වන සියලු ම පුද්ගලයන්ගේ වගකීම් වේ.

අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා නීතිය රැක ගැනීම හා ආරක්ෂා කිරීම

ආ) ජාතික අපේක්ෂාවන්ට අනුග්‍රහය දැක්වීම හා ජාතික එක්සත් බව පෝෂණය කිරීම

ඇ) මහජන දේපළ සංරක්ෂණය කර ආරක්ෂා කිරීම හා පොදු දේපළ අවභාවිතය හා අපතේ යැවීමට විරුද්ධව ක්‍රියා කිරීම

ඈ) අන් අයගේ අයිතීන් හා නිදහසට ගරු කිරීම

ඉ) පරිසරය ආරක්ෂා කිරීම හා එහි පොහොසත් බව, සම්පත් සංරක්ෂණය කිරීම

46. වෛරී ප්‍රකාශනවලින් වැළකීමත්,සමාජ අසමගියට හේතු වන හෝ සමාජ කැළඹීමකට හේතු වන ප්‍රකාශ කිරීමෙන් වැළකීමත්, සියලු ම පුරවැසියන්ගේ මූලික වගකීමක් වේ. නියාමක මූල ධර්ම, නීති මගින් ක්‍රියා කළ හැකි දේ බවට පත් කළ යුතු යයි ඉතා ප්‍රබල ඉල්ලීම් තිබුණි. කමිටුව මෙම අදහසට අනුවේදී වුවත්, මෙම කොටසේ අඩංගු මූලධර්ම සම්බන්ධයෙන් ඉන්දියානු ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන නිර්දේශ කිරීමට එකඟ වූහ.

47. මෙම පරිච්ඡේදයේ අඩංගු ප්‍රතිපාදන කිසි ම උසාවියක හෝ අධිකරණයක බලාත්මක කළ හැකි නොවේ.

# 12 පරිච්ඡේදය

# මූලික අයිතිවාසිකම්

## 12.1 ඉදිරිපත් කළ අදහස්

සමස්තයක් වශයෙන් ගත් කළ මූලික අයිතිවාසිකම් (දේශපාලන, සිවිල්, සමාජීය, සංස්කෘතික හා ආර්ථික අයිතිවාසිකම්) හා කණ්ඩායම් අයිතිවාසිකම් ගැන අදහස් ඉදිරිපත් කළ සියලු දෙනා ම ඒකමතිකව ඉල්ලා සිටියේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේද ශක්තිමත් කිරීමත්, පුළුල් කිරීමත්, මෙන් ම ආණ්ඩුක්‍රමව්‍යවස්ථා ප්‍රතිපාදන වඩා හොඳින් ක්‍රියාත්මක කිරීමත්ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මානව හිමිකම් පිළිබඳ පරිච්ඡේදය පුළුල් කිරීම ප්‍රජාතන්ත්‍රීකරණය දෙසට තබන පියවරක් ලෙස සැලකිය හැකියි. 1948 මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් එළිදැක්වූ පළමු පරම්පරාවේ අයිතිවාසිකම්වලට අතිකුත් ව්‍යතිරේඛීමානව අයිතිවාසිකම් ප්‍රඥප්තීන් එක් කර ගැනීමෙන් ජාත්‍යන්තර වශයෙන් සිදුවී තිබෙන වර්ධනයන්ට අනුකූලව අයිතිවාසිකම් පනතක් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් කළ යුතු යැයි කමිටුව ඉදිරියේ අදහස් දැක්වූ බොහෝ දෙනෙකු ප්‍රකාශ කළෝය. ශ්‍රී ලංකාව අත්සන් කර ඇති ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුති අතර සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුම, සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුමේ ව්‍යතිරේඛී ගිවිසුම, ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ගිවිසුම ආදිය වෙයි. මෙම ජාත්‍යන්තර ගිවිසුම්වල නිශ්චිතව දක්වා ඇති අයිතිවාසිකම්, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අයිතිවාසිකම් පනතේ පිළිබිඹු විය යුතුය.

විවිධ වයස් කාණ්ඩවලට අයත් කණ්ඩායම්ද, වාර්ගික, භාෂා හා ආගමික අනන්‍යතා, ලිංගික අනන්‍යතා හා විශේෂ අවශ්‍යතා මත පදනම් වූ කණ්ඩායම් විසින් ද, යෝජනා ගණනාවක් ඉදිරිපත් කරන ලදී. ඔවුන්ගේ අනන්‍යතාව නිසා ඔවුන් නිතර පීඩනයට හා සූරාකෑමට ලක් වන හෙයින් මෙම කණ්ඩායම් විශේෂ පිළිගැනීමක් හා ආරක්ෂාවක් ඉල්ලා සිටියහ. මෙයින් සමහරක් බහුතර දේශපාලනයට අසු වී ඇති කලාපීය හෝ ප්‍රාදේශිය මට්ටම්වල දී ප්‍රධාන ජන කණ්ඩායම් තුළ සිටින සුළුතර කණ්ඩායම් වේ.

ප්‍රාදේශීය මට්ටම්වලදී සුළුතර/බහුතර ගතිකය වෙනස් වන බව සඳහන් කළ යුතුය. උදාහරණයක් වශයෙන් ජාතික ජනවාර්ගික සංයුතිය ප්‍රාදේශිය මට්ටම්වලදී වෙනස් වේ. මෙහිදී වෙනස් ගතිකයන් ක්‍රියාත්මක වීමෙන් නව සුළුතරයන් නිර්මාණය වේ. ජනවාර්ගික සබඳතා සම්බන්ධයෙන් පමණක් නොව සමාජයේ හා දේශපාලන ක්‍රමයේ විවිධ මට්ටම්වලදී

ආගම, කුලය, පන්තිය හා අනිකුත් සමාජ සංස්කෘතික වෙනස්කම් සම්බන්ධයෙන් ද, බහුතරවාදී දේශපාලනය දකිත්තට ලැබෙන බව පිළිගැනීම වැදගත් වේ. අප වෙත නියෝජන ඉදිරිපත් කළ කාන්තා කණ්ඩායම්, කුල කණ්ඩායම්, සුළුතර ජනවාර්ගික හා ආගමික කණ්ඩායම් ප්‍රාදේශීය මට්ටමේ දකින්ට ලැබෙන සූරා කෑම හා ආධිපත්‍යය විස්තර කළහ. මේ නිසා ප්‍රාදේශීය අධිපති කණ්ඩායම් විසින් වෙනස් ලෙස සලකනු ලැබීමට භාජනය විය හැකි කණ්ඩායම්වල අයිතිවාසිකම් හා ආරක්ෂාව සහතික කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ.

අධිපති කණ්ඩායම් හා ඔවුන්ගේ දෘෂ්ටිවාදවලින් පුද්ගල නිදහස උල්ලංඝනය වීමේ අවදානමක් ද, තිබේ. මෙය වඩාත් ම දැකිය හැකි වන්නේ බොහෝවිට බලහත්කාරය සහ ආධිපත්‍යයයොදවා ආරෝපනය කිරීම මගින් බලහත්කාරී ලෙස ක්‍රියාත්මක කරන සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ සන්දර්භය තුළය. කමිටුව ඉදිරියේ දැක්වූ අදහස්වලින් පැහැදිලි වූයේ මේ අතින් විශේෂයෙන්ම අනාරක්ෂිත වන්නේ කාන්තාවන්, සුළුතර ජනවාර්ගික කණ්ඩායම් හා ආදිවාසී කණ්ඩායම් බවයි.

කමිටුව ඉදිරියේ අදහස් දැක්වූ කණ්ඩායම් අතර නුවරඑළිය, බදුල්ල, මහනුවර, රත්නපුර, කෑගල්ල, මොනරාගල, වවුනියා, කිලිනොච්චි හා කොළඹ ජීවත් වන මලයහ (කඳුරට) දෙමළ ජාතිකයන්, මැලේ ජාතිකයන්, බර්ගර් ජාතිකයන්, මඩකලපුවේ පෘතුගීසි කථා කරන බර්ගර් ප්‍රජාව, මොනරාගල, බදුල්ල හා මඩකලපුවේ ආදීවාසි කණ්ඩායම්, තෙළිගු කථා කරන ප්‍රජාවන්, මලයාලි ජනයා, පුත්තලමේ ජීවත් වන අප්‍රිකානු සම්භවයක් සහිත ප්‍රජාව හා සුළුතර ආගමික කණ්ඩායම් ද විය. මෙම කණ්ඩායම් විසින් ඉදිරිපත් කළ අදහස වූයේ භාෂාව, ජීවන ක්‍රම, භාවිතයන් ආදී ඔවුන්ගේ විශේෂිත සංස්කෘතික අනන්‍යතා පිළිගැනීමයි. නියෝජ්‍ය ආයතන සඳහා විශේෂ පියවර හා අවුරුදු ගණනාවක නො සලකා හැරීම වෙනුවෙන් ප්‍රතිජානන පියවරයන් ගන්නා ලෙස ද, ඔවුහු ඉල්ලා සිටියහ.

බොහෝ කණ්ඩායම් ඔවුන්ගේ විශේෂිත සංස්කෘතික අනන්‍යතාව පිළිගැනීම හා ප්‍රතිජානනපියවරයන් සඳහාඉල්ලීම් ඉදිරිපත් කළේවිවිධ මට්ටම්වලදී තමන් පුද්ගලයන් සහ සමූහ වශයෙන් අසමාන සැලකීම්වලට, බැහැර කිරීමට සහ ආන්තිකකරණයට භාජනය වන බැවිනි. මෙය බහුතර සංස්කෘතියේ ආධිපත්‍යයේ ප්‍රතිඵලයක් විය හැකියි. බහුතර කණ්ඩායම් රාජ්‍ය අංශයේ ප්‍රමුඛත්වය දරන බැවින් හා තීරණ ගැනීමේ තනතුරු ඔවුන් විසින් දරන බැවින් පොදු සේවා ලබා ගැනීමේදී පවා ඔවුන් වෙනස් ලෙස සැලකීමට භාජනය වන බව මෙම කණ්ඩායම් කියා සිටියහ. මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ මලයහ

(කඳුරට)දෙමළ ජනයා කියා සිටියේ ඔවුන් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ බහුල ලෙස ඒකරාශී වී සිටියත් වෙනස් ලෙස සලකන පළාත් පාලන පනත් හා දේශපාලනීකරණය වූ රාජ්‍ය සේවය නිසා ඔවුන්ට මහජන සේවා ලබා ගැනීමේ අයිතිය අහිමි වී ඇති බවයි.[42]

එම නිසා විශේෂ කණ්ඩායම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව පිළිගනිමින්, ශ්‍රී ලාංකික සමාජයේ බහුවිධ අනන්‍යතා සැලකිල්ලට ගනිමින්, නව ව්‍යවස්ථාවෙන් පුද්ගල අයිතිවාසිකම් සහතික කිරීමේ ක්‍රම සොයා ගැනීම අවශ්‍ය වේ. විවිධ මට්ටම්වල දක්නට ලැබෙන බහුතරවාදයේ අනතුර පිළිගෙන ඒ ගැන අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

බොහෝ දෙනෙක් රැකියා, ජීවනෝපාය මෙන් ම අධ්‍යාපනය හා සෞඛ්‍යය වැනි සේවාවන් සඳහා පුද්ගලික අංශය මත යැපෙන බැවින් විධිමත් බලාත්මක කිරීමේ යාන්ත්‍රණයක් සහිත ව මූලික/මානව අයිතිවාසිකම් පිළිබඳ අධිකාර බලය යටතේ පුද්ගලික අංශය ද, ආවරණය කිරීමේ වැදගත්කම බොහෝ දෙනෙක් පෙන්වා දුන්හ.

ඉදිරිපත් කරන ලද අදහස් සැලකිල්ලට ගනිමින් කමිටුව නිර්දේශ කරන්නේ අයිතිවාසිකම් පනතක් ලෙස මානව හිමිකම් ඇතුළත් කිරීමෙන් මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය වැඩි දියුණු කළ යුතු බවයි. පහත දැක්වෙන නිර්දේශ සකස් කිරීමේදී අපි සමහර අවස්ථාවල පුද්ගලයන් හා කණ්ඩායම් විසින් තම නියෝජනයේදී යොදා ගත් භාෂා ව්‍යවහාරය ම භාවිතා කර ඇති බව සඳහන් කරමු.

## 12.2 නිර්දේශ

12.2.1 පහත සඳහන් ප්‍රතිපාදන සහිත නව **අයිතිවාසිකම් පනතක්** කමිටුව නිර්දේශ කරයි.

1. **ජීවිතයට ඇති අයිතිය**

   මෙය 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු වුවත් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මෙම මූලික අයිතිය අතුළත් නොවීම පුදුමයකි. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ නඩු තීන්දුවලදී ජීවිතයට ඇති මූලික අයිතිය නෛතික වශයෙන් පිළිගෙන තිබේ. ජීවිතයට ඇති අයිතිය විශේෂිත ව එක් කළ යුතු වන්නේ සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස, කම්කරු, රැකියා, ජීවනෝපාය, පරිසරය ආදී බොහෝ මූලික හා මානව අයිතිවාසිකම් ලැබෙන්නේ මෙම මූලික ජීවිතයට ඇති අයිතිය තුළින් වන බැවිනි. ජීවිතයට ඇති අයිතිය මිනිස් ජීවිතයේ කේන්ද්‍රය වන

[42] 1998 අංක15 දරණ ප්‍රාදේශීය සභා පනත, 1871 හා 1937 අංක 26 දරණ ගම් සභා ආඥාපනත, 1938 අංක 60 දරණ ගම් සභා ආඥාපනතට සිදුකළ සංශෝධනය, 1964 අංක 6 දරණ ගම් සභා නීතිය, 1889 අංක 13 දරණ (ඉන්දියානු) වතු කම්කරු ආඥාපනත, වතු වෙද්‍ය සේවා ආඥාපනත

අතර ශ්‍රී ලංකාව අත්සන් කර ඇති බොහෝ ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතිවල මෙය අඩංගු වේ.

මේ අනුව අපි පහත සඳහන් වගන්තිය යෝජනා කරමු.

"සෑම පුද්ගලයෙකුට ම ජීවිතයට, නිදහසට හා ආරක්ෂාවට නෛසර්ගික අයිතියක් ඇති අතර කිසිම පුද්ගලයෙකුට අත්තනෝමතික ලෙස ජීවිතය, නිදහස සහ ආරක්ෂාව අහිමි නො කළ යුතුය"

**2. සමානාත්මතාවයට ඇති අයිතිය**

ප්‍රජාතාන්ත්‍රික සමාජයක් ගොඩ නැඟීමේ අත්තිවාරම වන්නේ **සමානාත්මතාවට** ඇති අයිතියයි. අප ඉදිරියේ අදහස් දැක්වූ අය තදින් ම කියා සිටියේ **සමානාත්මතාවට** ඇති අයිතිය යනු නීතියේ ආධිපත්‍යය පමණක් නොවන බවයි. එය ඊට වඩා පුළුල් විය යුතුය. **සමානාත්මතාවට** ඇති අයිතිය ආරක්ෂා කිරීමට නීති තිබිය යුතුය. **සමානාත්මතාවට** ඇති අයිතිය ආරක්ෂා කිරීම සඳහා අසමාන සැලකීම් දැක්වීම පිටු දැකීමට නීති පැනවිය යුතුය. උදාහරණයක් වශයෙන් දැනට පවතින සම්මත නීති හා භාවිතයන් තුළ කුලය මුල් කරගෙන වෙනස් ලෙස සැලකීමේ අවස්ථා ඇති බව පෙන්වා දෙන ලදී. මෙයින් සමහරක් විශේෂ අවධානය යොමු විය යුතු ඉතා සංවේදී ගැටලු වන අතර ඒවා සිවිල් සමාජයේ මැදිහත් වීම තුළින් විසඳිය යුතු වේ. මේ නිසා **සමානාත්මතාව**ආරක්ෂා කිරීමේ නීතියක් සම්මත කර ගැනීමට අමතරව මෙවැනි ප්‍රශ්න ගැන ක්‍රියා කිරීම සඳහා වෙනස් ලෙස සැලකීමට විරුද්ධ අසමාන ලෙස සැලකීම පිටුදැකීමේ කොමිසමක් පත් කළ යුතු යයි යෝජනා කෙරේ.

අයිතිවාසිකම් පිළිබඳ පනතට අපි පහත සඳහන් වගන්ති යෝජනා කරමු.

- සෑම පුරවැසියෙකුට ම **සමානාත්මතාවට ඇති** අයිතිය හා එය බලාත්මක කිරීම සහතික කෙරේ.
- ජාතිය, ආගම, කුලය, වෛවාහක තත්ත්වය, මාතෘ භාවය, වයස, භාෂාව, කායික හෝ මානසික දුබලතාව,ගැබිණි බව, සිවිල් තත්ත්වය, වැන්දඹු වීම, සමාජ සම්භවය, ලිංගිකත්ව නැඹුරුව හෝ ලිංගිකත්වය සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ අනන්‍යතාව මත පදනම් ව කිසි ම පුද්ගලයෙක් හෝ කණ්ඩායමකට වෙනස් ලෙස නො සැලකිය යුතු ය.

- අතීතයේ සිදුවූ ආන්තිකකරණයන් හා කොන් කිරීම් පිළි ගනිමින් කාන්තාවන්, දුබලතා සහිත පුද්ගලයන්, දූගීන්, නූගතුන් හා පීඩිත කුල කණ්ඩායම් හෝ විශේෂ ලෙස හඳුනා ගත් කණ්ඩායම් වැනි වෙනස් ලෙස සැලකීමට භාජනය වන ආන්තික කණ්ඩායම්වලට සමානාත්මතාව හිමිකර ගැනීමට අවශ්‍ය විශේෂිත පියවර  රජය විසින් ගත යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මෙම ප්‍රතිපාදන තුළ  එවැනි පියවර  වෙනස් ලෙස සැලකීමක් නො වනු ඇත.
- කාන්තාවන්ගේ ගරුත්වය, සුබ සාධනය හෝ අපේක්ෂාවන්ට විරුද්ධ වන හෝ ඔවුන්ගේ තත්ත්වය පහත හෙළන හෝ  නීති, සංස්කෘති, චාරිත්‍ර හෝ සම්ප්‍රදායන් තහනම් කළ යුතුය.
- පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට සමාන අයිතිවාසිකම් තිබේ. විශේෂයෙන්ම පවුලේ, අධ්‍යාපනයේ, සෞඛ්‍යයේ,  සෙවණ සැපයීමේ,  දේපළ අයිතියේ, ජීවනෝපායේ,  රැකියාවේ, වැඩපොළෙහි හා දේශපාලනයෙහිස්ත්‍රීන්ට ඇති සමානාත්මතාව නීතිය සහ භාවිතාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් තහවුරු කළ යුතුය.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලධර්මවලට පටහැණි නීතිවලට පැවතීමට ඉඩ ලබාදෙන වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 16 වැනි ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුය.  වෙනස් ලෙස සැලකීමට තුඩු දෙන  චාරිත්‍රානුකූල හා සාම්ප්‍රදායික නීති සංශෝධනය කිරීම/ඉවත් කිරීම පිළිබඳ ව සියලු ප්‍රජාවන් සමග සාකච්ඡා කර  සාම්ප්‍රදායික නීති හා චාරිත්‍ර පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් සොයා බැලීමට  ඉහළ මට්ටමේ නියෝජිත කමිටුවක් පත් කරන ලෙස  මෙම කමිටුව නිර්දේශ කරයි.[43]

## 3. මානව ගරුත්වය

සෑම පුද්ගලයෙකුට ම නෛසර්ගික පුද්ගල අභිමානය, ස්වාධිකාරය හා පුද්ගලත්වය පිළිගනී.

[43] කුෂාන් ද අල්විස්, ජ.නී හා එම්.වයි.එම් ෆායිස්.  වර්තමාන ව්‍යවස්ථාවේ 15 හා 16 වගන්තිවල සඳහන් සීමාවන්ට යටත්ව, මෙම කොටසේ මූලික අයිතිවාසිකම් පිළිබඳව දක්වා ඇති කරුණු වලට එකඟ වේ.

## 4. පුද්ගල නිදහස හා ආරක්ෂාව

රඳවා ගැනීම හා රැඳවියන්ට සලකන ආකාරය සම්බන්ධයෙන් බොහෝ නියෝජන ඉදිරිපත් කරන ලදී. අත්තනෝමතික රඳවා ගැනීම්, වධ දීම් හා අධිකරණ ක්‍රියාවලියේ පිළිගත නො හැකි ප්‍රමාදසහ හිඩැස්වල ප්‍රතිඵලයක් ලෙස පීඩා විඳීමට සිදු වූ බොහෝ දෙනෙක් කමිටුව ඉදිරියේ අදහස් දැක්වූහ. මෙය දේශීය හා ජාත්‍යන්තර මානව හිමිකම් ආයතන හා ක්‍රියාකාරීන්ගෙන් ශ්‍රී ලංකා රජය දෝෂාරෝපණයට ලක් වූ ක්ෂේත්‍රයකි. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා මූලික අයිතිවාසිකම් පිළිබඳ නව පරිච්ඡේදයක් පිළිබඳව සඳහන් වන (2009) කමිටු වාර්තාවේ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම, රඳවා ගැනීම හා දඬුවම් දීම පිළිබඳ පුළුල් වගන්තියක් (13 වගන්තිය) තිබේ.

මෙයට අමතරව පහත දැක්වෙන කරුණු ද, අයිතිවාසිකම් පනතට ඇතුළත් කළ යුතු යයි අපි නිර්දේශ කරමු:

- කිසිම පුද්ගලයෙකුගේ නිදහස අත්තනෝමතික ලෙස අහිමි නො කළ යුතු මෙන් ම විධිමත් නඩු විභාගයකින් තොර ව කිසිවෙක් රඳවා නො ගැනීම
- පෞද්ගලික හා පෞද්ගලික ස්ථානවලදී අවමානයට, කුරිරු හෝ අමානුෂික ලෙස සැලකීමට හෝ වධ දීමට ලක් නොවීමේ නිදහස
- ස්වාධිකාරය ක්‍රියාත්මක කිරීමේ හා ප්‍රජනනය පිළිබඳ තීරණ ඇතුලු කායික පූර්ණත්වය විඳීමේ නිදහස
- රඳවා ගැනීමේදී, අධිකරණ ක්‍රියාවලියේදී හා රැඳවීමෙන් නිදහස් කිරීමේදී විධිමත් ක්‍රියා මාර්ග අනුගමනය කිරීම.
- පිටුවහල් කිරීමෙන් පසු පුද්ගලයෙක් වධ දීමට ලක් වීමට ඉඩ ඇත්නම් පිටුවහල් නො කිරීමේ අයිතිය
- ගරුත්වයෙන් සලකමින් හා ප්‍රතිශෝධනයට අවස්ථා ලබා දෙමින් සිරකරුවන් පුනරුත්ථාපනය කර නිදහස් කිරීමට රජය සහතික විය යුතුය.

## 5. පෞද්ගලිකත්වයට හා පවුල් ජීවිතයට ඇති අයිතිය

ආබාධ සහිත පුද්ගලයන්ට එහි ඇති ගම්‍යාර්ථය සමග පෞද්ගලිකත්වයට ඇති අයිතිය මූලික අයිතියක් ලෙස නියම කළ යුතුය. මෙයට වෛද්‍ය හා අනිකුත් වාර්තා, නිවස හා පවුල මෙන් ම මැතිවරණ ක්‍රියාවලිය ඇතුළු පුද්ගලික සන්නිවේදන

වැනි ආකාරයේ ලිපි ලේඛන,සෝදිසියෙන් හා ඒවාට මැදිහත් වීමෙන් ආරක්ෂාව ද, ඇතුළත් විය යුතු ය.

- සෑම පුද්ගලයෙකුට ම පෞද්ගලිකත්වයේ අයිතිය, පවුල් ජීවිතයට අත්තනෝමතික ලෙස මැදිහත් වීමෙන් ආරක්ෂා වීමේ අයිතිය, නිවසේ, ලිපි ලේඛන හා සන්නිවේදනවල අනුල්ලංඝනීයත්වය ඇති අතර එවැනි පුද්ගලයෙකුගේ ගරුත්වයට හා කීර්තියට නීති විරෝධි ලෙස පහර නො දිය යුතුය.
- වයස් සම්පූර්ණ වී ඇති සියලු පුද්ගලයන්ට ජනවර්ගය, ජාතිය, ආගම, ලිංගික අනන්‍යතාව හෝ ලිංගික නැඹුරුව ආදියේ සීමාවන්ගෙන් තොරව විවාහ වීමට හා පවුලක් සෑදීමට අයිතිය තිබේ. විවාහයට, විවාහය තුළ හා එය අවලංගු කිරීමෙන් පසුව ඔවුන්ට සමාන අයිතිවාසිකම් තිබේ.

## 6. ආගම, විශ්වාස, හෘද සාක්ෂියේ හා සිතීමේ නිදහස

ආගම හා විශ්වාස පිළිබඳ නිදහස පිළිබඳ ව සඳහන් වන වගන්තිය ශක්තිමත් කිරීමේ අවශ්‍යතා කමිටුව ඉදිරියේ කරුණු දැක්වූ බොහෝ අය විසින් පෙන්වා දෙන ලදී. මෙයට පදනම් වූ තර්ක දෙකක් විය. පළමුවැන්න වූයේ පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9වැනි ව්‍යවස්ථාව වෙනස් නොවන බැවින් බුද්ධාගම හැර අනිත් ආගම්වලට නිදහස හා ආරක්ෂාව ලබා දෙන ව්‍යවස්ථාමය සහතිකයක් අවශ්‍ය බවයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වැනි ව්‍යවස්ථාව වෙනස් කිරීමකට හෝ ඉවත් කිරීමකට භාජනය වුවත්, ආගමික නිදහසට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රබල ආරක්ෂාවක් ලැබිය යුතුය යන්න සමහරුන්ගේ අදහස විය.1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (10 ව්‍යවස්ථාව, පරිච්ඡේදය 3) දැනටමත් සිතීමේ, හෘද සාක්ෂියේ හා ආගමේ නිදහස ලබාදී තිබේ. සුළු සංශෝධන හා පහත දැක්වෙන කොටස් එකතු කරමින් මෙය රඳවා ගත යුතුය.

- මෙම ඡේදයෙන් ප්‍රකාශිත හා පිළිගත් මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ දකිසිම සීමා කිරීමක් නො විය යුතුය.
- ඇදහීමක් අනුගමනය නො කරන්නන්ගේ අයිතිවාසිකම්වලට ද ගරු කළ යුතුය.

## 7. අදහස් පළ කිරීමේ, රැස්වීමේ, පෙළපාලි යෑමේ,පිකට් කිරීමේ, පෙත්සම් ඉදිරිපත් කිරීමේ හා සංගම් පිහිටුවේ නිදහස

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) ව්‍යවස්ථාව රඳවා ගැනීම කළ යුතුය.

## 8. පුරවැසිභාවය

පුරවැසිභාවය පිළිබඳ ප්‍රශ්නය ප්‍රබල ලෙස පැන නැඟුණේ ඉන්දියානු සම්භවයක් ඇති ජනයාගෙනි. පුරවැසි අයිතිවාසිකම් සම්බන්ධයෙන් ද, සාකච්ඡා කරන ලදී. උදාහරණයක් වශයෙන් විශේෂයෙන්ම ද්විත්ව පුරවැසියන්ගේ ඉඩම්, දේපළ හා දේශපාලන අයිතිය සම්බන්ධයෙන් විවිධ මත පළ වුණි. අපි පහත දැක්වෙන යෝජනාව ඉදිරිපත් කරමු.

- පුරවැසි තත්ත්වය සම්බන්ධයෙන් ජාතිය, ආගම. කුලය, විවාහක තත්වය, මාතෘ භාවය, වයස, භාෂාව, මානසික හෝ කායික දුබලතා, ගැබ්ණිබව, සිවිල් තත්ත්වය, වැන්දඹුබව, ලිංගික නැඹුරුව, හෝ ලිංගික අනන්‍යතාව මත කිසිම වෙනස් ලෙස සැලකීමක් නො විය යුතුය. සියලු ම පුරවැසියන්ට පුරවැසිභාවයේ අයිතිවාසිකම්, වරප්‍රසාද හා ප්‍රතිලාභ සමාන ලෙස හිමි වන අතර ඒ ආකාරයට ම පුරවැසිභාවයේ වගකීම් හා නියමයන්ට ද යටත් වේ.

## 9. පදිංචියේ හා ගමන් බිමන් යෑමේ නිදහස

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) ව්‍යවස්ථාව රඳවා ගැනීම කළ යුතුය.

## 10. ආපසු පැමිණීමේ නිදහස

යුද්ධය නිසා රටින් පිටවී යෑමට සිදුවූ අය ආපසු ශ්‍රී ලංකාව ඒමේ දී මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව කමිටුවේ අවධානය යොමු කරන ලදී. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමේ අයිතිය පිළිගත්තා නමුත් ආපසු එන අය මුහුණ පාන බාධක සැලකිල්ලට ගනිමින් මෙම ප්‍රතිපාදනය වැඩි දියුණු කර ශක්තිමත් කරන ලෙස ඉල්ලා සිටින ලදි. ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවෙන් මේ සියලු ම ගැටලු විසඳිය නො හැකි නමුත් අපි පහත දැක්වෙන නිර්දේශය ඉදිරිපත් කරමු.

- ආපසු පැමිණීම පහසු කිරීම සඳහා රජයේ වගකීම දක්වන වගන්තියක් නියාමක මූලධර්මවලට ඇතුළත් කිරීම.
- පහත දැක්වෙන විශේෂිත වගන්ති ඇතුළත් කළ යුතුය:

- ○ සෑම පුරවැසියෙකුට ම ජනරජයට ආපසු පැමිණීමේ අයිතිය තිබේ.
- ○ ඔහුගේ/ඇගේ රටට ආපසු පැමිණීමේ අයිතිය අත්තනෝමතික ලෙස කිසිම කෙනෙකුට අහිමි නො කළ යුතු ය.

## 11. සාධාරණ පරිපාලනමය ක්‍රියා සඳහා ඇති අයිතිය

සේවා ලබා ගැනීමේදී හා අසාධාරණ පරිපාලන භාවිතයන් පිළිබඳ දුක්ගැනවිලි බොහෝ දෙනෙක් අපට ඉදිරිපත් කළහ. ඇත්ත වශයෙන් ම රාජ්‍ය අංශය ගැන කළකිරීමට ප්‍රධාන ම හේතුවත් මෙයයි. දුක්ගැනවිලිවලට ප්‍රතිචාර දැක්වීමේ යන්ත්‍රණයක් නො තිබීම හෝ පවතින යන්ත්‍රණ ඵලදායී නොවීම දුර්වලතා ලෙස පෙන්වා දෙන ලදී. තම දුක්ගැනවිලි ගැන ප්‍රතිචාරයක් ලබා ගැනීමට අවුරුදු ගණන් බලා සිටීමට සිදු වූ අවස්ථා ඔවුන් පෙන්වා දුණි. ඉතා සංවේදී මෙම ගැටලුව සම්බන්ධයෙන් කෙන්යාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති වගන්තියට සමාන වගන්තියක් අපි යෝජනා කරමු:

- ඉක්මන්, කාර්යක්ෂම, නීත්‍යානුකූල යුක්ති සහගත හාපටිපාටිවලට අනුව සාධාරණ පරිපාලන ක්‍රියාකාරීත්වයකට සෑම පුද්ගලයෙකුට ම අයිතියක් තිබේ.
- පුද්ගලයෙකුගේ අයිතිවාසිකමක් හෝ මූලික නිදහසක් කෙරෙහි පරිපාලන ක්‍රියාවක් නිසා අහිතකර බලපෑමක් ඇති වේ නම් එම ක්‍රියාව සඳහා හේතු ලිඛිත ව ලබා ගැනීමට එම පුද්ගලයාට අයිතියක් තිබේ.
- (1) වගන්තියේ සඳහන් අයිතිවාසිකම ලබා දීම සඳහා පාර්ලිමේන්තුව නීති සම්මත කළ යුතු අතර (අ) අධිකරණයක් හෝ උචිත හා අපක්ෂපාතී විනිශ්චය සභාවක් මගින් පරිපාලන ක්‍රියාවක් සමාලෝචනයට භාජනය කිරීම (ආ) කාර්යක්ෂම පරිපාලනයක් ප්‍රවර්ධනය කිරීමට එම නීති මගින් ඉඩ සැලසිය යුතු ය.

## 12. සෞඛ්‍යයට ඇති අයිතිය

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය රැකවරණයට ඇති අයිතිය මූලික අයිතියක් ලෙස දක්වා නොමැති නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියාමක මූලධර්ම පිළිබඳ පරිච්ඡේදයේ 27 (2) (ඇ) ව්‍යවස්ථාවෙහි වක්‍ර ව සඳහන් කර තිබේ. එය 29 වැනි ඡේදය මත පදනම් වී ඇති අතර ඒ ගැන නීතියෙන් ක්‍රියා කළ නො හැකිවාක් මෙන් ම කිසිම උසාවියකින්

ආරක්ෂාවක් නො ලැබේ. සෞඛ්‍යයට ඇති අයිතිය සමග නිදහස් සෞඛ්‍ය සේවයට ශ්‍රී ලංකාවේ ඇති දීර්ඝ කාලීන කැපවීම අනුව යමින් සෞඛ්‍ය ප්‍රතිපත්තිවලට මඟ පෙන්විය හැකි උචිත කොටසක් නියාමක මූලධර්ම පිළිබඳ පරිච්ඡේදයේ ඇතුළත් කළ යුතුය. සෞඛ්‍ය සේවා ලබා ගැනීමේ දුෂ්කරතා, සෞඛ්‍ය සේවයේ හා වෛද්‍ය ප්‍රතිකාරවල ගුණාත්මක භාවය, පුද්ගලික සෞඛ්‍ය සේවාවල අධිකතර මිල මෙන් ම මේ අංශයේ නියාමනයක් නොමැති වීම ආදිය ගැන කමිටුවට බොහෝ පැමිණිලි ලැබුණි. මේ නිසා සෞඛ්‍යයට ඇති අයිතිය මූලික/මානව හිමිකමක් ලෙස මෙසේ ඇතුළත් කළ යුතුය.

- ලබා ගත හැකි ඉහළ ම මට්ටමේ කායික, මානසික හා සමාජීය සෞඛ්‍ය සේවා ලබා ගැනීමට පුරවැසියාට ඇති අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කෙරේ. සෞඛ්‍ය සේවා, නිවාරණ සේවා හා පානීය ජලය ලබා ගැනීම ඇතුළු සෞඛ්‍යය හා සුබ සාධනයට ප්‍රමාණවත් ජීවන මට්ටමකට සෑම පුරවැසියෙකුට ම අයිතියක් තිබේ.
- කිසිම පුද්ගලයෙකුට හදිසි වෛද්‍ය ප්‍රතිකාර අහිමි නො කළ යුතුය.

## 13. ආහාර, ජලය, නිවාස හා සමාජ ආරක්ෂාව

- ආහාර සුරක්ෂිතතාව හා ආහාර ස්වාධීනත්වයට ඇති අයිතිය
- ප්‍රමාණවත් ආහාර, ජලය, ඇඳුම් හා නිවාස ඇතුළු ප්‍රමාණවත් ජීවන තත්ත්වයක්
- කුස ගින්නෙන් තොර ව සිටීමේ අයිතිය
- සමාජ ආරක්ෂාව හා සමාජ රක්ෂණයට ඇති අයිතිය

## 14. අධ්‍යාපන අයිතිය

සෞඛ්‍ය රැකවරණය සඳහා ඇති අයිතිය මෙන්ම අධ්‍යාපනයට ඇති අයිතිය ද, වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතියක් ලෙස ඇතුළත් කර නැත. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන සම්ප්‍රදාය පිළිගනිමින් අධ්‍යාපනයට ඇති අයිතිය මූලික අයිතියක් ලෙස ව්‍යවස්ථාවට ඇතුළත කළ යුතුය යන්න අපගේ අදහසයි. අපට ලැබුණු බොහෝ අදහස් දැක්වීම්වල ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය රැකගැනීමත්, මෙම ප්‍රතිපත්තිවලට ඇති අභියෝග ජය ගැනීමට ගත යුතු පියවරත්, සඳහන් කර තිබුණි. නිදහස් අධ්‍යාපනයට ඇති අභියෝග ලෙස ඔවුන් දුටුවේ පුද්ගලික

උපකාරක පන්ති මත වැඩි විශ්වාසය තැබීමත්, අධ්‍යාපන සේවා සැපයීමට කිසිම නියාමනයකින් තොර ව පුද්ගලික ව්‍යවසායකයින්ට ඉඩ ලැබීමත්ය. ලබා දෙන අධ්‍යාපනයේ ගුණාත්මක භාවයේ අසමානතා වැඩීම පිළිබඳ ව ද, කරුණු දක්වන ලදී. විශේෂයෙන් ම උසස් අධ්‍යාපනයේ වැඩි වන ඉල්ලුමට ප්‍රතිචාර දැක්වීමේදී රජය මුහුණ දෙන දුෂ්කරතා ගැන ජනතාව දැන සිටියත්, රට පුරා පුද්ගලයන් හා කණ්ඩායම්වල ප්‍රබල ඉල්ලීමක් වූයේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය ශක්තිමත් කිරීමත් පවත්වා ගැනීමත් ඇතුලුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ රජය ප්‍රබලකාර්ය භාරයක් ඉටු කළ යුතු බවයි.

අපි පහත දැක්වෙන වගන්ති යෝජනා කරමු:

- සෑම කෙනෙකුට ම අධ්‍යාපනය ලබා ගැනීමට අයිතියක් ඇති අතර ඒ තුළින් මිනිස් පෞරුෂයේ පූර්ණ සංවර්ධනයත්, ඒ පිළිබඳ අභිමානවත් හැඟීමකුත්, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් හා මූලික නිදහස් ගැන ඇති ගෞරවය ශක්තිමත් යුතුය.
- රජයේ වියදමින් ප්‍රාථමික, ද්විතීයික හා තෘතීය අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය

## 15. ඉඩම් අයිතිය

පනතේ මෙම පරිච්ඡේදය යටතේ පහත දැක්වෙන වගන්ති ඇතුළත් කිරීමට අපි යෝජනා කරමු.

අ. ස්ත්‍රීන්ට ඉඩම් උරුමය ලබා ගැනීමේ අයිතිය සහතික කළ යුතුය.

ආ. වතු අංශයේ ජනතාවට ඔවුන් ජීවත් වන ඉඩම්වල අයිතිය සහතික කළ යුතුය.

ඇ. ඉඩම්වල පදිංචි කිරීමේදී වෙනස් ලෙස සලකනු නො ලැබීමට වාර්ගික කණ්ඩායම්වලට ඇති අයිතිය.

ඈ. ‘සංවර්ධනයේ’ නාමයෙන් ඉඩම් අත්පත් කර ගැනීමෙන් ආරක්ෂා වීමට පුරවැසියාට ඇති අයිතිය

ඉ. පදිංචිවීම හා ජීවනෝපයන් සඳහා ඉඩම් ලබා ගැනීමට ආන්තික හා දුගී ප්‍රජාවන්ට ඇති අයිතිය

ඊ. ස්වාභාවික හා මිනිස් ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ව්‍යසන සිදුවිය හැකි ප්‍රදේශවල ඇති පාරිසරික වශයෙන් සංවේදී ඉඩම් ආරක්ෂා කිරීමේ අයිතිය

ඨ. අකාර්යක්ෂම හා අයෝග්‍ය ආකාරයට ඉඩම් භාවිතයෙන් ආරක්ෂා කිරීමේ අයිතිය

ඩ. වනාන්තර හා රක්ෂිත ඉඩම් අල්ලා ගැනීමෙන් වැළැක්වීමේ අයිතිය

## 16. පරිසරය ආරක්ෂා කිරීම

- සෑම පුද්ගලයෙකුට ම පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න පරිසරයකට අයිතියක් ඇති අතර නෛතික හා වෙනත් පියවර මගින් වර්තමාන හා අනාගත පරම්පරාවල ප්‍රයෝජනය සඳහා පරිසරය ආරක්ෂා කර ගැනීමේ අයිතිය[44]ද, මෙයට ඇතුළත් වේ.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන හා ආරක්ෂා කර ඇති පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න පරිසරයකට ඇති අයිතිය අහිමි කිරීමක්, උල්ලංඝනයක්, කඩ කිරීමක් හෝ තර්ජනයක් සිදු වී ඇතැයි, සිදු වෙමින් පවතී යයි හෝ සිදුවීමට ඉඩ ඇතැයි හෝ යම් කිසි පුද්ගලයෙක් සිතන්නේ නම් එම පුද්ගලයාට එම කරුණ සම්බන්ධයෙන් ඇති නෛතික පියවරට අමතරව උසාවියකින් සහනය ඉල්ලා සිටීමට පුළුවන.
- එවැනි අයැදුමක් සලකා බැලීමෙන් පසු උසාවියට නියෝගයක් නිකුත් කිරීමට, උපදෙස් දීමට හෝ පහත දැක්වෙන ආකාරයේ උචිත ක්‍රියා මාර්ගයක් ගැනීමට හෝ ඉඩ තිබේ.
  - (අ) පරිසරයට හානිකර ඕනෑම ක්‍රියාවක් හෝ අතපසුවීමක් හෝ වැළැක්වීම නතර කිරීම හෝ අත්හිටුවීම
  - (ආ) පරිසරයට හානිකර ඕනෑම ක්‍රියාවක් හෝ අතපසුවීමක් හෝ වැළැක්වීම හෝ අත්හිටුවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුට බල කිරීම
    හෝ
  - (ඇ) පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න පරිසරයකට ඇති අයිතිය උල්ලංඝනය වූ ඕනෑම කෙනෙකුට වන්දි ලබා දීම

[44] කෙන්යාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වගන්තිය 42

## 17. වැඩකිරීමට, රැකියාවට හා ජීවනෝපායට ඇති අයිතිය

ජීවනෝපායන් හා රැකියා ලබා ගැනීම සම්බන්ධයෙන් ජනතාව තුළ ඇති කනස්සල්ල කමිටුවට ඉදිරිපත් කළ බොහෝ  අදහස් දැක්වීම්වලින් පැහැදිලි විය. මෙම ප්‍රශ්නය නගනු ලැබුවේ විශේෂයෙන්ම තරුණයන් සම්බන්ධයෙනි. මේ සමගම  නීති විරෝධී කටයුතුවල යොදවා ළමයින් හා අනිකුත් අනාරක්ෂිත කණ්ඩායම් සූරාකෑම පිළිබඳව ද,  සඳහන් කෙරුණි. බොහෝ තර්ජනයන්ට මුහුණදී ඇති ගොවි ප්‍රජාව හා ධීවර ප්‍රජාව වැනි  විශේෂ කණ්ඩායම්වල ජීවනෝපායන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන්ද කරුණු ඉදිරිපත් කරන ලදී. මෙහිදී ඉදිරිපත් කළ සමහර කරුණු පිළිබඳ ව  කටයුතු කළ යුත්තේ  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියෙන් පිටස්තර ව වේ. කෙසේ නමුත්  අපේ අදහස වන්නේ වැඩ කිරීම, ජීවනෝපාය හා රැකියාවක නිරතවීම පිළිබඳඅවශ්‍යතා අයිතිවාසිකම් ලෙස පිළිගෙන මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ ඇතුළත් කළ යුතු බවයි.

අපි පහත දැක්වෙන වගන්ති යෝජනා කරමු.

- නීතියට අනුකූලව, ස්වයං රැකියාවන් ද, ඇතුළු ව නිදහසේ තෝරා ගත් වෘත්තියක නිරතවීම මගින් වැඩ කිරීමට ඇති අයිතිය
- සෑම පුද්ගලයෙකුට ම සමාන අවස්ථා සඳහා අයිතිය මෙන් ම ජ්‍යෙෂ්ඨත්වය හා හැකියාව හැර, වෙනත් දේ මත පදනම් නොවී, සුදුසු ඉහළ මට්ටමකට ඔහුගේ/ඇයගේ රැකියාවේ උසස්වීමට ද, අයිතිය තිබේ.

## 18. වෘත්තීය සමිති අයිතිවාසිකම්

විශේෂයෙන්ම නව සංවර්ධනයන් හා විදේශ ආයෝජන  නිසා  කම්කරු හා වෘත්තිය සමිති අයිතිවාසිකම්වලට  තර්ජනයක් එල්ල වී ඇතැයි  කමිටුව ඉදිරියට පැමිණි බොහෝ දෙනෙක් ප්‍රකාශ කර සිටි හ. දේශීය ජනතාවට සමහර අයිතිවාසිකම් අහිමි කරමින් අත්සන් කළ හැකි ජාත්‍යන්තර වෙළඳ ගිවිසුම් පිළිබද ව බියක් ද, පළ කෙරුණි. කම්කරු හා වෘත්තිය සමිති  අයිතිවාසිකම් උල්ලංඝනය කළ අවස්ථාවලට උදාහරණ ලෙස නිදහස් වෙළඳ කලාපයේ  කම්කරු අයිතීන් රැක ගැනීමේදි හා ඒ ගැන සාකච්ඡා කිරීමේදී  මුහුණ දෙන ප්‍රශ්න මෙන් ම විශේෂ ගිවිසුම් නිසා විදේශීය ආයෝජකයන් විසින් දේශීය නීති  අනුව කටයුතු නො කරන හෙයින්  වෘත්තිය සමිති සෑදීමට ඇති බාධක ද,  පෙන්වා දෙනු ලැබීය. මේ සම්බන්ධයෙන් අප ඉදිරියේ

කරුණු දැක්වූ අයගේ තර්කය වූයේ මෙම අයිතිවාසිකම් ශක්තිමත් කළ යුතු බවත්, කම්කරු හා වෘත්තිය සමිති අයිතිවාසිකම් සම්බන්ධයෙන් කිසිම සීමා පැනවීමක් නො කළ යුතු බවයි.

මේ අතරම විශේෂයෙන්ම ප්‍රවාහන හා සෞඛ්‍ය සේවාවන් හි ජනතාවට අහිතකර ලෙස බලපාන වැඩවර්ජන මෙහෙයවන සමහර වෘත්තිය සමිතිවල අධික බලය හා බලපෑම පිළිබඳව ද, අදහස් ඉදිරිපත් විය. වර්ජන ක්‍රියාවල ප්‍රතිඵලයක් ලෙස දෛනික ජීවිතය කඩා බිඳ වැටීම ද, සමහර අයගේ උදහසට හේතු විය. වෘත්තිය සමිති අයිතිවාසිකම්වලට ගරු කළ යුතු යැයි පොදු එකඟතාවක් තිබුණත් වෘත්තිය සමිති ක්‍රියා නිසා බොහෝ අපහසුතාවන්ට පත්වන අයගේ අයිතිවාසිකම් සමග වෘත්තීය සමිති අයිතිවාසිකම් තුලිත කළ යුතු බවට ද, අදහසක් ඉදිරිපත් විය.

අපේ යෝජනා පහත දැක්වේ

- තමාගේ මනාපය අනුව වෘත්තිය සමිතියක් සෑදීමට හෝ වෘත්තිය සමිතියකට බැඳීමට හෝ සෑම පුද්ගලයෙකුට ම නිදහස තිබෙන අතර එවැනි වෘත්තිය සමිතිවලට බාධාවකින් තොර ව කටයුතු කිරීමට හැකි විය යුතුය.
- වැඩවර්ජන ඇතුළු වෘත්තිය සමිති කටයුතුවලට සහභාගී වීමට සෑම කෙනෙකුට ම අයිතියක් ඇති අතර එය නීතියට අනුකූලව විය යුතුය.
- ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ජාතික හෝ ආගමික සංහිඳියාව ආරක්ෂා කිරීමට හෝ අන් අයගේ අයිතිවාසිකම් හෝ නිදහස පිළිගැනීමට හෝ ගරු කිරීමට හෝ අවශ්‍ය වන නීතියෙන් නියම කර ඇති සීමා කිරීම් හැර මෙම ඡේදයෙන් පිළිගෙන ඇති හා ප්‍රකාශ කර ඇති අයිතිවාසිකම් සම්බන්ධයෙන් කිසිම සීමා කිරීමක් පැනවිය නොහැක.

## 19. වැඩ කිරීමට සුරක්ෂිත හා නිසි තත්වයන් ලබා ගැනීමේ අයිතිය

වැඩපොළ අනාරක්ෂිත තත්ත්ව මෙන් ම සේවකයන් ආරක්ෂා කිරීමට රජය අසමත් වීම ගැන අප ඉදිරියේ බොහෝ දෙනෙක් කරුණු දැක්වූහ. බොහෝ දෙනෙක් පෙන්වා දුන්නේ දැනට ඇති කම්කරු දෙපාර්තමේන්තුව වැනි ආයතන සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ඔවුන්ගේ වගකීම අතින් අසාර්ථක වී ඇති බවයි. කර්මාන්තශාලා ආඥාපනත වැනි නීති අක්‍රිය වී තිබේ. සේවකයන්ගේ ආරක්ෂාව

මූලික අයිතිවාසිකමක් ලෙස ඇතුළත් කිරීමෙන් මෙය ශක්තිමත් කළ යුතු වේ. මෙය ඇත්ත වශයෙන් ම ජීවිතයට ඇති අයිතියේ දිගුවකි.

මේ නිසා මූලික අයිතිවාසිකම්වලට පහත දැක්වෙන වගන්තිය එක් කිරීමට අපි යෝජනා කරමු.

- සෑම පුද්ගලයෙකුට ම ආරක්ෂිත, නිසි, සෞඛ්‍ය සම්පන්න හා සාධාරණ වැඩ තත්ත්වයන්ට අයිතියක් තිබේ.
- සෑම පුද්ගලයෙකුට ම විවේකය, විනෝදය හා වැඩ කරන පැය ගණනේ සාධාරණ සීමාවකට මෙන් ම පඩි සහිත වාර නිවාඩු හා රජයේ නිවාඩු දින සඳහා ගෙවීම්වලට අයිතියක් තිබේ.

## 20. දේපළ හා ඉඩම් අයිතිය

දේපළ අයිතිය වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ආරක්ෂා කර නැත. ඉඩම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් නොතිබීම ද, බොහෝ ප්‍රශ්නවලට හේතු වී තිබේ (ඉඩම් පිළිබඳ කොටස බලන්න). මෑත කාලයේ නීතිය ඉදිරියට හෝ උසාවියට යෑමට ඉඩක් නොදී සංවර්ධනය සඳහා අත්තනෝමතික ලෙස මිනිසුන් නෙරපීම නිසා දේපළ අයිතිය පිළිබඳ ප්‍රතිපාදන ආණ්ඩුවට ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමේ අවශ්‍යතාව ඉස්මතු වී තිබේ. ප්‍රතිසන්ධාන ප්‍රයත්නයන්ට ද, ඉඩම් අයිතිය කේන්ද්‍රීය වේ. අප ඉදිරියට ආ ආදිවාසි කණ්ඩායම් ද, ඉඩම් භාවිතය හා දේපළ අයිතිය ගැන කරුණු දැක්වූහ.

අපි පහත සඳහන් වගන්ති යෝජනා කරමු.

- සෑම පුරවැසියෙකුට ම තනි ව හෝ වෙනත් අය සමග හෝ දේපළ අයිති කර ගැනීමේ අයිතිය තිබේ.
- සෑම පුද්ගලයෙකුට ම භාවිතය, මාරු කිරීම, පරිපාලනය, පාලනය, අයිතිය, අත්පත් කර ගැනීම, කළමනාකරණය, බුත්තිය, පැවරීම, උරුමය ආදිය සම්බන්ධයෙන් සමාන අයිතිවාසිකම් තිබිය යුතුය.
- අදාළ තත්ත්ව සැලකිල්ලට ගැනීමෙන් පසු උසාවියෙන් ලබාගත් නියෝගයක් මත නීතියෙන් ඉඩදී ඇති ආකාරයට හැර කිසිම පුද්ගලයකුගේ නිවසක් කඩා බිඳ නොදැමිය යුතු අතර ඔහුගේ/ඇයගේ නිවසෙන් ඉවත් නොකළ

යුතුය. කිසිම නීතියකින් අත්තනෝමතික ඉවත් කිරීම්වලට ඉඩ නොදිය යුතුය.

- අදාළ තත්ත්ව සැලකිල්ලට ගත් උසාවි නියෝගයකින් නියම කර ඇති ආකාරයට කාලිනව, නිසි හා සාධාරණ වන්දි ගෙවීමකින් තොරව කිසිම පුද්ගලයෙකුගේ දේපළ අහිමි නොකළ යුතුය.

## 21. රාජ්‍ය රැකියාවල සාධාරණත්වය හා සමාන අවස්ථා

සියලුම දිස්ත්‍රික්කවලින් අප ඉදිරියට ආ අය ප්‍රකාශ කළ කරුණක් නම් රාජ්‍ය සේවයේ රැකියාවලදීදේශපාලන සම්බන්ධතා, ජනවර්ගය හා කුලය ආදිය සම්බන්ධයෙන් වෙනස් ලෙස සැලකීමක් සිදුවන බවයි. රාජ්‍ය අංශය දේශපාලනීකරණය වීම ගැන ප්‍රබල විරෝධයක් පෙන්වූ ඔවුන් ඉල්ලා සිටියේ රාජ්‍ය අංශය ස්වාධීන කරන ලෙසයි. රජයේ තනතුරු සඳහා බඳවා ගැනීමේදී දක්නට ලැබෙන අගතිය නිසා අප්‍රසාදයක් ඇතිවී තිබෙනවා පමණක් නොව රටේ ආර්ථිකයට අහිතකර ප්‍රතිඵල ද, ගෙන දී ඇත. මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා සීමිත කාලයකට යම්කිසි සහන දායක ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ද, යෝජනා කරන ලදී.

මේ නිසා මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයට පහත දැක්වෙන ආකාරයේ විශේෂ ප්‍රතිපාදනයක් ඇතුළත් කළ යුතු යැයි අපි යෝජනා කරමු.

- රජය යටතේ ඕනෑම තනතුරකට පත් කිරීමේදී හා රැකියා සම්බන්ධ කටයුතුවලදී සියලු ම පුරවැසියන්ට සාධාරණය හා සමාන අවස්ථා ලැබිය යුතු ය.

## 22. අතුරුදහන් නොවීමේ අයිතිය[45]

බලහත්කාර අතුරුදහන් කිරීම්වලින් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව අප ඉදිරියේ බොහෝ දෙනෙක් පෙන්වා දුන්හ. විශේෂයෙන්ම කාන්තා කණ්ඩායම් විසින් මෙය අවධාරණය කරන ලදී. බලහත්කාර අතුරුදහන් කිරීම්වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තියට ශ්‍රී ලංකාව මෑතදී අත්සන් කරන ලදී.

අයිතිවාසිකම් පිළිබඳ පනතේ ඇතුළත් කිරීම සඳහා පහත දැක්වෙන විශේෂිත වගන්ති නිර්දේශ කරමු.

[45] එක් සාමාජිකයෙක් වූ කුෂාන් ද අල්විස්, ජ.නී.ප්‍රකාශ කළේ මෙම අයිතිය අතීතයට බලපාන ආකාරයට යොදා නොගත යුතු බවයි. තව ද, ඔහුගේ මතය වූයේ අයිතිවාසිකම් පනතේ ජීවිතයට ඇති අයිතිය ඇතුලු යෝජනා කර ඇති සියල්ල ඇතුළත් වන්නේ නම් මෙම වගන්තිය අනවශ්‍ය විය හැකි බවයි.

කිසි ම පුද්ගලයෙක් බලහත්කාර අතුරුදහන් කිරීම්වලට[46] භාජනය නො කළ යුතු අතර සියලු දෙනාට ම  පහත දැක්වෙන වගකීම් සහතික කර සිටී.

- බලහත්කාර අතුරුදහන් කිරීම් විමර්ශනය කර ඒවාට වගකිය යුතු අය අධිකරණය ඉදිරියට පැමිණ වීම;
- අපරාධ නීතිය යටතේ බලහත්කාර අතුරුදහන් කිරීම් වරදක් බවට පත් කිරීම ගැන සහතික වීම;
- චූදිතයා නේවාසිකයෙක් හෝ  පුරවැසියෙක් නොවන විට පවා  බලහත්කාර අතුරුදහන් කිරීම චෝදනා ගොනු කළ හැකි ආකාරයට අධිකරණ බල ප්‍රදේශය ස්ථාපිත කිරීම;
- අපරාධකරුවන්ට නඩු පවරන හෝ රටට ආපසු භාර දෙන බව සහතික කිරීමට වෙනත් රාජ්‍ය සමග සහයෝගයෙන් කටයුතු කිරීම  හා  අතුරුදහන් කිරීමට ගොදුරු වූ අයට  සහාය වීම හෝ ඔවුන්ගේ මළ සිරුරු භාර දීම; බන්ධනාගාර ගතකිරීම උසාවියකදී අභියෝගයට ලක් කිරීම ඇතුලු නිදහස අහිමි කිරීම පිළිබඳ  අවම නෛතික ප්‍රමිතිවලට ගරු කිරීම;
- වර්තමානයේ සිර ගතකර සිටින අයගේ ලේඛනයක් පවත්වා ගැනීම හා එය නෑයන් හා නීතිඥයින්ට පරීක්ෂා කිරීමට ඉඩ දීම;
- බලහත්කාර අතුරුදහන් කිරීම්වලට ගොදුරුවූවන් හෝ එය සෘජු ව බල පෑ අයට වන්දි හෝ හානි පූරණය කර ගැනීමට අයිතිය ලබා දීම;
- හානි පූරණ අයිතියට  ද්‍රව්‍යමය හා සදාචාර හානි මෙන් ම අදාළ අවස්ථාවන්හි දී, අ) ප්‍රතිස්ථාපනය අ) පුනරුත්ථාපනය ඇ) ගරුත්වය හා හානි පූරණය ඇතුලු තෘප්තිය හා ඈ) නැවත සිදු නොවීමේ සහතිකය ආදිය ද, ඇතුළත් වේ.

## 23. තොරතුරු ලබා ගැනීම

කමිටුවට ඉදිරිපත් කළ අදහස්වලින් පෙනී ගියේ තොරතුර ලබා ගැනීමටත්,  දැනුවත් වීමටත්, විශාල ඉල්ලුමක් ඇති බවයි. කෙසේ වෙතත් ජනතාව ඉල්ලා සිටියේ

[46]අපගේ සාකච්ඡාව සඳහා "බලහත්කාර අතුරුදහන් කිරීම්" යනුවෙන් සළකනු ලබන්නේ දේශපාලන සංවයේ හෝ දේරාජ්‍ය , නියෝජිතයන් විසින් හෝ  ඒවායේ අනුමැතිය, උදව් කිරීම හා එකඟතාව ඇතිව ක්‍රියාකරන පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් විසින් හෝ අත්අඩංගුවට ගැනීම, රඳවා ගැනීම, පැහැර ගෙන යාම හෝ වෙනත් කිසිම ආකාරයකින් පුද්ගලයෙකුගේ නිදහස අහිමි කිරීම සහ ඉන් අනතුරුවඅතුරුදහන් කළ පුද්ගලයා ගේ නිදහස අහිමි කරනු ලැබූ බව    , තික්ෂේප  කිරීම හෝ ඔහු ගේ හෝ ඇයගේ ඉරණම හෝ සිටිනා තැනක් සැඟවීම මගින් එබඳු පුද්ගලයෙකු පිළිගැනීම ප්‍ර නීතියේ ආරක්ෂාවෙන් පිටත ස්ථාන ගත කිරීමේ  සහ කාල සීමාවකට නීතියේ රැකවරණයෙන් ඔවුන් ඉවත් කිරීමේ අරමුණ සහිතව ක්‍රියා කිරීමයි

තොරතුරු ලබා ගැනීමේ අයිතිය යටතේ රාජ්‍ය, පුද්ගලික හා රාජ්‍ය නොවන ආයතන ද, ආවරණය විය යුතු බවයි. අපි මේ සඳහා පහත දැක්වෙන වගන්ති යෝජනා කරමු.

- ඔහුට/ඇයට හෝ මහජනතාවට වැදගත් වන කරුණු සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට සහ ඉල්ලා සිටීමට සෑම පුරවැසියෙකුට ම අයිතියක් තිබේ.
- ප්‍රසිද්ධියට පත් කර ඇති තොරතුරු ලබා ගැනීමේදී පවා ආබාධ සහිත පුද්ගලයන්ට විවිධ බාධකවලට මුහුණ දීමට සිදු වේ. එසේ නොමැති තොරතුරු ලබා ගැනීම ඉතා දුෂ්කර වේ. තම දේශපාලන නියෝජිතයන්ගේ සුදුසුකම් හා ජයග්‍රහණ පිළිබඳ තොරතුරු කාලීන ව නොලැබීම නිසා ආබාධිත පුද්ගලයන්ට මැතිවරණ ක්‍රියාවලියට සහභාගී වීමට නොහැකි වී තිබේ. සමාජ සුබ සාධන ගෙවීම්, රෙගුලාසි, වෛද්‍ය වාර්තා, නීති ආධාර හා අධ්‍යාපනය ආදී ආබාධිතයන්ට සම්බන්ධ සේවා සහ වැඩසටහන් සපයන ආයතනවල ක්‍රියා මාර්ග පාරදෘශ්‍ය නැත්නම් මෙම ආයතන වගකියන බවට සහතික විය නොහැක.

## 24. යුක්තිය සඳහා අයිතිය

- සියලු පුද්ගලයන්ට අධිකරණය ඉදිරියට යෑමේ අයිතිය රජය සහතික කළ යුතු අතර යම් කිසි ගාස්තුවක් අවශ්‍ය නම් එය සාධාරණ විය යුතු මෙන් ම සාධාරණය ඉටු කර ගැනීමට එය බාධකයක් නොවිය යුතුය.
- ආබාධිත පුද්ගලයන්ට අපරාධයක් වාර්තා කිරීමට පොලිස් පද්ධතිය යොදා ගැනීමේදී, උසාවියට නඩුවක් ගොනු කිරීමේදී, සාක්ෂිකරුවෙක් ලෙස පෙනී සිටීමේදී හා වෙනත් ඕනෑම නෛතික ක්‍රියාමාර්ගයකට සහභාගී වීමේදී උචිත පහසුකම් සැලසිය යුතුය.
- නීති ආධාර ලබා ගැනීමට ඇති අයිතිය පිළිගත යුතුය.
- විශේෂයෙන්ම ළමයින් සම්බන්ධව නෛතික නියෝජනයට ඇති අයිතිය පිළිගත යුතු ය.

## 25. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම්

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අදහස් ගණනාවක් ඉදිරිපත් විය. ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහණය වේගයෙන් වැඩි වන බැවින් මෙම කණ්ඩායමේ අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කළ යුතු යැයි පෙන්වා දෙන ලදී.

අයිතිවාසිකම් පනතේ ජ්යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කොටසේ පහත දැක්වෙන කරුණු ඇතුළත් කිරීමට යෝජනා කරමු.

i. ආර්ථික අයිතිවාසිකම්

ii. සමාජ ආරක්ෂාව සහතික කිරීම

අ) විශ්‍රාම වැටුප් අයිතිය (1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් කර තිබූ,1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කළ විශ්‍රාමිකයන් පිළිබඳ ප්‍රතිපාදන නැවත ඇතුළත් කළ යුතුය)

ආ) සෞඛ්‍ය. පෝෂණ හා වෛද්‍ය ප්‍රතිලාභ

ඇ) ප්‍රවාහන සහනාධාරය

iii. රැකවරණය හා ආරක්ෂාව සැපයීම

අ) නො සලකා හැරීමෙන්, සූරා කෑමෙන් හා අපයෝජනයෙන් ආරක්ෂාව

ආ) ලිංගික හිංසාව ඇතුළු හිංසාවෙන් ආරක්ෂාව

ඇ) පවුල් සාමාජිකයන්/භාරකරුවන් විසින් රැක බලා නොගන්නා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් රැක බලා ගැනීමේ යන්ත්‍රණයක්

ඈ) ආයතනික යන්ත්‍රණ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අවශ්‍යතාවන්ට සංවේදී වන බවට සහතික වීම. මෙය විශේෂයෙන් සඳහන් කරන ලද්දේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අවශ්‍යතාවන්ට කිසිසේත් සංවේදි නොවන බෙහෙවින් නිලධාරීවාදී පද්ධති සම්බන්ධයෙනි.

## 26. පාරිභෝගික අයිතිවාසිකම්

ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂාව ඉතා දුර්වල බවට පැමිණිලි කළ මහජනයා ඉල්ලා සිටියේ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම් (භාණ්ඩ හා සේවාවල ගුණාත්මක භාවය, තොරතුරු, සෞඛ්‍ය ආරක්ෂාව, ඌනතා නිසා ඇති වන අනතුරුවලට වන්දි ගෙවීම, සත්‍ය දැන්වීම්කරණය) ආරක්ෂා කළ යුතු බවයි.

## 27. තිරසර සංවර්ධනය හා ශුභ සාධනයට ඇති අයිතිය

මහජනයාගේ අදහස වූයේ රජයේ සම්පත් හා සංවර්ධනය ලබා ගැනීම පවා ශ්‍රී ලංකාවේදී ප්‍රශ්නයක් බවයි. ආර්ථික සංවර්ධනයට පමණක් අවධානය යොමු කළ අසමතුලිත සංවර්ධනය නිසා දුගී පුද්ගලයන් හා කණ්ඩායම් තවත් කොන් වූ බව ද, පෙන්වා දෙන ලදී.

මේ අනුව තිරසාර සංවර්ධනය හා පුද්ගලයන්ගේ හා කණ්ඩායම්වල ශුභ සාධනයට ඇති අයිතිය ව්‍යවස්ථානුකූලව පිළිගත යුතු වේ.

## 28. විවිධ ලිංගික අනන්‍යතා සහිත ජනයාගේ අයිතිවාසිකම්

විවිධ ලිංගික නැඹුරුතා හා අනන්‍යතා සහිත පුද්ගලයන් ඔවුන් හඳුන්වන්නේ නාරි-මෛථුන, සමලිංගික, දිවි-ලිංගික, පාරලිංගික, අන්තර් ලිංගික හා අසාමාන්‍ය ප්‍රජාව ලෙසයි. මෙම ප්‍රජාව ආරක්ෂා කිරීම පිළිබඳ ව බොහෝ අංශවලින් නියෝජනයන් ඉදිරිපත් කෙරුණි. මෙය අලුත් ගැටලුවක් බැවින් මෙම ප්‍රජාවේ අයිතිවාසිකම් හා ආරක්ෂාව පිළිබඳ සංවාදයක් ආරම්භ කිරීම මෙන් ම යම් ව්‍යවස්ථාමය ආරක්ෂාවක් ලබාදීමත් අවශ්‍ය යැයි සලකන ලදී.

මෙම නාරි-මෛථුන, සමලිංගික, දිවි-ලිංගික, පාරලිංගික, අන්තර් ලිංගික හා අසාමාන්‍ය කණ්ඩායමට පුළුල් පරාසයක අනන්‍යතා හා ආශාවන් අයත් වේ. මෙම කණ්ඩායම විෂමලිංගිකත්වයේ ස්වාභාවිකත්වය, අනිවාර්යතාව හා බලකිරීම ප්‍රශ්න කරති. මෙම පදය සමලිංගිකතාවේ හා විෂමලිංගිකතාවේ ද්විත්වයෙන් ඔබ්බට යන සාම්ප්‍රදායික නොවන ලිංගික අනන්‍යතාවක් ලෙස පුළුල් කළ හැකි වේ.

මෙම නාරි-මෛථුන, සමලිංගික, ද්වි-ලිංගික, පාරලිංගික, අන්තර් ලිංගික හා අසාමාන්‍ය ප්‍රජාවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් රජයේ නෛතික වගකීම,මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) මත පදනම් වූ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේත්, පසුව එකඟවූ ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතිවලත් පැහැදිලිව දක්වා තිබේ.

මේ නිසා "ජීවිතයට ඇති අයිතිය, පුද්ගලයන්ගේ හා පෞද්ගලිකත්වයේ ආරක්ෂාව, වධ දීමෙන්, අත්තනෝමතික අත් අඩංගුවට ගැනීමෙන් හා රඳවා ගැනීමෙන් නිදහස් වීමේ අයිතිය, වෙනස් ලෙස සැලකීමෙන් නිදහස් වීමේ අයිතිය හා ප්‍රකාශනයේ, සමිති සෑදීමේ හා සාමකාමී ව රැස්වීමේ අයිතිය ඇතුළු ජාත්‍යන්තර මානව හිමිකම් නීතියෙන් දක්වා ඇති ආකාරයට ලිංගිකතාව, ලිංගික නැඹුරුව හා ලිංගික අනන්‍යතාව කුමක් වුවත්, සියලු ම පුද්ගලයන්ට සමාන ආරක්ෂාව ලබා දීම රජයේ වගකීම බව පිළිගත යුතුය. මෙම ප්‍රජාව වෙනුවෙන් කරුණු දැක්වූ අය පෙන්වා දුන්නේ ඔවුන් ඉල්ලා සිටින්නේ විශේෂ ආරක්ෂාවක් නොව නීතිය යටතේ ආරක්ෂාව පිළිබඳ සමාන අයිතියක් හා වෙනස් ලෙස නො සැලකීමේ අයිතිය බවයි.

- සමානත්වය, ගරුත්වය හා වෙනස් ලෙස නො සැලකීම සම්බන්ධ මෙම නාරි-මෛථුන, සමලිංගික, ද්වි-ලිංගික, පාරලිංගික, අන්තර් ලිංගික හා අසාමාන්‍ය ප්‍රජාවේ අයිතීන් අලුත් ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතුය. ජාතිය, ආගම, කුලය ලිංගිකත්වය හා ලිංගික නැඹුරුව සමග සමානත්වය හා වෙනස් ලෙස නොසැලකීමේ වගන්ති ද, ඇතුළත් කළ යුතුය. ලිංගික හා ලිංගික නැඹුරුව පිළිබඳ පද මෙහි විශේෂයෙන් ඇතුළත් කිරීම නිසා මෙම ප්‍රජාවට සමාන ලෙස සැලකීම හා වෙනස් ලෙස නො සැලකීම පිළිබඳ අර්ථ ව්‍යාකූලත්වය අවම වනු ඇත.
- ලිංගික නැඹුරුව සාපේක්ෂ වශයෙන් මෑතදී මානව හිමිකම් නීතියට එක් වූ පදයක් වන අතර අපේ සාරධර්ම පද්ධතිය හා චර්යා රටාව තුළ මේ පිළිබඳ පූර්ව විනිශ්චය, ඍණාත්මක ඒකාකෘති, වෙනස් ලෙස සැළකීම ඉතා ගැඹුරට කා වැදී තිබේ.
- ඉහතින් දැක්වූ කරුණුවල ප්‍රතිඵලයක් ලෙස නීතියෙන් හෝ භාවිතයෙන් මෙම මූලික සිවිල්, දේශපාලන, සමාජීය හා ආර්ථික අයිතිවාසිකම් අහිමි කෙරෙන

බැවින් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මේවා සහතික කිරීමේ අවශ්‍යතාවක් තිබේ.

- වෙනස් ලෙස සැලකීමට විරුද්ධ නීති, ව්‍යවස්ථා ප්‍රතිපාදන, හෝ ඒවා බලාත්මක කිරීමේදී ලිංගික නැඹුරුව ගැන ඇති කොටස් මග හැරීමෙත් හිංසාවෙන් හා අඩන්තේට්ටම්වලින් නිදහස් වීමට හා වෙනස් ලෙස සැලකීමෙන් වැළකී සිටීම අහිමි කරනු ලැබේ.
- පොලිස් විමර්ශන හා රඳවා ගැනීම්වලදී වධ දීමෙන්, කුරිරු, අමානුෂික හා අවමන් සහගත ලෙස සැලකීමෙන් නිදහස් වීමේ අයිතිය
- අධිකරණ හා නීති බලාත්මක කරන නිලධාරීන්ගේ පූර්ව විනිශ්චයන්හි බලපෑමෙන් තොර ව සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය
- සම්බන්ධය පුද්ගලික හා එකඟ වූ වැඩිහිටියන් අතර වුවත්, අස්වාභාවික මෛථුන නීති පැවතීම නිසා පෞද්ගලිකත්වයට ඇති අයිතිය අහිමි කිරීම
- නීතියෙන් සුප්‍රකාශකව අහිමි කරන අදහස් ප්‍රකාශ කිරීමේ හා සමිති සමාගම් සෑදීමේ අයිතිය
- වෙනස් ලෙස සැලකීමේ රැකියා ප්‍රතිපත්ති හා භාවිතයන් අනුව කල්පිත හෝ සත්‍ය ලිංගික නැඹුරුව මත පදනම් ව අසාධාරණ ලෙස සේවයෙන් පහ කිරීම් තුළින් ආර්ථික අයිතිවාසිකම් අතර වඩාත් බලපෑමට ලක්වී ඇති වැඩ කිරීමේ අයිතිය
- ජීවන තත්ත්වයට බලපාන සමාජ ආරක්ෂාව, ආධාර හා ප්‍රතිලාභවලට ඇති අයිතිය. උදාහරණයක් වශයෙන් සමාජ ආරක්ෂණයට සුදුසුකම් ලැබීම සඳහා කලයත්‍ර අනන්‍යතාව ඉල්ලා සිටීම
- සෞඛ්‍ය සේවා පද්ධතියේ වෙනස් ලෙස සලකන ප්‍රතිපත්ති හා භාවිතාවන් හා ගැටෙන කායික හා මානසික සෞඛ්‍යයට ඇති අයිතිය

- අධ්‍යාපනයට ඇති අයිතිය. මෙම ප්‍රජාවේ සිසුන්ට ශික්ෂකයන් හා සමානයන්ගේ තර්ජනවලට මුහුණ පෑමට සිදු වේ.
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCRP) 2වැනි හා 26 වැනි ඡේද සමග පූර්ණ අනුකූලත්වය සහතික කිරීම සඳහා දණ්ඩ නිති සංග්‍රහයේ 363 හා 365 (අ) වගන්ති ඉවත් හෝ සංශෝධනය කළ යුතු ය.
- මෙම ප්‍රජාවේ පුද්ගලයන්ට තඩු පැවරීමට බොහෝ අවස්ථාවල වරණීය ලෙස යොදා ගන්නා පාදඩ ආඥාපනත සංශෝධනය කළ යුතුය.
- ශ්‍රී ලංකාව අත්සන් කර ඇති මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය හා අනිකුත් ගිවිසුම් යටතට එන සියලු මානව හිමිකම් ඇතුළත් වන ආකාරයට මානව හිමිකම් කොමිසමේ බලතල පුළුල් කළ යුතුය.

## 29.ස්ත්‍රී අයිතිවාසිකම්

මහජන අදහස් දැක්වීමේ ක්‍රියාවලියේ සඳහන් කළ යුතු ලක්ෂණයක් වන්නේ සෑම දිස්ත්‍රික්කයක ම කාන්තා සංවිධාන විශාල සංඛ්‍යාවක් අදහස් දැක්වීමට ඉදිරිපත් වීමයි. මහජනයා මෙම ක්‍රියාවලිය ගැන දැනුවත් වීමත් සමග කාන්තා කණ්ඩායම් නියෝජනයන් ඉදිරිපත් කිරීමට සංවිධානය වූ බව පෙනුණි. විවිධ කණ්ඩායම් සමග සාකච්ඡා කිරීමෙන් පසු (දිස්ත්‍රික් අදහස් දැක්වීම් මත පදනම් ව) සමහර කාන්තා කණ්ඩායම් ඒකාබද්ධ ලිඛිත කරුණු දැක්වීම් ඉදිරිපත් කරන ලදී.

කාන්තා නියෝජනවලින් ව්‍යවස්ථාවේ සියලු ම අංශ ආවරණය විය. ඔවුන් පෙන්වා දුන්නේ අයිතිවාසිකම් මත පදනම් වූ ව්‍යවස්ථාවකින් එහි උත්තරීතර භාවය සහතික කෙරෙන අතර කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත්, වෙනස් ලෙස සැලකූ අවස්ථාවන් හි නෛතික පියවර ගැනීමටත් හැකිවන බවයි. සමස්තයක් වශයෙන් ගත් කළ කාන්තාවන් පෙනී සිටියේ රාජ්‍ය තන්ත්‍රයේ ප්‍රජාතන්ත්‍රීකරණය, සාමය, ප්‍රතිසන්ධානය, වෙනස් ලෙස නොසැලකීම, සමාන අවස්ථා සහ සමානත්වය ද, ඇතුලුව සියලුම ආකාරයෙන් ප්‍රචණ්ඩත්වය (දේශපාලන මෙන්ම ගෘහස්ථ) හා ගැටුම්, බහුවිධ ආකාරයෙන් කාන්තාවනට බලපාන බව ඔවුහු පෙන්වා දුන්හ. කාන්තා ගෘහ මූලිකයින්, වැන්දඹුවන්, ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවන්, අතුරුදහන්

වීම්/වධදීම්වලට ලක්වූවන්ගේ නෑදෑයන් ආදීන් කමිටුව ඉදිරියට පැමිණ තිබුනේ ඔවුන්ගේ අත්දැකීම් බෙදා හදා ගැනීමට මෙන් ම  මතුවට මෙවැනි දේ සිදු නොවන ආකාරයේ යන්ත්‍රණයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටීමයි. ඔවුන්ගේ දුක්ගැනවිලිවලට ප්‍රතිචාර දක්වන පියවර ගැනීම ද, ඔවුහු අපේක්ෂා කළෝය.

පොදුවේ රටේ සෑම කොටසකින් ම පැමිණි කාන්තාවන් ඉල්ලා සිටියේ ශ්‍රී ලංකාව බහු-සංස්කෘතික, බහු-ආගමික රටක් ලෙස පිළිගන්නා ලෙසයි. රාජ්‍යයේ ස්වභාවය හා බලය පැවරීම ගැන විවිධ මත තිබුණත්  ඒ සියල්ලම යටින් දැකිය හැකි තේමාවන් වූයේ සමානත්වය හා  වෙනස් ලෙස සැලකීමට විරුද්ධත්වයයි. දේශපාලන ආයතන හා අනිකුත් තීරණ ගන්නා ආයතනවල  කාන්තා නියෝජනය වැඩි කිරීම සහතික කිරීමට විශේෂ පියවර ගත යුතු බව ඔවුහු එකහෙළාම කියා සිටියහ.[47]

කාන්තා කණ්ඩායම් ඉල්ලා සිටි තවත් කරුණක් නම් ආණ්ඩුක්‍රම  ව්‍යවස්ථාවේ භාෂාව ලිංගිකත්වයට සංවේදි විය යුතු බවත්,ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමාන අවස්ථා භාෂාවක් යොදා ගත යුතු බවත්ය. මේ නිසා ව්‍යවස්ථා කෙටුම්පත් කමිටු  ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යොදා ගන්නා භාෂාව සම්බන්ධයෙන්  ලිංගිකත්වය පිළිබඳ විශේෂඥයින්ගෙන් උපදෙස්  ගත යුතු යයි අපි යෝජනා කරමු.

පහත කොටසට පදනමවී ඇත්තේ විවිධ කාන්තා කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද අදහස් වන අතර  විශේෂයෙන්ම ඒවා කාන්තාවන්ගේ මූලික අයිතිවාසිකම් පිළිබඳ ව වේ. කාන්තා කණ්ඩායම් වෙනත් කරුණු ගැන දැක්වූ අදහස්  අදාළ කොටස්වලදී සාකච්ඡා කර ඇත.

සමස්තයක් වශයෙන්  කාන්තා කණ්ඩායම් ඉස්මතු කර පෙන්වා දුන්නේ වෙනස් ලෙස නො සැලකීම, ප්‍රචණ්ඩත්වයෙන්  ආරක්ෂා වීම (නිවසේ හා පුළුල් සමාජයේ) හා පුරවැසියන්ගේ සමාජ-ආර්ථික යහපත වැනි කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමේ අවශ්‍යතාවයි. අනන්‍යතාව හා පිළිගැනීම සම්බන්ධයෙන් කාන්තාවන් උනන්දු වන අතර විශේෂයෙන්ම පවුලට හා සමාජයට  කාන්තාවන්ගේ ආර්ථික දායකත්වය පිළිගැනීම ඔවුන් අපේක්ෂා කරයි. මෙම කරුණු සම්බන්ධයෙන් රජයේ මෙන් ම

[47] සියලුම මට්ටම් වල තීරණ ගන්නා ආයතනවල  කාන්තා නියෝජනය වැඩි කරන ලෙස රටපුරා පුරුෂයින් සහ ස්ත්‍රීන් ඉල්ලා සිටි බව මෙහිලා සඳහන් කළ යුතුය. සමහරුන් යෝජනා කළේ කාන්තා සහභාගීත්වය සහතික කිරීම සඳහා 25% සිට 50% දක්වාවූ කෝටාවක්  කාන්තාවන්ට වෙන් කළ යුතු බවයි.

නෛතික රාමුවේ (රටේ නීතියේ පදනම වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව) කාර්ය භාරය සම්බන්ධයෙන් කාන්තාවෝ උනන්දුවක් දක්වති.

කාන්තාවන් ඉල්ලා සිටි සමහර කරුණු සම්බන්ධයෙන් (උදාහරණයක් වශයෙන් පුද්ගල නීති පිළිබඳ ප්‍රතිසංස්කරණ) ආගමික හා සංස්කෘතික කණ්ඩායම් හා එකඟත්වයට පැමිණීම දුෂ්කර වීමට ඉඩ තිබේ. රටේ නීති ඒකාකාර විය යුතු බවට බොහෝ දෙනෙක් කරුණු ඉදිරිපත් කළ අතර කාන්තා කණ්ඩායම් තර්ක කළේ කාන්තා සමානාත්මතාව හා වෙනස් ලෙස නො සැලකීම යන කරුණු මත පදනම්වයි. තවත් කණ්ඩායම් නීති එකාකාර විය යුතුයැයි ප්‍රකාශ කරමින් ඉතා දැඩි ක්‍රියා මාර්ගයක් වූ ආගමික හා වාර්ගික කණ්ඩායම්වලට අනවශ්‍ය වාසියක් සලසන සියලු ම පුද්ගල නීති ඉවත් කරන ලෙස ද ඉල්ලා සිටියේය. මෙම ආස්ථානයෙන් පෙනී ගියේ පුද්ගල නීති යොදා ගැනීම පිළිබඳ නොදැනුවත් කම මෙන්ම පුද්ගල නීති පිළිබඳ සාවද්‍ය තොරතුරුයි. උදාහරණයක් වශයෙන් සමහර කණ්ඩායම් පෙන්වා දුන්නේ තේසවලාමේ නීතිය නිසා දෙමළ නොවන අයට උතුරේ ඉඩම් මිලදී ගත නොහැකි බවයි. නමුත් මෙය සත්‍ය තත්ත්වය නොවේ. පුද්ගල නීති සංශෝධනය කිරීමට විශේෂයෙන්ම ආගමික කණ්ඩායම් විරුද්ධ වූ අතර ඔවුන් කියා සිටියේ පුද්ගල නීති ඒ ආකාරයට ම තිබිය යුතු බවයි.

ඒ සම්බන්ධයෙන් ඇති විවිධ ආස්ථානයන් අනුව බලන විට පුද්ගල නීති සංශෝධනය සංවේදී ප්‍රශ්නයක් විය හැකි බැවින් විවිධ කණ්ඩායම් සමග සාකච්ඡා කර පුද්ගල නීති සංශෝධනය ගැන කටයුතු කිරීමට කොමිසමක් පත් කරන ලෙස අපි යෝජනා කරමු. කෙසේ වෙතත් මෙම ප්‍රශ්නයේ වැදගත්කම ගැන යළි යළිත් සඳහන් කරන අතර මෙම සංශෝධන හැකි තාක් ඉක්මනින් ගෙන ඒම සඳහා සාකච්ඡා අරඹන ලෙස අදාළ ආයතනවලින් ඉල්ලා සිටිමු.

අයිතිවාසිකම් පනතේ කාන්තාවන් වෙනුවෙන් විශේෂ කොටසක් තිබිය යුතු යැයි යෝජනා කරන අතර එහි පහත සඳහන් කරුණු ඇතුළත් කළ යුතු යැයි කියා සිටිමු.

***ස්ත්‍රීන්ට මූලික අයිතිවාසිකම්:***

- ස්ත්‍රීන්ට වෙනස් ලෙස සලකන සියලු නීති/ප්‍රතිපාදන අවලංගු කිරීම
- පිරිමින්ට හා ස්ත්‍රීන්ට සමාන අයිතීන් තිබිය යුතුය. විශේෂයෙන්ම පවුල නම් වූ පුද්ගලික ක්ෂේත්‍රයේමෙන් ම පුළුල් සමාජයේ ද, නීතියෙන් හා භාවිතයෙන් සමානාත්මතාවය තහවුරු කළ යුතුය.
- සමාන වටිනාකමක් ඇති වැඩ සඳහා ස්ත්‍රීන්ට සමාන වැටුප් ලබා ගැනීමේ අයිතිය තිබේ.
- ස්ත්‍රීන්ට ස්වීකාරයට හා කායික පූර්ණත්වය විඳිමට අයිතියක් තිබේ
- හිංසාවෙන් තොරව අභිමානයෙන් ජීවත් වීමේ අයිතිය ස්ත්‍රීන්ට තිබේ
- ඔවුන්ට අවශ්‍ය රැකියා සොයා ගැනීමටත්, ජීවනෝපාය හා වේතනයකටත් ස්ත්‍රීන්ට අයිතියක් තිබේ.
- ආහාර සුරක්ෂිතතාව හා ආහාර ස්වාධීනත්වයට ස්ත්‍රීන්ට අයිතියක් තිබේ
- සමාජ ආරක්ෂණය, නිවාස, අධ්‍යාපනය හා සෞඛ්‍යය ආදියට ස්ත්‍රීන්ට අයිතියක් තිබේ.
- නියෝජනය සහ තීරණ ගැනීමේ සමාන අයිතියක් ස්ත්රීන්ට තිබේ.
- පුද්ගලික හා පොදු ස්ථානවලදී හිංසාව, වධ දීම්, අවමන් සහගත, කුරිරු හා අමානුෂික සැලකීම්වලින් නිදහස් වීමේ අයිතියක් ස්ත්‍රීන්ටතිබේ.

ඉහත දැක්වූ විශේෂිත නිර්දේශවලට අමතරව කාන්තා කණ්ඩායම්වලින් ලැබුණු අදහස් මත පදනම් ව පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කරමු.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භාෂාව ලිංගික වශයෙන් අපක්ෂපාතී විය යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භාෂාව පිළිබඳ ව ව්‍යවස්ථා කෙටුම්පත් කමිටුව ලිංගිකත්වය පිළිබඳ විශේෂඥයෙකුගේ උපදෙස් ලබා ගත යුතුය.
- කෙටුම්පත් කමිටුවට උපදෙස් දීමට ලිංගිකත්වය පිළිබඳ විශේෂඥයින්ගේ කමිටුවක් පත් කළ යුතුය. ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයේ කාන්තා නියෝජනය ඉතා පහළ වන අතර උප කමිටු සඳහා කිසිම මන්ත්‍රීවරියක් නම් කර නැති බැවින් මෙය ඉතා වැදගත් වේ.
- කාන්තාවන් සඳහා ස්වාධීන කොමිසමක් පත් කළ යුතුය. මේ පිළිබඳ විස්තර 18 වැනි පරිච්ඡේදයේ සඳහන් කර ඇත.

## 30. ළමයින්ගේ හා තරුණ ජනයාගේ  අයිතිවාසිකම්

ළමයින් හා තරුණයන් පිළිබඳ ව බොහෝ යෝජනා ඉදිරිපත් විය.  මෙයින් සමහරක් විශේෂයන්ම වයස හා සම්බන්ධ ඒවා වූ අතර  පුළුල් වශයෙන්  සෞඛ්‍යය  හා අධ්‍යාපනය  මෙන් ම  ඒවාට සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබද ව විය.  අධ්‍යාපන අංශයේ පවතින ප්‍රශ්න බොහෝ අය මතු කර තිබුණි. මේ අතර ප්‍රතිපත්ති නැතිකම, ගුණාත්මක භාවයේ වෙනස්කම්, අධ්‍යාපනයේ සමානත්වය හා අවස්ථා පිළිබඳ පරමාර්ථවල බිඳ වැටීම හා අධ්‍යාපන පාඨමාලා හා ව්‍යුහයේ ප්‍රශ්න ද,  විය.  මේවා ප්‍රතිසන්ධානයට හා සාමය ගොඩනැගීමේ ප්‍රයත්නයන්ට  පටහැණි යැයි  ප්‍රකාශ විය.[48]

ළමයින්ට විරුද්ධව සිදු වන ලිංගික හා අනිකුත් ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ අවශ්‍යතාව බොහෝ අය විසින් පෙන්වා දෙන ලදී. ළමයින් සමග කටයුතු කිරීමේදී අධිකරණ ක්‍රියාවලිය සංවේදී නොවීමත්, එවැනි නඩු අනවශ්‍ය ලෙස ප්‍රමාදවීම පිළිබදවත්,  බොහෝ අය දොස් පැවරුවේ අධිකරණයටයි. ළමා අපයෝජනය හා හිංසාවන් සම්බන්ධයෙන්  වරදකරුවන් වන අයට  මරණ දඬුවම හෝ අඩුම වශයෙන් ඉතා දැඩි දඬුවම් පැනවිය යුතු යැයි යෝජනා විය.

අඩු වයස් ගැබ් ගැනීමේ ප්‍රශ්නය නිසා විවාහය සඳහා කැමැත්ත දිය හැකි වයස අවුරුදු 16 දක්වා අඩු කරන ලෙසද,  අදහසක් ඉදිරිපත් විය.

ඉදිරිපත් වූ අදහස් සම්බන්ධයෙන් වාද විවාද ඇතිවූ එක් අවස්ථාවක් නම්  නෛතික දූෂණයේ වයස හා විවාහ වයස එකක් විය යුතු යයි ගෙන ආ යෝජනාවයි. කෙසේ වෙතත්  විවාහය යනු ප්‍රචණ්ඩත්වය හෝ සූරාකෑමෙන් තොර පරමාදර්ශී තත්ත්වයක් බවත් ලිංගික සබඳතා තිබිය යුත්තේ විවාහය තුළ පමණක් බවත්, මෙම යෝජනාවෙන් උපකල්පනය කෙරේ. අඩු වයසින් විවාහ වීමේ හා අඩු වයසෙන් ගැබ් ගැනීමේ සෞඛ්‍ය ගැටලු  එය නොසලකයි. මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ ළමයින් වැඩි වශයෙන් ලිංගික අපරාධවලට යොමු වීම ගැන ප්‍රතිචාරයක් වශයෙනි.

[48]විශේෂිත නිර්දේශ අතර  සමාජයේ බහුවිධ ස්වභාවය,සියල්ලන් ඇතුළත්වීමේ අගය හා වෙනස් ලෙස නොසැලකීම ආදිය ඇතුළත්වන ලෙස පාඨමාලා සංශෝධනය කිරීම. ආගමික හා ඒක ලිංගික පාසැල් අධෛර්යමත් කිරීම හා ලෝක ආගම්, ප්‍රජා අධ්‍යාපනය ආදිය පාඨමාලාවට ඇතුළත් කිරීමද, විය.

නමුත් විවාහ වන වයස අඩු කිරීමෙන් හෝ  නෛතික දූෂණයේ වයස වැඩි කිරීමෙන් හෝ  මේ ප්‍රශ්නය විසඳිය හැකි ද? යන්න ගැන ගැඹුරින් සලකා බැලිය යුතුය.

පහත දැක්වෙන කරුණු ද, ඇතුළත්ව  ළමයින්ගේ හා තරුණයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ කොටසක්  අයිතිවාසිකම් පනතේ ඇතුළත් විය යුතු යැයි අපි නිර්දේශ කරමු.

i. ***ළමයින්ගේ හා තරුණ ජනයාගේ අයිතිවාසිකම්:***

අ) සමානාත්මතාව හා වෙනස් ලෙස සැලකීමෙන් නිදහස, ළමයින්ට හා තරුණ ජනයාට රටේ පුරවැසියන්ට හිමි සියලුම අයිතිවාසිකම් ඇති අතර ඔවුන්ගේ වයසට නියමිත  අයිතීන්ද ලැබේ.

ආ) අනන්‍යතාව හා ජාතිකත්වය-විවාහයෙන් පිට උපන් ළමයින්ට ද, සමාන අයිතිවාසිකම්  සහතික කිරීම

ඇ) අපයෝජනය, නොසලකා හැරීම, හිංසාව, අඩන්තේට්ටම් කිරීම හා අවමානයට ලක්වීම ආදියෙන් ආරක්ෂාව

ඈ) පවුල් පරිසරයෙන් ඉවත් කළ විට  පවුලක රැකවරණය හෝ විකල්ප රැකවරණයකට ඇති අයිතිය

ඉ) මූලික අවශ්‍යතා සපුරාලීම:පෝෂණය, සෙවණ, සෞඛ්‍ය හා සමාජ සේවා

ඊ) ළමා හිතකාමී නීති ආධාර හා අධිකරණයට යෑමේ පහසුව

උ) අවි ගැටුම්වලට යොදා නොගැනීම හා අවිගැටුම් සමයේ විශේෂ ආරක්ෂාව

ඌ) ළමයින්ගේ සෞඛ්‍යයට හානිකර ඇබ්බැහිවන ද්‍රව්‍යවලින් ආරක්ෂාව

ඒ) වයසට උචිත ප්‍රජනන හා ලිංගික අධ්‍යාපනය ඇතුළු රජයෙන් සපයන නිදහස් අධ්‍යාපනය

ඔ) කායික හා මානසික සෞඛ්‍යය අතින් ලබා ගත හැකි ඉහළම තත්ත්වය, රජයෙන් ලබා දෙන වැළැක්වීමේ හා සුව කිරීමේ සෞඛ්‍ය

සේවා නොමිලේ ලබා ගැනීම, හදිසි වෛද්‍ය ප්‍රතිකාර. ප්‍රජනන හා ලිංගික සෞඛ්‍ය සේවා ලබා ගැනීමේ අයිතිය

ඕ) වයස අවුරුදු පහත්, දහඅටත් අතර සියල්ලන්ට රජයෙන් සපයන නිදහස් අධ්‍යාපනය ලබා ගත හැකි වීම. වයස අවුරුදු පහත්, දහහතරත් අතර අධ්‍යාපනය සියල්ලන්ට අනිවාර්ය වේ.

ක) අනතුරුදායක කටයුතු සහිත රැකියා, ශ්‍රමය සූරාකෑම, නීතිවිරෝධී මිනිස් ප්‍රවාහනය, වහල් සේවය හා බලෙන් වැඩ ගැනීම ආදියෙන් ආරක්ෂාව

ග) ආබාධ සහිත, පරිහායක/නිදන්ගත රෝග සහිත ළමයින්ට විශේෂ ආරක්ෂාව

ජ) දෙමාපියන් එක් කෙනෙක් හෝ දෙදෙනා ම අත්අඩංගුවට පත්වූ විට විශේෂ ආරක්ෂාව

ට) ව්‍යසන හෝ ගැටුම් කාලවලදී ප්‍රමුඛ රැකවරණය

ඩ) හිංසාව, වාර්ගික හා/හෝ ලිංගික හිංසාව ප්‍රවර්ධනය කරන පණිවුඩවලින් ආරක්ෂාව

ii. ළමයින්ගේ හා තරුණයන්ගේ විශේෂ අපේක්ෂාවන් රැක ගෙන ප්‍රවර්ධනය කිරීම රජයේ වගකීමක් වේ.

අ) සූරාකෑම, අපයෝජනය හා නොසලකා හැරීම ආදියෙන් ආරක්ෂා කිරීම

ආ) විශේෂයෙන්ම අනාරක්ෂිත, දෙමාපිය හෝ භාරකාර රැකවරණයක් නැති, ප්‍රචණ්ඩත්වයේ හා ගැටුම්වලට ගොදුරු වූ ළමයින්ට සහාය වන සමාජ හා නීති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

iii ජාතිය ගොඩනැඟීමේ, ප්‍රතිසන්ධානයේ හා සංවර්ධනයේදී තරුණ ජනයාගේ කාර්ය භාරය පිළිගැනීම.

අ) පොදු හා ප්‍රජා කටයුතුවලට ළමයින් හා තරුණයන් සහභාගී කරවීම

iv) පවුල, සමාජයේ වැදගත් ඒකකයක් බවත් සමාජය හා රජය විසින් එය ආරක්ෂා කළ යුතු බවත් පිළිගැනීම

අ) සියලුම පුරුෂයින්ට සහ ස්ත්‍රීන්ට විවාහ වීමේ හෝ නො වීමේ හිමිකමමෙන්ම, පවුලක් ස්ථාපිත කිරීමට හිමිකම තිබේ. පවුල තුළ පුරුෂයාගේ සහ ස්ත්‍රීයගේ අයිතිවාසිකම් සමාන විය යුතුය.

ආ) විවාහයක් සිදු විය හැකි වන්නේ එසේ බලාපොරොත්තු වන කලත්‍රයන්ගේ පූර්ණ හා නිදහස් එකඟත්වය මත පමණි.

ඇ) විවාහය තුළත්, එය අවලංගු කිරීමෙන් පසුවත්, කලත්‍රයන්ගේ අයිතිවාසිකම් හා වගකීම් සමාන වේ. එවැනි විවාහවල දරුවන්ගේ ආරක්ෂාවට අවශ්‍ය ප්‍රතිපාදන සපයා දිය යුතුය.

v. සියලුම අවස්ථාවන්හිදි ළමයාගේ පාර්ශවයෙන් බලන විට හොඳ ම දේ පිළිබඳ මූලධර්මය අනුගමනය කිරීම

## 31. ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම්

ආබාධ සහිත පුද්ගලයන්ගේ විශේෂ අවශ්‍යතා පිළිබඳ ව කණ්ඩායම් කිහිපයක් ම කරුණු ඉදිරිපත් කළහ. මෙහිදී පෙන්වා දුන් එක් කරුණක් වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සියලු දෙනාට ම පොදු විය යුතු බවයි. ව්‍යවස්ථාවෙන් සියල්ලන් ඇතුළත් වන සමාජයක් සහතික කළ යුතු යැයි ද, මිනිසුන් අතර ඇති වෙනස්කම් මානව විවිධත්වයේ කොටසක් ලෙස පිළි ගත යුතු යැයිද, පෙන්වා දෙන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පදනම විය යුත්තේ බහුවිධ සමාජයක් පිළිබඳ දැක්ම වන අතර විශේෂයෙන් ම වෙනස් හැකියා සහිත අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කළ යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාවේ පහත සඳහන් කොටස අඩංගු විය යුතු යයි යෝජනා කරන ලදී.

- මනුෂ්‍යත්වයේ හා මානව විවිධත්වයේ කොටසක් ලෙස දුබලතා සහිත පුද්ගලයන් පිළිගෙන ගරු කළ යුතු ය.

අයිතිවාසිකම් පනතේ ආබාධිත පුද්ගලයන් පිළිබඳ විශේෂ කොටසේ පහත දැක්වෙන කරුණු ඇතුළත් කළ යුතු යැයි අපි යෝජනා කරමු. පෙර කොටස්වල සඳහන් කළ කරුණුවලට අමතරව මෙම විශේෂ පියවර ද, සහතික කළ යුතු වේ.

i විශේෂයෙන්ම බහුවිධ ආකාරයට වෙනස් ලෙස සැලකීමේ අත්දැකීම විඳින ආබාධයන් සහිත ස්ත්‍රීන් හා ගැහැනු ළමයින් ඇතුළු සියලු ආබාධිත පුද්ගලයන්ට සත්‍ය වශයෙන් ම සමානත්වය ළඟා කර ගැනීමට අවශ්‍ය විශේෂිත පියවර සඳහා සහනදායී ක්‍රියා මාර්ගයක් ගැනීම. මෙම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන තුළ එවැනි පියවර වෙනස් ලෙස සැලකීමක් නොවනු ඇත.

ii. ශ්‍රී ලංකාවේ දැනට ඇති ආර්ථික, සමාජ, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්, ආබාධ සහිත පුද්ගලයන්ගේ විශේෂිත තත්ත්වයට සංකල්පීය වශයෙන් සම්බන්ධ කිරීම සඳහා මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ අදාළ ඡේදයන්හි සමාන අවස්ථා පිළිබඳ ව සඳහන් විය යුතුය. ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සාක්ෂාත් කර ගත හැකි රාමුවට වැදගත් වන්නේ සමාන සැලකීම නොව මෙම මූලධර්මයයි.

iii නීතිය ඉදිරියේ සමාන පිළිගැනීමකට ඇති අයිතිය සමග, තමාට කැමති තීරණ ගැනීමේ නිදහස ඇතුළුව ආබාධයක් සහිත සෑම පුද්ගලයෙකුගේ ම ආවේණික හා පුද්ගල අභිමානය, ස්වාධිකාරය, හා පුද්ගලත්වය විශේෂිත ලෙස පිළිගත යුතුය. මෙයින් අදහස් කරන්නේ ආබාධ සහිත පුද්ගලයෙකුට එම ආබාධය නිසා මැතිවරණ ක්‍රියාවලිය ඇතුළු දේශපාලන හා පොදු කටයුතුවලට බලපෑම් කිරීමේ අයිතිය අහිමි කළ නොහැකි බවයි. ඔවුන් ද, ශ්‍රී ලංකාවේ සමාන පුරවැසියන් ලෙස සැලකිය යුතු වේ. තවද, පුද්ගලයෙකුගේ කායික හා මානසික පූර්ණත්වයට රජය ගරු කළ යුතු අතර ආදේශක නොව සහායක තීරණ ගැනීමේ යන්ත්‍රණයක් සහිත ව ඔවුන්ගේ නෛතික තත්ත්වය පිළිගත යුතුය.

iv. දුබලතා තිබීම කිසිම අවස්ථාවක ඔවුන්ගේ නිදහස අහිමි කිරීමට හේතුවක් නොවේ.

v. දුබලතා සහිත පුද්ගලයන් ඉතා අනාරක්ෂිත වන අවස්ථා ඉස්මතු කරමින් දුබලතා සහිත පුද්ගලයන්ගේ ජීවිතයට ඇති අයිතිය විශේෂිතව පිළිගත යුතුය.

vi. සුරාකෑමෙන් නිදහස: ශ්‍රී ලංකාවේ දුබලතා සහිත පුද්ගලයන් ආයතනගත කිරීමේ ඉහළ ප්‍රණතාවක් දක්නට ලැබේ. මේවායේ කාන්තාවන් හා ගැහැනු ළමයින් සූරාකෑමට ලක්වීමේ අවදානම ඉතා ඉහළය.

vii. නිවස ඇතුළත හා පිටත මෙන් ම පොදු හා පුද්ගලික ආයතන තුළ ඔවුන්ගේ ලිංගිකත්වය පදනම් වූ අංශ ඇතුලුව සියලුම ආකාරයෙන් අපයෝජන හා සූරාකෑම්වලින් රජය, දුබලතා සහිත පුද්ගලයන් ආරක්ෂා කළ යුතුය.

viii. ආර්ථික හා සමාජීය අයිතිවාසිකම්: අධ්‍යාපනය, සෞඛ්‍යය, රැකියා, සමාජ ආරක්ෂාව සහ නිවාස සමග මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ දක්වා ඇති හා විවිධ සම්මුති මගින් ශ්‍රී ලංකාව එකඟ වී ඇති ආර්ථික සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් දුබලතා සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් විශේෂයෙන් පිළිගත යුතුය.

ix. ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳකොමිසමක් ස්ථාපිත කිරීම. (විස්තර සඳහා 18 පරිච්ඡේදය බලන්න)

x මැතිවරණ ප්‍රතිසංස්කරණ- මැතිවරණ ක්‍රියාවලියට සහභාගී වීම: මධ්‍යම රජය හා බලය පැවරූ අනිකුත් මට්ටම්වල රාජ්‍ය ආයතනවලට ඡන්දය දීමට හා තේරී පත්වීමට දුබලතා සහිත පුද්ගලයන්ට ඇති අවස්ථා හා අයිතිය නිශ්චිතව දැක්විය යුතු ය. මේ පිළිබඳ විස්තර 15 පරිච්ඡේදයේ අඩංගු වේ.

## 32. සත්ව අයිතිවාසිකම් හා ආරක්ෂාව

කමිටුව ඉදිරියට ආ කණ්ඩායම් කීපයක්ම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනයක් ලෙස සත්ත්ව අයිතිවාසිකම් ඇතුළත් කිරීමේ අවශ්‍යතාව පෙන්වා දුන්නේය. මෙම කණ්ඩායම්වල තර්කයට පදනම් වූයේ මිනිසුන් මෙන් සතුන් ද, සංවේතන ජීවින් නිසා ඔවුන්ටද, ජීවිතයට අයිතියක් ඇති බවයි. සත්ත්වයන් සංවේතන ජීවින් ලෙස පිළිගෙන ඇති නවසීලන්තය, ප්‍රංශය හා ඔස්ට්‍රියාව වැනි රටවල් ගණනක උදාහරණද, ඔවුන් ඉදිරිපත් කළහ.

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29 වැනි ව්‍යවස්ථාව "ප්‍රජාවේ යහපත වෙනුවෙන් පරිසරය ආරක්ෂා කර සංරක්ෂණය කර දියුණු කිරීම" රජයේ වගකීමක් ලෙස දක්වා තිබේ. සත්ත්ව අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි කණ්ඩායම් කියා සිටියේ නියාමක මූලධර්ම උසාවියකින් හෝ අධිකරණයකින් ක්‍රියාත්මක කළ නො හැකි බැවින් මෙය ක්‍රියාත්මක කිරීමේ හිඩැසක් ඇති බවයි.

කමිටුවේ නිර්දේශය වන්නේ සතුන්ගේ සුබ සාධනය ප්‍රවර්ධනය කරන හා සතුන්ට කුරිරු ලෙස සැලකීම වළක්වන, නීති මගින් ක්‍රියා කළ හැකි වගන්තියක් අයිතිවාසිකම් පනතට ඇතුළත් කිරීම පිළිබඳ ව සළකා බැලිය යුතුය යන්න යි. මේ මගින් කාරුණික හා සානුකම්පික ලෙස සතුන්ට සැලකීම සහතික කෙරෙනු ඇත.

## 12.3 මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සහන ලබා ගැනීම හා යුක්තිය ඉටු කරවා ගැනීම

### 12.3.1 ඉදිරිපත් කළ අදහස්

මීට පෙරද, සඳහන් කළ පරිදි මූලික අයිතිවාසිකම් පුළුල් කිරීම හා පාලන තන්ත්‍රය ප්‍රජාතන්ත්‍රීකරණය, අප ඉදිරියට පැමිණි බොහෝ දෙනෙකුගේ ඉල්ලීම විය. තමන්ගේ දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමේ ප්‍රයත්නවලදී මෙන් ම සහන ලබා ගැනීමේදී මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා ඔවුහු විස්තර කළහ. ඔවුන්ගේ මතය වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති අයිතිවාසිකම් හා ආරක්ෂාව පුරවැසියන් බහුතරයකට ලබාගත නොහැකි මෙන් ම අර්ථාන්විත නොවන බවයි. දිවයින පුරාම ජනතාව මෙම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ ගැටලු අපට පැහැදිලි කළෝය.

### 12.3.2 නිර්දේශ

ව්‍යවස්ථා කෙටුම්පත් ක්‍රියාවලියේදී සලකා බැලීම සඳහා මෙන් ම මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණය සම්බන්ධයෙන් පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කරමු.

1. අයිතිවාසිකම් පනත කෙටුම්පත් කළ යුත්තේ ජනතාවගේ වෙනස් වන අවශ්‍යතා හා අපේක්ෂාවන්ට ප්‍රතිචාර දැක්විය හැකි ආකාරයටයි. අයිතිවාසිකම් පිළිබඳ අදහස ක්‍රමයෙන් පරිණාමය වන සමාජීය ලේඛනයක් ලෙස සැලකිය යුතුය. වෙනත් වචනවලින් කිවහොත් වරින් වර සංශෝධනය කිරීම සඳහා ප්‍රතිපාදන තිබිය යුතුය.

2. අයිතිවාසිකම් අතර ගැටුමක් ඇතිවූ විට ඒවා විසඳා ගත හැකි ආකාරය පිළිබඳ ව ද, අයිතිවාසිකම් පනතේ අවධානය යොමු විය යුතුය.

   අ) ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම පිළිබඳ අදහස් අනතුරට පත් නොකර තරගකාරී හෝ එකිනෙක ගැටෙන අයිතිවාසිකම් පිළිබඳ විසංවාද සම්බන්ධයෙන් තීරණ ගන්නා ක්‍රියාවලිය නිශ්චිතව දැක්විය යුතුය.

3. නිෂේධනාත්මක අයිතිවාසිකම් (රාජ්‍යයෙන් ආරක්ෂා වීම) හා ධනාත්මක අයිතිවාසිකම් (රජයේ ආරක්ෂාවට හිමිකම්, පෝෂණය, සෙවණ, අධ්‍යාපනය, සෞඛ්‍යය, රැකියා) අතර සමතුලිත බවක් ඇති බවට වග බලාගත යුතුය. රාජ්‍ය ප්‍රතිපත්තියේ නියාමක මූලධර්ම සකස් වන්නේ කෙසේ ද? යන්න මෙයට සම්බන්ධ විය හැක. සාම්ප්‍රදායික ව අයිතිවාසිකම් ගැන සිතන්නේ රජයේ සීමා ඉක්මවා යෑම්වලින් ආරක්ෂා වීමක් ලෙස වුවත්, අද පුද්ගලික ව්‍යවසාය/ ආයතන බොහෝ අවස්ථාවල රජයට වඩා බලපෑමක් රාජ්‍ය උපකරණවලට සහ බලයන් කරන බැවින් රජයට පිටින් ඇති ආයතන ද, වග කිව යුතු ලෙස සැලකීම අවශ්‍ය වේ.

4. අයිතිවාසිකම් පිළිබඳ ව අවධාරණය කිරීම රාජ්‍යය සමග ඇති සමාජ ගිවිසුමෙන් ඉවත් වීමක් නොවන බවට සහතික විය යුතුය. එසේ වුවහොත්, එහි ප්‍රතිඵලය වන්නේ මූලික රාජ්‍ය කාර්යයන වත් ඉටු කළ නොහැකි අසාර්ථක අවම රජයකි. මෙයින් අදහස් කරන්නේ රාජ්‍යයේ නියාමක

ප්‍රතිපත්ති හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනිකුත් කොටස්, අයිතිවාසිකම් පනත සමග ගැලපෙන හා සහාය දෙන ආකාරයේ විය යුතුය යන්නයි.

5. කණ්ඩායම් පදනම් වූ පීඩනයට විරුද්ධව සටන් කිරීමට අයිතිවාසිකම්වල ඇති අගය අවබෝධ කර ගැනීම.

6. අසමාන සැලකිලි පිටුදැකීමේ කොමිසමක් හෝ සමාන අවස්ථා කොමිසමක් ස්ථාපිත කිරීම (21 වැනි පරිච්ඡේදය බලන්න).

7. අධිකරණ ක්‍රියාදාමයකින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් සිදුවූ අවස්ථාවලදී මූලික අයිතිවාසිකම් පිළිබඳඅධිකරණ බලයට අධිකරණය ද,යටත් විය යුතුය.

8. පුද්ගලික ආයතන විසින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළ විට එය මූලික අයිතිවාසිකම් අධිකරණයට යටත් විය යුතුය.

9. මූලික අයිතිවාසකම් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් ඕනෑම කණ්ඩායමකට හෝ පුද්ගලයෙක් වෙනුවෙන් ඕනෑම කණ්ඩායමකට නඩු පැවරිය හැකි ආකාරයට හෝ පොදු යහපත වෙනුවෙන් නඩු පැවරීමේ ප්‍රතිපාදන සකස් කළ යුතුය.

10. නියමිත කාලයකට ප්‍රතිජනන ක්‍රියාමාර්ගයක් සැකසීම- සමාජයේ අසමානතාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා උචිත සිද්ධි සම්බන්ධයෙන් අසමානතාව ආපසු හැරවීමේ ක්‍රියාමාර්ග ගැනීම (21 වැනි පරිච්ඡේදය බලන්න).

11. අයිතිවාසිකම් පනත් මූලික අයිතිවාසිකම් වගන්ති සහ ශ්‍රී ලංකාව විසින් අත්සන් කර ඇති එක්සත් ජාතීන්ගේ සම්මුති සමග සංගත වන බවට සහතික විය යුතුය.

12. හදිසි අවස්ථා රෙගුලාසි හා මහජන/ජාතික ආරක්ෂාව මගින් මූලික අයිතිවාසිකම් යටපත් කිරීමේ අනතුර අප ඉදිරියට පැමිණි බොහෝ අය විසින් පෙන්වා දෙන ලදී. මේ නිසා මූලික අයිතිවාසිකම් සීමා කිරීම හැකි තාක් දුරට අවම කළ යුතුය.

## 12.4 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි ව්‍යවස්ථාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශිත ඕනෑම මූලික අයිතිවාසිකමක් විධායක හෝ පරිපාලන ක්‍රියාවකින් උල්ලංඝනය වීම හෝ උල්ලංඝනය වීමට ඉඩ ඇති විට ඒ සම්බන්ධයෙන් තීරණය කිරීමේ එකම හා තනි අධිකරන බලය පවරා ඇත්තේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වැනි ව්‍යවස්ථාව මගිනි.

126 ඡේදය යටතේ ඕනෑම විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ හෝ උල්ලංඝනය වීමට යන අවස්ථාවක එම චෝදනාව කරන පුද්ගලයා විසින් එවැනි උල්ලංඝනයක් සිදු වී මාසයක් ඇතුළත මූලික අයිතිය උල්ලංඝනයවීම පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කළ යුතු වේ.

### 12.4.1 ඉදිරිපත් කළ අදහස්

අප වෙත සිදු කළ මහජන අදහස් දැක්වීම විශාල සංඛ්‍යාවකින් පෙන්වා දුන්නේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනයවිම පිළිබඳ සහනයක් ඉල්ලීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 126 ව්‍යවස්ථාව යටතේ නියම කර ඇති ක්‍රියා මාර්ගය අනුව සාමාන්‍ය පුද්ගලයෙකුට පහත දැක්වෙන හේතු නිසා සහනයක් ලබා ගැනීම දුෂ්කර බවයි.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ අයදුම්පතක් ගොනු කිරීමට අදාළ සියලු ලේඛන සූදානම් කර ගැනීමට ලබා දී ඇති මාසයක කාලය ප්‍රමාණවත් නොවීම.
- කොළඹ ක්‍රියාත්මක වන ශ්‍රේෂ්ඨාධිකරණයේ අයදුම්පතක් ගොනු කිරීම ඉතා වියදම් අධික හා දුෂ්කර කාර්යයක් වීම
- මෙය සාධාරණ ප්‍රතිපාදනයක් නොවේ
- ශ්‍රේෂ්ඨාධිකරණය ඉහළම උසාවිය වන බැවින් එහි නියෝගයක් සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතියක් නැති වීම.

### 12.4.2 නිර්දේශ

1. මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ කාල සීමාව මාස 3ක් දක්වා වැඩි කළ යුතුය.

2. පළමුවෙන් මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය පළාත් සැසිවාර පවත්වන අභියාචනාධිකරණයට පවරා එහි නියෝගයකට විරුද්ධව අභියාචන ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කිරීමේ බලය ලබා දීම

3. උචිත අවස්ථාවන්හි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිළිබඳ ව අවිධිමත් අයදුම්පතක් හෝ පිළිගෙන ඒ පිළිබඳ ව ක්‍රියා කිරීමට අවශ්‍ය වන උසාවි නීති සකස් කිරීම

4. කණ්ඩායමක සාමාජිකයෙකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූවිට එම කණ්ඩායමට මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කිරීමේ අයිතිය ලබා දීම

# 13 පරිච්ඡේදය

# භාෂා අයිතිවාසිකම්

## 13.1 ඉදිරිපත් කළ අදහස්

භාෂා අයිතිවාසිකම් පිළිබඳ ඉදිරිපත් කළ නියෝජනයන්හි අවධානය යොමු කර තිබුනේ පුරවැසියා කැමති භාෂාවකින් පොදු සේවා ලබා ගැනීමේ අයිතිය හා කුඩා සුළුතරයන්ගේ භාෂා ආරක්ෂා කර සංරක්ෂණය කිරීමට ගත යුතු පියවර සම්බන්ධයෙනි.

රජයේ සියලු ආයතන තුළ නිල, ජාතික හෝ පරිපාලන භාෂ ලෙස සිංහල හා දෙමළ භාෂා ප්‍රකාශ කළ යුතුද? යන්න සම්බන්ධයෙන් විවිධ මත තිබුණි. මෙහිදී ඉංග්‍රීසි යොදා ගනු ඇත්තේ සන්ධාන භාෂාව ලෙසයි. මෙයට විකල්ප අදහසක් වූයේ භාෂා තුනම රජයේ නිල/පරිපාලන භාෂා ලෙස ප්‍රකාශ කිරීමයි. තවත් අතිරේක යෝජනාවක් වූයේ නිල භාෂාව බලාත්මක කළ යුත්තේ ප්‍රදේශ පදනමකින් විය යුතු බවයි. එම ප්‍රදේශයේ බහුතරයේ භාෂාව නිල භාෂාව වේ. මෙම ප්‍රදේශය පළාතක්, දිස්ත්‍රික්කයක් හෝ දිස්ත්‍රික්කයක් තුළ කුඩා කොට්ඨාසයක් හෝ විමට පුළුවන.මේ අනුවරජය හා පුද්ගලික ආයතන විසින් සේවා සැපයීමත්, ඒවා සමග සන්නිවේදනයත්, පුරවැසියා කැමති භාෂාවකින් විය යුතුය යන්න මූලික අයිතියක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් කළ යුතු අතර මෙම අයිතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නෛතික සහනයක් තිබිය යුතුය. ඉහත යෝජනාව අනුව රජයේ සේවයට බඳවා ගන්නා සියලු දෙනාටම අවම වශයෙන් ද්වි-භාෂා හෝ ත්‍රි-භාෂා හැකියාවන් තිබිය යුතු වේ. මෙහිදී ඉංග්‍රීසි වැඩ කරන/සන්ධාන භාෂාව වනු ඇත.

සියලු පුරවැසියන් අතර ද්වි-භාෂා කුසලතා ප්‍රවර්ධනය කිරීම මහජනතාව අපේක්ෂා කරන අතර අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔවුන්ගේ ඉල්ලීම වූයේ 1 වැනි වසරේ සිට අ.පො.ස. උසස් පෙළ දක්වා ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට භාෂා තුනම ඉගැන්විය යුතුය යන්නයි. කෙසේ වෙතත් තමා කැමති භාෂාවකින් අධ්‍යාපනය ලැබීමේ අයිති සෑම පුරවැසියෙකුටම තිබේ.

ජාතික භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය භාෂා කොමිසම සවිබල ගැන්විය යුතුය. මෙය ක්‍රියාත්මක කිරීමට සුදුසුකම් ලත් දක්ෂ පරිවර්තකයින්, භාෂා පරිවර්තකයින් හා ලඝු ලේඛකයින් වැනි අවශ්‍යතා සපුරාලිය යුතු වේ. මහජනයා සඳහා වූ දැන්වීම්, වෙබ් අඩවි, දැන්වීම් පුවරු, සංඥා හා උපදෙස් ඇතුලු සියලු රජයේ තොරතුරු සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම තිබිය යුතුය. ජනයාගේ භාෂා අයිතිවාසිකම් උල්ලංඝනය කළ

විට හෝ ක්‍රියාත්මක නොකළ විට නීති මගින් ක්‍රියා කළ හැකි විය යුතුය. මැලේ, ආදිවාසි, තෙළිඟු මලයාලම්, අභිගුණ්ඨික, අප්‍රිකානු සම්භවයක් සහිත ප්‍රජාවන්, බෝරා, සින්ධි ආදි භාෂා ආරක්ෂා කිරීමටත්, සංරක්ෂණය කිරීමටත්, පියවර ගත යුතුය. මෙවැනි භාෂා 21 ඇතැයි කියනු ලැබේ.

භාෂා අයිතිවාසිකම් පිළිබඳ මහජන අදහස් දැක්වීම්වල පොදු ඉල්ලීම වූයේ තමා කැමති භාෂාවකින් රජයේ සේවා ලබා ගැනීමටත්, රජය සමග සන්නිවේදනය කිරීමේත් පහසුවයි. බොහෝ විට මෙය කෙනෙකුගේ මව් භාෂාව වන අතර මෙයින් පෙනුනේ තමන්ගේ භාෂාවේ භාවිතය පිළිබඳව රජය සමාන ආකාරයට සැලකීමයි. කුඩා සුළුතර කණ්ඩායමවල ඉල්ලීම වූයේ ඔවුන්ගේ භාෂා හා ඒ හා බැඳුණු සංස්කෘතික භාවිත විනාශ වි යැමට නො දී රැක ගැනිමට රාජ්‍ය පිළිගැනිම හා සහාය ලබා දීමයි.

## 13.2 නිර්දේශ

ශ්‍රී ලංකාවේ සුළුතර කණ්ඩායම්වලට අයත් පුරවැසියන්ගේ ඉල්ලීම වන්නේ, ශ්‍රී ලාංකික සමාජයේ සම සහකරුවන් ලෙස ඔවුන්ගේ භාෂාවෙන් රජය සමග ගනුදෙනු කිරීමත්, සේවා ලබා ගැනිමත්, බව සිහි කරමින් ශ්‍රී ලංකා ජනතාවගේ භාෂා අයිතීන් පිළිබඳව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කිරීමට කැමැත්තෙමු.

1. සිංහල හා දෙමළ භාෂා නිල, ජාතික හා පරිපාලන භාෂා ලෙසත්, ඉංග්‍රිසි සන්ධාන භාෂාව ලෙසත්, ප්‍රකාශ කළ යුතුය.
2. පුරවැසියා කැමති භාෂාවකින් රජය සමග සන්නිවේදනය කිරීම හා පොදු සේවාවන් ලබාගැනිම මූලික අයිතියක් ලෙස සහතික විම. විශේෂයෙන්ම මෙය පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වේ.
    i. ඕනෑම ජාතික භාෂාවකින් අධ්‍යාපනය ලැබීමේ අයිතිය
    ii. පරිපාලනයේ භාෂාව හා උසාවියේ භාෂාව ඉතා තදින් ක්‍රියාත්මක කළ යුතු අතර එය මූලික අයිතිවාසිකමක් බවට ප්‍රතිපාදන ඇතුළත් කළ යුතුය.
        - දෙපාර්තමේන්තුවක් හෝ රජයේ වෙනත් ඕනෑමආයතනයක් සමග ඕනෑම ජාතික භාෂාවකින් හෝ සන්ධාන භාෂාවෙන් සන්නිවේදනය කිරීම මූලික අයිතිවාසිකමක් ලෙස ප්‍රකාශ කළ යුතුය.
        - ඕනෑම පළාත් සභාවක් හෝ පළාත් සභාවක් යටතේ ඇති ඕනෑම ආයතනයක් සමග සිංහල හෝ දෙමළ භාෂාවලින් හෝඉංග්‍රීසි

භාෂාවෙන් සන්නිවේදනය මූලික අයිතිවාසිකමක් ලෙස ප්‍රකාශ කළ යුතුය.

iii. සියලු රජයේ හා පළාත් සභා දැන්වීම්, පෝර්ම හා එවැනි පොදු ලේඛන සියල්ල සිංහල හා දෙමළ භාෂාවලින් තිබීමත්, එවැනි දැන්වීම් පෝර්ම ආදිය සම්බන්ධයෙන් සිංහල හෝ දෙමළ භාෂාවලින් සන්නිවේදනය කිරීම අයිතිය ඕනෑම පාර්ශවයකට ඇති බවත් මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගැනීම.

iv. භාෂාව පදනම් කර ගෙන වෙනස් ලෙස සැලකීම මූලික අයිතිවාසිකම් උල්ලංඝනයක් ලෙස සැලකීම.

3. සෑම පුරවැසියෙකුටම තමන් කැමති භාෂාවෙන් අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය තිබේ. පළමු වැනි ශ්‍රේණියේ සිට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ඉගෙනීම අනිවාර්ය කළ යුතුය.

4. ජාතික භාෂා ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය භාෂා කොමිසමට බලය ලබා දීම

5. කුඩා සුළුතර කණ්ඩායම්වල භාෂා ආරක්ෂා කිරීමට හා සංරක්ෂණය කිරීමට රජයේ ආධාර ලබා දිය යුතු වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එවැනි භාෂා පිළිබඳ උපලේඛනයක් ඇතුළත් කළ යුතුය.

6. සියලු පුරවැසියන්ට ඔවුන්ගේ භාෂා හා සංස්කෘතිය ඉගෙනීමට අයිතියක් ඇති අතර ඓතිහාසිකව රටේ වාසය කරන ජනයාගේ භාෂා හා සංස්කෘති පෝෂණය කිරීමත්, සංරක්ෂණය කිරීමත් සඳහා රාජ්‍ය භාෂා කොමිසමේ විෂය පථය පුළුල් කළ යුතු වේ. තමන්ගේ භාෂාව හා සංස්කෘතිය ඉගෙනීමේ සමාන අවස්ථා සෑම පුරවැසියෙකුටම ලබා දීම රජයේ වගකීමක් වෙයි.

7. ආබාධිතයන්ගේ භාෂා, සංඥා භාෂා හා බ්‍රේල් ආදියද, අවශ්‍ය වූ අවස්ථාවන්හි නිල සන්නිවේදනයට යොදා ගත හැකි භාෂා වන බැවින් රජයේ සේවා අපේක්ෂා කරන මෙවැනි අයට මෙම භාෂාවලින් එම තොරතුරු ලබා දීම රජයේ වගකීමකි.

# 14. පරිච්ඡේදය

## අධිකරණය

කමිටුව ඉදිරියේ අධිකරණය හා එහි ක්‍රියාකාරීත්වය ගැන කරුණු දැක්වූ බහුතරය ප්‍රධාන ප්‍රශ්න තුනක් ගැන අවධානය යොමු කළේය. ඒවා නම් නීතිය ක්‍රියාත්මක කිරීමේදී දැකිය හැකි 'අධිකතර ප්‍රමාදයන්', යුක්තිය ලබා ගැනීමේ 'විශාල වියදම්' හා 'අධිකරණයේ ස්වාධීනත්වය" පිළිබඳ ප්‍රශ්න කාරී තත්වයයි.

අධිකරණ ක්‍රියාවලියේ ඇති ආකාර්යක්ෂම බව හා දූෂණය මෙන්ම ග්‍රාමීය මට්ටමේ සුළු ආරවුල් විසඳීමට උසාවි අපොහොසත් වීම ගැනද මහජනතාව කරුණු දැක්වූහ. ග්‍රාමීය මට්ටමේ අධිකරණ යන්ත්‍රණයක් නොමැතිවීම හා අධිකරණ පද්ධතියේ ප්‍රමාදයන් හා වියදම් නිසා බොහෝ දුගී හා ආන්තික කණ්ඩායම් අධිකරණය වෙත යෑමේ මූලික අයිතය අත හැර දමති. බොහෝ දෙනෙක් පෙන්වා දුන් තවත් කරුණක් වූයේ මෙම අයිතිය ලබා ගැනීමට යන වියදම, සාමාන්‍ය පුරවැසියෙකුගේ ආර්ථික හැකියාවට ඔරොත්තු නොදෙන බැවින් අධිකරණයට යෑමේ අයිතිය හුදු මායාවක් පමණක් බවයි. නඩු පැවරීම සඳහා අය කරන ගාස්තු ඔවුන්ට දරා ගත නොහැකි බැවින් ඔවුන් උසාවි තුළින් යුක්තිය ලබා ගැනිමේ අදහස අත්හැර දමති. එක්තරා විධියකට තේරුම් ගත හොත් නිතියේ ප්‍රමාදයන් හා නඩු පැවරීමේ වියදම් නිසා සමහර අය ඔවුන්ගේ ප්‍රශ්න විසඳාගැනීමට නීත්‍යානුකූල නොවන හා බහිර් නීතික ක්‍රම වලට යොමු වීමෙන් රටේ නීතියේ ආධිපත්‍යය දුර්වල වී තිබේ.

රටේ උසාවි පද්ධතිය හෝ උසාවි ව්‍යුහය සම්පූර්ණයෙන්ම වෙනස් කිරීම වැනි විප්ලවකාරී අදහස් කමිටුවට එතරම් ලැබුණේ නැත. තරමක ව්‍යුහාත්මක ප්‍රතිසංවිධානයක් තුළින් වර්තමාන උසාවි පද්ධතිය, ජනතාවට සමීප කළ හැකිය යන්න පිළිබඳව පොදු එකඟත්වයක් දැකිය හැකි විය.

කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් ඉදිරිපත්වූ අදහසක් වූයේ ප්‍රධාන වශයෙන් ව්‍යවස්ථාවේ අර්ථ දැක්වීම් සම්බන්ධ ගැටලු ගැන කටයුතු කිරීම මෙන්ම ව්‍යවස්ථාදායකයේ සම්මත වූ නීති අධිකරණමය සමාලෝචනයකට භාජනය කරන ව්‍යවස්ථාදායක උසාවියක් ස්ථාපිත කිරිමයි.

### 14.1. උසාවි ව්‍යුහය

මෙම වාර්තාවේ වෙනම සාකච්ඡාවට භාජනය කර ඇති ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීමේ අදහසට අමතරව, දැනට රටේ ඇති ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය, පළාත් මහාධිකරණ, දිස්ත්‍රික් උසාවි හා මහේස්ත්‍රාත් උසාවි දිගටම ක්‍රියාත්මක විය යුතුයයි පොදු එකඟත්වයක් තිබුණි. ජනතාවගේ අධිකරණ බලය කෙළින්ම ව්‍යවස්ථාව තුළින් උපරිමාධිකරණවලට ලැබිය යුතු යයිද යෝජනා කරන ලදී. එය පාර්ලිමේන්තුව තුළින් ව්‍යවස්ථාවෙන් ලබා ගත් බලයක් නොවිය යුතුය. ජනතාවගේ අධිකරණ බලය කෙළින්ම ව්‍යවස්ථාවෙන් උපරිමාධිකරණවලට පැවරිය යුතුයයි නිර්දේශ කරන අතර මෙම උසාවිවල විවිධ අධිකරණ විෂය සීමාවන් ව්‍යවස්ථාවේම දැක්විය යුතු වේ. රජයේ අනිත් ආයතනවලින් න්‍යායිකව හා පෙනුම යන දෙයාකාරයෙන් ම එය ස්වාධීනත්වය තහවුරු කරන බැවින් කමිටුව ඒ අදහසට එකඟ වේ.

කෙසේ වෙතත් බොහෝ දෙනෙක් විසින් ඉදිරිපත් කළ අදහසක් වූයේ මූලික මිනිස් අයිතිවාසිකම් හා භාෂා අයිතිවාසිකම් පිළිබඳ නඩු ඇසීමේ හා තීන්දු දීමේ අධිකරණ බලය අභියාචනාධිකරණයට දිය යුතු බවත් එය කොළඹට සීමා නොකර රටේ සෑම පළාතකම උසාවි පිහිටු විය යුතු බවත්ය. මෙම අදහස ක්‍රියාත්මක කිරීම සඳහා අභියාචනාධිකරණයේ විනිසුරුවන් ගණන 35- 45 දක්වා වැඩි කළ යුතු බවත් පලාත් මට්ටමේ අභියාචනාධිකරණවල අඩුම වශයෙන් ස්ථිරව විනිසුරුවන් තුන් දෙනෙක් සිටිය යුතු බවටත් යෝජනා කරන ලදී.මේ ආකාරයටම ජාතික නීති පිළිබඳව මෙම උසාවිවලට පලාත් මට්ටමේදී ක්‍රියාත්මක කිරීම සඳහා රිට් අධිකරණ බලතල ලබා දිය යුතු බවටද යෝජනා කරන ලදී. පළාත තුළ මහධිකරණ තීන්දු සම්බන්ධ අභියාචනා මෙන්ම පළාත් මහධිකරණවල තීන්දු සම්බන්ධ අභියාචනා පළාතේ පිහිටුවනු ලබන අභියාචනාධිකරණයට යොමු කළ හැකි වේ.

ජන රජයේ මහාධිකරණයට දැනට පවතින ආකාරයටම ප්‍රධාන අපරාධ සම්බන්ධයෙන් අධිකරණ බලය ක්‍රියාත්මක කළ හැකිවේ. පළාත් මහාධිකරණය 13වැනි සංශෝධනයේ ප්‍රතිපාදන හා ඉන්පසුව සම්මත කළ නීති යටතේ ඇති ලැබ් ඇති අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ඇත. මහේස්ත්‍රාත් උසාවි හා දිස්ත්‍රික් උසාවිවල නියෝග හා තීන්දු

පිලිබඳව ඇති අභියාචන හා ප්‍රතිශෝධන අධිකරණ බලය පළාත් මහාධිකරණ විසින් දිගටම ක්‍රියාත්මක කරනු ඇත.[49]

රටේ මහේස්ත්‍රාත් උසාවි හා දිස්ත්‍රික් උසාවි ක්‍රියාත්මක වන අතර දෙමාපියන් හා දරුවන් අතර ඇති වන සිවිල් හා අර්ධ සිවිල් ස්වභාවයේ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට දිස්ත්‍රික්ක මට්ටමේ පවුල් උසාවි පිහිටුවීම ගැනද යෝජනා ඉදිරිපත් විය. නඩත්තු ආඥාපනත, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත, ළමයින්ගේ භාරකාරත්වය පිළිබඳ ප්‍රශ්න, ළමයින්ගේ රැකවරණය, ආදි කරුණු පවුල් උසාවිවලින් විසඳිය හැකි අතර සුදුසු අවස්ථාවන්හි දි ඒවා ළමා උසාවියට යොමු කළ හැකි වේ. මේ අනුව පවුල් හා පවුල සම්බන්ධ කරුණු ගැන කටයුතු කිරීමට දිස්ත්‍රික්ක මට්ටමේ පවුල් උසාවි පිහිටුවිම නිර්දේශ කෙරේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් ගණන 15 දක්වාත් අභියාචනාධිකරණ විනිසුරුවන් සංඛ්‍යාව 35-45 අතර ගණනක් දක්වාත් වැඩි කිරීම නිර්දේශ කෙරේ. ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණය/පළාත් මහාධිකරණය, දිස්ත්‍රික් උසාවි හා මහේස්ත්‍රාත් උසාවි ආදී සෑම අධිකරණයකටම නඩුලැයිස්තු පාලකයෙක් (Master of Rolls) පත් කළ යුතුයයිද යෝජනා විය. නඩු ලැයිස්තු පාලකයා, ඒ උසාවියේම විනිසුරුවෙක් වන අතර එක්වරකට මාස හයකට නො අඩු කාලයකට අගවිනිසුරු විසින් පත් කෙරේ. නඩු ලැයිස්තු පාලකගේ ප්‍රධාන වගකීම්/ කාර්යයන් වන්නේ (i) පූර්ව හා පශ්චාත් තර්ක ක්‍රියාවලියට සම්බන්ධ වීම (ii) බේරුම් කිරීම් පහසු කිරීම (iii) නීති තර්ක ඉදිරිපත් කිරීමට දින නියම කිරීම (iv) උසාවි හා උසාවි කාලය වෙන් කිරීම සහ (v) අග විනිසුරු සමග සාකච්ඡා කර විනිසුරු මඩුල්ල පත් කිරීම ආදියයි. පළාත් මහාධිකරණ හා පළාත්වල ක්‍රියාත්මක වන මහධිකරණ සම්බන්ධයෙන් එක් නඩු ලැයිස්තු පාලකයෙකුට කටයුතු කල හැකි වේ. මේ ආකාරයටම දිස්ත්‍රික්කයක දිස්ත්‍රික් උසාවි සඳහා එක් නඩුලැයිස්තු පාලකයෙක්ද දිස්ත්‍රික්කයේ මහේස්ත්‍රාත් උසාවි සඳහා එක් නඩු ලැයිස්තු පාලකයෙක්ද වශයෙන් පත් කළ හැකි වේ. මහධිකරණ. දිස්ත්‍රික් උසාවි හා මහේස්ත්‍රාත් උසාවි සඳහා නඩු ලැයිස්තු පාලක පත් කළ යුත්තේ අධිකරණ සේවා කොමිසමයි.

[49] පළාත් මහාධිකරණයේ අභියාචනා හා ප්‍රතිශෝධන අධිකරණ බලය මහේස්ත්‍රාත් උසාවිවල තීන්දු ,තීරණ හා නියෝගවලට පමණක් සීමා කළ යුතු බවටද දිස්ත්‍රික් උසාවි හෝ කම්කරු/ගොවි උසාවිවල තීරණ එයට යොමු නොකළ යුතු බවටද මතයක් ඉදිරිපත් විය. ඒවා යොමු කළ යුත්තේ පළාතේ ඇති අභියාචනාධිකරණයටයි.

ප්‍රාථමික උසාවි ඉවත් කිරීම නිසා මහේස්ත්‍රාත් උසාවිවල කාර්ය භාරය හා වැඩ ප්‍රමාණය වැඩි විමෙත් බොහෝ ප්‍රමාදයත් සිදුවේ. බොහෝ අයගේ ඉල්ලීමක් වූයේ සුළු ආරවුල් හා සාමය කඩවීම් ගැන අධිකරණ බලය සහිතව ප්‍රාථමික උසාවි නැවත පිහිටුවීමයි. ප්‍රථමික අෂාවි අහෝසි කළ අවස්ථාවේ සුළු ඉල්ලීම් පිලිබඳ උසාවි පිහිටුවීමට උසාවි ව්‍යුහ පනත සංශෝධනය කළ බව කමිටුව දැනුවත් ය. කෙසේ වෙතත් අමාත්‍ය නියෝගයක් මගින් මෙම ප්‍රතිපාදන ක්‍රියාත්මක නොකළ අතර මෙම ව්‍යවස්ථා ප්‍රතිපාදනය අහෝසි කිරීමෙන් තොරව තවමත් නිති පොතේ දක්නට තිබේ!

සමථ මණ්ඩලවල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන්ද වර්තමාන නීතිය සංශෝධනය විය යුතු යයි යෝජනාවක් කෙරුණි. වර්තමාන නීතියට අවශ්‍ය වෙනස්කම් කිරීම තුළින් සමථ මණ්ඩලයේදි එකඟ වන විසඳුම බලාත්මක කළහැකි වේය යන අදහස ඉදිරිපත් විය. මෙම යෝජනාවේ යම් වටිනාකමක් ඇතැයි කමිටුව පිළිගන්නා බැවින් ඒ ගැන සලකා බැලිම හා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ කෙරේ.

## 14.2. **ව්‍යවස්ථාදායක උසාවිය/ ශ්‍රේෂ්ඨාධිකරණයේ ව්‍යවස්ථාදායක මඩුල්ල**

### 14.2.1 ඉදිරිපත් කළ අදහස්

අධිකරණය ගැන අදහස් දැක්වූ බොහෝ දෙනෙක් කියා සිටියේ ව්‍යවස්ථාදායක උසාවියක් පිහිටු විය යුතු බවයි. ව්‍යවස්ථාදායක උසාවියක් අවශ්‍ය වී ඇත්තේ මූලික වශයෙන් පාර්ලිමේන්තු පනත්වල ව්‍යවස්ථානුකූලතාව නිර්ණය කිරීමට හා පාර්ලිමේන්තුව හා පළාත් සභා විසින් සම්මත කළ නීති අධිකරණ සමාලෝචනයකට භාජනය කර ඒවායේ ව්‍යවස්ථානුකූලතාව තීරණය කිරීමයි.

මෙයට අමතරව මහජනයා ඉදිරිපත් කළ තවත් අදහසක් වූයේ අධිකරණ සේවා කොමිසමේ තීරණ සමාලෝචනය කිරීම සඳහා මෙන්ම ශ්‍රේෂ්ඨාධිකරණයේ තින්දු ගැන අභියාචනා ඇසීම සඳහා ව්‍යවස්ථාදායක උසාවියක් අත්‍යවශ්‍ය බවයි. තවත් සමහරෙකුගේ අදහස වූයේ රාජ්‍යයේ සියලු ම ආයතනවල තහංචි හා වැළකුම් තුළින් මෙය ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාවලිය වැඩි දියුණු කරන බවයි.

### 14.2.2 නිර්දේශ

මේ සම්බන්ධයෙන් කමිටුව ඉතා දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද අතර ප්‍රකාශ වූ මත අතර තියුණු වෙනස්කම් තිබුනි. ව්‍යවස්ථා සම්පාදක සභාවේ සැලකිල්ලට ගැනීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරමු.

1. පහත දැක්වෙන අධිකරණ බලය සහිතව ව්‍යවස්ථාදායක අධිකරණයක් පිහිටුවිය යුතු යයි සමහර සාමාජිකයන් විසින් නිර්දේශ කරන ලදී.[50]

අ. යෝජිත ව්‍යවස්ථා සංශෝධනවල ව්‍යවස්ථානුකූලතාව නිර්ණය කිරීම

ආ. පාර්ලිමේන්තු පනත්වල ව්‍යවස්ථානුකූලතාව නිර්ණය කිරීම

ඇ. පාර්ලිමේන්තු පනත්, රාජ්‍ය ප්‍රතිපත්තියේ නියාමක මූලධර්ම සමග ගැළපේද යන්න නිර්ණය කර ප්‍රකාශ කිරීම

ඈ. පාර්ලිමේන්තුව සහ පළාත්සභා මගින් සම්මත කරන නීතිවල ව්‍යවස්ථානුකූලතාව නිර්ණය කිරීමට එම නීති අධිකරණ සමාලෝචනයකට භාජනය කිරීම

ඉ. ව්‍යවස්ථාව අර්ථ නිරූපණය හා සම්බන්ධ කරුණු ගැන ප්‍රකාශ කිරීම

ඊ. අධිකරණ සේවා කොමිසමෙන් ගත් ඕනෑම තීරණයක් ගැන අධිකරණ සමාලෝචනයක් කිරීම

උ. ජාතික හා ව්‍යවස්ථාමය වැදගත්කමක් ඇති කරුණක් තිබේ යයි ව්‍යවස්ථාදායක උසාවියේ අදහස වන අවස්ථාවන්හි ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දු සම්බන්ධයෙන් අභියාචනා ඇසීම

ඌ. ඒවායින් මූලික අයිතිවාසිකම්/ මානව අයිතිවාසිකම් කඩ කර ඇතැයි යන පදනම මත අධිකරන ක්‍රියා, නියෝග හා තීන්දු අභියෝගයට ලක් කරන පෙත්සම් ඇසීම

ඔ. ව්‍යවස්ථාමය වශයෙන් වැදගත්වන ඕනෑම කරුණක් ගැන ව්‍යවස්ථාදායක උසාවියේ මතය දැන ගැනීමට ජනාධිපති, අගමැති හා කථානායකට හැකි වන ලෙස උපදේශාත්මක අධිකාර බලය

[50] හරිනි අමරසූරිය; එම්.කේ.නදීකා දමයන්ති; සිරිමසිරි හපුආරච්චි; වින්ස්ටන් පතිරාජ; එන් සෙල්වක්කුමාරන්; එස් තවරාජා; එස් .විජේසන්දිරන්; ලාල් විජේනායක

2. ව්‍යවස්ථාදායක අධිකරණය, ශ්‍රී ලංකාවේ උසාවිවල අග්‍ර උසාවිය වන අතර එය පොතන උසාවියක් වනු ඇත.

   අ. ව්‍යවස්ථාදායක උසාවිය සභාපති හා තවත් විනිසුරුවන් 6 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

   ආ. ව්‍යවස්ථාදායක උසාවියේ සභාපති හා විනිසුරුවන් ව්‍යවස්ථාදායක මණ්ඩලයේ නිර්දේශ මත ජනාධිපති විසින් පත් කරනු ලැබේ.

   ඇ. ව්‍යවස්ථාදායක උසාවිය සම්පූර්ණ උසාවියක් ලෙස හෝ විනිසුරුවන් පස් දෙනෙකුගේ කොටසක් ලෙස ක්‍රියා කරනු ඇත.

3. ව්‍යවස්ථාදායක සභාව, ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවන්, නීතිය හා සම්බන්ධ විෂයයන් පිළිබඳ අධ්‍යයන සුදුසුකම් ඇති විශාරද පුද්ගලයන් හා නීති ක්ෂේත්‍රෙය් විශ්‍රාමික විශිෂ්ටයන්ගෙන් සමන්විත යුතුයයි යෝජනා කෙරේ.

4. දේශපාලනයට කෙළින්ම සම්බන්ධ හෝ දේශපාලන පක්ෂයක තනතුරක් දැරූ හෝ දරන පුද්ගලයන් ව්‍යවස්ථාදායක උසාවියට පත් නොකළ යුතුයයි නිර්දේශ කෙරේ.

ඉහත විස්තරාත්මකව දක්වා ඇති ආකාරයේ ව්‍යවස්ථාදායක උසාවියක් පිහිටුවිම ගැන සමහර කමිටු සාමාජිකයන් එකඟ වූයේ නැත. ඔවුන්ගේ මතය වූයේ මේ මගින් රජයේ විධායක හා නීතිසම්පාදකඅංශවලට අධිකරණයේ ස්වාධීනත්වයට මැදිහත්විමට ඉඩ ලැබෙන බවයි. ඔවුන් වැඩිදුරටත් කියා සිටියේ ශ්‍රෙෂ්ඨාධිකරණයට ඉහළින් ආයතනයක් තිබිය යුතු නැති බවයි. වර්තමානයේ වුවද නීතිඥයින් නොවන අය ශ්‍රෙෂ්ඨාධිකරණයට පත්කිරීමට තහනමක් නැතිබවද ඔවුන් පෙන්වා දුන්නේය. වෙනස් ආයතනයක් ලෙස ව්‍යවස්ථාදායක උසාවියක් පිහිටුවීමට විරුද්ධවන අතර ඔවුන් යෝජනා කලේ පවතින අධිකරණ ව්‍යුහය තුළ ශ්‍රේෂ්ඨාධිකරණයේ ව්‍යවස්ථාදායක මඩුල්ලකි.[51]

තවත් නිර්දේශයක් වූයේ පවතින උසාවි ව්‍යුහය තුළ ව්‍යවස්ථාදායක මඩුල්ලක් පිහිටුවිමත් එය ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ගෙන් පමණක් සමන්විත නොවිය යුතුය යන අදහසයි. ඔවුන් යෝජනා කළේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවන්, නීතිය හා සම්බන්ධ

[51] කුෂාන් ද අල්විස්, ජා.නී. එම් වයි.එම්. ෆයිස්; සුනිල් ජයරත්න; කුමුදු කුසුම් කුමාර; කාන්ති රණසිංහ

විෂයයන් පිළිබඳ අධ්‍යයන සුදුසුකම් ඇති විශාරද පුද්ගලයන් හා නීති ක්ෂේත්‍රෙය් විශ්‍රාමික විශිෂ්ටයන්ගෙන් සමන්විත උසාවියකි.[52]

## 14.3 අධිකරණ සමාලෝචනය

ව්‍යවස්ථාදායක උසාවියක් ස්ථාපිත කරන ලෙස ඉල්ලා සිටි යෝජනාවල නීති අදිකරණ සමාලෝජනයකට භාජනය කළ යුතුය යන අදහස ද තිබුණි. ඔවුන්ගේ මතය වූයේ ව්‍යවස්ථාවේ උත්තරීතරබව පිලිබඳ සංකල්පය සහතික කළ හැකි වන්නේ නීති සම්පාදකයන් විසින් සම්මත කරන නීති අධිකරණ සමාලෝචනයකට ලක්කළ හැකිනම් පමණක්ය යන්නයි.මේ නිසා ඔවුන් ඒකමතිකව කියා සිටියේ පාර්ලිමේන්තුව සහ අනිකුත් නීතිසම්පාදක ආයතන විසින් සම්මත කරන නීතිවල ව්‍යවස්ථානුකූලබව විමසා බැලීම සඳහා උසාවියට, විශේෂයෙන්ම ඵයවස්ථාදායක උසාවියට පනත් සහ නීති අදිකරණ සමාලෝචනයකට බභාජනය කිරීමේ අධිකරණ බලය තිබිය යුතු බවයි.

## 14.4 අධිකරණයේ ස්වාධීනත්වය

යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සාධාරණ, සංගත හා අපක්ෂපාතී විම සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් වන්නේ හොඳින් ක්‍රියාකරන,කාර්යක්ෂම හා ස්වාධීන අධිකරණයකි. නිසි ක්‍රියාමාර්ග, නීතියේ ආධිපත්‍යය හා ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නැතිවම බැරි අංගයක් වන්නේ අධිකරණ ස්වාධීනත්වයයි. අධිකරණයේ ස්වාධීනත්වය සහතික කරන මූලික මූලධර්ම ව්‍යවස්ථාවේ සඳහන් කළ යුතු වේ. විනිසුරුවන් නීතිය අනුව පමණක් ක්‍රියා කළ යුතු අතර අභියාචනා ක්‍රියාවලියකින් තොරව ඔවුන්ගේ තීරණ සංශෝධනය නොකළ යුතුය.

විනිසුරුවන් පත් කිරීම හා වෘත්තීය ජීවිතය පිළිබඳ සියලු තීරණ ගත යුත්තේ ඔවුන්ගේ නිපුණතාව පදනම්ව හා වාස්තවික නිර්ණායක යොදා ගනිමිනි. විනිසුරුවන් ඇගයීම කිසිවිටක ඔවුන්ගේ තීරණවල අන්තර්ගතය මත පදනම්ව නොවිය යුතු අතර විශේෂයෙන්ම නිදොස් කිරීම අසාර්ථකබවේ ලක්ෂණයක් ලෙස නොසැලකිය යුතුය. විනිසුරුවෙකුගේ වගවීම හා නඩු ඇසීමේදී ඔවුන්ගේ ස්වාධීනත්වය අතර උචිත සමතුලිතතාවක් පවත්වා ගැනීම වැදගත් වේ. විනිසුරුවන්ගේ විනය වගකීම, ඔවුන්ගේ තීන්දුවල අන්තර්ගතයට හෝ අධිකරණමය ප්‍රමාද දෝෂවලට ව්‍යාප්ත කළ යුතු නොවේ.

අධිකරණ විනය සම්බන්ධයෙන් නඩු ආරම්භ කරන ආයතනය ඒ ගැන තීන්දු දෙන ආයතනය නොවිය යුතුය. මේවාට මුහුණ දෙන විනිසුරුවන්ට ක්‍රියාමාර්ග බිළිබඳ සියලු

[52]ඒ.එම්.නවරත්න බණ්ඩාර; එස්.සී.සී. ඉළංකෝවන්

රැවරණ ලැබිය යුතු අතර විනය පරීක්ෂණ සම්පූර්ණයෙන්ම පාරදෘශ්‍ය විය යුතුය. අධිකරණ පද්ධතිය තුළ හෝ ඉන් පිටත තුන්වැනි පාර්ශවයක උපදෙස් මත විනිසුරුවන් ක්‍රියා නොකළ යුතුය යන්න ස්වයං ප්‍රත්‍යක්ෂ කරුණකි. බාහිර බලපෑම්වලින් නිදහස සහතික කිරීම සඳහා මොනම ආකාරයකින් හෝ විනිසුරුවන්ට බලපෑම් කිරීමට තැත්කරන්නන්ට විරුද්ධව දණ්ඩන නීතියේ නිශ්චිතව දැක්විය යුතු වේ.

### 14.4.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන් පත් කිරීම

#### 14.4.1.1 ඉදිරිපත් කළ අදහස්

ව්‍යවස්ථාදායක මණ්ඩලයේ අනුමැතිය ඇතුව ජනාධිපති විසින් උපරිමාධිකරණවලට විනිසුරුවන් පත් කළ යුත්තේ අගවිනිසුරු, නීතිපති හා නීති ක්ෂේත්‍රයේ නිර්දේශ ලබා ගෙන ඒවා සලකා බැලීමෙන් අනතුරුව පමණි. ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන් ජනාධිපති ඉදිරියේ දිවුරුම් දීම වෙනුවට නිල දිවුරුම්දීම කළ යුත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයේ උත්සවාකර සැසියක් ඉදිරියේය.

#### 14.4.1.2 නිර්දේශ

මේ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන් පත් කළ යුත්තේ ජනාධිපති දෙන අක්තපත්‍රයකිනි.
- ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ අභියාචනාධිකරණයට විනිසුරුවෙක් පත් කිරීමට ජනාධිපතිට බලය ලැබෙන්නේ යෝජිත පත්වීම ව්‍යවස්ථාදායක මණ්ඩලය විසින් අනුමත කර ඇත්නම් පමණි.
- ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ අභියාචනාධිකරණයට පත් කළ විනිසුරුවෙක් නිල රාජකාරී ආරම්භ කිරීමට පෙර ශ්‍රේෂ්ඨාධිකරණයේ උත්සවාකර සැසියකදී තනතුරේ දිවුරුම ගැනීම අවශ්‍ය වේ.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ පුරප්පාඩුවක් ඇතිවූ විට එම තනතුරට පත් කළ යුතු පුද්ගලයා පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරන ලෙස අගවිනිසුරු නීතිපති හා ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන්, ජනාධිපති තුමා ඉල්ලා සිටිය යුතුය.
- ඉන්පසු අගවිනිසුරු නීතිපති හා ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන්, නිර්දේශ කරන ලද නම් අතරෙන් ජනාධිපති එක් පුද්ගලයෙක් තෝරා ගත යුතුය.

- පුරප්පාඩු වූ තනතුරුට පත් කිරීමට නිර්දේශිත නම සමග අග විනිසුරු නීතිපති හා ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන් නිර්දේශ කරන ලද සියලුම නම් ද ජනාධිපති විසින් ව්‍යවස්ථාදායක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.
- ජනාධිපති විසින් නිර්දේශ කළ තැනැත්තාගේ පත්වීම ව්‍යවස්ථාදායක මණ්ඩලය විසින් අනුමත කරනු ලැබුවහොත් එම පුද්ගලයා ජනාධිපති විසින් පත් කරනු ඇත.
- ජනාධිපති විසින් නිර්දේශ කරන ලද පුද්ගලයා පත් කිරීම ව්‍යවස්ථාදායක මණ්ඩලය විසින් අනුමත නොකළ හොත් ඔවුන්ගේ තීරණයට හේතු දක්වමින් අගවිනිසුරු නීතිපති හා ශ්‍රී ලංකා නීතිඥ සංගමයෙන් නිර්දේශ කරන ලද අනිත් පුද්ගලයන් අතරෙන් කෙනෙක් පත් කරන ලෙස ජනාධිපතිට නිර්දේශ කළ යුතුය
- එවැනි අවස්ථාවකදී ව්‍යවස්ථාදායක මණ්ඩලයෙන් නිර්දේශ කර ඇති පරිදි ජනාධිපති වෙනත් පුද්ගලයෙක් පත් කළ යුතුය.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ පුරප්පාඩු පිරවීමට පත් කිරීම් සිදු කිරීමේදී අනවශ්‍ය ප්‍රමාදයන් ඇති නොවන බවට ජනාධිපති හා ව්‍යවස්ථාදායක මණ්ඩලය සහතික වීම අවශ්‍ය වේ.

### 14.4.2 ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණයේ විනිසුරුවන් විශ්‍රාම ගැනීම

#### 14.4.2.1 ඉදිරිපත් කළ අදහස්

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් හා අභියාචනාධිකරණයේ විනිසුරුවන් යන දෙකොටසටම විශ්‍රාම ගැනීමේ වයස එකක් විය යුතු අතර අගවිනිසුරුගේ හා අභියාචනාධිකරණයේ සභාපති තනතුරු කාලයට උපරිම සීමාවක් තිබිය යුතුය. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් විශ්‍රාම ගැනිමෙන් පසු රැකියා කිරීම පිළිබඳව වැඩිපර සීමා පැනවිය යුතු වේ.

#### 14.4.2.2 නිර්දේශ

ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන්ගේ විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 65 විය යුතුය.
- අග විනිසුරු හා අභියාචනාධිකරණයේ සභාපති එම තනතුරු දැරිය යුත්තේ උපරිම වශයෙන් අවුරුදු හයකි. අග විනිසුරු හෝ අභියාචනාධිකරණයේ සභාපති වයස 65

විමට පෙර ඔහුගේ ධුර කාලය වන අවුරුදු හය සම්පූර්ණ කළ හොත් අවුරුදු හයේ ධුර කාලය අවසානයේ පූර්ණ ප්‍රතිලාභ සහතිව විශ්‍රාම ගැනිමට හෝ අවුරුදු 65 වනතෙක් උසාවියේ විනිසුරුවෙක් ලෙස දිගටම සේවය කිරීම හෝ යන විකල්ප දෙකෙන් එකක් තෝරා ගැනීමට ඉඩ දිය යුතුය.

- විශ්‍රාම ගැනීමෙන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන් උසාවියේ හෝ අධිකරණවල පෙනී සිටිමෙන් හෝ නීතිඥ කුටියේ උපදෙස් සැපීමෙන් හෝ ආදි කිසිම ආකාරයකින් නීතිමය කටයුතු නොකළ යුතුයි.
- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලය හෝ පිළිගත් ආයතනයක ඉගැන්වීම හැරෙන්නට, විශ්‍රාම ගැනීමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන් විශ්‍රාම ගැනීමෙන් අවුරුදු තුනක අවම කාලයක් ගත වන තුරු රාජ්‍ය අංශයේ ගෙවීම් සහිත හෝ රහිත කිසිම පත්වීමක් බාර නො ගත යුතුය.

### 14.4.3 ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන්ගේ වැටුප්

#### 14.4.3.1 ඉදිරිපත් කළ අදහස්

රාජකාරි කාලය තුළ හා විශ්‍රාම ගැනීමෙන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන්ට ගෙවිය යුතු හා ඔවුන්ට ලැබිය යුතු වැටුප්, විශ්‍රාම වැටුප් හා අනිකුත් සියලු ප්‍රතිලාභ ආරක්ෂා කිරීම සඳහා විශේෂ ප්‍රතිපාදන ඇතුළත් කළ යුතුය.

#### 14.3.4.2 නිර්දේශ

ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන්ගේ වැටුප් හා විශ්‍රාම හිමිකම් පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු අතර එය ඒකාබද්ධ ගිණුමෙන් අය කර ගත යුතුය.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන්ට ගෙවිය යුතු හා ඔවුන්ට ලැබිය යුතු වැටුප්, විශ්‍රාම හිමිකම් හා අනිකුත් සියලු ප්‍රතිලාභ ඔවුන් පත්කිරීමෙන් පසු අඩු කළ හැකි නොවේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන් විශ්‍රාම ගැනිමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවන්ට ගෙවිය යුතු හා ඔවුන්ට ලැබිය යුතු විශ්‍රාම හිමිකම් හා අනිකුත් සියලු ප්‍රතිලාභ විශ්‍රාමික විනිසුරුගේ ජීවිත කාලය තුළදී අඩු කළ හැකි නොවේ

### 14.4.4 ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන් ඉවත් කිරීම

#### 14.4.4.1 ඉදිරිපත් කළ අදහස්

ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙකු ඉවත් කළ යුත්තේ එම විනිසුරු ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස දිගටම කටයුතු කිරීමට නුසුදුසුවන විෂමාචාරයක් හෝ අනිසි ක්‍රියාවක් කර ඇති බවට ඔප්පු වුව හොත් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස කටයුතු කිරීමට නොහැකි කායික හෝ මානසික අබලතාවක් ඇති බවට ඔප්පු වුවහොත් පමණි.

උපරිමාධිකරණවල විනිසුරුවන් ඉවත් කිරීමට දැනට පාර්ලිමේන්තුවට දි ඇති අධිකාරිය ඉවත් කළ යුතුය. ජනාධිපතිට ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවෙකු ඉවත් බල හැක්කේ, එම විනිසුරු ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස දිගටම කටයුතු කිරීමට නුසුදුසුවන විෂමාචාරයක් හෝ අනිසි ක්‍රියාවක් කර ඇති බවට ඔප්පු වී ඇති බවට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස කටයුතු කිරීමට නොහැකි කායික හෝ මානසික අබලතාවක් ඇති බව ඔප්පු වි ඇතැයි ව්‍යවස්ථාදායක මණ්ඩලයේ තීරණයක් ලැබිමෙන් පසුව පමණි.

ව්‍යවස්ථාදායක මණ්ඩලයට එවැනි තීරණයක් ගත හැකි වන්නේ විනිසුරු විෂමාචාරයකට, අනිසි ක්‍රියාවකට වැරදිකරු වී ඇති බව හෝ විනිසුරු කායික හෝ මානසික දුබලතාවකින් පෙළෙන බව හෝ දක්වන උපරිමාධිකරණ සඳහා පත් බල අධිකරණ සේවා කොමිසමෙන් වයවස්ථාදායක මණ්ඩලයට ඉදිරිපත් කළ වාර්තාවක් සැලකිල්ලට ගැනීමෙන් පසුව පමණි.

#### 14.4.4.2 නිර්දේශ

ඒ අනුව පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කෙරේ.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස දිගටම කටයුතු කිරීමට නුසුදුසුවන විෂමාචාරයක් හෝ අනිසි ක්‍රියාවක් කර ඇති බවට ඔප්පු වී ඇති බවට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස කටයුතු කිරීමට නොහැකි කායික හෝ මානසික අබලතාවක් ඇති බව ඔප්පු වී ඇතැයි යන පදනම මත ජනාධිපති විසින් කරන නියෝගයකින් හැර ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ඉවත් කළ නොහැක
- ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස දිගටම කටයුතු කිරීමට නුසුදුසුවන විෂමාචාරයක් හෝ අනිසි ක්‍රියාවක් කර ඇති බවට ඔප්පු වී ඇති බවට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස කටයුතු කිරීමට නොහැකි කායික හෝ මානසික අබලතාවක් ඇති බව ඔප්පු වී ඇතැයි යන පදනම මත ව්‍යවස්ථාදායක මණ්ඩලය ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ඉවත් කිරීම නිර්දේශ කර නැත්නම් ජනාධිපතිට එවැනි නියෝගයක් කළ හැකි නොවේ.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස කටයුතු කිරීමට නොහැකි කායික හෝ මානසික අබලතාවක් ඇති බවට උපරිමාධිකරණ සඳහාවූ අධිකරණ කොමිසම විසින් ව්‍යවස්ථාදායක මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කර ඇති හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස දිගටම කටයුතු කිරීමට නුසුදුසුවන විෂමාචාරයක් හෝ අනිසි ක්‍රියාවක් කර ඇති බවට විමර්ශන කණ්ඩායමක් විසින් සොයා ගෙන උපරිමාධිකරණ සඳහාවූ අධිකරණ කොමිසම මගින් ව්‍යවස්ථාදායක මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කළ අවස්ථාවලදී හැර ව්‍යවස්ථාදායක මණ්ඩලය එවැනි නිර්දේශයක් නොකළ යුතුය.
- විනිසුරු විෂමාචාරයකට වැරදිකරු බව විමර්ශන මණ්ඩලයක් විසින් තීරණය කර ඇතැයි උපරිමාදිකරණය සඳහාවූ අදිකරණ කොමිසම ඵයවස්ථාදායක මන්ඩලයට ඉදිරිපත් කළ වාර්තාව සලකා බැලිමෙන් පසු, එම විෂමාචාරය හෝ අනිසි ක්‍රියාව ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස කටයුතු කිරීමට නුසුදුසු කරන ත්තවයේ විෂමාචාරයක් හෝ අනිසි ක්‍රියාවක් යයි තීරණය කළ හොත් ව්‍යවස්ථාදායක මණ්ඩලයල එම විනිසුර ධුරයෙන් පහ කිරිම හැර සුදුසු

විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා එම වාර්තාව උපරිමාධිකරණ සඳහවූ අධිකරණ කොමිසට යවනු ඇත.

### 14.4.5 ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිසුරුවන්ගේ නිවාඩු

#### 14.4.5.1 ඉදිරිපත් කළ අදහස්

විනිසුරුවන්ගේ නිවාඩු ලබා දීම පිළිබඳ අධිකාරී බලය පැවරිය යුත්තේ අග විනිසුරු හා අභියාචනාධිකරණයේ සභාපතිටයි.පහළ උසාවි වලින් ශ්‍රේෂ්ඨාධිකරණයට හාහා අභියාචනාධිකරණයට අවස්ථාව අනුව විනිසුරුවන් පත් කිරීමේ බලය අගවිනිසුරු සතු වේ.

#### 14.4.5.2 නිර්දේශ

පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කරමු.

- ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන්ගේ නිවාඩු අනුමත කිරීම අග විනිසුරු විසින් කළ යුතු අතර අභියාචනාධිකරණයේ විනිසුරුවන්ගේ නිවාඩු අනුමත කිරීම අභියාචනාධිකරනයේ සභාපති විසින් කළ යුතුය.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවන්ගේ ගණපූරණය තාවකාලිකව නැතිවූ අවස්ථාවන්හි සීමිත කාලයකට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවෙක් ලෙස කටයුතු කිරීමට අභියාචනාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවෙක් පත් කිරීමට අග විනිසුරුට බලය තිබේ. අභියාචනාකරණයේ විනිසුරුවන්ගේ ගණපූරණයේ තටකාලික අඩුවක් ඇතිවූ විට සීමිත කාලයකට අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස කටයුතු කිරීමට මහාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවෙක් පත් කිරීමට අග විනිසුරුට බලය දිය යුතුය.

## 14.5 උපරිමාධිකරණ සඳහා අධිකරණ කොමිසම

### 14.5.1 ඉදිරිපත් කළ අදහස්

උපරිමාධිකරණය සඳහා අධිකරණ කොමිසමක් තිබිය යුතු අතර එහි වගකීම් හා රාජකාරී මෙසේය: ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවන්ට විරුද්ධව ඇති අනිසි ක්‍රියා හා විෂමාචාර පිළිබඳ පැමිණිලි ගැන විමර්ශනය කර දැනුම් දීම; කායික හෝ මානසික දුබලතාවක් නිසා ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ

අභියාචනාධිකරණයේ විනිසුරුවෙක් ලෙස කටයුතු කල නොහැකිදැයි විමර්ශනය කිරීම; විෂමාචාර හෝ අනිසි ක්‍රියාවල යෙදෙන හෝ ඔවුන්ගේ නිල රාජකාරී වලදී හැකියවක් හෝ කාර්ය ශුරත්වයක් පෙන්වීමට අසමත් වන ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවන් තනතුරෙන් ඉවත් කිරීමෙන් හැර වෙනත් විනය ක්රියාමාර්ග ගැනීමේබලය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවන් යම් නිසි විෂඹාචාරයක් වේනම් ඒගැන වගකිව යුතු වුවත් අදිකරණයේ ස්වාධිනත්වය හා අභිමානය ආරක්ෂා වන ආකාරයට විෂමාචරයක් හෝ අනිසි ක්‍රියාවක් පිලිබඳ පැමිනිල්ලක් ලැබුණු විටඒ ගැන කටයුතු කිරීමට පැහැදිලි හා නිශ්චිත ක්‍රියාමාර්ගයක් තිබිය යුතුය.

### 14.5.2 නිර්දේශ

මේ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කෙරේ.

- උපරිමාධිකරණ සඳහා පහත දැක්වෙන පුද්ගලයන්ගෙන් සමන්විත අධිකරණ කොමිසමක් පිහිටුවිය යුතුය.
- සභාපති ලෙස කටයුතු කරන අග විනිසුරු
- ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවන් දෙදෙනෙක්
- ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිර්දේශ මත අගවිනිසුරු විසින් නම් කරන අවංක හා ප්‍රසිද්ධ ජ්‍යෙෂ්ඨ නීතිඥයෙක්.
  මෙම පුද්ගලයන් අවුරුදු 05 කාලයකකට මෙම තනතුරු දැරිය යුතු අතර ඒ කාලය තුළ උසාවියක හෝ අධිකැණයක පෙනී සිටීම තහනම් වේ.
- අග විනිසුරු, නීතිපති හා ශ්‍රී ලංකා නීතිඥ සංගමය මගින් ඒකාබද්ධව නම් කරන ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවන් තුන් දෙනෙක්
- උපරිමාධිකරණය සඳහා වූ අධිකරණ කොමිසමේ වගකීම් හා රාජකාරී පහත දැක්වේ.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවන්ට විරුද්ධව ඇති විෂමාචාර හා අනිසි ක්‍රියා පිළිබඳ පැමිණිළි විමර්ශනය කර කරුණු සොයා ගැනීම
- විෂමාචාර හෝ අනිසි ක්‍රියාවල යෙදෙන හෝ හැකියවක් හෝ කාර්ය ශුරත්වයක් පෙන්වීමට අසමත් වන ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවන් සම්බන්ධයෙන් තනතුරෙන් ඉවත් කිරීමෙන් හැර උචිත විනය ක්‍රියා මාර්ග ගැනීම;

- ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙකුට කායික හෝ මානසික අබාධයක් කටයුතු කිරීමට නොහැකිදැයි විමර්ශනය කර කරුනු සොයා ගැනීම
- ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවන්ගේ විෂමාචාර හෝ අනිසි ක්‍රියා ගැන උපරිමාධිකරණයේ අධිකරණ කොමිසමට පැමිණිලි කිරීමට ශ්‍රී ලංකා පුරවැසියන්ට අයිතියක් තිබේ.
- එවැනි පැමිණිලි දිවුරුම් පෙත්සමක් මගින් සහායක සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතු අතර දැන දැනම සාවද්‍ය පැමිණිල්ලක් කිරීම හෝ ද්වේෂ සහගත පැමිණිල්ලක් කිරීස සම්බන්ධයෙන් වැරදිකරු වුවහොත් උසාවියට අපහාස කිරීම හා බොරු සාක්ෂි ඉදිරිපත් කිරීම ගැන පැමිණිලිකරුටදඬුවම් කරනු ඇත.
- එවැනි පැමිණිල්ලක් ලැබුණු විට උපරිමාධිකරණයේ අධිකරණ කොමිසම පැමිණිල්ලේ සඳහන් වන විනිසුරුගෙන් ප්‍රකාශයක් ලබා ගත යුතුය.
- පැමිණිල්ල හා විනිසුරුගේ ප්‍රකාශය සලකා බැලීමෙන් අනතුරුව උපරිමාධිකරණයේ අධිකරණ කොමිසමේ මතය වන්නේ එය හරයක් නැති හෝ වැදගැම්මකට නැති හෝ බොළඳ හෝ ද්වේශ සහගත පැමිණිල්ලක් බව නම් කොමිසමට එය ඉවත දමා අවශ්‍ය නම් උසාවියට අපහාස කිරීම ගැන පැමිණිලිකරුට තඩු පැවරීම සඳහා එය නීතිපතිට යොමු කළ හැකි වේ.
- පැමිණිල්ල හා විනිසුරුගේ ප්‍රකාශය සලකා බැලීමෙන් අනතුරුව උපරිමාධිකරණයේ අධිකරණ කොමිසමේ මතය වන්නේ එහි වැඩිදුර විමර්ශනය කළ යුතු දුක්ගැනවිල්ලක් ඇති බව නම් කොමිසම මූලික විමර්ශනයක් කර පැමිනිලිකරුට හා විනිසුරුට ඔවුන්ගේ ආස්ථානයන් සම්බන්ධව වැඩිදුර කරුණු ඉදරිපත් කිරීමට අවස්ථාවක් ලබා දිය යුතුය.
- එවැනි මූලික විමර්ශනයකින් පසුව විෂමාචාර චෝදනා ඉදිරිපත් කිරිමට තරම් කරුනු ඇතැයි උපරිමාධිකරණය සඳහාවූ අධිකරණ කොමිසමට පෙනී ගියහොත් කොමිසම විෂමාචාර හෝ අනිසික්‍රියා සම්බන්ධ චෝදනා සකස් කර විනිසරට ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්විමට පූර්ණ හා සාධාරණ අවස්ථාවක් ලබා දිය යුතුය.
- ඉන්පසු විෂමාචාර චෝදනා ගැන විභාග කිරීමට උපරිමාධිකරණයේ අධිකරණ කොමිසම විසින් විමර්ශන මණ්ඩලයක් පත කළ යුතුය.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙකුට විරුද්ධව විෂමාචාර චෝදනා ගැන විභාග කිරීමට පත් කරන විමර්ශන මණ්ඩලය ශ්‍රේෂ්ඨාධිකරණයේ

විශ්‍රාමික විනිසුරුවන් තුන්දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එහි සභාපති විය යුත්තේ විශ්‍රාමගත් අගවිනිසුරුවරයෙකි.

- විෂමාචාර හා අනිසි ක්‍රියා ගැන චෝදනාව ඇත්තේ  අගවිනිසුරුට විරුද්ධව නම් විමර්ශන මණ්ඩලය ශ්‍රේෂ්ඨාධිකරණයේ  විශ්‍රාමික විනිසුරුවන් දෙදෙනෙකුගෙන් හා පොදු රාජ්‍ය මණ්ඩලයේ රටක විශ්‍රාමික අගවිනිසුරුවරයෙක්  එහි සභාපති විය යුතුය.
- විමර්ශනය අවසානයේ විෂමාචාර හෝ අනිසි ක්‍රියා චෝදනා සම්බන්ධයෙන් විනිසුරු වැරදිකරුදු නැද්ද යන්න තීර්ණය කර  උපරිමාදිකරණය සඳහා වූ අදිකරණ කොමිසමට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.  කොමිසම එය ව්‍යවස්ථාදායක මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත.
- තම වාර්තාවේ උචිතයයි සිතන නිරදේශයක් කිරීමට  විමර්ශන මණ්ඩලයට බලය තිබේ.
- උපරිමාධිකරණය සඳහාවූ  අධිකරණ කොමිසම, විමර්ශන මණ්ඩලයේ වාර්තාව, ව්‍යවස්ථාදායක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.
- තනතුරෙන් පහ කිරීම හැර විනිසුරු ගැන උචිත විනිය ක්‍රියාමාර්ගයක් ගැනිම සඳහා මෙම වාර්තාව ව්‍යවස්ථාදායක ඹණ්ඩලය විසින්  උපරිමාදිකරණය සඳහාවූ අධිකරණ කොමිසමට යොමු කරනු ඇත. කොමිසම  විනිසුරුට විරුද්ධව තනතුරෙනු පහ කිරීම හැර  සුදුසුයයි සිතන  විනය ක්‍රියා මාර්ගයක් ගත යුතුය.
- කායික හෝ මානසික දුබලතාවක ප්‍රතිඵලයක් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිසුරුවෙකුට  නියමිත රාජකාරි ඉටු කළ නොහැකි යයි සිතීමට  සාධාරණ හේතු ඇති විට, උපරිමාධිකරණයේ අධිකරණ කොමිසම අවශ්‍ය ආකාරයට පරීක්ෂණයක් හා විමර්ශණයක් සිදු කර  ව්‍යවස්ථාදායක මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. කායික හෝ මානසික දුබලතාවේ ප්‍රතිඵලයක් ලෙස විනිසුරුට ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ  අභියාචනාධිකරණයේ විනිසුරුවෙකු ලෙස හැකිද නැද්ද යන්න ගැන මෙම වාර්තාවේ සඳහන් විය යුතුය.
- උපරිමාධිකරණය සඳහා වූ  අධිකරණ කොමිසමේ සාමාජිකයන්ගේ  ධූර කාලයේ සුරුක්ෂිතතාව  ආරක්ෂා කළ යුතුය.
- උපරිමාදිකරණය සඳහවූ අදිකරණ කොමිසමේ  ලේකම්  විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරුවෙකු විය යුතුය

## 14.6 අධිකරණ සේවා කොමිසම

### 14.6.1 ඉදිරිපත් කළ අදහස්

අග විනසුරු හා ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවන් දෙදෙනෙකුට අමතරව අභියාචනාධිකරණයේ සභාපති හා නීති වෘත්තියේ නියෝජිතයෙකු අධිකරන සේවා කොමිසමේ සේවය කළ යුතුය.[53]

### 14.6.2 නිර්දේශ

මේ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

- අධිකරණ සේවා කොමිසම (දැනට අග විනිසුරු හා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත වන) පහත සඳහන් පුදුගලයන්ගෙන් සමන්විත විය යුතුය.
- සභාපති ලෙස කටයුතු කරන අග විනිසුරු
- ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවන් දෙදෙනෙක්
- අභියාචනාධිකරණයේ සභාපති
- ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නිර්දේශ මත අගවිනිසුරු විසින් නම් කරන අවංක හා ප්‍රසිද්ධ එක් ජ්‍යෙෂ්ඨ නීතිඥයෙක්. මෙම තැනැත්තා අවරුදු පහක කාලයකට මෙම තනතුරු දැරිය යුතු අතර ඒ කාලය තුළ උසාවියක හෝ අධිකරණයක පෙනී නොසිටය යුතුය.
- අධිකරණ සේවා කොමිසමට, මහාධිකරණ විනිසුරුවන් ඇතුළු සියලුම අදිකරණ නිලධාරීන් පිළිබද පත් කිරීම, උසස් කිරීම,මාරු කිරීම, සේවයෙන් පහ කිරීම, පරිපාලන අධිකාරිය හා විනයානුකූල අධිකාරිය ඇතුළු සියලු බලතල තිබේ.
- ඔවුන්ගේ නිල කාලය තුළ අධිකරන සේවා කොමිසමේ සාමාජිකයන්ගේ නිලයේ සුරුක්ෂිතතාව ආරක්ෂා කළ යුතුය.
- අධිකරණ සේවා කොමිසමේ ලේකම්, මහාධිකරණ විනිසුරුවෙකු විය යුතුය.

[53] මහජනයාගෙන් ඉදිරිපත්වූ එක් අදහසක් වූයේ ශ්‍රේෂ්ඨාධිකරණයේවිනිසුරුවන්ට පමණක් සීමා නොවන දකුනු අප්‍රිකාවේ ආකෘතිය යොදා ගත යුතු බවයි.දකුනු අප්‍රිකාවේ අධිකරණ සේවා කොමිසම නීතිඥයින්. රාජ්‍ය නිලධාරීන්,විද්වතුන් හා අනිකුත් බුද්ධිමතුන්ගෙන් සමන්විත වේ. (දකුනු අප්‍රිකානු ව්‍යවස්ථාවේ 178(1) වගන්තිය)

## 14.7 මානව හිමිකම් කොමිසම

### 14.7.1 ඉදිරිපත් කළ අදහස්

මානව හිමිකම් කොමිසමේ ක්‍රියාකාරීත්වය පිළිබඳව කමිටුව ඉදිරියේ බොහෝ දෙනෙක් අදහස් දැක්වූහ. අධිකරණ පද්ධතියේ පිහිට නොපතා තම දුක් ගැනවිලි ගැන පැමිණිලි කළ හැකි යන්ත්‍රණයක් ලෙස ජනතාව මානව හිමිකම් කොමිසම සලකන බව පැහැදිලිවම පෙනෙන්නට තිබුණි.

මානව හිමිකම් කොමිසමේ තීරණවලට විත්තිකරුවන් අනුකූලතාවක් නොදැක්වීම නිසා එහි ඵලදායීත්වය අඩුවීම ගැන මහජනයා අතර කලකිරීමක් තිබුණි. මහජනයාගේ පැමිණිල්ල වූයේ මානව හිමිකම් කොමිසම ඔවුන්ගේ පැමිණිලි විභාග කිරීමෙන් පසුව දෙන තීරණය බලාත්මක නොවීමයි. මෙයට හේතුව රාජ්‍ය බලධාරීන් කොමිසමේ නියෝගවලට අනුකූලව කටයුතු නොකිරීමයි.

බොහෝ අය පෙන්වා දුන්නේ ඔවුන්ගේ තීරණ ක්‍රියාත්මක කළ හැකි ආකාරයට කොමිසමේ බලතල වැඩි කළ යුතු බවයි.පළාත් මට්ටමේ කොමිසමේ ක්‍රියාකාරීත්වය වැඩිදියුනු කිරීම ගැනද යෝජනා ඉදිරිපත් විය.

කමිටුවේ ආරාධනයෙන් පැමිණි මානව හිමිකම් කොමිසම ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමේදි මුහුණපාන අභියෝග හා බාධක විස්තර කළේය.[54] මානව හා අනිකුත් සම්පත් ප්‍රමාණවත් තරම් නොතිබිම ප්‍රධාන ගැටලුවක් විය. නිතියේ ආදිපත්‍යය හා නීතියට අනුකළවිම නො සලකන සංස්කෘතියක් බිහිවී ඇති බවටද කොමිසම ඔවුන්ගේ අදහස් දැක්වීමේදී එකඟ විය.

### 14.7.2 නිර්දේශ

ඉහත සඳහන් කරුණු මත පදනම්ව අපි පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කරමු.

i. ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයේ සඳහන් ආකාරයට කොමසාරිස්වරුන් පත් කරමින් මානව හිමිකම් කොමිසමක් ස්ථාපිත කළ යුතු ය. කොමිසමේ බලතල, කාර්යයන් හා රාජකාරී ව්‍යවසථාවේ සඳහන් වන අතර වැඩි විස්තර පනතේ දී තිබේ.

[54] මානව හිමිකම් කොමිසම වෙනත් කරුණු ගැනද නිර්දේශ ඉදිරිපත් කළේය. විශේෂයෙන්ම අදාල කොටස්වලදී සාකච්ඡා කර ඇති හිමිකම් පනත පුළුල් කිරීම ගැනද ඔවුන් අදහස් දැක්වූහ.

ii. පළාත් කොමසාරිස්වරුන් ලෙස සේවය කිරීමට ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටිනසේ මානව හිමිකම් කොමිසමේ සාමාජිකත්වය පුළුල් කළ යුතුය.

iii. මානව හිමිකම් කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක නොකළ හොත් අදාළ වගඋත්තරකරු විසින් නිශ්චිත කාලයක් තුළ ඒයට හේතු ලිඛිතව මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කිරීම අනිවාර්ය කළ යුතුය.

iv. වගඋත්තරකරු නිර්දේශයට අනුව කටයුතු නොකරන්නේනම් හෝ අනුකූලතාව නොදැක්විමට දි ඇති හේතු ගැන මානව හිමිකම් කොමිසම තෘප්තිමත් නොවන්නේ නම් හෝ ,මානව හිමිකම් කොමිසමට හෝ පැමිනිලිකරුට තීරණය බලත්මක කරවා ගැනීමට අබියාචනාධිකරණයට යා හැකි වේ.

v. වර්තමාන ව්‍යවස්ථාවේ 126 හෝ 141 වගන්ති යටතේ හැර මානව හිමිකම් කොමිසමේ තීරණයක් හෝ ක්‍රියාවක් අභියෝගයට ලක් කළ නොහැක.

vi. ඒකාබද්ධ අරමුදල තුලින් පාර්ලිමේන්තුව, මානව හිමිකම් කොමිසමේ කටයුතු සඳහා ප්‍රාමාණවත් අරමුදල් සැපයිය යුතුය.

## 14.8 ඔම්බුඩ්ස්වරයා

### 14.8.1 ඉදිරිපත් කළ අදහස්

පරිපාලනය සඳහාවූ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ කාර්යාලය පිළිබඳව කමිටුව ඉදිරියේ අදහස් දක්වන ලදී. උසාවියේ පිහිට නො පතා රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය සංස්ථා නිලධාරීන්, පළාත්පාලන ආයතන හා වෙනත් ආයතන වලින් මූලික අයිතිවාසිකම් කඩවීම හෝ වෙනත් හානි සිදුළු ු අයට සහනයක් ලබා ගැනීමේ ක්‍රමයක් ලෙස මෙය වඩාත් ඵලදායි හා ශක්තිමත් ආයතනයක් බවට පත් කිරීමේ අවශ්‍යතාව සහජනතාව පෙන්වා දුන්නේය. මේ මගින් වැඩි වියදමකින් තොරව ඉක්මන් සහනයක් ලබා ගත හැකි වේ. අපට කරුනු ඉදිරිපත් කළ අය කියා සිටියේ එම්බුඩ්ස්මන්වරයාට යවන පෙත්සම පාර්ලිමේන්තුවේ පෙත්සම් කමිටුවට ඉදිරිපත් කළ ඒවාට සීමා නොවිය යුතු බවත් මූලික අයිතීන්/ මානව අයිතීන් උල්ලංඝනය කිරීම් හෝ වෙනත් ඕනෑම අසාධාරණයකට ගොදුරුවූ අයට විවෘත විය යුතු බවයි.

වර්තමාන පද්ධතියේ ඇති දුර්වලතාවක් ලෙස පෙන්වා දෙන ලද්දේ විමර්ශන කිසෘමට සම්පත් හිඟවිම හා පැමිණිලි පරීක්ෂා කිරීමට ඵලදායී යන්ත්‍රණයක් නොමැති වීමයි. තවත් පැමිණිල්ලක් වූයේ ඔම්බුඩ්ස්මන්වරයාගේ තීරණ ක්‍රියාත්මක කිරීමට අසමත් වීමයි.

ඔම්බුඩ්ස්මන්වරයා, අධිකරණයක් නොවන බැවින් ඔහුගේ තීරණ බලාත්මක කිරීම දුෂ්කර බව අපේ අදහසයි. එහෙත් යමෙකුට විරුද්ධව දි ඇති තීරණය, බලාත්මක වී නැත්නම් එය උප ජනාධිපතිට/දෙවැනි මන්ත්‍රණ සභාවේ සභාපතිට යොමු කළ හැකි ප්‍රතිපාදනයක් ඇතුළත් කිරීමට පුළුවන.

### 14.8.2 නිර්දේශ

ඉහත දැක්වූ කරුණු මත පදනම්ව කමිටුවේ නිරිදේශ පහත දැක්වේ.

1. මූලික කරුනු/සුළු දුක්ගැනවිලි විමර්ශනය කිරීමට සෑම දිස්ත්‍රික්කයක් සඳහා නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයෙක් පත් කළ යුතුය.
2. ඔම්බුඩස්මන්වරයා හා නියෝජ්‍ය ඔම්බුඩස්මන්වරුන් ඵයවස්ථාදායක අදිකරණයේ උපදෙස් මත ජනාධිපති විසින් පත් කළ යුතුය.
3. ඔම්බුඩස්මන්වරයාගේ හා නියෝජ්‍ය ඔම්බුඩස්මන්වරුන්ගේ කාර්යාලවලට , පාර්ලිමේන්තුව ඒකබද්ධ අරමුදල මගින් අරමුදල් සැපයිය යුතුය.
4. පරිපාලනය පිලිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්ගේ කාර්යාලය, ඔම්බුඩ්ස්මන්වරයා ලෙස හැඳින්විය යුතුය. එසේ නෙවුන හොත් ඔමබුඩ්ස්වරයා පාර්ලිමේන්තු පාලනයට යටත්යයි ජනතාව සිතන්නට ඉඩ තිබේ.

## 14.9 යුක්තිය ලබා ගැනීම - නීතිඥ ගාස්තු හා මිල අධික යුක්තිය

### 14.9.1 ඉදිරිපත් කළ අදහස්

දුගි. ආන්තික හා ග්‍රාමිය ජනතාව මුහුණ දෙන ගැටලුවක් වූයේ දීර්ඝ කාලයක් තිස්සේ ඇදි යන දේපළ ආරවුල් හා ඉඩම් ප්‍රශ්න සම්බන්ධයෙන් අධිකරනයේ නඩු පැවරීමට අවශ්‍ය මුදල් වියදම් දරා ගැනීමට නොහැකි වීමයි. අධිකරන ක්‍රියාවලිය සංකීර්ණථ ආයාසකර හා වියදම් වැඩි ක්‍රමයකි. නඩුමගට බසින්නන්ගේ වියදම් අඩු කිරීමට පමණක් නොව සියල්ලන්ටම ජයග්‍රාහකයන් විය හැකි ආකාරයේ විරුද්ධවාදි ක්‍රියාවලියක් වෙනුවට විමර්ශී ආකාරයේ හෝ උසාවි සහාය ඇති සමථ ක්‍රියාවලියක් ගැනද සැලකිල්ල යොමු කරන ලදී. එසේ නෙවේ නම් සිදුවන්නේ ජයග්‍රාහකයාට සියල්ල ලැබීමයි!

යුක්තිය ලබා ගැනීම සඳහා කළ යුතු අධිකතර වියදම් ගැන ජනතාව පළ කලේ කෝපයකි. මේනිසා බොහෝ දෙනෙකුට යුක්තය ලබා ගැනිමට අධික මිලක් ගෙව්මට

සිදුවී තිබේ. මෙයට බොහෝ දුරට හේතු වන්නේ විනිසුරුවන්ගේ සම්මත විරෝධී ක්‍රියා,නීතිඥයින්ගේ අධික ගාස්තු හා දූෂිත ක්‍රියා සහ  සිවිල් හා අපරාධ නඩු සඳහා දැරිය යුතු  අධික වියදම්ය. පොලීසිය, බන්ධනාගරය හා උසාවි කාර්ය මණ්ඩලය  අතර ඇති ව්‍යහාත්මක දූෂණය ගැනද  ජනතාව විවේජනය කළහ. මෙනිසා දූෂිත රාජ්‍ය නිලධාරීන් සමග හවුලේ බෙදා ගන්නා  අධික නීතිඥ ගාස්තු  ගෙවීමට ඔවුන්ට සිදුවී තිබේ.

මේ සම්බන්ධයෙන් කමිටුවට ඉදිරිපත් කළ තවත් අදහසක් වූයේ අතිරේක මූල්‍ය හා මානව සම්පත් ලබා දෙමින්  රජයන් නීති ආධාර ලබා දීමේ ක්‍රමය වඩාත් කාර්යක්ෂම හා ඵලදායි කළ යුතු බවයි.නීති ආධාර කොමිසම  ව්‍යවස්ථාදායක මණ්ඩලය යටතට එන  ස්වාදින කොමිසක් බවට පත් කර ඒ සඳහා පාර්ලිමේන්තුව  ඒකාබද්ධ අරමුදලෙන් ඍජුවම අරමුදල් ලබා දිය යුතුයයිද  යොජනා කරන ලදී.  එය දුප්පතුන් හා ආන්තික කන්ඩායම්වලට ප්‍රාෙයාෙගිකව සත්‍ය වශයෙන් නීති ආධාර ලබා දෙන බව  ගැන සහතික වීම සඳහා මෙම කමය වරින්වර පරීක්ෂාවට ලක් කළ යුතුවේ.

### 14.9.2 නිර්දේශ

ව්‍යවස්ථාදායක මන්ඩලය මගින් කොමසාරිස්වරුන් පත් කිරීමේ ප්‍රතිපාදන සහිතව වයවස්ථාව යටතේ ස්වාධීන ආයතනයක් ලෙස නිති ආධාර කොමිසම පිහිටුවිය යුතුයයි කමිටුව නිර්දේශ කර සිටී.  මේ සඳහා අවශය අරමුදල්  කෙලින්ම පාර්ලිමේන්තුව ඒකාබද්ධ අරමුදලෙන් ලබා දිය යුතුයයිද නිර්දේශ කරමු.

කාලිකව හා ප්‍රමාදයකින් තොරව සාදාරනය ඉටු කිරීම අධිකරණයේ කාර්යයක් හා පරම වගකිමක්බව  ව්‍යස්ථාවේ සඳහන් කිරීමට යෝජනා කරමු.නීති ක්ෂේත්‍රයන් සමග සහයෝගයෙන් කටයුතුකරමින්  අර්ථාන්විත ලෙස නඩු අවසන් කිරීමට ඔවුන් ක්‍රියා කළ යුතුය.

## 14.10 නීතියේ ප්‍රමාදයන්

යුක්තිය පසඳලිම පිලිබඳව අදහස් දැක්වූ බොහෝ දෙනෙකුට අධිකරණයෙන් සාධාරණය ඉටු කරවා ගැනීමේදි ඔවුන්  මුහුණ දුන් ප්‍රමාද වීම් සම්බන්ධයෙන් දැඩි විවේචනයක් තිබුණි. ඔවුන් පෙන්වා දුන්නේ “යුක්තිය ප්‍රමාද වීම යුක්තිය නැති කිරීමක්” බව යන සුපුරුදු කියමනේ සත්‍යතාවයි.

කමිටු සාමාජිකයන්ගේ මතය වන්නේ ඉදිරිපත් කළ විවේජන බොහෝදුරට සත්‍ය බවත් රජය හා විශේෂයෙන්ම අදිකරණ පද්ධතිය, ඉතා ඉක්මනින් හා ගැඹුරින් මේ කරුණුවලට අවධානය යොමු කළ යුතු බවයි. නිර්දේශ කරන සමහර යෝජනා අතර උසාවි හා විනිසුරුවන් ගණන වැඩි කිරීම, සුළු කරුනු සඳහා උසාවි/ ප්‍රාථමික උසාවි පිහිටුවීම, සමථ ක්‍රියාවලය ප්‍රවර්ධනය කිරීම, බේරුම් කිරීමේ හා අනිකුත් ආරවුල් විසඳීමේ ක්‍රම, ගත යුතු ක්‍රියාමාර්ග හා පියවර සරල කිරීම සඳහා උසාවි ක්‍රියාපිළිවෙල හා සම්බන්ධ නීති ප්‍රතිශෝධනය කිරීම ආදිය වේ.

# 15 පරිච්ඡේදය

# මැතිවරණ ක්‍රමය හා ක්‍රියාවලිය

## 15.1 ඉදිරිපත් කළ අදහස්

මැතිවරණ ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අපට ඉතා විස්තරාත්මක, විචාරශීලී හා නවීන අදහස් සහිත යෝජනා ගණනාවක් ලැබුණි. මහජනයා මැතිවරණ ක්‍රියාවලිය ගැන දැක්වූ අදහස් අපි මෙම කොටසේදී සාකච්ඡා කරමු.

මැතිවරණ ක්‍රමයේ හා ක්‍රියාවලියේ විවිධ අංශ ගැන මහජනයා දැක්වූ අදහස් පහත දැක්වේ.

### 15.1.1 ඡන්ද බලයේ තේරුම හා මැතිවරණවල අධික වියදම

කමිටුවට යෝජනා ඉදිරිපත් කළ බොහෝ දෙනෙක් අදහස් දක්වා තිබුණේ ඔවුන්ගේ තෝරා ගත් නියෝජිතයන් පිළිබඳ ව හා රජයේ විවිධ ස්තරවල අනුගමනය කරන නියෝජන ක්‍රමය පිළිබඳවයි.

සමහර පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට පත් වී ඇති නියෝජිතයන් වැඩියෙන් උනන්දු වන්නේ ජනතාවට සේවය කිරීමට නොව ඔවුන්ගේ දේශපාලන බලය යොදා ගනිමින් මුදල් ඉපයීමට බව මහජනයාගේ අදහස විය. අප ඉදිරියට ආ සමහරුන් පළ කළ මතයක් වූයේ මැතිවරණ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම ඉතා වියදම් අධික කාර්යයක් වන බැවින් වර්තමාන ක්‍රමය යටතේ වැඩි වාසියක් ඇත්තේ ධනවත් අපේක්ෂකයන්ට පමණක් බවයි. ඡන්දයෙන් තේරී පත්වීමේ හැකියාව ඇත්තේ රුපියල් මිලියන ගණන් වියදම් කළ හැකි අයට පමණි. තේරී පත්වීමෙන් පසු මෙම නියෝජිතයන්ට තම මැතිවරණ ව්‍යාපාරයට මුදල් ලබා දුන් අයට සැලකීමට සිදු වේ. මේ මගින් ජනතාවගේ ඡන්ද බලය පිළිබඳ සංකල්පය ප්‍රබල ලෙස විකෘති කරයි.

කමිටුවට ඉදිරිපත් කළ නියෝජනවලින් පැහැදිලිව ම පෙනී ගියේ ඔවුන්ගේ තේරී පත්වූ නියෝජිතයන්ගේ නොහොබිනා හැසිරීම සම්බන්ධයෙන් ජනතාවගේ අසතුටයි. වර්තමාන සංකීර්ණ දේශපාලන, සමාජ-සංස්කෘතික හා තාක්ෂණික වාතාවරණය තුළ මහජන නියෝජිතයෙකු වීමට අවශ්‍ය අධ්‍යාපනය හෝ වෘත්තීය සුදුසුකම් ඡන්දයෙන් පත් වන බොහෝ දෙනෙකුට නැති බව මහජනයාගේ අදහස විය.

මෙම හිඩැස පිරවීමට මහජනයා යෝජනා කළේ රජයේ විවිධ මට්ටම් සඳහා අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ පටිපාටියක් තිබිය යුතු බවයි. ඡන්දයෙන් තේරී පත්වන නියෝජිත ආයතනයක සාමාජිකයෙක් වීම සඳහා සුදුස්සෙක් වීමට, ඔහු/ඇය තේරී පත් වූ නියෝජිතයෙක් වීමට පෙර, නියමිත සුදුසුකම් ලබා ගත යුතු වේ.

තේරී පත් වී ඇති නියෝජිතයන්ගේ ස්වභාවය පිළිබඳ ව බොහෝ අය සෑහීමකට පත් නොවීම සම්බන්ධයෙන් කමිටුවේ අවධානය යොමු කරන ලදී.

කෙසේ වෙතත් ඡන්දයෙන් තේරී පත්වූ නියෝජිතයෙක් වීමට පුරවැසියෙකුට අධ්‍යාපන සුදුසුකම් නියම කිරීම, ප්‍රජාතන්ත්‍ර විරෝධී මෙන් ම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව කමිටුවේ අදහසයි. අපගේ මතය වන්නේ වඩා ම සුදුසුකම් ඇති තැනැත්තා තෝරා ගැනීමේ වගකීම පුරවැසියන්ට ඇති බවයි. තව ද, අධ්‍යාපන සුදුසුකම්වලින් පමණක් කෙනෙකුට ඵලදායී නියෝජිතයෙක් වීමට නුපුළුවන.

### 15.1.2 පවුල් ප්‍රශ්නය හා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය

ශ්‍රී ලංකාවේ දේශපාලනයේ පවුල්වල භූමිකාව සම්බන්ධයෙන් සමාජයේ විවිධ මට්ටම්වල ජනයා ඔවුන්ගේ අප්‍රසාදය ප්‍රකාශ කළෝ ය. විශේෂයෙන් ම සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පෙර කිසි දිනක දකින්නට නො තිබූ ආකාරයට දේශපාලනඥයින්ගේ දූ දරුවන් භාර්යාවන්, ස්වාමිපුරුෂයන් හා විවිධ නෑයන් වර්තමාන දේශපාලන ක්‍රියාදාමයේ දැකිය හැකියි. මහජනයා මෙයට තදින් විරුද්ධත්වය පෑ අතර දේශපාලනඥයින්ගේ පවුලේ නෑයන් දේශපාලනයේ නියැළීම පිළිබඳ කිසියම් සීමාවක් තිබිය යුතු බවයි.

“පවුල් දේශපාලනය” සම්බන්ධයෙන් ජනතාවගේ කළකිරීම කමිටුවට අවබෝධ කර ගත හැකි නමුත් පවුල් සාමාජිකයන් දේශපාලනයට ඒම වළක්වන නීති ගෙන ඒම සම්බන්ධයෙන් අපගේ මතය වන්නේ එය ප්‍රජාතන්ත්‍රීය මූලධර්ම හා මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් වන බවයි.

### 15.1.3 මුදල් හිඟ අපේක්ෂකයන්ට සාධාරණයක් නොමැති වීම

මනාප ඡන්ද ක්‍රමයක් සහිත සමානුපාතික නියෝජන ක්‍රමයේදී අපේක්ෂකයෙකුට දැරීමට සිදුවන වියදම් පිළිබඳ ව ගැටලුවක් තිබේ. ජයග්‍රහණය සඳහා තම ප්‍රතිරූපය ඉහළ නංවා ගැනීමට අපේක්ෂකයෙකුට විශාල ප්‍රදේශයක වියදම් අධික මැතිවරණ ව්‍යාපාරයක් ගෙන යෑමට සිදු වී තිබේ.

මෙය, විශාල වශයෙන් මූල්‍ය සම්පත් නොමැති අපේක්ෂකයන් දේශපාලනයට සම්බන්ධ වීම අධෛර්යමත් කරනු පමණක් නොව දූෂණයට ද, අනුබල දෙයි.

### 15.1.4 තේරී පත්වන නියෝජිතයන්ගේ නුසුදුසු හැසිරීම

ඔවුන්ගේ තේරී පත් වී ඇති නියෝජිතයන් පිළිබඳව මහජනයා තුළ ඇත්තේ ඉතා අවඥා සහගත හැඟීමකි. මෑත මැතිවරණවලදී මැරවරයන්ගේ, පාතාල සාමාජිකයන්ගේ භූමිකාව මෙන් ම ව්‍යාපාරිකයන්ගේ බලපෑම ද, පැහැදිලිව දැකිය හැකි විය. මේ නිසා එක ම දේශපාලන පක්ෂය තුළ පවා දේශපාලන බිය වැද්දීම්, ප්‍රචණ්ඩ හා ගැටුම්කාරී දේශපාලනයක් දැකිය හැකි වූයේය. මහජනතාව චෝදනා කළේ ඔවුන්ගේ නියෝජිතයන් වඩා උනන්දු වූයේ බලය හා නිලය අනිසි ලෙස භාවිතා කරමින් පුද්ගලික ධනය වැඩි කර ගැනීමට බවයි. මහජනයාට අවශ්‍ය වූයේ තම නියෝජිතයන්ගේ දූෂණය හා බලයෙන් අයථා ප්‍රයෝජන ගැනීම අවම කරන රෙගුලාසියි. තමන්ගේ වත්කම් හෙළි කරමින් දේශපාලනයට එන පුද්ගලයන්ට ජනතාව ප්‍රබල ලෙස අනුග්‍රහය දැක්වූහ. ජනතාව යෝජනා කළේ මෙම වත්කම් ප්‍රකාශනවලට ඔවුන්ගේ පවුල් සාමාජිකයන්ගේ වත්කම් ද, ඇතුළත් විය යුතු බවයි.

### 15.1.5 තේරී පත් වූ නියෝජිතයන් ආපසු කැඳවීම

ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීමට සම්බන්ධව, පත් වූ නියෝජිතයන් ජනතාවගේ වරම හෝ ආචාර ධර්ම පද්ධතිය හෝ උල්ලංඝනය කළහොත් ඔවුන් ආපසු කැඳවීමේ ක්‍රමයක් ද, තිබිය යුතු යයි යෝජනා කරන ලදී. මෑතදී දකින්නට ලැබුණු පුද්ගලික ලාභ ප්‍රයෝජන, වරප්‍රසාද හා අතුරු ප්‍රතිලාභ ආදිය සඳහා පැති මාරු කිරීම ජනතාවගේ වරම උල්ලංඝනය කිරීමක් බව මහජනතාව පෙන්වා දුන්හ.

මැතිවරණ කොට්ඨාසයක ඡන්දදායකයන් බහුතරයක් තමන් තෝරා පත් කර ගත් නියෝජිතයා අකාර්යක්ෂම හෝ ආචාර ධර්ම උල්ලංඝනය කර ඇති බව හෝ වංචනික යයි සිතන්නේ නම් ආපසු කැඳවීමේ ක්‍රියා මාර්ගයක් ආරම්භ කිරීමට ඡන්ද දායකයන්ට දිවුරුම් ප්‍රකාශ සහිතව පෙත්සමක් අත්සන් කිරීමට පුළුවන. ඉන්පසු නියෝජිතයා වැරදිකරුවෙකු වුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම අවලංගු කර අතුරු මැතිවරණයක් පැවැත්විය යුතු වේ.

### 15.1.6 ආගම හා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය

ඇතමුන් ප්‍රකාශ කර සිටියේ ආගම හා දේශපාලනය අයත් වන්නේ ලෝක දෙකකට බවයි. ඔවුන්ගේ මතය වූයේ ආගමික ස්ථාන හා සියලු ම ආගම්වල පූජකවරුන් දේශපාලනයට සම්බන්ධ වීම වැළැක්විය යුතු බවයි. පූජකයන්, දේශපාලනයට සම්බන්ධ වීමත්, ආගම හා දේශපාලනය අතර ඇති සමීප සබඳතාවත්, නිසා ආගම අවමානයට භාජනය වූ අවස්ථා ගණනාවක් ඔවුන් ගෙන හැර දැක්වූහ. ඔවුන්ගේ තර්කය වූයේ මේ නිසා ආගමික ගැටුම් ඇතිවන බවයි.

කමිටුවේ අදහස වූයේ ප්‍රජාතන්ත්‍රවාදී රටක පූජකයින් දේශපාලනයට සම්බන්ධ නොවිය යුතුයැයි නීති පැනවීම දුෂ්කර බවයි. මෙය ආගමික ආයතන විසින් ගත යුතු තීරණයකි. අවශ්‍ය නම්, ආගම හා දේශපාලනය සම්බන්ධ කිරීමට ගන්නා ප්‍රයත්න ප්‍රතික්ෂේප කිරීම පුරවැසියන්ගේ ද, වගකීමක් වේ.

### 15.1.7 තෝරා පත් කර ගන්නා නියෝජිතයන්ගේ වයස හා වරප්‍රසාද

මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ ව අදහස් ඉදිරිපත් කළ අය අතරින් බොහෝ අය පෙන්වා දුන්නේ කායික හෝ මානසික යෝග්‍යතාව අවශ්‍ය නොවන එක ම වෘත්තිය, දේශපාලනය බවයි. දුබලබව නිසා ක්‍රියාකාරී ලෙස දේශපාලන කටයුතුවලට සහභාගී විය නොහැකි අය පවා ඔවුන්ට වරප්‍රසාද ලබා දීමේ අරමුණෙන් වගකිව යුතු තනතුරුවලට පත්කරන බව ඔවුන් පෙන්වා දුන්නේය. මෙහිදී යෝජනා කෙරුණේ දේශපාලන අපේක්ෂකයන්ට ඉහළ වයස් සීමාවක් තිබිය යුතු බවත්, එය වයස 70 විය යුතු බවත්ය. සෑම මට්ටමකම දේශපාලනඥයින්ට නිල කාල සීමාවක් ද, නිර්දේශ කරන ලදී.

### 15.1.8 මැතිවරණ ක්‍රම

කමිටුවට අදහස් ඉදිරිපත් කළ බොහෝ දෙනෙක් වර්තමාන සමානුපාතික නියෝජන (PR) ක්‍රමයේ ඇති අඩුපාඩු ඉස්මතු කළෝ ය.

ඔවුන්ගේ තර්කය වූයේ සමානුපාතික ක්‍රමයෙන්, මැතිවරණයේදී ජයග්‍රහණය කරන දේශපාලන පක්ෂයට, කෘත්‍රිම බහුතරයක් නිර්මාණය කර දෙන බවයි. තව ද, මින් පෙර ද පෙන්වා දී ඇති පරිදි එය ඉතා වියදම් අධික මැතිවරණ ක්‍රමයක් වන අතර රටේ තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් පොදු ජනතාව ඈත් කරයි.

මෙයට සම්බන්ධ අනිත් කරුණ වන්නේ රජයේ සෑම මට්ටමකම, පාලක දේශපාලන පවුල්වලින් සමන්විත ඉහළ පෙළැන්තියක් නිර්මාණය වී තිබීම හා මැතිවරණවල අධික වියදම් නිසා මේ සමාජ ස්තරය නීති විරෝධී ක්‍රමවලින් මුදල් ඉපයීමට යොමු වීමයි. මේ නිසා ම පක්ෂ ඇතුළේ ම ප්‍රතිවිරෝධ ඇතිවී තිබේ.

කෙසේ වෙතත් සමානුපාතික ක්‍රමයේ ඇති ධනාත්මක ලක්ෂණ ද, පෙන්වා දෙන ලද අතර ඒවා පහත දැක්වේ

- කේවල ක්‍රමය යටතේ ලබා ගත හැකි අත්තනෝමතික බහුතරයන් වැළැක්වීම
- පොදු තීරණ ගන්නා ආයතන තුළ, දේශපාලන වශයෙන් වැදගත් වෙනත් මතවලට ඉඩ ලබා දීම
- ආන්තික සුළුතරයන් හා කණ්ඩායම්වලට පොදු තීරණ ගන්නා ආයතන තුළ නියෝජනය වීමට හැකිවීම
- සමූහමතික ප්‍රජාතන්ත්‍රවාදී භාවිතයන් ප්‍රවර්ධනය කරන වාතාවරණයක් නිර්මාණය කිරීම

තීරණ ගන්නා රජයේ සාකච්ඡාවලදී වෙනස් අදහස්වලට ඉඩ දෙන අතර ම ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කිරීම ජනතාව තම නියෝජිතයන්ගෙන් බලාපොරොත්තු වේ. කෙටියෙන් කිව හොත් ජනතාව වඩාම කැමති වූයේ සමානුපාතික හා කේවල ක්‍රමවල මිශ්‍රණයකටයි. මිශ්‍ර ක්‍රමයක ඡන්ද පත්‍රිකා දෙකක් ( එකක් සමානුපාතික හා එකක් කේවල යනුවෙන්) ලබා දීමට ද යෝජනා කරන ලදී.

### 15.1.9 ජනවාර්ගික- ආගමික පක්ෂ පිළිබඳ ගැටලුව

යම්කිසි වාර්ගික-ආගමික අනන්‍යතාවක් සමග තමන් හඳුනා ගන්නා දේශපාලන පක්ෂ සමහර අය තදින්ම විවේචනය කළෝ ය. ඔවුන් කියා සිටියේ එවැනි පක්ෂ තහනම් කළ යුතු බවයි.

මේ ගැන ගැඹුරින් සලකා බැලූ කමිටුවේ අදහස වන්නේ එවැනි පක්ෂ මේ අවස්ථාවේ තහනම් කිරීම කළ නොහැකි දෙයක් බවත් මේ නිසා අනවශ්‍ය ගැටුමක් ඇතිවිය හැකි බවත්ය.

### 15.1.10 ඡන්ද දායකයන්ගේ අයිතිවාසිකම්

අපේ විදේශීය දූත මණ්ඩලවල ආධාරයෙන් (නියම කළ ස්ථානවල) ඡන්ද පොළවල් පිහිටුවීමෙන් ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ හා විදේශවල ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන ලෙස ප්‍රබල නිර්දේශ තිබුණි. මේ සම්බන්ධයෙන් මහජනතාව යෝජනා කළ තවත් අදහසක් වූයේ උපතේදී පුද්ගලයන් ලියාපදිංචි කරන හා මරණයේ දී ඒවා ඉවත් කරන දත්ත සමුදාය පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කිරීමයි. මෙම පද්ධතිය පුරවැසියන්ගේ අනිකුත් සේවා අවශ්‍යතා සඳහා ද, යොදා ගත හැකි වේ. උදා: හැඳුනුම්පත්, වාහන අයිතිය, කෘෂි ණය හා ආපසු ගෙවීම් වාර්තා කිරීම ආදිය

තව ද, දැන් බොහෝ පුද්ගලයන්ට පරිගණක/ජංගම දුරකථන ඇති බැවින් තථ්‍ය කාල ඉලෙක්ට්‍රොනික ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් ද, යෝජනා කරන ලදී.

රට පුරා ඇති ආයෝජන ප්‍රවර්ධන කලාපවල වැඩ කරන සේවකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා තමන්ගේ ගම් ප්‍රදේශවලට යෑමේ අපහසුව පිළිබඳව ද සාකච්ඡා විය. ඡන්ද වංචා කිරීම, අල්ලස් දීම හා මහජන මුදල් යොදවා ඡන්ද මිලදී ගැනීම වැනි දූෂණ ගැන බරපතළ ලෙස අවධානය යොමු කළ යුතු බව ද, මේ සඳහා ශක්තිමත් නෛතික රාමුවක් හා අපක්ෂපාතී බලාත්මක කිරීමක් අවශ්‍ය බව ද පෙන්වා දෙන ලදී.

මේ පිළිබඳ විස්තරාත්මකව සාකච්ඡා කළ කමිටුව සංක්‍රමණික සේවකයන්ට ඡන්ද අයිතිය ලබා දීම ගැන එකඟ වුවත් විදේශවල සිටින සියලූ ශ්‍රී ලාංකිකයන්ට මැතිවරණයට සහභාගීවීමේ පහසුකම් සැලසීමේදී ඉතා පරිස්සමින් කටයුතු කිරීම අවශ්‍ය බව පෙන්වා දුන්නේය. ඉලෙක්ට්‍රොනික ඡන්ද ක්‍රමය වැඩිදුරටත් විමසා බැලිය යුතු අදහසක් වුවත් ඒ සඳහා අවශ්‍ය දත්ත සමුදාය පද්ධතිය ස්ථාපිත කිරීමේ දී, රජය එය පුද්ගල රහ්‍යසභාවය උල්ලංඝනය කිරීමට හා අදිසෝදිසියට පුද්ගලයන් ලක් කිරීමට යොදා ගත හැකි බැවින්, පරීක්ෂාකාරී විය යුතු බව කමිටුවේ අදහස විය.

### 15.1.11 ජනාධිපති තෝරා පත් කිරීම

අප ඉදිරියට පැමිණි අයට මේ සම්බන්ධයෙන් විවිධ මත තිබුණි. ඒවා කෙටියෙන් පහත දැක්වේ.

- විධායක ජනාධිපති ධූරය සම්පූර්ණයෙන් ම ඉවත් කළ හොත් ජනාධිපති කෙනෙක් පත් කිරීම සඳහා සෘජු ඡන්ද ක්‍රමයක් අවශ්‍ය නොවනු ඇත.
- 19වැනි සංශෝධනයෙන් පසුව පවතින ආකාරයට ජනාධිපති ක්‍රමය පැවතිය යුතුය.
- ජනාධිපති තෝරා ගන්නේ ඡන්ද විද්‍යාලයකින් නම් එය මන්ත්‍රණ සභා දෙකේ ම මන්ත්‍රීවරු (ද්වි-මණ්ඩල ව්‍යවස්ථාදායකය පිළිබඳ යෝජනාව සලකා බලන්නේ නම්), පළාත් සභා මන්ත්‍රීවරු, නගරාධිපතිවරු හා පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ගෙන් එය සමන්විත විය යුතුය.
- ජනාධිපති තෝරා පත් කරන්නේ පාර්ලිමේන්තුවේ සාමාජිකයන් විසින් නම් එම ඡන්ද විමසීම, අග විනිසුරු, අභියාචනාධිකරණයේ සභාපති හා පාර්ලිමේන්තුවේ මහලේකම්ගේ අධීක්ෂණය යටතේ මැතිවරණ කොමිසම විසින් පැවැත්විය යුතුයි.
- ජනාධිපතිට සීමිත බලතල පැවරුවත් ඔහු/ඇය මහජන ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතුයි.

### 15.1.12 මැතිවරණ වියදම් අඩු කිරීම

පහත දැක්වෙන යෝජනා ද, ඇතුළු ප්‍රජාතන්ත්‍රීය නියෝජනය වඩාත් අර්ථාන්විත කරන විවිධ අදහස් මහජනයා විසින් ඉදිරිපත් ලදී

- පහළම මට්ටමේ සෘජු නියෝජනය හා පළාත් හා ජාතික මට්ටමේ වක්‍ර නියෝජනය
- මැතිවරණ දින දර්ශනයක් හඳුන්වා දීම
- සියලු ම ස්තරවල නියෝජිත ආයතනවල මැතිවරණ එක ම දිනයක පැවැත්වීම
- ජනාධිපති හා පාර්ලිමේන්තු මැතිවරණ එක් දිනකත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන මැතිවරණ තවත් දිනකත් පැවැත්වීම

*මැතිවරණ දින දර්ශනය*

විවිධ ප්‍රදේශවල විවිධ දිනවල විටින් විට පළාත් සභා හා පළාත් පාලන ආයතන මැතිවරණ පැවැත්වීමටත්, මැතිවරණ ගැටලු බොහොමයකටත් හේතු වී ඇත්තේ මැතිවරණ දින දර්ශනයක් නොමැති වීම බව කමිටුව ඉදිරියට පැමිණි මහජනයාගේ අදහස විය. මෙහි

ප්‍රතිඵලයක් ලෙස රටේ යහපත සඳහා යොදා ගත හැකි ව තිබූ මුදල් විශාල ප්‍රමාණයක් හා අතිකූත් සම්පත් අනවශ්‍ය ලෙස මැතිවරණවලට යෙදීමට සිදු වී තිබේ. වරින් වර මැතිවරණ පැවැත්වීම, රට පාලනය කිරීමේ කටයුතු අනවශ්‍ය ලෙස අවුල් කිරීමක් බව ද, මහජනයාගේ අදහස විය.

මෙම යෝජනාවල අරමුණ වූයේ ඡන්දදායකයාගේ අපහසුව අවම කිරීම, ආර්ථිකයට ඇති කරන අයහපත් බලපෑම අඩු කිරීම, මැතිවරණ සඳහා කරන අධික වියදම් අඩු කිරීම හා නැවත නැවතත් රාජ්‍ය නිලධාරීන් විශාල සංඛ්‍යාවක් මේ සඳහා යෙදවීම අවම කිරීම ආදියයි. කෙසේ වෙතත් කමිටුවේ අදහස වූයේ පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් තුළ විවිධ අවස්ථාවල අතුරු මැතිවරණ පැවැත්වීමට සිදුවිය හැකි බැවින් මැතිවරණ දින දර්ශනයක් පවත්වා ගැනීම දුෂ්කර විය හැකි බවයි. එසේ නමුත් වරින් වර මැතිවරණ පැවැත්වීම තුළින් මුළු පද්ධතියම හසුරුවීමට  ඉඩ ලැබීම පිළිබඳ ව ද, අවධානය යොමු කළ යුතු වේ.

### 15.1.13 ජාතික ලැයිස්තුව

පාර්ලිමේන්තුවට තේරී පත් නොවූ අපේක්ෂකයන් ජාතික ලැයිස්තුව තුළින් පත් කිරීම සම්බන්ධයෙන් කමිටුව ඉදිරියට පැමිණි බොහෝ දෙනෙක් දැඩි අප්‍රසාදය පළ කළහ. එය ඡන්දදායකයාගේ අයිතිය උල්ලංඝනය කරමින් ප්‍රජාතන්ත්‍රීය ක්‍රියාවලියට හානි පමුණුවයි. ජාතික ලැයිස්තුව හඳුන්වා දෙන ලද්දේ බුද්ධිමතුන්, වෘත්තිකයන් හා විශිෂ්ඨ පුද්ගලයන්ට පාර්ලිමේන්තුව තුළින් රටට සේවය කිරීමේ අවස්ථාව ලබා දීමට බැවින්, මෙවැනි පත්වීම් එම අරමුණට සම්පූර්ණයෙන් පටහැණි බව ද, ඔවුන් පෙන්වා දුන්නේ ය. බොහෝ අයගේ මතය වූයේ ජාතික ලැයිස්තුව පිළිබඳ මුල් අදහස සම්පූර්ණයෙන්ම විකෘති වී ඇති බවයි.

### 15.1.14 මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම

මේ සම්බන්ධයෙන් කරුණු දැක්වූ අය ඉල්ලා සිටියේ සුළුතරයන් හා ආන්තික කණ්ඩායම්වලට නියෝජනයක් ලැබෙන සේ හා පළාත් පාලන ආයතනවලින් වඩා හොඳ සේවාවක් ලබා ගත හැකි ආකාරයට මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කළ යුතු බවයි. උදාහරණයක් වශයෙන් ත්‍රිකුණාමලය හා පදවි-සිරිපුර ඇතුළත් වන වැලිඔය නමින් අලුත් කොට්ඨාසයක් නැගෙනහිර පළාතේත්, දෙහිඅත්තකන්ඩිය, මහියංගණය, හා රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශ ඇතුළත් මහියංගණය නමින්  අලුත් කොට්ඨාසයක් ද  යෝජනා කරන ලදී.

මොනරගල දිස්ත්‍රික්කයේ කීප දෙනෙක් ම එම දිස්ත්‍රික්කය සඳහා අලුත් ඡන්ද කොට්ඨාස දෙකක් නිර්මාණය කරන ලෙස ඉල්ලා සිටියහ. මෙයින් පළමුවැන්න බුත්තල, කතරගම හා බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහාත්, දෙවැන්න වැල්ලවාය, තණමල්විල හා සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහාත් ය. විශේෂයෙන්ම පුත්තලම හා අම්පාර වැනි රටේ අනිකුත් ප්‍රදේශවලින් ද, මෙයට සමාන යෝජනා ඉදිරිපත් විය.

එක් විශාල මැතිවරණ කොට්ඨාසයක් ඇති විට විමධ්‍යගත අයවැය හා සංවර්ධන අරමුදල් අසාධාරණ ලෙස බෙදී යන බව බොහෝ දෙනෙක් පෙන්වා දුන් අතර කමිටුව මේ පිළිබඳ ව ගැඹුරින් සාකච්ඡා කළේය. වර්තමාන සීමා නිර්ණය ක්‍රමය, පළාත් හා දිස්ත්‍රික්ක තුළ ඇති දැවැන්ත විෂමතා හා අසමානත්ව සැලකිල්ලට ගෙන නැති බැවින් අලුතෙන් සීමා නිර්ණය කිරීමේදී මේ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු විය යුතු බව කමිටුවේ අදහසයි.

### 15.1.15 ඌන නියෝජනයක් ඇති කණ්ඩායම්

මේ සම්බන්ධයෙන් කරුණු දැක්වූ අය අවධාරණය කළේ තෝරා පත් කර ගන්නා ආයතනවල ප්‍රමාණවත් නියෝජනයක් නැති කණ්ඩායම්වලට ඔවුන් නියෝජනය කිරීමේ අවස්ථා ලබා දිය යුතු බවයි. මැතිවරණ ක්‍රියාවලියේ වෙනස් අවශ්‍යතා ඇති අයගේ සහභාගීත්වය පහසු කිරීම සඳහා ද, විශේෂ පියවර ගත යුතු බව ද, පෙන්වා දෙන ලදී.

- නියෝජනය සහතික කිරීම - මේ සඳහා පාර්ලිමේන්තුවේ, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල පත්කළ මන්ත්‍රීන් හෝ ජාතික ලැයිස්තු මන්ත්‍රීන් වැනි ක්‍රමවලින් මෙම කණ්ඩායම්වලට නියෝජනයක් ලබා දීම අවශ්‍ය වේ.
- එවැනි සියලු කණ්ඩායම්වල දේශපාලන සහභාගීත්වය වැඩි කිරීමේ ක්‍රියාවලියේ පාර්ශවකරුවන් ලෙස දේශපාලන පක්ෂ ඇතුළත් කළ යුතුය. සුළුතර කණ්ඩායම් හා ප්‍රමාණවත් නියෝජනයක් නැති කණ්ඩායම්වලට දේශපාලන පක්ෂ නියෝජනයක් ලබා දෙන බව සහතික කිරීමට නීති හා දිරි ගැන්වීම් සහිත වාතාවරණයක් ඇති කිරීමට මැතිවරණ කොමිසම තුළින් රජය ක්‍රියා කිරීම අවශ්‍ය වේ. උදාහරණයක් වශයෙන් මැතිවරණයට ඉදිරිපත් කරන අයගෙන් යම් කිසි ප්‍රතිශතයක් කාන්තාවන්, ආබාධිතයන් හා කුඩා ප්‍රජා කණ්ඩායම්වලින් විය යුතුය.
- අවශ්‍ය අවස්ථාවලදී ඉලෙක්ට්‍රොනික හා තැපැල් ඡන්ද වැනි විකල්ප හා ප්‍රවාහන පහසුකම් සැපයීම ඇතුළුව සියලු ම පුරවැසියන්ට ඡන්ද ක්‍රියා පිළිවෙළ, පහසුකම් හා ද්‍රව්‍ය ලබා දීම රජය සහතික කළ යුතු බවට ප්‍රබල ඉල්ලීමක් විය.

- අවසාන වශයෙන්, පදිංචි ස්ථානය කුමක් වුවත්, රටේ මැතිවරණ ක්‍රියාවලියට සහභාගී වීමේ හැකියාව සෑම පුරවැසියෙකුට ම සහතික කිරීම කළ යුතුය.

### 15.1.16 කාන්තා නියෝජනය

රටේ ජනගහණයෙන් අඩකට වැඩි කොටසක් කාන්තාවන් වුවත්, රාජ්‍ය ව්‍යුහය තුළ සෑම මට්ටමකම ඔවුන්ගේ නියෝජනය ඉතා සීමිත වේ. රටේ සියලුම පළාත්වලින් ඉදිරිපත් වූ අදහස්වල කාන්තා නියෝජනය වැඩි කිරීමේ අවශ්‍යතාව පෙන්වා දී තිබුණි. මෙම ව්‍යුහ තුළට කාන්තා සාමාජිකාවන් පත් කර ගැනීමට (කණ්ඩායමක් ලෙස) කාන්තාවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටියත්, පසුගිය අවුරුදු 65 තුළ කාන්තාවන් පත් වී ඇත්තේ අල්ප සංඛ්‍යාවකි.

### 15.1.17 ආබාධ සහිත පුද්ගලයෝ

ආබාධිත පුද්ගලයන් මට්ටම් කීපයකදී, කීප ආකාරයකට අවාසිදායක තත්ත්වයකට මුහුණ දෙන බැවින් ඔවුන්ට මැතිවරණ ක්‍රියාවලියේ දෙපැත්තත් ම සහභාගී වීම දුෂ්කර වී තිබේ. එනම් අපේක්ෂකයන් හෝ ඡන්දදායකයන් හෝ ලෙසයි. ආබාධිත පුද්ගලයන් යම් කිසි සංඛ්‍යාවක් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් කිරීමට දේශපාලන පක්ෂ දිරිගැන්විය යුතු යැයිද ප්‍රකාශ කරන ලදී.

### 15.1.18 කුඩා ප්‍රජා කණ්ඩායම්

විශේෂ නම් කිරීමේ ක්‍රමයකින් හෝ සහනදායී ක්‍රියා මාර්ගයක් තුළින් රාජ්‍ය ව්‍යුහය තුළ තමන්ට නියෝජනයක් ලබා දෙන ක්‍රමයක් සහතික කරන ලෙස ආදිවාසීන්, මැලේ, තෙළිඟු හා මලයාලම් කථා කරන ජනයා, පෘතුගීසි කථා කරන බර්ගර් ජනයා, අප්‍රිකානු සම්භවයක් සහිත ජනයා ආදී විවිධ කොටස් වෙනුවෙන් කරුණු දැක්වූ නියෝජිතයෝ ඉල්ලා සිටියහ.

මෙහිදී ඉතා පැහැදිලිව පෙනී ගියේ වඩා සාර්ථක නියෝජන ක්‍රියාවලියක් සහතික කරන ආකාරයට මැතිවරණ ක්‍රමය ප්‍රතිශෝධනය කිරීම හා අවංක හා සදාචාරාත්මක අපේක්ෂකයන් මැතිවරණ ක්‍රියාවලියට සහභාගී වීම වැනි කරුණුවලට විශාල ජනතා ප්‍රසාදයක් ඇති බවයි. බේදකාරී, ප්‍රචණ්ඩ හා දූෂිත දේශපාලනය ගැන ජනතාව තදින්ම කලකිරී ඇති බව ද අපට පැහැදිලි විය.

අපේ අදහස වන්නේ මේ පිළිබඳව ජනතාව දැක්වූ අදහස් ඉතා බරපතළ ලෙස සැලකිල්ලට ගත යුතු බවයි. මැතිවරණ ක්‍රියාවලිය තවත් පිරිහීමට ලක් වුවහොත් මහජනයා ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතියේ එක් වැදගත් ස්ථම්භයක් වන ඡන්ද බලය භාවිතයට ගැනීමෙන්

වැළකී සිටීමට ඉඩ තිබේ. ප්‍රජාතන්ත්‍රවාදි පද්ධතිය තුළ ජනතාවගේ සහභාගීත්වය උද්දීපනය කිරීමේ හදිසි අවශ්‍යතාවක් පැන නැගී ඇත.

### 15.2 නිර්දේශ

ඉහත සඳහන් කරුණු සියල්ල සලකා බැලීමෙන් පසු, කමිටුව ඉදිරිපත් කරන යෝජනා පහත දැක්වේ.

### 15.2.1 මැතිවරණ ක්‍රමය

i. එක් සාමාජිකයෙක් කිසි ම වෙනස් කිරීමකින් තොරව යෝජිත 20වැනි සංශෝධන පනතට කැමැත්ත පළ කළ අතර පහත දැක්වෙන මැතිවරණ පිළිබඳ නිර්දේශ කිසිවකට එකඟ නොවේ.[55]

ii. අනිත් සාමාජිකයන් පහත දැක්වෙන කරුණුවලට එකඟවූහ.

*අ. ජනාධිපතිවරණය*

- ජනාධිපති නාමික රාජ්‍ය නායකයා නම් ඔහු/ඇය, පාර්ලිමේන්තු මන්ත්‍රීන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, නගරාධිපතිවරුන්, උප නගරාධිපතිවරුන්, පළාත්පාලන ආයතනවල සභාපතිවරුන් හා උප සභාපතිවරුන්ගෙන් සමන්විත ඡන්දදායක ගණයකින් තෝරා පත් කර ගත යුතුය.
- ජනාධිපතිට සීමිත බලතල ලබා දෙන්නේ නම් ඔහු/ඇය මහජන ඡන්දයෙන් තෝරා පත් කර ගත යුතුය.

*ආ. පාර්ලිමේන්තු මැතිවරණය*

- මිශ්‍ර ක්‍රමයක් - කොට්ඨාසයකට මන්ත්‍රීවරු දෙදෙනෙක් පත් කරන කේවලක්‍රමයක සහ පළාත් මට්ටමේ සමානුපාතික ලැයිස්තුවක් සහිත ලැයිස්තු ක්‍රමය මිශ්‍රකරගත් ඡන්ද ක්‍රමයක්
- කේවල ක්‍රමයෙන් 60%ක් හා සමානුපාතික ක්‍රමයෙන් 40%ක් පත් කර ගැනීම
- කේවල ක්‍රමයට එකක් හා සමානුපාතික ක්‍රමයට එකක් යනුවෙන් ඡන්ද පත්‍රිකා දෙකක් නිකුත් කිරීම
- කේවල ක්‍රමය -පිරිමි හා ගැහැනු අපේක්ෂකයන් සඳහා වෙනම ඡන්ද පත්‍රිකා දෙකක් ලබාදීම

[55] කුෂාන් ද අල්විස්, ජ.නී

- සමානුපාතික ක්‍රමය - සෑම ඡන්ද පත්‍රිකාවක ම පිරිමි හා ගැහැනු අපේක්ෂකයන්ගේ ලැයිස්තුවල විකල්ප නම් ඇතුළත් කිරීම. ලැයිස්තුවල තරුණ අපේක්ෂකයන් සඳහා ද, යම් කිසි ප්‍රතිශතයක් අඩංගු විය යුතුය.
- කමිටුවේ සාමාජිකයන් බොහෝ දෙනෙකුගේ මතය වූයේ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් සංඛ්‍යාව 225 නො ඉක්මවිය යුතු බවයි. විශේෂයෙන්ම පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා මෙම වාර්තාවේ නිර්දේශ කර ඇති යෝජනා සමග එවැන්නක් අවශ්‍ය නොවේ.

### ඇ. පළාත් සභා මැතිවරණය

- මිශ්‍ර ක්‍රමයක් - කොට්ඨාසයකට මන්ත්‍රීවරු දෙදෙනෙක් පත් කරන කේවලක්‍රමයක සහ පළාත් මට්ටමේ සමානුපාතික ලැයිස්තුවක් සහිත ලැයිස්තු ක්‍රමය මිශ්‍රකරගත් ඡන්ද ක්‍රමයක්
- කේවල ක්‍රමයෙන් 60%ක් හා සමානුපාතික ක්‍රමයෙන් 40%ක් පත් කර ගැනීම
- කේවල ක්‍රමයට එකක් හා සමානුපාතික ක්‍රමයට එකක් යනුවෙන් ඡන්ද පත්‍රිකා දෙකක් ලබාදීම
- කේවල ක්‍රමය- පිරිමි හා ගැහැනු අපේක්ෂකයන් සඳහා වෙන ම ඡන්ද පත්‍රිකා දෙකක් ලබා දීම
- සමානුපාතික ක්‍රමය-සෑම ඡන්ද පත්‍රිකා වකම පිරිමි හා ගැහැනු අපේක්ෂකයන්ගේ ලැයිස්තුවල විකල්ප නම් ඇතුළත් කිරීම. ලැයිස්තුවල තරුණ අපේක්ෂකයන් සඳහා ද, යම් කිසි ප්‍රතිශතයක් අඩංගු විය යුතුය.

### ඈ. පළාත් පාලන ආයතන මැතිවරණ

- පළාත් සභා මැතිවරණයට සමාන වේ. නමුත් සමානුපාතික නියෝජනයේ පදනම වන්නේ පළාත් පාලන ආයතනයේ ප්‍රදේශයයි.

### ඉ. බහු මන්ත්‍රී කොට්ඨාස

- බහුත්වවාදී ලක්ෂණ ඇති කොට්ඨාස සඳහා (පාර්ලිමේන්තු හා පළාත් සභා මැතිවරණ) බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාස ක්‍රමයක් කමිටුව නිර්දේශ කරයි.

*ඊ. ස්වාධීන අපේක්ෂකයෝ*

- කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාස සඳහා ස්වාධීන කණ්ඩායම් සෑදීමෙන් තොරව ස්වාධීන අපේක්ෂකයන් ලෙස තරග කිරීමට පුද්ගලික පුරවැසියන්ට පහසුකම් සැලසිය යුතුයි.

*උ. ජාතික ලැයිස්තුව*

- සමහර කමිටු සාමාජිකයන්ගේ අදහස වූයේ මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් හා දෙවැනි මන්ත්‍රණ සභාවක් ස්ථාපිත කළහොත් ජාතික ලැයිස්තුවක් අවශ්‍ය නොවන බවයි.[56]
- අනිත් සාමාජිකයන්ගේ මතය වූයේ පහත දැක්වෙන කොන්දේසි යටතේ ජාතික ලැයිස්තුව දිගට ම පවත්වා ගත යුතු බවයි.[57]
  - ජාතික ලැයිස්තුවේ සංඛ්‍යාව අඩුකිරීම
  - ජාතික ලැයිස්තු සාමාජිකයන් එම ලැයිස්තුවෙන් පත් කළ යුතු අතර අනිත් ලැයිස්තුවල පුද්ගලයන් නම් නොකළ යුතුය. ජාතික ලැයිස්තුව ප්‍රත්‍යවර්තනය වන ආකාරයට එනම් එකක් හැර එකක් වශයෙන් පිළිවෙළින් පුරුෂයන් හා ස්ත්‍රීන් පත් කරන ආකාරයට සකස් කළ යුතුය.

### 15.2.2 මැතිවරණ ක්‍රියාවලිය

***i. මැතිවරණ වියදම් සීමා කිරීම***

අපේක්ෂකයන් විසින් හා ඔවුන් වෙනුවෙන් කරන මැතිවරණය හා සම්බන්ධ වියදම්වලට සීමාවක් පැනවිය යුතුය. මූල්‍ය පරිත්‍යාග කළ පුද්ගලයන් හා ප්‍රමාණ ද, හෙළි කළ යුතුය. අපේක්ෂකයන් මේ සම්බන්ධයෙන් වග කියන තත්ත්වයට පත් කළ හැකි, දැඩි නිශ්චිත ක්‍රමයක් නීති මගින් ඇති කළ යුතු ය.

**ii *වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම***

තරග කිරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයන් මැතිවරණයට පෙර වත්කම් හා බැරකම් ප්‍රකාශයක් කළ යුතු අතර තේරී පත් වුවහොත් ඉන්

[56] උපුල් අබේරත්න; හරිනි අමරසූරිය; කුෂාන් ද අල්විස් ජ.නී; එම්.කේ. නදීකා දමයන්ති; එස්.සී.සී. ඉලංකෝවන්; කුමුදු කුසුම් කුමාර; කාන්ති රණසිංහ; එන්.සෙල්වක්කුමාරන්; ලාල් විජේනායක; ඒ.එම්. නවරත්න බණ්ඩාර;
[57] සිරිමසිරි හපුආරච්චි; වින්ස්ටන් පතිරාජා; සුනිල් ජයරත්න

පසු සෑම වර්ෂයකට ම වරක් ධුර කාලය අවසන් වනතුරු එම ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුයි. එහි දක්වා ඇති විස්තර සත්‍ය නොවේ නම් මහජනයා අතරින් ඕනෑ ම කෙනෙකුට ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කළ හැකි වන ලෙස මෙය ප්‍රසිද්ධ කළ යුතුය.

iii *භාරකාර ආණ්ඩුව*

පාර්ලිමේන්තු හා පළාත් සභා මැතිවරණවලදී ඒවායේ අමාත්‍ය මණ්ඩලසාමාන්‍ය ආකාරයට ක්‍රියාත්මක නොවිය යුතුයි. මැතිවරණ කොමිසමේ පරීක්ෂාව යටතේ ක්‍රියාත්මක වන භාරකාර ආණ්ඩුවක් තිබිය යුතුය.

iv *ආචාර ධර්ම පද්ධතිය*

ඡන්දයෙන් තේරී පත් වන නියෝජිතයන් සඳහා ආචාර ධර්ම පද්ධතියක් තිබිය යුතුය. එය උල්ලංඝනය කරන පුද්ගලයන් උසාවියට ගෙන යෑමට හෝ ආපසු කැඳවීමට හෝ හැකි විය යුතුයි.

v *පැනි මාරු කිරීම*

- හෘද සාක්ෂියට අනුව ඡන්දය දීමට ඉඩ දිය යුතුය.
- කුමන තත්වයක් යටතේවත් පැනි මාරු කිරීමට ඉඩ දිය යුතු නොවේ.[58]
- පහත සඳහන් කරුණුවලට යටත්ව පැනි මාරු කිරීමට ඉඩ දිය යුතුය.
    - පැනි මාරු කරන අයට කිසිම ප්‍රතිලාභයක් හෝ වරප්‍රසාදයක් නො ලැබිය යුතුයි.
    - ඔවුන්ට යම් කිසි ප්‍රතිලාභයක් ලැබුණ හොත් ඔවුන් අතුරු මැතිවරණයකදී ආපසු ජනතාව ඉදිරියට යා යුතුයි.
- රජය අස්ථාවර වන්නේ නැත්තම් මන්ත්‍රීවරුන්ට හෘද සාක්ෂිය අනුව ඡන්දය දීමට ඉඩ දිය හැකියි. ඒ සාධනීය විශ්වාස භංග යන්ත්‍රණයක් හඳුන්වාදීමේ අවශ්‍යතාව සහතික කිරීමටයි.[59]

---

[58] කුෂාන් ද අල්විස්, ජ.නී; සිරිමසිරි හපුආරච්චි
[59] උපුල් අබේරත්න;

vi ***පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ආපසු කැඳවීම***

ආපසු කැඳවීමේ ක්‍රමයක් කමිටුව අනුමත කරන අතර එය නිර්දේශ කරයි. එංගලන්තයේ හා වේල්සයේ 2015 ආපසු කැඳවීමේ පනත මේ සඳහා මග පෙන්වීමක් ලෙස ගත හැක.

vii ***මැතිවරණ දින දර්ශනය***

ජනාධිපතිවරණ. පාර්ලිමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා මැතිවරණ පැවැත්වෙන දින නිශ්චිතව දක්වන මැතිවරණ දින දර්ශනයක් හඳුන්වා දිය යුතුය.[60] අතුරු මැතිවරණ පැවැත්වීම හෝ විශ්වාස-භංග යෝජනා නිසා ඇතිවන තත්ත්ව හෝ මැතිවරණ දින දර්ශනය සකස් කිරීමේදී සැලකිල්ලට ගත යුතු වේ.

viii ***ස්ත්‍රී හා තරුණ නියෝජනය***

- බහුතරවාදී ක්‍රමයක් යටතේ සෑම පක්ෂයක්ම කේවල ආසන සඳහා තරග කිරීමට නාමයෝජනා කරන අපේක්ෂකයන්ගෙන් අඩු ම වශයෙන් තුනෙන් එකක් ස්ත්‍රීන් විය යුතුය.[61]
- සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පුරුෂ හා කාන්තා අපේක්ෂකයන් අතර ප්‍රත්‍යවර්තනය වන ආවෘත ලැයිස්තුවක් තිබිය යුතුය.
- සෑම පක්ෂයකින් ම තරුණ සහභාගිත්වයක් සහතික කිරීම සඳහා මෙයට සමාන ක්‍රමයක් හඳුන්වා දිය යුතුය.

ix ***ඡන්දය ප්‍රකාශ කිරීම***

- රජයේ ලියාපදිංචි වී ඇති සංක්‍රමණික සේවකයන්ට ඡන්දය ප්‍රකාශ කළ හැකි උචිත යන්ත්‍රණයක් හඳුන්වා දිය යුතුය.
- උචිත ආරක්ෂණ විධිවිධාන සහිත ව ඉලෙක්ට්‍රොනික ඡන්ද ක්‍රමයක් හඳුන්වා දීමට ක්‍රියා කළ යුතු වේ.

---

[60] කමිටු සාමාජිකයෙක් වූ උපුල් අබේරත්න මැතිවරණ දින දර්ශනය පිළිබඳ අදහසට සහාය දැක් වූයේ නැත.
[61] හරිනි අමරසූරිය; එම්.කේ. නදීකා දමයන්ති; කුමුදු කුසුම් කුමාර; කාන්ති රණසිංහ; එන් සෙල්වක්කුමාරන් යන අය කියා සිටියේ සෑම පක්ෂයකින්ම කේවල ක්‍රමයට තරග කරන අපේක්ෂකයන් ගෙන් අඩක් කාන්තාවන් විය යුතු බවයි.

- කම්හල් සේවකයන්, නිදහස් වෙළඳ කලාප සේවකයන්, ආබාධ සහිත පුද්ගලයන් හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වැනි අයට ඡන්දය ප්‍රකාශ කිරීම පහසු කිරීම සඳහා (ප්‍රවාහන පහසුකම් ඇතුළුව) විශේෂ ඡන්ද පොළවල් හෝ වෙනත් විධිවිධාන යෙදිය යුතුයි.
- ආබාධිත පුද්ගලයන් හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ඇතුළු සිය ලුම පුරවැසියන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියා පිළිවෙල, පහසුකම් හා ද්‍රව්‍ය පහසුවෙන් ලබා ගත හැකි විය යුතුය.

### x *මැතිවරණ ප්‍රචාරක වැඩ*

මැතිවරණ කාලය තුළ ප්‍රචාරය පිළිබඳ ව ඇති රෙගුලාසි තදින් ම බලාත්මක කළ යුතුයි. විශේෂයෙන් ම සීමිත සම්පත් ඇති අපේක්ෂකයන්ට රජය මාධ්‍යවල සමාන කාලයක් ලබා දිය යුතු වේ. පරිසර හිතකාමී හා පොදු ජනයාගේ එදිනෙදා ජීවිතයට අනවශ්‍ය ලෙස බලපෑමක් නොකරන මැතිවරණ ප්‍රචාරක කටයුතු දිරි ගැන්විය යුතුය.

### xi *නියෝජනයක් නැති/ ඌන නියෝජනයක් සහිත කණ්ඩායම්*

කිසි ම නියෝජනයක් නැති හා ඌන නියෝජනයක් සහිත කණ්ඩායම්වල සහභාගීත්වය සහතික කිරීම සඳහා (නම් කළ මන්ත්‍රීන්, බහු -මන්ත්‍රී ආසන, වෙන්කළ ආසන) යන්ත්‍රණයක් හඳුන්වා දිය යුතු වේ. තෙළිඟු හා මලයාලම් කථා කරන ජනයා, මැලේ හා බර්ගර් ජනයා හා අප්‍රිකානු සම්භවයක් ඇති ජනයා ආදීන් මෙවැනි කණ්ඩායම් වේ. මැතිවරණ සම්බන්ධ ලිපිලේඛන බ්‍රේල් භාෂාවෙන් ලබා දීම ඇතුළු ආබාධ සහිත පුද්ගලයන්ට මැතිවරණවලදී තරග කළ හැකි වාතාවරණයක් ඇති කිරීම අවශ්‍ය වේ.

### xii *අපේක්ෂකයන්ගේ දිවුරුම් ප්‍රකාශ*

පහත දැක්වෙන කරුණු ඇතුළත් දිවුරුම් ප්‍රකාශයක් සෑම අපේක්ෂකයෙක් ම නාම යෝජනා පත්‍රයට ඇමිණීම සහතික කිරීම සඳහා මැතිවරණ නීති සංශෝධනය කළ යුතු යයි සමහර සාමාජිකයෝ යෝජනා කළහ.[62]

- අපේක්ෂකයාගේ අධ්‍යාපන සුදුසුකම් හා එම සුදුසුකම් ලබා ගත් දින
- අපේක්ෂකයා උසාවියකින් වරදකරුවෙක් ලෙස ප්‍රකාශ කර තිබේ ද? යන්න හා එසේනම් චෝදනාවේ ස්වභාවය හා උසාවියේ තීන්දුව.

[62] සමහර සාමාජිකයන් මෙම නිර්දේශය සමග එකඟ වූයේ නැත

# 16 පරිච්ඡේදය

# රාජ්‍ය සේවය, රාජ්‍ය මූල්‍යය හා විගණනය

## 16.1 ඉදිරිපත් කළ අදහස්

රටේ සියලු ම අංශ අතර එකඟතාවක් දැකිය හැකිවූ මෙන් ම සෑමවිට ම ඉදිරිපත් වූ කරුණක් වූයේ රාජ්‍ය අංශයේ තත්ත්වය සම්බන්ධයෙන් මහජනයා අතර තිබූ දැඩි කලකිරීමයි. පහත දැක්වෙන පරිදි රජයේ සේවා පිළිබඳ ව මහජනයාට තිබුණේ ඉතා විවේචනාත්මක අදහසකි. මෙම තත්ත්වයට සෘජුව ම දෝෂාරෝපණය එල්ල වූයේ දේශපාලනඥයින්ටයි. මෙයට හේතුව තමන්ගේ ආධාරකරුවන්ට රැකියා ලබා දීමට මෙන්ම තම නෑ හිතමිතුරන්ට විවිධ වරප්‍රසාද හා පිටවාසි ලබා දීමට දේශපාලනඥයින් රාජ්‍ය අංශය තමන්ගේ නිත්දගමක් ලෙස භාවිතා කිරීමයි.

බොහෝ පැමිණිලි හා දුක්ගැනවිලි ඉදිරිපත් කරන ලද අතර පහත දැක්වෙන්නේ ඒවායේ සාරාංශයකි.

- රාජ්‍ය අංශය දේශපාලනීකරණය වීම හා රාජ්‍ය අංශයේ ස්වාධීනත්වය නැතිවීම
- බඳවා ගැනීම්, මාරුකිරීම් හා උසස් කිරීම් පිළිබඳ දුක්ගැනවිලි හා එම දුක්ගැනවිලිවලට ප්‍රතිචාර දැක්වීමට එලදායී යන්ත්‍රණයක් නොතිබීම
- සේවාවල අඩු ගුණාත්මක බව. අකාර්යක්ෂමතාව හා නිලධාරීන්ගේ උනන්දු නැතිකම
- මහජනයා සමග කටයුතු කිරීමේදී රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ දකින්නට ලැබෙන පක්ෂග්‍රාහී, අගතිගාමි හා අහංකාර ආකල්ප
- මහජනයාට අවශ්‍ය සේවා ලබා ගැනීම ඉතා ව්‍යාකූලත්වයට පත් වී ඇත්තේ සේවා ද්වි-කරණය, අවුල් ක්‍රම හා බහුවිධ ආයතන ආදිය හේතුවෙනි.
- සම්පත් අපතේ යැවීම හා දූෂණය
- රාජ්‍ය අංශයේ දක්නට ඇති අනුග්‍රාහක ක්‍රමය නිසා අනුග්‍රාහකයෙක් නොමැතිව කිසි ම සේවාවක් ලබා ගැනීම ඉතා දුෂ්කර වීම
- භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොකිරීම නිසා මහජනයාට ඔවුන් කැමති භාෂාවෙන් අවශ්‍ය සේවා ලබාගත නොහැකි වීම හෝ ඉතා දුෂ්කරවීම

- බඳවා ගැනීමේදී මෙන් ම සේවා සැපයීමේදී රාජ්‍ය සේවය විසින් සමහර සමාජ කණ්ඩායම් කොන් කිරීම හා බැහැර කිරීම

රාජ්‍ය අංශයේ ඇති දේශපාලන පළි ගැනීම් හා විෂමතාවන් ගැන රාජ්‍ය අංශයේ නිලධාරීන් ද, බොහෝ දුක්ගැනවිලි ඉදිරිපත් කළෝ ය. පළිගැනීම්වලට විසඳුමක් සොයා තැනින් තැනට යෑමට සිදු වූ අවස්ථා ද, සමහරු පෙන්වා දුන්නෝ ය. අසාධාරණ බඳවා ගැනීමේ ප්‍රතිපත්ති හෝ දැනට ඇති බඳවා ගැනීමේ ප්‍රතිපත්ති නොකතා හැරීම හෝ බහුල ලෙස ව්‍යාප්ත වී තිබේ. ඒ ආකාරයට ම උසස් කිරීමේ පටිපාටි ද, අවශ්‍ය ආකාරයට හසුරුවන බව පෙනේ.

පැහැදිලි ව ම රාජ්‍ය අංශය ප්‍රතිශෝධනය කිරීමේ අවශ්‍යතාවක් ඇති බව පෙනේ. ප්‍රතිශෝධන උත්සාහයන්ගේ අරමුණ විය යුත්තේ රාජ්‍ය අංශය අඩු කිරීම පමණක් නොව එහි ස්වාධීනත්වය, ගුණාත්මකභාවය හා සේවා සැපයීම ශක්තිමත් කළ හැකි පද්ධති ස්ථාපිත කිරීමයි.

කලින් රජයේ දෙපාර්තමේන්තුවලින් කළ කාර්යයන් හා සැපයූ සේවාවන් දැන් සිදු කෙරෙන්නේ ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ වෙනත් ආයතන මගිනි. මෙම ආයතන රජයේ දෙපාර්තමේන්තු ගණයට අයත් නොවේ. මේ නිසා බඳවා ගැනීම,උසස් කිරීම,වැටුප්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම ආදිය සම්බන්ධයෙන් ව්‍යවස්ථා ප්‍රතිපාදනවලින් සහතික කර ඇති සමානත්වය,කාර්යක්ෂමතාව, වෙනස් ලෙස නො සැලකීම හා දේශපාලනීයකරණය නොකිරීම ආදිය ඔවුන්ට අදාළ නොවේ. ව්‍යවස්ථාව වෙනත් දේ අතර මෙවැනි කරුණු ගැන ක්‍රියා කිරීමට රාජ්‍ය සේවා කොමිසමක් පිහිටුවා තිබේ. අමාත්‍යංශ ලේකම්වරුන් පත් කිරීම හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම පිළිබඳව කමිටුව විශේෂ ප්‍රතිපාදන නිර්දේශ කර තිබේ.

## 16.2 **නිර්දේශ**

### 16.2.1 දේශපාලනය හා පරිපාලනය අතර අවකාශය/ රාජ්‍ය සේවයේ කළමනාකරණ ශක්‍යතාව

මෙම නිර්දේශ සම්බන්ධයෙන් කමිටුවේ පොදු එකඟත්වයක් නොවීය. එහෙයින් එය මෙසේ ඉදිරිපත් කෙරේ.

කමිටුවේ සමහර සාමාජිකයන් විසින් පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කෙරේ.[63]

අ) වත්මන් ව්‍යවස්ථාවේ 54 (1) ව්‍යවස්ථාව, පහත දැක්වෙන ඡේදයෙන් ප්‍රතිස්ථාපනය කිරීම;

" රාජ්‍ය නිලධාරීන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, අස් කිරීම, විනය පාලනය හා කළමනාකරණ ශක්‍යතා වැඩි දියුණු කිරීම රාජ්‍ය සේවා කොමිසමට පැවරිය යුතු අතර එය ව්‍යවස්ථාදායක මණ්ඩලයේ නිර්දේශ මත ජනාධිපති විසින් පත් කරන සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විත විය යුතුය. මෙයින් සාමාජිකයන් තුන්දෙනෙකුට නො අඩු සංඛ්‍යාවක් රාජ්‍ය නිලධාරියෙක් ලෙස අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති පුද්ගලයන් විය යුතු අතර රාජ්‍ය සේවා කොමිසමේ අනිත් සාමාජිකයන් පරිපාලන නීති, රාජ්‍ය මුදල් හා මානව සම්පත්, ව්‍යාපාර හා රාජ්‍ය කළමනාකරණය ආදිය පිළිබඳ දැනුම හා අත්දැකීම් ඇති පුද්ගලයන් විය යුතුය."

ආ) වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 (2) සිට 54 (11)ව්‍යවස්ථා ඒ ආකාරයට ම තබා ගැනීම

ඇ) රාජ්‍ය සේවා කොමිසමට පාර්ලිමේන්තුවෙන් සෘජුව ම අරමුදල් හා කාර්ය මණ්ඩල ලබා ගත හැකි වන සේ පාර්ලිමේන්තුව අවශ්‍ය නෛතික හැකියාවන් ලබා දිය යුතුය.

ඈ) රාජ්‍ය සේවා කොමිසමට පවරා ඇති "රාජ්‍ය සේවයේ කළමනාකරණ ශක්‍යතාව වැඩිදියුණු කිරීම" ආරම්භ කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිසම යටතේ කළමනාකරණ කාර්යාලයක් ස්ථාපිත කරනු ඇත. මෙම කළමනාකරණ කාර්යාලයේ වගකීම් වන්නේ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් රාජ්‍ය කළමනාකරණ භාවිත අනුව රාජ්‍ය සේවයේ කාර්ය සාධනය දියුණු කිරීමට යහපත් කළමනාකරණ භාවිත හඳුන්වා දීමත්, ඒ හා සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීමත්, මෙන් ම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතීන් ආරක්ෂා කිරීමත් වේ.

[63] උපුල් අබේරත්න; හරිනි අමරසූරිය: ඒ.එම්. නවරත්න බණ්ඩාර; එම්.කේ. නදීකා දමයන්ති; එස්.සී.සී. ඉළංකෝවන්; එම්.වයි.එම්. ෆායිස්; සිරිමසිරි හපුආරච්චි; සුනිල් ජයරත්න; කුමුදු කුසුම් කුමාර; වින්ස්ටන් පතිරාජ; තේමිය එල්.බී. හුරුල්ලේ; කාන්ති රණසිංහ; එන්. සෙල්වක්කුමාරන්; එස්. තවරාජා; එස්.විජේසන්දිරන්; ලාල් විජේනායක

(ඉ) ජනාධිපති විසින් යෝජනා කරන පුද්ගලයන් ජනාධිපති, අමාත්‍ය මණ්ඩලය හා අමාත්‍යංශ ලේකම්වරුන් ලෙස පත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කළ යුතු වේ. ජනාධිපති විසින් යෝජනා කරන පුද්ගලයන් පත් කිරීමට පෙර පාර්ලිමේන්තුවේ උසස් තනතුරු කමිටුවේදී මාධ්‍ය හා සිවිල් සමාජයේ සහභාගිත්වයෙන් මහජන පරීක්ෂා ක්‍රියාවලියක් සිදුවිය යුතු ය.

(ඊ) පරිපාලන පද්ධතිය තුළ වෘත්තීය ප්‍රමිති පවත්වා ගනිමින් ඇමතිවරු හා ලේකම්වරුන් අතර යහපත් ක්‍රියාකාරී සබඳතාවක් පවත්වා ගැනීමට බාධකයක් මෙන් ම රාජ්‍ය සේවා කොමිසමට පවරා ඇති බලය නිෂේධනය කරන වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52(2) ව්‍යවස්ථාව ඉවත් කිරීම (එක් සාමාජිකයෙක් මෙම නිර්දේශයට එකඟ වූයේ නැත)[64]

උ) රජයේ දෙපාර්තමේන්තුවල පරිපාලන ඒකකවල භූගෝලීය සීමා, නීත්‍යනුකූල ව ස්ථාපිත කර ඇති පහළ ම මට්ටමේ පරිපාලන ඒකකය වන ග්‍රාම නිලධාරී කොට්ඨාසය මත පදනම් විය යුතුය. ඔවුන්ගේ සේවා ප්‍රදේශ නිරූපණය කිරීමේ දී හෝ අර්ථ දැක්වීමේදී කිසි ම රාජ්‍ය ආයතනයකට ග්‍රාම නිලධාරී කොට්ඨාස ඉක්මවා යෑමට බලයක් නැත. ප්‍රාදේශීය සභා සීමාවන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාවන් එක ම විය යුතුය.

එක් සාමාජිකයෙක් විසින් පහත දැක්වෙන නිර්දේශය ඉදිරිපත් කරන ලදී.[65]

වර්තමාන ව්‍යවස්ථාවේ 9 හා 17 වැනි පරිච්ඡේද ඒ ආකාරයට ම තබා ගත යුතුය. මෙම නිර්දේශ ෆෙඩරල් යන පදය යොදා නො ගෙන ෆෙඩරල් රාජ්‍යයක් කරා යන පියවරක් මෙන් ම රාජ්‍ය සේවා හා රාජ්‍ය අරමුදල් පිළිබඳ බලය පවරන ලෙස කිසිදා ඉල්ලීමක් නොකළ උතුරු පළාතෙන් පිට ජීවත්වන ජනයා මත ෆෙඩරල් සංකල්පය බලෙන් පැටවීමක් වෙයි.

### 16.2.2 රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය

අ. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම්, උසස්කිරීම් හා අනිකුත් මානව සම්පත් කටයුතුවලදී මෙන් ම පරිපාලන තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී දැඩි ලෙස ක්‍රියාත්මක කරන කුසලතා ක්‍රමයක් යොදා ගත යුතුයි. මෙය, සීමිත කාල

[64] එස්.තවරාජ
[65] කුෂාන් ද අල්විස්, ජ.නී.

පරිච්ඡේදයකට කාන්තාවන් , සුළුතර ප්‍රජාවන්, යුද්ධයේ බලපෑමට ලක්වූ ප්‍රජාවන් ආදි හඳුනාගත් වරප්‍රසාද නොලත් කණ්ඩායම් සවිබල ගැන්වීමට බඳවා ගැනීම් පටිපාටිවල ප්‍රමාණවත් ඉඩක් ලබා දීමේ ප්‍රතිජනන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, පරිපාලන බලධාරීන්ට බාධකයක් නොවේ.

ආ. කුසලතා පදනමක් මත බඳවා ගැනීමට මැදිහත් වීම හෝ බාධා කිරීම දඬුවම් දිය හැකි වරදක් බවට පත් කරන හා පුරවැසියෙකුට එවැනි ක්‍රියාවක් උසාවියේදී අභියෝගයට ලක් කළ හැකි නීති පාර්ලිමේන්තුව සම්මත කළ යුතුයි.

ඇ. පාර්ලිමේන්තුව එම නීතිය යටතේ ම රාජ්‍ය නිලධාරීන් ජාතික හෝ ප්‍රාදේශීය දේශපාලනයට සහභාගිවීම තහනම් කර එවැනි ක්‍රියා දඬුවම් දිය හැකි වරදක් කළ යුතුය.

ඈ. නීතියට අනුව තනතුරේ කටයුතු කිරීම නිසා රාජ්‍ය නිලධාරියෙකුගෙන් පළිගැනීම හෝ වෙනස් ලෙස සැලකීම හෝ අස් කිරීම, තනතුරෙන් ඉවත් කිරීම, තත්ත්වය පහත දැමීම හෝ නෛතික ක්‍රියාපිළිවෙලකින් තොරව විනය ක්‍රියාමාර්ග ගැනීම හෝ වළක්වන ප්‍රතිපාදන ව්‍යවස්ථාවේ අඩංගු විය යුතුය.

ඉ. ඇමතිවරුන්ට ඔවුන් තෝරාගත් ප්‍රතිපත්ති උපදේශකයන්ට දේශපාලන පත්වීම් දීමට අවශ්‍ය නම් මහජන පරීක්ෂා ක්‍රමයක් සහිතව උසස් තනතුරු කමිටුවෙන් එම පත්වීම් අනුමත කළ යුතු වේ.

ඊ. රජයේ සේවකයන්ගේ විශ්‍රාම අයිතිවාසිකම් ව්‍යවස්ථාවේ ඇතුළත් කිරීම (1972 ව්‍යවස්ථාවේ 109 වැනි වගන්තියට සමාන)

### 16.2.3 අත්තනෝමතික පරිපාලන බලය පාලනය කිරීම/ රාජ්‍ය සේවයේ, අර්ධ රාජ්‍ය ආයතනවල සාමාජිකයන්ට විරුද්ධ පැමිණිලි

අ. 59 වැනි ඡේදයට අනුව අධිකරණ සේවා කොමිසම විසින් පත් කරන ලද පරිපාලන අභියාචනා උසාවිය දිගට ම පවත්වා ගෙන යෑම. කෙසේ වෙතත් එයට පවරා ඇති බලය පහත දැක්වෙන ආකාරයට පුළුල් කිරීමට යෝජනා කෙරේ.

i) වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඇති ආකාරයට රාජ්‍ය සේවා කොමිසමේ තීරණවලට විරුද්ධව රාජ්‍ය නිලධාරීන්ගෙන් ලැබෙන අභියාචනා බාර ගැනීම

ii) පරිපාලන චක්‍රෙල්බන හා රෙගුලාසි අමාත්‍ය මණ්ඩලයේ හෝ ඇමතිවරුන්ගේ තීරණ හා අදාළ පාර්ලිමේන්තු නීතියට අනුව නීත්‍යනුකූල දැයි සමාලෝචනය කිරීම

සහ

iii) පරිපාලකයන්ගේ අත්තනෝමතික ක්‍රියාවන්ට විරුද්ධව යුක්තිය ඉටු කරවා ගැනීමට මහජනයාට අවස්ථාව දීම.

ආ. වත්මන් ව්‍යවස්ථාවේ 55(1) ව්‍යවස්ථාව පහත දැක්වෙන ආකාරයට ප්‍රතිවින්‍යාස කරන්න.

" පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය පාලනය හා සේවයෙන් පහ කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ සියලු ප්‍රතිපත්තිමය කරුණු තීරණය කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිසම විසිනි"

ඇ. වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාව ඉවත් කළ යුතුය. 55(3) සිට 55(5) දක්වා ඡේද තබා ගත යුතුය.

ඈ. පාර්ලිමේන්තු පෙත්සම් කමිටුව, රාජ්‍ය ගිණුම් කාරක සභාව (PAC), රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කමිටුව (COPE) ආදියෙන් රාජ්‍ය නිලධාරීන්ට දෙන ලද නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් නිරීක්ෂණ මෙහෙයවීම හා ඒවායේ ප්‍රගතිය ගැන පාර්ලිමේන්තුවට වාර්තා කිරීමේ කාර්යය රාජ්‍ය සේවා කොමිසමට පැවරිය යුතුය.

ඉ. අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයන්ට රාජ්‍ය නිලධාරීන්ට ලැබෙන මාත්‍ය නිවාඩු, බෝනස් වැනි සමාන පහසුකම් ලැබෙන සේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලට පොදු මානව සම්පත් ප්‍රතිපත්තියක් සකස් කිරීම

ඊ. සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, ව්‍යවස්ථාපිත අධිකාරී වැනි අර්ධ රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත්වීම් සම්බන්ධයෙන් ද, ඉහත 16.2.2 (අ) කොටසේ යෝජනා කර ඇති ආකාරයේ ක්‍රමයක් තිබීම අවශ්‍ය

යයි කමිටුවේ අදහස වේ. මේ මගින් ඔවුන් ද, පත් කරන්නේ කුසලතා මත සමානත්වය, කාර්යක්ෂමතාව, වෙනස් ලෙස නොසැලකීම, නිර්-දේශපාලනීකරණය ආදිය සැලකිල්ලට ගන්නා සුපරීක්ෂාකාරී ක්‍රියා මාර්ගයකින් බව සහතික කළ හැකි වේ. මෙම කටයුතු සඳහා අර්ධ රාජ්‍ය ආයතන සඳහා රාජ්‍ය සේවා කොමිසමක් ස්වාධීන ආයතනයක් ලෙස පිහිටුවීම කමිටුව නිර්දේශ කරයි. මෙය ව්‍යවස්ථාවේ සඳහන් විය යුතු අතර එයට රාජ්‍ය සේවා කොමිසමට සමාන ප්‍රතිපාදන තිබිය හැකියි.

### 16.2.4 රාජ්‍ය සේවා ලබා ගැනීම හා සම්බන්ධ විශේෂ ගැටලු

පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නීති සම්මත කිරීම අවශ්‍ය බව සඳහන් කරන ප්‍රතිපාදන ව්‍යවස්ථාවේ අඩංගු විය යුතුය.

අ. රජයේ පොදු සේවා ලබා ගැනීම ගැන සීමා පනවමින් වතු ජනගහණය පිළිබඳ සියලු කටයුතු ගැන තීරණය කිරීම වතු කළමනාකරුවන්ට වතු සමාගම් විසින් බලය පවරා තිබීමත්, වතු ජනාවාස සම්පූර්ණ වශයෙන් රාජ්‍ය පරිපාලනය යටතට ගෙන නොතිබීමත්, නිසා වතු ජනතාවට රාජ්‍ය සේවාවන් ලබා ගැනීමට ඇති වර්තමාන බාධක ඉවත් කිරීම.

ආ. වතු මානව ජනාවාස ද, රාජ්‍ය ආයතනවලින් ඍජු ව ම සේවා සපයන ග්‍රාමීය පද්ධතියේ කොටසක් ලෙස ප්‍රකාශයට පත් කිරීම

ඇ. විශේෂ බඳවා ගැනීමේ පරිපාටි තුළින් යුද්ධයේ බලපෑමට ලක් වූ ජනතාව ඇතුලු ආන්තික ප්‍රජාවන් සහ කණ්ඩායම්වලින් රාජ්‍ය සේවයට ඇතුළත් කර ගැනීමට සහතදායී ක්‍රියා මාර්ගයක් හඳුන්වා දීම

ඈ. දෙමළ ප්‍රජාව සමග එදිනෙදා කටයුතු කළ හැකි, දෙමළ දැනුමක් ඇති පුද්ගලයන්රජයේ කාර්යාලවලට පත් කිරීම. සිංහල කථා කරන ප්‍රජාව සුළුතරය වන ප්‍රදේශවල ද, මෙයට සමාන ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම.

### 16.2.5 පළාත් රාජ්‍ය සේවාව හා රාජ්‍ය මූල්‍යය

අ. පළාත් රාජ්‍ය සේවා කොමිසමක්, පළාත් උසස් තනතුරු කමිටුව විසින් නිර්දේශ කළ යුතු අතර ආණ්ඩුකාරයා විසින් ඔවුන් පත් කළ යුතුය. පළාත් රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයන්, පළාත් රාජ්‍ය සේවයේ විනය හා මානව සම්පත් ගැටලු ගැන කටයුතු කළ හැකි අත්දැකීම් හා දැනුම සහිත අවංක

පුද්ගලයන් විය යුතුය. පළාත් රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයන්ගේ නිලකාලය හා තනතුරෙන් ඉවත්වීම ආදිය ගැන රෙගුලාසි පිළියෙල කිරීමේදී වර්තමාන ව්‍යවස්ථාවේ 54 (4) ව්‍ය169වස්ථාව අනුගමනය කළ යුතුයි.

ආ. පළාත් රාජ්‍ය සේවයේ පත් කිරීම,. උසස්කිරීම්, විනය පාලනය හා කළමනාකාර කාර්ය සාධනය වැඩි දියුණු කිරීම පළාත් රාජ්‍ය සේවා කොමිසමට පැවරිය යුතුය. මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයේ පොදු වෘත්තීය ප්‍රමිති අනුගමනය කරන බවට සහතික වීම සඳහා සෑම පළාත් රාජ්‍ය සේවා කොමිසමක්ම රාජ්‍ය සේවා කොමිසම හා අනිත් පළාත් රාජ්‍ය සේවා කොමිසමක් සමග සම්බන්ධීකරණයෙන් ක්‍රියා කළ යුතු වේ.

ඇ. ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනවලට අනුකූල ව නීති කෙටුම්පත් කිරීම සම්බන්ධයෙන් පළාත් සභාවලට උපදෙස් දීමට ස්වාධීන ඇඩ්වකේට් ජනරාල්වරයෙක් හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ ඒකකයක් හෝ තිබිය යුතුය.

ඈ. පළාත් රාජ්‍ය සේවා කොමිසමේ තීරණවලට විරුද්ධව පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයන්ට පරිපාලන අභියාචන උසාවියට අභියාචනා ඉදිරිපත් කළ හැකිවේ. පළාත් රාජ්‍ය සේවා කොමිසමේ තීරණවලින් ඔවුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීම් ගැන මහජනයාට ද, සහන ඉල්ලා පරිපාලන අභියාචන උසාවියට කරුණු ඉදිරිපත් කළ හැකි වේ. පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයන් නිකුත් කරන පරිපාලන චක්‍රලේඛ, පළාත් සභාව සම්මත නීතිවලට අනුකූල බව සහතික කිරීමට ඒවා පළාත් ඇඩ්වකේට් ජනරාල් විසින් සියුම් ලෙස පරීක්ෂාවට භාජනය කළ යුතුය.

ඉ. පළාත් පරිපාලනය හසුරුවීම සඳහා විවෘත දැන්වීම් හා කුසලතා පදනම් ව තෝරාගත් පළාත් කළමනාකාර සේවයක් පත් කළ යුතුය. මෙම පළාත් කළමනාකාර සේවයේ සාමාජිකයන් පළාත් අතර මාරු කිරීමට හැකි වේ. පළත් කළමනාකරණ සේවයේ අවශ්‍යතා නියම කරන සේවා අත්පොත පිළියෙල කළ යුත්තේ රාජ්‍ය සේවා කොමිසමේ හා පළාත් සේවා කොමිෂන්වල නියෝජිතයන්ගෙන් සමන්විත ඒකාබද්ධ කමිටුවක් මගිනි. දීප ව්‍යාප්ත සේවාවන්හි සාමාජිකයන්, පළාත් කළමනාකරණ සේවයට ද්විතීනය කළ හැකියි.

### 16.2.6 රාජ්‍ය තාන්ත්‍රික සේවාව

අ. රාජ්‍ය තාන්ත්‍රික තනතුරුවලට අනුග්‍රාහක පදනමක් යටතේ පුද්ගලයන් පත්කිරීම නතර කිරීම

ආ. විදේශ සේවයේ බඳවා ගැනීමේ තීර්ණායක තීරණය කිරීමටත්, රාජ්‍ය තාන්ත්‍රික තනතුරු සඳහා වෘත්තියෙන් රාජ්‍ය තාන්ත්‍රිකයන් නොවන පුද්ගලයන්ගේ නාම යෝජනා ඇගයීමත් සඳහා රාජ්‍ය තාන්ත්‍රික සේවා කොමිසමක් (DSC) ස්ථාපිත කළ යුතුය. මෙම (DSC) කොමිසම විසින් තීරණය කළ යුතු කරුණු අතර තානාපති සේවයේ සිටිය යුතු වෘත්තිය හා වෘත්තීය නොවන නිලධාරීන්ගේ අනුපාතය, වෘත්තීය නොවන රාජ්‍ය තාන්ත්‍රිකයන් පත් කළ හැකි තානාපති තනතුරු හඳුනා ගැනීම හා එසේ පත් කරන පුද්ගලයන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් ආදිය වේ.

### 16.2.7 රාජ්‍ය මූල්‍යය හා විගණනය

අ. රාජ්‍ය මුදල් පිළිබඳව වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති 148 හා 151 ජේද ඒ ආකාරයට ම රඳවා ගැනීම.

ආ. ව්‍යවස්ථාදායක මණ්ඩලයේ නිර්දේශ මත ජනාධිපති විසින් මුදල් කොමිසම පත් කළ යුතුය. එය භාණ්ඩාගාරය තුළ නොතිබිය යුතුය. සම්පූර්ණ රාජ්‍ය ආදායමෙන් වෙන් කළ යුතු ප්‍රතිශතය හා පාර්ලිමේන්තුවෙන් ලබා දුන් අරමුදල් පළාත් සභා අතර බෙදා දීම පිළිබඳ නිර්ණායක මුදල් කොමිසම විසින් පිළියෙල කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

ඇ. පළාත් සභා සහ පළාත්පාලන ආයතනවලට අවම වෙන් කිරීම බදුවලින් හා ණයවලින් ජනනය වන රාජ්‍ය ආදායමෙන් 25%ක් විය යුතු අතර මුදල් කොමිසම පළාත් සභා හා පළාත්පාලන ආයතන අතර එය බෙදා දිය යුතුය (යෝජිත අනුපාතය වන්නේ පළාත් සභා සඳහා 18%ක් හා පළාත්පාලන ආයතන සඳහා 7%ක්ය). එක් සාමාජිකයෙක් යෝජනා කළේ බලය පැවරීම අර්ථාන්විත වීම සඳහා පළාත් සභාවලට අවම වෙන් කිරීම රාජ්‍ය ආදායමෙන් 40%ක් විය යුතු බවය. (පළාත් සභාවලට 30% හා පළාත්පාලන ආයතනවලට 10%ක්).[66]

---

[66] එස්.තවරාජා

ඈ. ආණ්ඩුකාරයාගේ හා පළාතේ ප්‍රධාන ලේකම්ගේ මැදිහත් වීමෙන් නිදහස් පළාත් සභාව විසින් පත් කළ අභ්‍යන්තර විගණන අංශයක් පළාත් සභාවේ තිබිය යුතුය.

ඉ. දුර්වල සෞඛ්‍ය තත්ත්වය හෝ කායික හෝ මානසික දුබලතාවක් නිසා විගණකාධිපති ඉවත් කිරීමට ජනාධිපතිට බලය ලබා දෙන 153 (ඈ) ව්‍යවස්ථාව ඉවත් කළ යුතුය.

ඊ. ස්වාධීන විගණන කොමිසමක් නිර්මාණය කර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපති විසින් පත් කළ යුතුය.

උ. රජයේ අරමුදල් සාවද්‍ය පරිහරණයට සම්බන්ධ නිලධාරීන්ගෙන් එම මුදල් අය කර ගැනීමටත්, ඔවුන්ට නඩු පවරන ලෙස ඉල්ලා නීතිපතිට වාර්තා කිරීමටත්, විගණකාධිපතිට බලය දිය යුතුය.

ඌ. ජනාධිපති විසින් වැඩබලන විගණකාධිපතිවරයෙක් පත් කිරීම වැළැක්වීම සඳහා අලුත් පුද්ගලයා පත් කිරීම පිළිබඳ කටයුතු ව්‍යවස්ථාදායක මණ්ඩලය කලින් ම ආරම්භ කළ යුතුය.

එ. මහජන මුදල් භාවිතයට ගෙන ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධයෙන් ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම ඇමතිවරුන්ට අනිවාර්ය කළ යුතු අතර එය අනුමැතිය සඳහා මහජනයාට විවෘත කළ යුතුය.

ඒ. අල්ලස හා දූෂණය තුරන් කිරීමට දැනට ඇති යන්ත්‍රණය ශක්තිමත් කිරීම. මුදල් වියදම් කිරීමේ වැඩපිළිවෙල සම්බන්ධයෙන් විස්තර අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යැවීම අනිවාර්ය කිරීමෙන් ඔවුන්ට එම ක්‍රියාවලිය සමීක්ෂණය කිරීම පහසු කරවීම.

ඔ. කොටස් වෙළඳපොලට ඇතුල්වීම සඳහා අර්ථසාධක අරමුදල් හා භාරකාර අරමුදල් ආයෝජනය කළ සමාගම් සමීක්ෂණය කිරීමට ඔවුන් රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කමිටුවට (COPE) ඉදිරියට කැඳවීමට හැකි වන සේ නීති සම්මත කිරීම.

# 17 පරිච්ඡේදය

# මහජන ආරක්ෂාව හා මානව ආරක්ෂාව

## 17.1 ඉදිරිපත් කළ අදහස්

මහජන ආරක්ෂාව හා මානව ආරක්ෂාව පිළිබඳ යෝජනා ඉදිරිපත් කළ යෝජනාවල වැඩි වශයෙන් සඳහන් වූයේ සුළුජාතීන්ගේ අදහස් හා ජාතික ආරක්ෂාවේ නාමයෙන් පුරවැසියන්ගේ නිදහස හා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙනි. මානව හිමිකම් කොමිසම විසින් පෙන්වා දුන් පරිදි ශ්‍රී ලංකාව ICCPR ප්‍රඥප්තියට අත්සන් කර ඇති බැවින් මහජන ආරක්ෂාව පිළිබඳ නීති ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකීම් අනුව විය යුතුය.

පුද්ගලික නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා රැකියා ලබා ගැනීමේ නිදහස ( කම්කරු අයිතිවාසිකම් ඇතුලුව) ඇතුලු මූලික අයිතිවාසිකම් සීමා කිරීම් අවම කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) සමාලෝචනය කළ යුතුය යන්න ඉදිරිපත්වූ එක් අදහසකි. සාධාරණ විමර්ශනයක් හා නඩු විභාගයක් සඳහා දණ්ඩනීති සංග්‍රහයේ නියම කර ඇති ක්‍රියා පිළිවෙලට පටහැණි ප්‍රතිපාදන එහි අඩංගු වේ.

තවත් විකල්ප අදහසක් වූයේ රජය හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කර නැති විට පවා පුරවැසියන්ගේ අයිතිවාසිකම් අහිමි කළ හැකි අතිශය දරුණු ස්වභාවයකින් යුත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සම්පූර්ණයෙන් ම ඉවත් කළ යුතු බවයි.

වෙනත් යෝජනා අතර පිට පළාත්වල සුළු ජාතිකයන්ගේ ආරක්ෂාව සහතික කිරීම; පොලිසියට හා හමුදාවට බඳවා ගැනීම ජනවාර්ගික අනුපාතයට අනුව වීම; ජාතික හමුදාවේ පුද්ගලයන් යම් කිසි කලාපයක සේවය කරන විට එම කලාපයේ නිල ඇඳුම භාවිතා කිරීම; ආරක්ෂක හමුදා ස්ථාන මානව ජනාවාසවලට ඈතින් පිහිටුවීම වැනි කරුණු ද, ඇතුළත් විය.

ජනතාවගේ මූලික අයිතිවාසිකම් තර්ජනයට, සීමාකිරීම්වලට, අතික්‍රමණයට හෝ උල්ලංඝනය කිරීමට ලක් නොකළ යුතුය. එවැනි සීමා කිරීම් ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් විය යුතුයි. නියමිත නෛතික ක්‍රියාවලියකින් තොරව කිසි ම පුද්ගලයෙක් අත්අඩංගුවට ගත යුතු නොවේ.

මානව හිමිකම් කොමිසම ඉදිරිපත් කළ කරුණු අතර මහජන ආරක්ෂාව පිළිබඳ විධිවිධාන ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ප්‍රතිඥාවන්ට අනුකූලවීම (ICCPR හි 4 වැනි ජේදය); හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ හැකිවන්නේ "ජාතියේ ජීවය තර්ජනයට ලක්වී" ඇති අවස්ථාවක පමණක් වීම; හදිසි අවස්ථා ප්‍රකාශන හා නියෝග සඳහා අධිකරණ සමාලෝචනයක් තිබිම සහතික කිරීම; හදිසි අවස්ථාව හය මාසයකට වැඩි කලක් පැවතුනහොත් එය තවදුරටත් දීර්ඝ කිරීම පාර්ලිමේන්තුව විශේෂ බහුතරයකින් අනුමත කිරීම; ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් ද අනුමත කර ඇති විශේෂයෙන් ම හදිසි අවස්ථාවක් තුළදී මානව හිමිකම් හීන කිරීම පිළිබඳ ප්‍රඥප්තියේ කෙටුම්පත අනුමත කිරීම ආදිය වේ.

*මානව ආරක්ෂාව*

පිරිසිදු ජලය, පිරිසිදු වාතය හා ජීවිත අයිතියට අවශ්‍ය අනිකුත් දේ ඇතුළු පරිසර ආරක්ෂාව සැපයීමෙන් ජනතාවට මානව ආරක්ෂාව තහවුරු කළ යුතු වේ. ගෝලීය උණුසුම් විම, පාරිසරික විනාශය, සාගර දූෂණය හා උපයෝජනය ආර්ථික සූරාකෑම ආදිය තුරන් කිරීමෙන් අභ්‍යවකාශ. වාත හා සාගර සුරක්ෂිතතාව ලබා දිය යුතු වේ. න්‍යෂ්ටික අයුධ පැතිරීම, කාර්මික දූෂණය, ජාන ඉන්ජිනේරු, කෘෂි රසායනික භාවිත ආදියෙන් මිනිස් ජීවිතයටත්,. සමාජයටත්, ඇතිවන තර්ජන වැළක්විය යුතුය.

රජය, ජාතික ආරක්ෂාවේ නාමයෙන් අත්තනෝමතික ලෙස මානව ආරක්ෂාව අනතුරට පත් නොකළ යුතුය. රාජ්‍යයේ නියෝජිතයන් හා රාජ්‍යයේ නොවන පුද්ගලයන් අතින් අයිතිවාසිකම් උල්ලංඝනය වූ විට එයට ගොදුරුවූවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර රැකගත යුතුය.

මහජන ආරක්ෂාව හා මානව ආරක්ෂාව පිළිබඳ ඉදිරිපත්වූ අදහස්වලින් පැහැදිලි ව පෙනී ගියේ දීර්ඝ කාලීන යුද්ධයේදී මානව හිමිකම් ගැටලුවලට මුහුණ පෑ සුළු ජාතික ප්‍රජාවන්ගේ සාමාජිකයන් මෙන් ම යුද්ධයේ විවිධ බලපෑම්වලට ලක්වූ අනිත් පුරවැසියන්ගේත් අපේක්ෂාවන්ය. පශ්චාත් යුද සමයේ රටේ ගොඩ නැගුණු හමුදා රාජ්‍ය මානසිකත්වය අද දක්වාම තරමක් දුරට දැකිය හැකි බව පෙනේ.

## 17.2 නිර්දේශ

1. හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීම අධිකරණ සමාලෝචනයකට යටත්වීම සහතික කළ යුතුය. හදිසි අවස්ථා රෙගුලාසි හා නියෝග පිළිබඳ අධිකරණ සමාලෝචන ඉක්මනින් අවසන් කළ යුතුය.

2. ව්‍යවස්ථාවේ පහත සඳහන් ප්‍රතිපාදන ඇතුළත් කළ යුතුය.

   i. පවතින නීතියට අමතරව මහජන ආරක්ෂක පනත යටතේ හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළ හැකි වන්නේ ජාතියේ ජීවිතය තර්ජනයට ලක්වී ඇති අවස්ථාවක හෝ ස්වාභාවික ව්‍යසනයකදී පමණි.

   ii. ශ්‍රේෂ්ඨාධිකරණයට සිය කැමැත්තෙන් හෝ උසාවියට ඉදිරිපත් කළ අයදුම්පතක් මත හෝ හදිසි අවස්ථා තත්ත්වයක් හේතු සහගත ද? යන්න සමාලෝචනය කළ හැක.

   iii මහජන ආරක්ෂක නීති යටතේ පනවන හදිසි අවස්ථා රෙගුලාසිවලට ජීවිතයට ඇති මූලික අයිතිය, සිතීමේ නිදහස, හෘද සාක්ෂියේ හා ආගමේ නිදහස, වධදීමෙන් නිදහස්වීමේ මූලික අයිතිය, අමානුෂික හෝ අවමානයට ලක් කෙරෙන සැලකිලි හා දඬුවම්, අත්තනෝමතික රඳවා නොගැනීමේ හා දඬුවම් නොලැබීමේ නිදහස හා අතුරුදහන් නොවීමේ නිදහස ආදිය උල්ලංඝනය කළ නොහැක.

   iv එක දිගට මාස හයකට වැඩි කාලයක් හදිසි අවස්ථාව පවත්වා ගත යුතු නම් හදිසි අවස්ථාව ප්‍රකාශ කිරීමේ නිවේදනය පාර්ලිමේන්තුවේ 2/3 ක බහුතරයකින් සම්මත විය යුතුයි.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි මානව සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම පිළිබද ප්‍රතිපාදනවල, පොලීසිය හා ආරක්ෂක හමුදා විසින් පුද්ගලයන් හා කණ්ඩායම්වලට එරෙහිව බලය යෙදීම මහජන ආරක්ෂාව හා නීතිය හා සාමයට ඇති තර්ජනයට සමානුපාතික විය යුතු බව ඇතුළත් විය යුතුය.

4. රටේ ත්‍රස්තවාදය වැළැක්වීම පිළිබඳ ප්‍රශ්න විසඳෙන ආකාරයට මහජන ආරක්ෂක ආඥාපනත සංශෝධනය කළ හැකි බැවින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතුය.[67]

5. රාජ්‍යයේ නියෝජිතයන් හා රාජ්‍යයේ නොවන පුද්ගලයන් අතින් අයිතිවාසිකම් උල්ලංඝනය වූ විට එයට ගොදුරු වූවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර රැකගත යුතුය.

[67] කුෂාන් ද අල්විස් ජ.නී. හා එම්.කේ නදීකා දමයන්ති මෙම නිර්දේශය සමග එකඟ වූයේ නැත.

# 18 පරිච්ඡේදය

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හා ස්වාධීන කොමිෂන් සභා

## 18.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

### 18.1.1 ඉදිරිපත් කළ අදහස්

අප ඉදිරියට ආ සිවිල් සමාජ සංවිධාන ගණනාවක් හා පුද්ගලයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වර්තමාන සංයුතිය ගැන දැක් වූයේ ඉතා විවේචනාත්මක ආකල්පයකි. 19වැනි ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවා ඇති වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත වන අතර එයින් හත් දෙනෙක් පාර්ලිමේන්තුවෙති. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් ලෙස ඇමතිවරු පත් කිරීමට වර්තමානයේ බාධාවක් නැත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඇමතිවරුන් පත් කිරීමෙන් ළැදියාවන් අතර ගැටුමක් ඇති විය හැකි බව මහජනයා පෙන්වා දුන්නේය. ස්වාධීන කොමිෂන් සභා හා උපරිමාධිකරණවලට සාමාජිකයන් නිර්දේශ කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් නිසා එහි අවංකබව හා ස්වාධීනත්වය රැක ගත යුතු අතර දේශපාලනීකරණයට ලක් නොවීම වැදගත් වේ. 2015 මාර්තු 16 දින දරණ ගැසට් පත්‍රයේ පළ කර ඇති 19 වැනි සංශෝධන පනතට යෝජනා කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතියට බොහෝ දෙනෙක් කැමති වූහ. ගැසට් පත්‍රයේ පළ කර ඇති ආකාරයට එහි සංයුතිය පහත දැක්වේ.

අ) අගමැති

ආ) කථානායක

ඇ) විරුද්ධ පක්ෂයේ නායක

ඈ) ජනාධිපති පත් කරන එක් පුද්ගලයෙක්

ඉ) අගමැති හා විරුද්ධ පක්ෂ නායකයා යන දෙදෙනාගේ නිර්දේශ මත ජනාධිපති පත් කරන පස් දෙනෙක්

ඊ) අගමැති හා විරුද්ධ පක්ෂ නායකයා අයත් වන දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හැර පාර්ලිමේන්තුවේ සිටින දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වල සාමාජිකයන්ගේ බහුතරයෙන් නම් කරන ජනාධිපති විසින් පත් කරන එක පුද්ගලයෙක්.

### 18.1.2 නිර්දේශ

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් සිදු කරන පත්වීම් සම්බන්ධයෙන් මහජනයාගේ විශ්වාසය දිනා ගැනීමේ වැදගත් පියවරක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය ඉහත දැක්වූ ආකාරයට විය යුතුය.

2. 19 වැනි සංශෝධන පනතේ තිබූ වැදගත් ප්‍රතිපාදනයක් වූ පහත දැක්වෙන කොටස නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතුය.

   අ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, බහුවිධතාව හා සමාජ විවිධත්වය ඇතුළු ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ව ලක්ෂණය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පිළිබිඹු වන බව සහතික කිරීම සඳහා අගමැති හා විරුද්ධ පක්ෂ නායකයා විසින් පස් දෙනෙක් නම් කිරීමේදී පාර්ලිමේන්තුවේ නියෝජනය දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නායකයන් සමග ඒ ගැන සාකච්ඡා කළ යුතුය.

   පත් කරන හෝ නම් යෝජනා කරන පුද්ගලයන් ප්‍රසිද්ධ හෝ පුද්ගලික ජීවිතයේ කීර්තියක් ලබා ඇති අවංක හා විශිෂ්ට පුද්ගලයන් විය යුතු අතර ඔවුන් කිසිම දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවිය යුතුයි.

## 18.2 ස්වාධීන කොමිෂන් සභා

### 18.2.1 ඉදිරිපත් කළ අදහස්

අප ඉදිරියේ කරුණු දැක්වූ රටේ විවිධ පළාත්වල ජනයා විවිධාකාර කොමිෂන් සභා පිහිටුවන ලෙස ඉල්ලා සිටියෝය. ඒවා පහත ලැයිස්තු ගත කර තිබේ. මෙම ඉල්ලීමට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ රජයේ ස්ථම්භ තුන වන ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණය ඔවුන් දකින්නේ නිලධාරීවාදී, දේශපාලණීකරණය වූ, දූෂිත හා මහජන දුක්ගැනවිලිවලට අසංවේදී ආයතන ලෙස වීමයි. මහජනයාගේ අදහස වී ඇත්තේ මෙම කොමිෂන් සභා වඩා ස්වාධීන හා මහජනයාට යම් කිසි සහනයක් ලබා ගත හැකි ආයතන බවය.

කෙසේ වෙතත් මෙය සැලකිල්ලට යොමු විය යුතු කරුණක් වන්නේ එයින් රජයේ ආයතනවල අසාර්ථක බව පැහැදිලි වන බැවිනි. එබැවින් එම ආයතන ශක්තිමත් කිරීම ගැන මෙන් ම ඒවා වැඩිදුරටත් ප්‍රජාතන්ත්‍රීකරණයට භාජනය කිරීම ගැන අවධානය යොමු කළ යුතුය. මේ නිසා රාජ්‍ය තන්ත්‍රයේආයතන හා පද්ධති ප්‍රතිශෝධනය වන තුරු තාවකාලික පියවරක් වශයෙන් සමහර කොමිෂන් සභා ස්ථාපිත කිරීම ගැන සලකා බැලිය යුතුය.

මෙම කාරණය පිළිබද ව මෙන් ම දැනට පවතින කොමිෂන් සභාවලට සමහර කරුණු ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ද සලකා බලන ලෙස කමිටුව යෝජනා කරයි.

19වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ දැනටත් පිහිටුවා ඇති ඒවාට අමතරව ව්‍යවස්ථාව මගින් පහත දැක්වෙන ආයතන පිහිටුවීමට මහජනයා යෝජනා ඉදිරිපත් කරන ලදී.

- රාජ්‍ය සේවා දුක්ගැනවිලි කොමිසම
- අර්ධ රාජ්‍ය ආයතන සඳහා වූ රාජ්‍ය සේවා කොමිසම
- වෙනස් ලෙස සැලකීමට විරුද්ධ හා සම අවස්ථා පිළිබඳ කොමිසම
- මාධ්‍ය කොමිසම
- කාන්තාවන් පිළිබඳ කොමිසම
- ළමයින් සඳහාවූ කොමිසම
- නීති ආධාර කොමිසම
- අධ්‍යාපන කොමිසම
- සෞඛ්‍ය කොමිසම
- පරිසර කොමිසම
- ආර්ථික සංවර්ධන දුක්ගැනවිලි කොමිසම
- ආබාධිතයන්ගේ අයිතිවාසිකම් කොමිසම
- උපරිමාධිකරණ සඳහා අධිකරණ කොමිසම
- මලයහ (උඩරට) දෙමළ සංවර්ධන කොමිසම
- තානාපති/විදේශ සේවා කොමිසම
- කේන්ද්‍රය-පර්යන්ත සබඳතා කොමිසම
- ජාතික ඉඩම් කොමිසම
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම
- රාජ්‍ය භාෂා කොමිසම
- ආහාර හා කෘෂිකර්ම කොමිසම
- දේශීය වෛද්‍ය කොමිසම
- සහනදායී ක්‍රියා සඳහා වූ කොමිසම

## 18.3 නිර්දේශ

දැනට ඇති ඒවාට අමතරව පිහිටුවිය යුතු සමහර කොමිෂන් සභා ගැන කමිටුව දැනටමත් නිර්දේශ ඉදිරිපත් කර තිබේ. වැඩි වැඩියෙන් කොමිෂන් සභා ඉල්ලීමට හේතු වී ඇති මහජනයාගේ ප්‍රශ්න, විසඳිය හැකි සමහර ව්‍යවස්ථාදායක ප්‍රතිපාදන ද, මෙහිදී නිර්දේශ කර තිබේ. අපේ අදහස වන්නේ ස්වාධීන කොමිෂන් සභා සංඛ්‍යාව, විෂය පථය හා සංයුතිය පිළිබඳව තීරණය කිරීමේදී ව්‍යවස්ථා සම්පාදක සභාව රාජ්‍ය ආයතනවල ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය, රාජ්‍ය සේවාවල කාර්යක්ෂමතාව වැනි පුළුල් කරුණු ගැන අවධානය යොමු කළ යුතු බවයි.

# 19 පරිච්ඡේදය

# ඉඩම්, පරිසරය හා සංවර්ධනය

## 19.1 ඉදිරිපත් කළ අදහස්

සමස්තයක් වශයෙන් සලකන විට ඉඩම්, පරිසරය හා සංවර්ධනය ගැන මහජනයා අදහස් ඉදිරිපත් කළේ පරිසර හා සංවර්ධන සංකල්ප ගැන පුළුල් අවබෝධයකින් බව පෙනේ. ප්‍රධාන වශයෙන් ඔවුන් අවධානය යොමු කළේ ප්‍රවේශය, යුක්තිය, සමානත්වය හා තිරසර බවටයි. කමිටුවට ඉදිරිපත් කළ අදහස්වල සාරාංශයක් පහත දැක්වේ.

### 19.1.1 ඉඩම්

ඉඩම් භාවිතය, ඉඩම් කළමනාකරණය, ඉඩම් අයිතිවාසිකම් හා ජීවනෝපාය හා ජනාවාස සඳහා ඉඩම් ලබා ගැනීම ආදි බොහෝ ප්‍රශ්නවලට ජනතාවට මුහුණ දීමට සිදුවී ඇති බව පැහැදිලිව දැකිය හැකි විය. කාන්තාවන් විශේෂයෙන් ම කරුණු ඉදිරිපත් කළේ පවතින ඉඩම් නීති, රෙගුලාසි හා යන්ත්‍රණවල දැකිය හැකි වෙනස් ලෙස සැලකීම පිළිබඳවය. උදාහරණයක් වශයෙන් බොහෝ දෙනෙක් පෙන්වා දුන්නේ සාමාන්‍යයෙන් රජයෙන් ඉඩම් ලබා දෙන්නේ නිවසේ පුරුෂයාගේ නමට පමණක් බවයි. විශේෂයෙන් ම රජයේ ඉඩම් ලබා දීමට පදනම් වී ඇත්තේ දෙටු පිළිවෙත් නීතිය නිසා ඔවුන් ඉඩම් උරුමය හා පැවරීමේදී වෙනස් ලෙස සැලකීමේ ප්‍රශ්නයට මුහුණ දෙයි. රජයේ ඉඩම් කැබලි කිරීම ගැන ද, ජනයා කරුණු ඉදිරිපත් කළහ. මේ ප්‍රශ්නයේ දෙපැත්තක් තිබුණි. පළමුවැන්න වූයේ වන ඉඩම් කැබලි කිරීමයි. දෙවැන්න වූයේ ජනතාව අතර බෙදා දී ඇති රජයේ ඉඩම් කැබලි කිරීමයි. උදාහරණයක් වශයෙන් රජයේ වැඩසටහන් යටතේ ඉඩම් ලැබුණු අයගේ දෙවැනි හා තුන්වැනි පරම්පරාව ඉඩම් ප්‍රමාණවත් නොවීම නිසා බොහෝ ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදුවී තිබේ. තවත් සමහරුන්ගේ තර්කය වූයේ රජයේ ඉඩම්වල අයිතිය මාරු කිරීම සීමා කරන නීති ද, (කැබලිවීම වැළැක්වීමට) වෙනස් ලෙස සැලකීමක් බවයි. බොහෝ අය පෙන්වා දුන්නේ ඉඩමේ අයිතිය මාරු කළ හැකි වන්නේ වැඩිහිටි පුත්‍රයාට පමණක් වීම පවුලේ අනිත් සාමාජිකයන්ට වෙනස් ආකාරයට සැලකීමක් බවයි. රටේ සමහර පළාත්වල විශේෂයෙන් ම නැගෙනහිර රජයේ ඉඩම් බෙදාදීම ඉතා මතභේදකාරී කටයුත්තකි. සමාන ලෙස ඉඩම් ලබා ගැනීමේ ප්‍රශ්නයේදී වාර්ගික-ආගමික හැඟීම් විශාල බලපෑමක් කළේය. ඉඩම් කැබලි කිරීම පිළිබඳ

ජනතාවගේ කනස්සල්ලට පාදක ගැටලුව වන්නේ ජීවනෝපාය කටයුතු සඳහා ඉඩම් ලබා ගත නොහැකිවීම බව අපගේ අදහසයි.

ඉඩම් අයිතිය හා භාවිතය පිළිබඳව ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න ගණනාවක් මහජනයා විසින් ඉස්මතු කරන ලදී. මෙයින් සමහරක් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ගැටලු වන අතර අපි ඒවා පසුබිම් තොරතුරු ලෙස මෙහි දක්වන්නේ ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණවලදී සැලකිල්ලට ගැනීම සඳහායි.

1. වෙනස් ලෙස සලකන රජයේ ඉඩම් ප්‍රතිපත්ති, චාරිත්‍ර හා සාම්ප්‍රදායට පදනම් වී ඇත්තේ පහත දැක්වෙන කරුණු වේ.
   අ. ලිංගිකත්වය මත පදනම්වූ රාජ්‍ය නීති ( සංශෝධිත 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥාපනත)
   ආ. ආර්ථික අංශය (උදාහරණයක් වශයෙන් වතු අංශයේ පුද්ගලයන් ජීවත්වන හා වැඩකරන ඉඩම් ඔවුන්ට අයත් නොවේ)
   ඇ. ඉඩම්වල පදිංචි කරවීමේ ප්‍රතිපත්තිය, සමහර වාර්ගික කණ්ඩායම්වලට වෙනස් ලෙස සලකයි.
   ඈ. 'සංවර්ධනය' කිරීම සඳහා රජය හෝ පුද්ගලික ආයතන ඉඩම් බලහත්කාරයෙන් අයත් කර ගැනීම

2. ඉඩම් භාවිත ප්‍රතිපත්තියේ දෝෂ

3. ඉඩම් නීති හා රෙගුලාසි බලාත්මක කිරීමේ දුර්වලතා

4. විශේෂයෙන් ම ආන්තික හා දුගී ප්‍රජාවන් ට පදිංචිවීම හා ජීවනෝපාය කටයුතු සඳහා ඉඩම් ලබාගත නොහැකි වීම.

5. රාජ්‍ය ඉඩම් පිළිබඳ තොරතුරු මහජනයාට ලබාගත නොහැකි වීම හා පාරදෘශ්‍ය නොවීම.

6. පාරිසරිකව සංවේදී ඉඩම්වලට ආරක්ෂාවක් නොමැතිවීම නිසා මිනිසුන් ඇති කළ හා ස්වාභාවික ව්‍යසන සිදුවීම.

7. දුප්පතුන්ට හිතවත් හා පරිසර හිතකාමී ප්‍රවේශයකින් කටයුතු නොකරන බලවත් කණ්ඩායම් විසින් අකාර්යක්ෂම හා තිරසාර නොවන ආකාරයට ඉඩම් භාවිතා කිරීම නිසා පසසේදී යෑම හා හායනය වීම.

8. වනාන්තර හා ආරක්ෂිත ඉඩම් විවිධ ප්‍රජාවන් විසින් බලෙන් අල්ලා ගැනීම නිසා සිදු වන මිනිස්-සත්ව ගැටුම් හා වන විනාශය.

9. රාජ්‍ය, පුද්ගලික හා ප්‍රජා ඉඩම් සම්බන්ධ නියම වර්ගීකරණ ක්‍රමයක් හෝ මායිම් ලකුණු කිරීමක් නැතිකම. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ ප්‍රජා හා රාජ්‍ය ඉඩම් ප්‍රමාණයෙන් අඩු වීමයි.

### 19.1.2 පරිසරය

මහජනයා පරිසරය ලෙස සැලකුවේ වාතය, ජලය (ගංගා හා අනිකුත් ජල මාර්ග හා සාගර) ඉඩම්. සතුන්, වනජීවීන්,වනාන්තර හා ස්වභාවික රක්ෂිත ආදිය යි

ආහාර සුරක්ෂිතතාව, දූෂණයෙන් තොර පරිසරයක්, පලිබෝධනාශක, පොහොර හා රසායනිකවලින් තොර කෘෂිකර්මයක්, සාම්ප්‍රදායික කෘෂිකර්ම පද්ධති හා ඒ ජීවන රටාව ආරක්ෂා කිරීම, කසළ බැහැර කිරීම, සනීපාරක්ෂාව හා විදේශීය විශේෂවල ආක්‍රමණයෙන් දේශීය පැලෑටි ආරක්ෂා කර ගැනීම ආදිය පිළිබඳව ද ඔවුහු අදහස් දැක්වූහ. කෙටියෙන් කිවහොත් ඔවුන් කථා කළේ මිනිසුන්ගේ ජීවිත හා ජීවනෝපායන් සමග වෙන් කළ නොහැකි ලෙස බැඳි ඇති මිනිස් පරිසරය හා පරිසර පද්ධතිය ගැනයි.

මහජනයාගේ අවධානය වැඩියෙන් ම යොමුවී ඇති කරුණු පහත දැක්වේ.

1. පිරිසිදු පරිසරයක් ලබා ගැනීම
   - අ. පිරිසිදු ජලය, වාතය හා ඉඩම්
   - ආ. ශබ්ද දූෂණය ඇතුළු සියලු ආකාරයේ දූෂකවලින් ආරක්ෂාව
   - ඇ. කසල බැහැර කිරීම හා සනීපාරක්ෂාව සඳහා උචිත යන්ත්‍රණ

2. ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම
   - අ. ස්වභාවධර්මය, වනජීවි රක්ෂිත, වනාන්තර, සාගර හා ජලමාර්ග ආරක්ෂා කිරීම
   - ආ. රටේ ජීව විවිධත්වය ආරක්ෂා කිරීම
   - ඇ. බොහෝවිට වාණිජ අරමුණු සඳහා ආනයනය කරන විදේශීය විලෝපී විශේෂවලින් දේශීය සතුන් හා ශාක ආරක්ෂා කිරීම
   - ඇ පාංශු බාදනය වැළැක්වීම

3. කෘෂිකර්ම හා ආහාර සුරක්ෂිතතාව

අ. පළිබෝධනාශක, රසායනික ද්‍රව්‍ය ආදියෙන් තොර ආහාර

4. දේශීය කෘෂි භාවිතයන් හා ඒ හා සම්බන්ධ ජීවන රටාව ආරක්ෂා කිරීම

5. සත්ත්ව සුබ සාධනය හා අයිතිවාසිකම්

6. සංවර්ධනයෙන් ඇති කරන අවදානමෙන් පරිසරය ආරක්ෂා කිරීම

අ. පරිසර ආරක්ෂාව සඳහා නීති සකස් කිරීම

ආ. නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණ හා එවැනි ක්‍රියාමාර්ග සරල කිරීම

### 19.1.3 සංවර්ධනය

මිනිසුන් සංවර්ධනය පුළුල් ලෙස අර්ථ දක්වන්නේ පුද්ගලයෙකුගේ හෝ ප්‍රජාවක ජීවිතයේ සියලු ම අංශ ඇතුළත් වන ආකාරයටයි. උදාහරණයක් වශයෙන් එක් අදහස් දැක්වීමකට අනුව සංවර්ධනය අර්ථ දක්වා තිබුණේ “ප්‍රමාණවත් ආහාර, ඇඳුම් හා නිවාසදිගටම දියුණුවන ජීවන තත්වය, විවේකය, සමාජීය හා සංස්කෘතික අවස්ථා විනෝදයෙන් ගත කිරීම ඇතුළුව සියලු පුරවැසියන් හා ඔවුන්ගේ පවුල්වලට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් ලබා ගැනීම” ලෙසයි. සංවර්ධනය පිළිබඳ ව කරන විස්තරය තුළ ආර්ථික සංවර්ධනය, සමාජ-සංස්කෘතික සංවර්ධනය, වැනි අදහස් මෙන්ම ආහාර, සෙවණ, ඇඳුම්, ප්‍රවාහනය, අධ්‍යාපනය, සෞඛ්‍යය, ජීවනෝපාය, ඉඩම් අයිතිය ආදි මූලික අවශ්‍යතා ද විය.

මහජනයා පෙන්වා දුන්නේ සංවර්ධනය තුළින් සමාජ සාධාරණත්වය, සමානත්වය, ප්‍රති ව්‍යාප්තිය හා තිරසරබව ආදිය සහතික කළ යුතු බවයි. ඉදිරිපත්වූ බොහෝ යෝජනාවල ප්‍රජාතන්ත්‍රවාදය, සහභාගීත්වය හා සාකච්ඡා කිරීම වැනි පරමාදර්ශී අදහස් ද ගැබ්වී තිබුණි. ප්‍රජාතන්ත්‍රවාදයට ආර්ථික ප්‍රජාතන්ත්‍රීකරණය ද, ඇතුළත් විය යුතුය යන අදහස ද, ඉදිරිපත් කරන ලදී. මහජනයා ආර්ථික ප්‍රජාතන්ත්‍රීකරණය පැහැදිලිකර තිබුණේ පහත දැක්වෙන ආකාරයටයි.

- ආර්ථිකයේ ප්‍රතිලාභ සමානව බෙදී යායුතුය.
- ආර්ථික තීරණ ගැනීමේ ක්‍රියාවලියට ජනතාව සහභාගී කරවා ගෙන ඔවුන් සමග සාකච්ඡා කිරීම.

- ආර්ථික කටයුතු සම්බන්ධයෙන් ජනතා ස්වෛරීත්වය  තහවුරු කිරීම

සංවර්ධන ගැටලු සම්බන්ධයෙන් මහජනයා පහත දැක්වෙන විශේෂිත කරුණු ඉදිරිපත් කළේය.

1. මූලික අවශ්‍යතා සැපයීමේදී රාජ්‍යයේ වගකීම

    අ. ආහාර, ඇඳුම් හා සෙවණ

2. රැකියා හා ජීවනෝපාය

    අ. සාම්ප්‍රදායික කර්මාන්ත හා ජීවනෝපායන්ආරක්ෂා කිරීම

    ආ. මිනිසුන් හා ප්‍රජාවන් අතර  සහයෝගීතාව ශක්තිමත් කිරීමට සමූපකාර හා සාමූහික  ආර්ථික හා සංවර්ධන ව්‍යාපෘති ප්‍රවර්ධනය කරන්න

    ඇ. සූරාකෑමෙන් ශ්‍රමය හා කම්කරුවන් ආරක්ෂා කිරීම

3. තීරණ ගැනීමේදී ජනතාව සමග සාකච්ඡා කිරීම හා සහභාගීකරවා ගැනීම සහතික කිරීමේ අවශ්‍යතාව

    අ. සංවර්ධනය නිසා සිදුවන අවතැන්වීම වැළැක්වීම

    ආ. සියල්ලන් ඇතුළත් වන සංවර්ධනයක් - විශේෂයෙන්ම ආබාධ සහිත පුද්ගලයන් වැනි අනාරක්ෂිත කණ්ඩායම්

    ඇ. සංවර්ධනය නිසා ඉඩම් අන්සතු වීම වැළැක්වීම

    ඈ. බහුජාතික සමාගම් හා සංස්ථාවලින්  මහජනයා ආරක්ෂා කිරීම

    ඉ. සාකච්ඡා හා සහභාගීත්වය සඳහා පිළිගත් යන්ත්‍රණයක් නොමැතිවීම

4. දිළිඳුබව තුරන් කිරීම සඳහා රජයේ වගකීම

5. පහත දැක්වෙන සංවර්ධන මූලධර්ම වෙනුවෙන් පෙනී සිටින්න

    අ. යුක්තිය

ආ. දුප්පතුන්ට හිතවත් හා තිරසර සංවර්ධනයක් සඳහා සම්පත් කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම

ඇ. සියල්ලන් ඇතුළත් කර ගැනීම

ඈ. සහභාගීත්ව හා සාකච්ඡාමය තීරණ ගැනීමේ ක්‍රියාවලියක්

ඉ. තිරසර හා සුරාකෑමෙන් තොර සංවර්ධනයක්

6. ආර්ථික සුරාකෑමෙන් ආරක්ෂා වීම සහතික කිරීම

අ. සංවර්ධනය හා සම්බන්ධ ආර්ථික දුක්ගැනවිලිවලට සහන හා ආරක්ෂාව සලසන යන්ත්‍රණයක්

ආ. සංවර්ධන ප්‍රතිපත්ති, ව්‍යාපෘති හා ජාත්‍යන්තර ගිවිසුම පිළිබඳ අධීක්ෂණයට නෛතික ක්‍රම හා ජනමතවිචාරණ

පරිසරය හා සංවර්ධනය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ බොහෝ අදහස්වල ඉහළ සිට පහළට එන සාකච්ඡාවලින් තොර සංවර්ධනය ගැන දැඩි විවේචනයක් තිබුණි. සමහර සංවර්ධන ව්‍යාපෘතිවල බරපතළ පරිසර බලපෑම් තිබූ බවත් (පවතින නීති හා රෙගුලාසි පවා උල්ලංඝනය කරමින්) එහි ප්‍රතිඵලයක් ලෙස ඉඩම් අන්සතුවීම, ශ්‍රමය සූරා කන රැකියා තත්ත්වයක් හා අවතැන්වීම් සිදුවූ බවත් පෙන්වා දෙන ලදී. සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් මහජනතාව සමග සාකච්ඡා, සමාජ වගවීම හා අධීක්ෂණය සහතික කරන යන්ත්‍රණයක් පිහිටුවීම සම්බන්ධයෙන් ද නිර්දේශ යෝජනා කරන ලදී. මහජන සහභාගීත්වය හා වගවීමේ යන්ත්‍රණ පිළිබඳ ප්‍රගතිශීලී අදහස් ඇති ඉන්දියාව, බොලීවියාව, කෙන්යාව, නේපාලය, ඉක්වදෝරය හා තවත් රටවල් ගණනාවක ව්‍යවස්ථා පිළිබඳ ව සඳහන් කරන ලදී. පළාත් පාලන ආයතනවලට ඔවුන්ගේ ප්‍රදේශයේ ඇති සම්පත් ගැන වැඩි බලයක් හා පාලනයක් දිය යුතු යැයි ද සංවර්ධන තීරණ ගැනීමේදී ඔවුන්ගේ අදහස්වලට වැඩි අවධානයක් යොමු කළ යුතු යැයි ද යෝජනා කරන ලදී.

මූලික වශයෙන් වෙළඳපොල තර්ක හා ලාභ ලැබීමේ අරමුණ මත පදනම් වූ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව බොහෝ අදහස් දැක්වීම්වල විවේචන තිබුණි. ධනවාදයට විකල්පයක් නැතැයි සමහරුන් කියා සිටි අතර තවත් අය නිදහස් වෙළඳපොල ප්‍රතිපත්ති මත පදනම්වූ සංවර්ධනය දැඩි ලෙස විවේචනය කළෝය. ඔවුන් වැඩිදුරටත් කියා සිටියේ ඒ මගින්

සිදුවන්නේ මානව හා ස්වාභාවික සම්පත් සූරා කෑම හා ජනතාව තව තවත් ආන්තික හා පිටස්තරයන් බවට පත්වන බවයි.

පරිසරය හා සංවර්ධනය සම්බන්ධයෙන් මතු කළ ගැටලුවලට ප්‍රතිචාර දක්වන නිර්දේශ ජනතාවගේ අයිතීන් මෙන් ම ජනතාවට රජයෙන් ඉටුවිය යුතු යුතුකම් සම්බන්ධයෙන් ද, විය. උදාහරණයක් වශයෙන් පිරිසිදු පරිසරයක ජීවත් වීමේ අයිතිය හා තිරසර පරිසර පද්ධතියක ජීවත්වීමේ අයිතිය ආදිය මූලික අයිතීන් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතුයයි යෝජනා කරන ලදී. ඒ අතර ම පරිසර පද්ධතිය, ස්වාභාවික සම්පත්, වන ජීවීන් ආදිය ආරක්ෂා කිරීම රජයේ වගකීමක් ලෙස යෝජනා කරන ලදී. මේ අනුව සංවර්ධනය, ඉඩම් හා පරිසරය අයිතිවාසිකම් ලෙස දැක්වූ අතර මෙමඅයිතීන් ආරක්ෂා කිරීමත් සුරක්ෂිත කිරීමත්. සහතික කිරීමත් රාජ්‍යයේ වගකීමක් බව පැහැදිලිව පෙන්වා දෙන ලදී.

## 19.2 නිර්දේශ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සෑදීමේ ක්‍රියාවලිය තුළ මෙම බහුවිධ හා සංකීර්ණ ගැටලු සැලකිල්ලට ගනිමින් අපේ නිර්දේශ පහත දක්වමු.

1. ස්වාභාවික සම්පත්, සතුන් හා වෘක්ෂලතා ආදියේ භාවිතය පිළිබද ව්‍යවස්ථාමය උපදෙස් ලබා දිය යුතුය.
2. ඉඩම්, පරිසරය හා සංවර්ධනය මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ ඇතුළත් කළ යුතුය. සතුන් හා වනජීවීන් පරිසරයේ හා පරිසර පද්ධතියේ කොටසක් වන බැවින් පරිසරය පිළිබඳ මූලික අයිතිවාසිකම් කොටසේ සත්ත්ව අයිතිවාසිකම් හා සුබ සාධනය සම්බන්ධයෙන් ද, සැලකිල්ල දැක්විය යුතුයි.
3. ඉඩම්,පරිසරය හා සංවර්ධනය පිළිබඳ අයිතිවාසිකම් ක්‍රියාත්මක වන්නේ කෙසේද? යන්න පැහැදිලි කරමින් ඒවා පිළිබඳ වෙන ම පරිච්ඡෙද ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතුය. කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේදී කෙන්යාවේ හා ඉක්වදෝරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සැලකිල්ලට ගන්නා ලෙස අපි යෝජනා කරමු. උදාහරණයක් වශයෙන් එහි පහත දැක්වෙන කරුණු සඳහා ප්‍රතිපාදන ඇතුළත් විය යුතුය.
    - පරිසරය හා ස්වාභාවික සම්පත්වල තිරසර උපයෝජනය, භාවිතය, කළමනාකරණය හා සංරක්ෂණය සහතික කරමින් ලැබෙන ප්‍රතිලාභ ද සමසේ බෙදී යන බවට සහතික වන්න.

- පරිසර විශේෂඥයින් සමග සාකච්ඡා කර අවම වන ආවරණයක් තීරණය කර එය මුදුන්පත් කරගෙන පවත්වා ගැනීමට ක්‍රියා කිරීම
- ප්‍රජාවන්ගේ ජාන සම්පත් හා ජෛව විවිධත්වයේ දේශීය දැනුමට ඇති නෛතික ආරක්ෂාව වැඩි දියුණු කර  ආරක්ෂා කරන්න.
- පරිසරය කළමනාකරණය, ආරක්ෂා කිරීම හා සංරක්ෂණයේදී මහජන සහභාගීත්වය දිරි ගැන්වීම
- ජාන සම්පත් හා ජෛව විවිධත්වය ආරක්ෂා කරන්න.
- පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රම ස්ථාපිත කරන්න.

4. පරිසර විගණනය හා පරිසරය සමීක්ෂණය කිරීම
5. පරිසරයට හානිදායක විය හැකි ක්‍රියාවලි හා කටයුතු තුරන් කරමි න්පරිසරය හා ස්වාභාවික සම්පත් ශ්‍රී ලාංකික ජනතාවගේ යහපත සඳහා යොදා ගැනීම
6. සෑම පුද්ගලයෙකුට ම රජයේ ආයතන සමග සහයෝගීව කටයුතු කිරීමට  වගකීමක් ඇති අතර සෑම දෙනාම පාරිසරිකව තිරසර සංවර්ධනයක් හා ස්වාභාවික සම්පත් භාවිතය සහතික කරමින්  පරිසරය ආරක්ෂා කර සංරක්ෂණය කළ යුතුය.[68]
7. සංවර්ධනය හා සම්බන්ධ සූරාකෑම හා අවතැන්වීම වළක්වන ප්‍රමාණවත් යන්ත්‍රණ ඇතිබව සහතික කිරීමට හා ආර්ථික සංවර්ධන දුක්ගැනවිලි ගැන සොයා බැලීමට කොමිසමක් ස්ථාපිත කිරීම
8. ඉඩම්, පරිසරය හා සංවර්ධනය හා සම්බන්ධ මූලික අයිතීන් උල්ලංඝනය කිරීම්වලට ගොදුරු වූ අයට වන්දි හා සහන ලබා දෙන ක්‍රම
9. සංවර්ධනයේ නාමයෙන් ජනතාව සූරාකන හෝ පරිසරයට හානිකරන හෝ පුද්ගලයෙක් හෝ ආයතනයකට විරුද්ධව කටයුතු කිරීමට බලය ඇති රාජ්‍ය නිලධාරීන්ගේ ඒ සම්බන්ධයෙන් වගකිව යුතු බවට ප්‍රතිපාදනයක් ඇති කිරීම
10. රටේ සම්පූර්ණ ඉඩම් ප්‍රමාණයෙන් පිළිගත හැකි ප්‍රතිශතයක්, වන ආවරණය ලෙස පවත්වා ගැනීමේ ක්‍රමයක් හඳුනා ගැනීම
11. රටේ තිරසර සාධාරණ  සමාජීය වශයෙන් යුක්ති සහගත සමාජ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කැපවීම

[68] කෙන්යාවේ ව්‍යවස්ථාවෙන් 69 හා 70 වගන්ති වලින් ගන්නා ලදී.

# 20 පරිච්ඡේදය
# ප්‍රතිජනන ක්‍රියා හා ප්‍රතිසන්ධානය

## 20.1 ඉදිරිපත් කළ අදහස්

අප වෙත අදහස් ඉදිරිපත් කළ මහජනයාගෙන් කොටසක් කියා සිටියේ සමාජයේ ආන්තික තත්ත්වයට පත් වූ හා අනාරක්ෂිත කණ්ඩායම් ගණනාවක් මුහුණ දී ඇති ප්‍රශ්න පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බවයි. මේ අතර සිටින සෑම පළාතක ම ජීවත්වන සුළුතර කණ්ඩායම්, ආදිවාසීන්, වෙනස් ලෙස සලකන කුල හා වහල් වැඩ කරන කණ්ඩායම්, ආබාධ සහිත පුද්ගලයන් හා යුද්ධයෙන් බැට කෑ ප්‍රජාවන්ද, වන අතර ඔවුන් පෙන්වා දුන්නේ මෙම කණ්ඩායම් සේවා ලබා ගැනීම අතින් මෙන් ම නියෝජනය හා සංවර්ධනය අතින් ද, අභියෝග ගණනාවකට මුහුණ දී ඇති බවයි. වඩා පහසුවෙන් සේවාවන් ලබා ගැනීම, ප්‍රමාණවත් නියෝජනය හා ඔවුන් ද, සහභාගීවන සංවර්ධනයක් තුළින් ඔවුන්ගේ ආන්තික තත්ත්වයෙන් මිදීමට සහතදායී පියවරක් ගන්නා ලෙස ඔවුහු ඉල්ලා සිටියහ. වෙනස් ලිංගික නැඹුරුතා සහිත අය කියා සිටියේ ඔවුන්ගේ ලිංගික නැඹුරුව නිසා වෙනස් ලෙස සැලකීමට භාජනය වන බවත්, එහි ඇති අප්‍රකට ස්වභාවය නිසා විශේෂ ආරක්ෂාවක් අවශ්‍ය බවත්ය. ආබාධ සහිත පුද්ගලයින් පෙන්වා දුන්නේ සමානතාව පමණක් ලැබීම ඔවුන් සම්බන්ධයෙන් විසඳුමක් නොවන බවත්, ඔවුන් සදාකාලිකව ම විශේෂ අවශ්‍යතා ඇති කණ්ඩායමක් ලෙස හඳුනා ගත යුතු බවත්ය. සමහරුන් මේ සඳහා යෝජනා කළේ ජනවාර්ගිකත්වය, ආගම ආදිය මත පදනම් වූ අනුපාතික ක්‍රමයකි. වෙනත් අය මතු කළ ප්‍රශ්නය වූයේ මේ නිසා වාර්ගික හා ආගමික වෙන්වීම තවත් වැඩි විය හැකි බවයි. සාමකාමී සහජීවනයට අත්‍යවශ්‍ය වන, ප්‍රචණ්ඩත්වයක් නැවත ඇති නොවීම සහතික කිරීම සඳහා සමාජය තව දුරටත් බෙදීම වැළැක්විය යුතුය යන්න ඔවුන්ගේ අදහස විය.

සියලු ආන්තික හා අනාරක්ෂිත කණ්ඩායම්වලට ආරක්ෂාව අවශ්‍ය බවත්ට, ඔවුන්ට පහසුවෙන් සේවා ලබා ගැනීම හා ප්‍රමාණවත් නියෝජනයක් ලබාදීම රජය විසින් සහතික කළ යුතු බවටත්, කමිටුව එකඟ විය. සංවර්ධන ක්‍රියාවලියට ඔවුන් සහභාගී කරවා ගනිමින් නියමිත කාල පරිච්ඡේදයක් (අවුරුදු 30 ක් පමණ) ඔවුන්ට අනිත් පුරවැසියන් හා සමාන තත්ත්වයකට ළඟා වීමට ආධාර කළ යුතු වේ. එම කාලය අවසානයේ ආබාධ සහිත පුද්ගලයන් හැර අන් අය සම්බන්ධයෙන් මෙම විශේෂ සහන සමාලෝචනය කළ හැකි වේ. නියාමක මූලධර්ම, මූලික අයිතිවාසිකම්, අධිකරණ හා මැතිවරණ ප්‍රතිසංස්කරණ, රාජ්‍ය සේවය හා ස්වාධීන කොමිෂන් සභා ආදි කරුණු යටතේ වාර්තාවේ විවිධ කොටස්වලදී කමිටුව මේ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර තිබේ.

# 21 පරිච්ඡේදය

## වෙනස් ලෙස සැළකීමට විරුද්ධ කොමිසම

### 21.1 ඉදිරිපත් කළ අදහස්

